# පද්‍ය'ච බොධිනී

## සමන්තකූට වණ්ණනා ව්‍යාඛ්‍යාව.

(ප්‍රථම භාගය.)

P. 33

ගාල්ලේ විද්‍යාලොක පාරිවෙණික

රුකඩගේණෙ චන්ද්‍රජොති ස්වාමීන් විසින්

සම්පාදිතයි.

ගාල්ලේ

විද්‍යාලොක පරිවෙණාධිපති ගෞරවාහී රාජකීය පූජ්‍ය පණ්ඩිත

ශාස්ත්‍රාචාර්‍ය

ශ්‍රී පුඤ්ඤසාරාභිධාන

වැලිවිටියේ නායක මාහිමියන් වහන්සේ විසින්

පිළිගන්නාලදී.

අම්පේගම පදිංචි

කේ. ඇල්. ජී. චාර්ලිස් අප්පුහාමි

විසින්

කොළඹ චන්ද්‍රසෙන මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවා

ප්‍රසිද්ධකරණලදී.

බු: ව: 2485.

ක්‍රි: ව: 1941.

# සංඥාපනය.

i සංඥා. "සමන්තකූට වණ්ණනා" යනු මේ ග්‍රන්ථයාගේ සංඥාවයි (=නාමයයි.) තථාගතයන් වහන්සේගේ විචිත්‍රාපදානය හා උන් වහන්සේගේ ලංකා ගමන ප්‍රවෘත්තිත් ද ඇතුළු වූ අන්‍ය වූ ද නොයෙක් කරුණුවලින් මේ ග්‍රන්ථය සමලඞ්කෘත ය. එහෙත් සමන්තකූට පර්වත වර්ණනය ම ග්‍රන්ථ කර්තෘන්ගේ මුඛ්‍යාධ්‍යාශය වූ හෙයින් මෙයට සමන්තකූට වණ්ණනා යන නාමය අන්වර්ථ ය.

ii. නිමිත්ත. ආරණ්‍යවාසී රාහුල නම් ස්ථවිර කෙනෙකුන් විසින් සමාරාධිත ව ග්‍රන්ථ කර්තෘන් විසින් මෙය රචිත හෙයින් බාහිර නිමිත්ත වනුයේ එම රාහුල ස්ථවිර තෙමේ යි. කියන ලද මැයි; සමන්තකූට වණ්ණනා නිගමනයෙහි :-

"යො යාචිතො'රඤ්ඤවාසී-ගුණාධාර සුධීමතා,
රාහුලත්ථෙර නාමෙන-විස්සුතෙන මහීතලෙ.="

(යමෙක් තෙමේ වනවාසී වූ යහපත් ගුණයන්ට ආධාර වූ සුන්දර ප්‍රඥාතිශය ඇති මිහිතලෙහි ප්‍රසිද්ධ වූ රාහුල ස්ථවිරයන් විසින් ආරාධනය කරණ ලද්දේ ද) යනු යි.

"සම්බුද්ධ චරිතය ඇතුළු ආගමික පක්ෂයෙහි වූ කරුණු රාශියක් රස බසින් වර්ණනා කිරීමෙන් පාලිභාෂාභිලාෂී ආධුනිකයන්ට හා බෞද්ධයන්ට ද මහත් සෙතක් සලසන්නේම යි" යන ග්‍රන්ථ කර්තෘන් තුළ පැවති සම්‍යක් කල්පනාව අභ්‍යන්තර නිමිත්ත වශයෙන් සැලකිය යුතුයි.

iii. කර්තෘ: මේ ග්‍රන්ථයෙහි කර්තෘවරයා වනාහි නානා භාෂා ශාස්ත්‍ර ප්‍රවීණ කවිකුල තිලකායමාන වූ බ්‍රාහ්මණ වංශොද්භූත ශ්‍රීමද් වෙදෙහ මහා ස්වාමිපාදයන් වහන්සේ ය. මූන්වහන්සේ ආරණ්‍ය වාසී ආනන්ද වනරතනාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකි. එහෙයින් කියනලදි:-

"භුවනෝදරමහි පඤ්ඤාතො-රවිචම්බර මණ්ඩලෙ
අරඤ්ඤරතනානන්ද-මහාථෙරො මහාගණී.
ජීවිතං විය යො සද්ධු-සාසනස්ස මහාකවී
සාරෙං සුපටිපත්තීසු-සද්ධසාගරපාරගො.
තස්ස සිස්සො හි යො විප්ප-ගාම වංසෙකකෙතුකො
ඥනාගාමො රඤ්ඤවාසී-සීලාදිගුණභූසනො."

(මහත් ගණයා ඇත්තා වූ යම් වනරතන ආනන්දාභිධාන මහාස්ථවිරයන් වහන්සේ කෙනෙක් අහසෙහි හිරු මෙන් ලොව ප්‍රසිද්ධ ද, ශාස්ත්‍ර ශාසනයාගේ ජීවිතෙන්ද්‍රිය බඳු ද, මහා පණ්ඩිත ද, මනා පිළිවෙත්හි සාර ද, ශාස්ත්‍රාර්ණවයාගේ පාරප්‍රාප්ත ද– උන් වහන්සේගේ ශිෂ්‍යවූ බ්‍රාහ්මණ වංශයට අසහාය ධ්වජයක් බඳු වූ දන්නාලද ආගම ශාස්ත්‍ර ඇති වන වාසී වූ සීලාදි සද්ගුණය ම ආභරණ කොට ඇති යමෙක් වී ද.)

ආනන්ද වනරතනාභිධාන මහාස්ථවිර පාදයන් වහන්සේ තත්කාලීන සඞ්ඝ සමාජයෙහි ප්‍රමුඛ ස්ථානයක් දැරූ ශ්‍රේෂ්ඨ පණ්ඩිතයකු බැව් පූර්වෝක්ත ගාථාවලින් හැඟේ. මුන් වහන් සේගෙන් ධර්ම ශාස්ත්‍රය උගත් ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් වූහ. ඔවුනතුරෙන් "පද්‍යමධු" නම් ප්‍රශස්ත මාගධී පද්‍ය කාව්‍යය හා "මහාරූපසිද්ධි" නම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථය රචනා කළ බුද්ධප්පිය මහා ස්වාමීන්ද්‍රයන් ද "සම්බන්ධ චින්තා සන්නය" කර්තෘ වූ ගොතම ස්වාමීපාදයන් ද උන්වහන්සේ ගේ ශිෂ්‍යයන් බැව් ඒ ඒ ග්‍රන්ථාවසානයන්හි දක්වනලදී. මෙසේ වෛදෙහ–බුද්ධප්පිය–ගොතම යන මුන්වහන්සේලා අභිධම්මමූලටීකා කර්තෘ වූ වනරතන ආනන්දාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ශිෂ්‍යයන් බවත්, සමකාලීන පණ්ඩිතවරයන් බවත් කිව යුතුය. ගුරුතැන් පත් වූ ආනන්ද වනරතන මහාස්ථවිරයන් වහන්සේ මෙන් ම සමන්තකූටවර්ණනා කර්තෘ වූ වෛදෙහ මහා ස්වාමීන්ද්‍රයන් වහන් සේ ද සිංහල–පාලි–සංස්කෘතාදී භාෂාන්තරයන්හි ගම්භීර ඥානය කින් යුක්ත ව වැජඹුනු උතුමෙකු බවට උන්වහන්සේගේ කෘතිහු ම සාක්ෂ්‍ය දරත්. මුන්වහන්සේ ලක්දිව ශාස්ත්‍රාගමාභිවෘද්ධිය සිද්ධ කරණු සඳහා විදේශයකින් පැමිණි උතුමෙකු බැව් ග්‍රන්ථ නිගමන යෙහි ප්‍රකාශිත කරුණුවලින් ස්ඵුට වේ.
ඊට හේතුව නම්:–

ලංකාවේ සියලුම සතුරු උවදුරු මුලිනුපුටා ලක් රජය එකසේසත් කොට දෙශාන්තරයන්හි පවා ස්වකීය කීර්තිය පැතිර වූ පෙර කිසි කලෙක නොවූ විරූ උසස් ම දියුණුවක් ඇති කොට සිංහල අධිරාජ්‍යයක් ගොඩනැංවූ පළමුවන පරාක්‍රමබාහු මහ රජතුමාගෙන් පසුව ලක් රජය ක්‍රමයෙන් පිරිහෙන්නට පටන් ගත්තේය. විදෙශයන්ගෙන් පැමිණි සතුරු රජවරුන්ගේ දරුණු ක්‍රියාවලින් ශාසනය හා ජාතිය ද භාෂාශාස්ත්‍ර ද විනාශයට පත්වූහ.



කාලිඞ්ග විජයබාහු නමින් එක් විසිවසක් පමණ ලක් රජය කළ මාඝ රජු විසින් ශාසනය හා භාෂා ශාස්ත්‍රයන් ද කෙතරම් දරුණු ලෙස විනාශ කරණ ලදද යත හොත්, ඔජස් උරා රකුසන් සෙයින් අතිශය නින්දිතලෙස සියල්ලම විනාශ කරණ ලදැයි මහාවංශයෙහි සඳහන් වේ. මේ රජුගේ කාලයේ ඇති වූ ශාස්ත්‍ර පරිහානිය යළිදු ප්‍රකෘතාවස්ථාවට පමුණුවා ක්‍රියා කිරීමට දඹදෙණියේ රජකළ තුන්වන විජයබාහු රජතුමා විසින් මහත් පරිශ්‍රමයක් දරණලදී. එහෙත් අභාග්‍යයකට මෙන් රජ පැමිණ ස්වල්ප කාලයකින් ම එතුමා පරලොකප්‍රාප්ත වූයෙන් බලාපොරොත්තු වූ පරිදි ක්‍රියා කිරීමට අවස්ථාවක් නො ලැබීන. එහෙත් එතුමාගේ පුත්‍ර වූ ද්විතීය පරාක්‍රමබාහු රජතුමා ද්‍රවිඩයන්ගේ ක්‍රෑර හස්තයෙන් විනාශ වූ ආගම හා ජාතිය ද භාෂා ශාස්ත්‍ර ද දියුණු කිරීමට වහ වහා ක්‍රියාරම්භ කෙළේය. එතුමා බලාපොරොත්තු වූ භාෂා ශාස්ත්‍රාභිවෘද්ධියට බලවත් බාධාවක්ව පැවැත්තේ භාෂාන්තර ප්‍රවීණ පඬිවරුන් එවකට ලංකාවේ නොමැතිවීම ය. මේ බැව් සැලකූ පැරකුම්බා රජතුමා විදෙශයන් කරා දූතයන් යවා ශාස්ත්‍රාගමයන්හි බුද්ධිමත් මහා පඬිවරුන් බොහෝ දෙනෙකුන් මෙහි ගෙන්වා මහත් සත්කාර කොට මාඝයාගෙන් විනාශ වූ ශාස්ත්‍රීය කටයුතු දියුණු කරලීමට කටයුතු සැලැස්වීය. තඹරට ආදී විදෙශයන්ගෙන් මෙහි වැඩම වූ ධර්මකීර්ති මහා ස්ථවිරයන් වහන්සේ ආදී පඬිවරු මෙහි ශාසනයේ හා භාෂාවේ දියුණුවට අධික පරිශ්‍රමයෙන් ක්‍රියා කළහ. වෛදෙහ මහා ස්ථවිරයන් වහන්සේ ද ද්විතීය පරාක්‍රමබාහු රජතුමාගේ ශාසනික ක්‍රියාවන්ට උපකාරී වීම සඳහා විදෙශයකින් පැමිණි උතුමකු විය යුතුයි. මේ කාලය නොයෙක් විදෙශවලින් පැමිණි පඬිවරුන්ගෙන් හා ස්වදේශීය ප්‍රව්‍රජිත පඬිවරයන් ගෙන් ද බැබලීන. එසේම උන්වහන්සේලා විසින් ලියකළ ද ග්‍රන්ථයන්ගේ සඞ්ඛ්‍යාව ද විශාලය. එහෙයින් කීහ:–

* "එසේම එකශ්‍රැතීන් නෙකාසඞ්ඛ්‍ය ග්‍රන්ථ ධාරණයට සමර්ථ වූ වජ්‍රඥාන ඇති ශාරිපුත්‍ර මහාස්ථවිරයන් වහන්සේගේ පවත් සඞ්ඝරක්ඛිත සුමඞ්ගල වාගීශ්වර ධම්මකිත්තිය නාගසේන ආනන්ද වෛදේහ බුද්ධප්පිය අනවමදර්ශී යනාදී මහාස්ථවිර වරයෝ නොයෙක් ටීකාර්ථ කථා හා තන් ප්‍රවෙශොපායවූ අනෙකප්‍රකාර ධර්ම ප්‍රබන්ධ හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍යාප්ති ශාසනය බැබලවූහ." යනු යි.

* පණ්ඩිත වේරගොඩ අමරමෝලි ස්වාමීන් වහන්සේගේ ශුද්ධියෙන් පළවූ පරිශිෂ්ට සංග්‍රහය සහිත නිකාය සංග්‍රහයෙහි 27 වෙනි පිට බලනු.

මෙතුමාගේ කාලය ශාස්ත්‍ර දියුණුව පිළිබඳ ස්වර්ණමය යුගය යි කිව යුතුයි. එයට ප්‍රධාන හේතුව නම් රජතුමා නොයෙක් භාෂාන්තරයන්හි දක්ෂ වූ සමය සමයාන්තරයන්හි විශාරද මහා පඬිවරයෙක් වීම ය. "කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" යන උපාධි නාමයෙන් පමණක් නොව රචනා කරණ ලද විනයවිනිශ්චය සන්නය-විශුද්ධිමාර්ග සන්නය-කව්සිළුමිණ යන කෘතීන් ගෙන් ද රජතුමාගේ පාණ්ඩිත්‍යය යස රඟට පැහැදිලි වේ.

ද්විතීය පරාක්‍රමබාහු රජතුමා රාජ්‍යශ්‍රීයට පත් වූයේ මෙයින් අවුරුදු 670 කින් පූර්වයෙහි නොහොත් බු:ව: 1791 දී ය. පරලෝක ප්‍රාප්තිය වූයේ බු:ව: 1826 යේ දී ය. වේදෙහ ස්වාමිපාදයන් වහන්සේ විසින් සමන්තකූට වර්ණනාව රචනා කරණ ලද්දේ ද මේ රජතුමාගේ රාජ්‍ය කාලය වූ මෙයින් යට 670 පටන් 635 දක්වා අතර කාලයකය යි කිව යුතුය.

**වෙනත් කෘතීහු.**

සිංහල ශබ්ද ලක්ෂණය හා රසවාහිනිය ද මුන්වහන්සේ කළ අන්‍ය ග්‍රන්ථයෝ වෙත්. සිංහල ශබ්ද ලක්ෂණය නම් සිදත් සඟරාව යයි ඇතැම් කෙනෙක් කියති. එහෙත් සිදත් සඟරාව රචනා කරණ ලද්දේ ප්‍රතිරාජ පරිවෙණාධිපතීන් වහන්සේ විසිනි. වේදෙහ ස්වාමීන් වහන්සේ ප්‍රතිරාජ පරිවෙණාධිපතිත්වයක් නො දැරූ හෙයින් උන්වහන්සේ කළ ශබ්ද ලක්ෂණය සිදත් සඟරාව යයි කීම ප්‍රතිඥා රහිතය. නිසැකයෙන්ම සිංහල ව්‍යාකරණය කැයි කිය යුතු මේ ග්‍රන්ථය නෂ්ට ප්‍රාය නොවී නම් සිංහලයන්ගේ මහත් ප්‍රසාදයට භාජන වනු නිසැකය. වෙදෙහ ස්වාමි පාදයන්ගේ ප්‍රථම කෘතිය ද මේ සිංහල ශබ්ද ලක්ෂණ යයි. සමන්තකූට වර්ණනාව රචිත කාලයේදී සිංහල ශබ්ද ලක්ෂණය පමණක් ලියා තිබීම ඊට සාධක ය. සමන්තකූට වර්ණනා නිගමනයෙහි:-

"යො කා සීහල භාසාය-සීහලං සද්ද ලක්ඛණං
තෙන වෙදෙහ ථෙරෙන-කතායං පිය සීලිනා."

(යමෙක් සිංහල භාෂාවෙන් සිංහල ශබ්ද ලක්ෂණය කෙළේ ද ඒ වෙදෙහ ස්ථවිරයන් වහන්සේ විසින් මේ සමන්තකූට වර්ණනාව කරණලදි.) යනුවෙන් එය කියනලදී. මුන්වහන්සේගේ තුන්වැනි කෘතිය රසවාහිනිය යි. ඒ වනාහි අනුරාධපුර මහා විහාරායතන ගුප්තවඞ්ක පරිවෙණාධීශ්වරවූ රට්ඨපාල මහා ස්වාමිඳුයන් සිංහල භාෂාවෙන් පැවති කථා වස්තූන් සංකලණය කොට පාලි භාෂාවෙන් ලියූ ග්‍රන්ථය පරිශොධනය කිරීමෙන් රචනා කරණලද පුස්තකය යි. මෙය පසුකාලෙක තෘතීය ධර්මකීර්ති සඞ්ඝරාජයන් වහන්සේ විසින් සිංහල භාෂාවට පරිවර්තනය කරණ ලදුව සද්ධර්මාලඞ්කාර නාමයෙන් අදත් බෞද්ධයන්ගේ ගෞරවයට පාත්‍ර වෙමින් පවතී.



iv. **ප්‍රමාණය.** මෙහි ගාථා වශයෙන් තත්‍ය සංදර්ශිත ගාථා ගණිතය හැර ෂණ්ණවත්‍යධික සප්ත ශත (796) ගාථා කෙනෙක් වෙති. ප්‍රථම මාර විජය කථා-ද්විතීය මාර විජය කථා ආදි වශයෙන් කොටස් දෙවිස්සකින් ප්‍රතිමණ්ඩිත ය.

**ග්‍රන්ථ කන්ධය:**

සමන්තකූට වර්ණනාව රචනා කරණ ලද්දේ තථාගතයන් වහන්සේගේ සිරිපා සටහණ සමනොළ කන්දේ පිහිටුවීමේ ප්‍රවෘත්තිය හා සමන්තකූටපර්වත වර්ණනයත් කරණු සඳහා ය ප්‍රමුඛ කාරණය මෙය වුවත් ප්‍රාසඞ්ගික වශයෙන් තථාගතාපදානය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් ද ඇතුළු ලංකාවේ ඓතිහාසික ප්‍රවෘත්තීත් ද අතිශය චමත්කාරලෙස මෙහි වර්ණනාකළහ. අතිශය මධුර පද ලාලිත්‍යයෙන් යුක්ත පද්‍යයන් ගෙන් රචිතවූ මේ ග්‍රන්ථය ශ්‍රොතෘන්ගේ මනඃ ප්‍රීණනය පිණිස පවත්නා බව කිව යුතුය. දළදාවංසය-ජිනචරිතය-ආදී උසස් පාලි පද්‍ය ග්‍රන්ථයන් අතර ද අග්‍රගණ්‍ය වූ මේ සමන්තකූට වර්ණනාව ප්‍රාක්තන සූරිවරයන්ගේ ගෞරවාදරයට භාජනව සතතයෙන් පඨන පාඨනවශයෙන් පරිශීලිත ද වූවාය. සංස්කෘත භාෂාවේ මුහුණුවරට අනුගතවූ පාලිභාෂාවෙන් මේ ග්‍රන්ථය විරචිතසේ පෙනේ. ප්‍රකරණ පාලි ග්‍රන්ථයන් පිළිබඳ දක්නා ලැබෙන මේ ස්වභාවය මෙයට පමණක් සීමා වූවක් නොවේ. පාලි භාෂාවෙහි ශෘඞ්ගාරාදි රස පරිපොෂිත ගද්‍ය පද්‍ය ග්‍රන්ථයන් දුර්ලභ හේතුවෙන් රසවත් පාලි කාව්‍ය ග්‍රන්ථයෝ දුර්ලභය. රසයෙන් පරිපොෂිතවූ ශ්‍රොතෘන්ගේ චිත්තානන්ද කර වූ පාලි කාව්‍ය රචනයට සංස්කෘත කවීන් අනුගමනය කටයුතු ම ය. බොහෝ සිංහල පඬිවරුන් මෙන් ම පාලි පඬිවරුන් ද මෙය බහුල වශයෙන්ම අනුගමනය කර තිබීම එයට සාධකය. පුර වර්ණනා-වන වර්ණනා ආදියෙන් සමුපලක්ෂිත මේ සමන්තකූට වර්ණනාව ප්‍රසාද මාධුර්‍යාදි ගුණයන්ගෙන් පරිපොෂිත පද්‍යවලින්ගෙන් ද ගහණ වූ මධුර මනෝහර රචනාවකි.

v. **ප්‍රයෝජන.**

මේ ග්‍රන්ථය උද්ග්‍රහණ ධාරණාදි වශයෙන් පරිශීලනය කරණ කොට ගෙණ ආධුනික ජනතාවට පාලි භාෂා විෂයෙහි ප්‍රවීණත්වයක් ඇතිවීමද, තථාගතාපදානාදි සාමයික ඓතිහාසික තොරතුරු රාශියක් දැනගැණීමෙන් ඇතිවන විපුලඵලයද මෙහි මුඛ්‍ය ප්‍රයෝජනය වශයෙන් සැලකිය යුතුයි.

**"අස්මදීය ව්‍යාඛ්‍යානය."**

සමන්තකූට වර්ණනාවට පෞරාණික ආචාර්‍යවරයකු විසින් ලියූ සන්නයක් ද ඇත්තේ ය. එහෙත් සාගීසථ වී මදළු විද්‍යෝදය මහා විද්‍යාලයාධීශ්වර අතිගරු මහගොඩ ශ්‍රී ඥානෙශ්වරාභිධාන නායක මාහිමියන් වහන්සේ හා ආචාර්‍ය වලානේ ධම්මානන්ද

ධාන නායක මාහිමියානන් වහන්සේ විසින් ලියූ සන්නය විද්‍යෝ-යන්ගේ ගෞරවයට භාජන වූවා පමණක් නොව අධුනිකජනතාව-ගේ අභිමතාර්ථ සිද්ධියටත් උපකාරීවූ බැව් ගෞරවයෙන් සඳහන් කරමහ. එහෙත් අධුනිකයන් විසින් මහත් අභිලාෂයකින් පරිශීලනය කරණ මේ ග්‍රන්ථයට සුදුසු සවිස්තර ව්‍යාඛ්‍යානයක් නොමැතිවීම බලවත් පාඩුවක් විය. මේ බැව් සැලකූ ගාල්ලේ විද්‍යාලොක පිරිවෙන්හි බෞද්ධ ශාස්ත්‍රාදිග්‍රහණයෙහි නියුක්ත අපි අන්වය-පදාර්ථ-භාවාර්ථ-පරිකථා ආදියෙන් යුක්තවූ මේ පද්‍යාවබෝධිනී නම් විස්තර ව්‍යාඛ්‍යානය ලියන්නට කල්පනා කෙළෙමු. එහෙත් අධුනිකයකු වූ අපට මේ ග්‍රන්ථය ඉතා යුහු සුලුව ලියා මුද්‍රණය කරවන්නට සිදුවූ හෙයින් මෙහි සාවද්‍ය ස්ථාන ඇති විය හැක. එබඳු තැන්හිදී අපගේ ප්‍රයාසයෙහි සන්තුෂ්ටිය භජනය කරණ සුධීවරයන් අප කෙරෙහි කෘපාපරවශ විය යුතු බැව් ගෞරවයෙන් සඳහන් කරමු. මේ ග්‍රන්ථය රචනා කිරීමේදී සියලු උපදෙස් දීමෙන් හා පිළිගෙණ වදාරා ග්‍රන්ථගෞරවය රැක දීමෙන් ද අපට අනුග්‍රහ කළ අපගේ ආචාර්ය්‍ය වූ ගාල්ලේ විද්‍යාලොක පරිවෙණාධීශ්වර වාචිස්සරාචාර්ය්‍ය රාජකීය පූජ්‍ය පණ්ඩිත අති ගරු වැලිවිටියේ ශ්‍රී සුමඞ්ගලාභිධාන දකුණු පලාතේ ප්‍රධාන අධිකරණ නායක මාහිමියන් වහන්සේට ද, මාගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය්‍ය වේරගොඩ පුෂ්පමණ්ඩාරාමය, ඥානම්පට ශ්‍රී ප්‍රියදර්ශිනාරාමය යන උභය විහාරාධිපති ගෞරවාර්හ පූජ්‍යාචාර්ය්‍ය අම්බලන්ගොඩ ශ්‍රී පියදස්සාභිධාන මහා ස්ථවිර පාදයන් වහන්සේට ද, මේ ග්‍රන්ථය මුද්‍රණය කරවීමට ආධාරොපකාරීවූ ශෝ. ඇල්. ජී. චාර්ලිස් අප්පුහාමි වෙල් විදානේ මහත්මයා ඇතුළු දායක මහතුන්ටද සෙයි මොක්ෂ ප්‍රතිලාභය වේවා.

මේ ග්‍රන්ථය ඉතා ඉක්මනටත් ශොභන ලෙසටත් මුද්‍රණය කරදුන් වජ්‍රසෙන මුද්‍රණාලයෙහි ප්‍රධාන කාර්ය්‍ය සම්පාදක වීරප්පෙරුම අප්පුහාමි ඇතුළු කාර්ය්‍ය මණ්ඩලය ද අපගේ ප්‍රශංසාවට හිමි වේවා.

මිට ශාස්ත්‍රාභිවෘද්ධිකාමී,

රැකඩෙන්නේ වජිරජෝති.

2485 / 1941 .6.1 වැනි දින

විද්‍යාලොක පිරිවෙණේ දී ය.

---

සැලකිය යුතු යි.

සම්පූර්ණ සමන්තකූට වර්ණනාවට ලියූ පරිකථා සහිත සවිස්තර ව්‍යාඛ්‍යානය ලබාදීම අධුනිකයන් අතට පැමිණවීමට කටයුතු කර ගෙණ යන හෙයින් ප්‍රතිපත්‍ර-උපග්‍රන්ථ-විෂය සූචි ආදිය ප්‍රථම භාගයට නොයෙදූ බැව් සඳහන් කරමි.

පරිහරණය සෙනසුන තුළ පමණයි

# සමන්තකූට වණ්ණනා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1 සතතවිතතකිත්තිං ධස්තභඞ්ගප්පදප්පං
තිභවහිතවිධානං සබ්බලොකෙකකෙතුං,
අමිතමතිමහග්ඝං සත්තිදං මෙරුසාරං
සුගතමකමුදුරං රූපසාරං නමාමි.

2 හතදුරිතකුසාරං මොහපඞ්කාපතාපං
මහතමලවිකාසං ජන්තුනං සෙසකානං,
කුමතිකුමුදකාසං බුද්ධපුබ්බාචලග්ග
උදිතමහමුදුරං ධම්මභානුං නමාමි.

3 සකලවිමලසීලං ධූතපාපාරිජාලං
සුරනරමහනීයං පාහුනෙය්‍යාහුනෙය්‍යං,
උජුපථපටිපන්නං පුඤ්ඤඛෙත්තං ජනානං
ගණමහමභිවන්දෙ සාරදං සාදරෙන.

4 ඉති කලිතපණාමො හන්ත්වා සබ්බාපසග්ගෙ
සුයතවිමලපාදම්භොජසම්පාත පූතං,
සුමනසිඛරිරාජං වණ්ණයිස්සං සුරන්තං
වසතිමතුලමෙත්තං සාධු ජන්තූ සුණන්තු.

5 සවණා ලපනා චෙව – සතියා වාපි වන්දනා,
යස්ස සම්මා සිද්ධිහොන්ති – නිබ්බාණසුඛවාධිගච්ඡති.

6 තස්මා සප්පුරිසො හේ'දං – පතෙවිතොනහි නියමපදං,
සවණීයං හි සාධූහි – අවික්ඛිත්තෙන චෙතසා.

7 යො ලොකාධිපතො නාථො – පූරෙත්වා දසපාරමී,
ජාතොසි තුසිතෙ කායෙ – සන්තුසිතො'ති විස්සුතො.

8 ආරද්ධිතො සුරාදීහි – කාලො මාරිස තෙ අයං,
තිණ්ණො තාරයිමං ලොකං – බහු අප්පරජක්ඛකා

9 එතදත්ථාය තෙ වීර - පූරිතා දස පාරමී,
බාහුං පියුස්ස පුඤ්ඤතා'ව - ලොකො ආලම්බතෙ තුවං.

10 තෙසං තං වචනං සුත්වා - මහාසත්තා මහාමතී,
විලොකනෙ විලොකෙත්වා - සබ්බාමලවිලොචනො.

11 ජම්බුදීපඞ්ගනතලෙ - තණ්ණීතා'ව මනොරමං,
පුරිං කපිලවත්ථු'සි - විසාණි'ව සුබාසිතං.

12 සිඛීනිකතම්ඝාභාස - තුඞ්ගසිඛරසම්බඩ්ගිතා,
මණිසිඞ්ගපජ්ජරකිණ්ණ - පාසාද සත්තභාසරෙ.

13 සඞ්ඛෙත ගහනෙ නිච්චං - යතෙරතසතානි ච,
අනිලෙරිතපජ්ජොත - සොණ්ණෙකතු අහු යහිං.

14 ජනානං නිලකෙතනානි - වදනෙහි තු යා පුරී,
මධුපාලිසමොසධි - කාසජ්නිසිරිමාවහෙ.

15 රඹගතුඹගතුරමෙඛනි - ගජ්ජෙතෙහි ච යා පුරී,
සඞ්කොසුනතුඹගකාලොලාල - ලොලසාගරසන්නිභා.

16 අවහම්මානා'ව දෙවානං - පුරලඞ්කාභුජාරිව,
මඤ්ජුනිලෙරිතා තුඞ්ග - නානාරාගධජා යහිං.

17 නානාවෙසධරා යස්මිං - නානාභූසණභූසිතා,
නානාසම්පත්තිසංයුතා - නානාවිජ්ජාසු පාරගා.

18 නවයොබ්බන උත්තමා - රූපෙන ච මනොහරා,
සබ්බසු නීරතා නිච්චං - අනන්තතුට්ඨකුලා සියුං.

19 නිච්චං කිළාවිදඩ්ඪාහි - නරනාරීහි සෙවිතා,
යා පුරී සාධු රූපා'සි - මධුරාලාපිනීහි ච.

20 තස්මිං සද්ධාදයොපෙතො - ඉක්ඛාකුකුලකෙතුකො,
සුද්ධොදනව්හයො ආසි - විස්සුතො භුවනන්තයෙ.

21 යස්සාසිතමලෙ සබ්බ - භූභුජානං මහීතලෙ,
කිරීටමණිනිඝාලි - කීළන්තී'ව නිරන්තරං.

22 යස්ස පත්ථවතෙජෙන - පුරතොනාම්පි දීපාතරෙ,
මහතීව'ම්බරෙ ලීලං - ඔසධීපතිනො දිවා.



23 යස්ස දානප්පවාහො තු - නානායාචකජන්තුනං,
මනොදධීසු වෙලන්තො - නික්ඛමන්තො'ව සන්තතං.

24 මහියා සුරම්භන්තීව - ධනෙන ධනදෙ විය,
රූපෙන කුසුමෙසූ'ව - යො ජම්භති මහීතලෙ.

25 තස්සාභිසිත්තා රජ්ජෙන - මහාමායා'ති විස්සුතා,
චන්දිකා විය චන්දස්ස - ගිරිජා'ව කපාලිනො.

26 ලක්ඛී'ව වාසුදෙවස්ස - සීතා'ව රාමරාජිනො,
මහෙසී'සි වරාරොහා - සුන්දරී සුන්දරාධරා.

27 තස්සා කුච්ඡිකරණ්ඩම්හි - අනග්ඝරතනං විය,
බත්තිංසානි නිමිත්තානි - විම්හාපෙන්තො සදෙවකං.

28 සිතම්බුජකරෙ සන්තො - සීතෙහඩ්ඩාසනො විය,
කත්වා පදක්ඛිණං මාතු - පටිසන්ධිමගණ්හි සො.

29 දසෙකාදසමාසෙන - තස්සාච්චං ආසි චෙතනා,
පස්සිතුං ඤාතිකඤ්ඤිනං - ගන්ත්වාන සඟරං තදා.

30 නිවෙදෙත්වා තමත්ථං සා - රඤ්ඤො තෙන සුසජ්ජිතෙ,
සපරිච්ඡද තදා මග්ගෙ - ගච්ඡන්තී අන්තරාපථෙ.

31 දෙවතානං මනොනන්ද - කරනන්දන සන්නිභං,
දිස්වාන ලුම්බිනිං නාම - උය්‍යානං මනනන්දනං.

32 තස්මිං කිළිතුමුස්සාහා - පවිසිත්වාන තං වනං,
කීළන්තී උපගන්ත්වාන - මඞ්ගලං සාලපාදපං

33 විලොලපල්ලවාකිණ්ණං - පුප්ඵුල්ලකුසුමොත්තතං,
ගහෙත්වා සාලසාඛං සා - සුරත්තකරපල්ලවා.

34 දෙවෙහි ගහිතා රත්තා - මහම්මාතෙ සදෙවකෙ,
ජනෙසි තනයං මායා - තුට්ඨා ලොකලොචනං.

35 බ්‍රහ්මාණො ලොකපාලා ච - මනුස්සා තමතො තදා,
සොණ්ණජාලාජිනාදීහි - ගණ්හිංසු ජනනන්දනං.

36 මහිං පතිට්ඨිතො ධීරො - පස්සිත්වාන දස දිසා,
උත්තරාභිමුඛො සත්ත - පදං ගන්ත්වාම්බුජේ ඨිතො.

37 දිසා සමන්තමවලොකෙත්වා - සුඵුල්ලම්බුජලොචනො,
නිච්ඡාරෙසාසභිං වාචං - අග්ගො සෙට්ඨො'ති ආදිකං.

38 බ්‍රහ්මා'මරනරාදීහි - පූජිතො ච නමස්සිතො,
කමෙන අභිවඩ්ඪෙන්තො - පුණ්ණපක්ඛෙ සසී යථා.

39 බ්‍රහ්මූනං ජනතජ්ඣායං - මනූරකුපුම්භනරෙ,
සාතකුම්භදදෙවෙහි - ධූතචාමරමජ්ඣගො.

40 දිබ්බෙහි රූපසද්දෙහි - ගන්ධෙහි ච රසෙහි ච,
ඵොට්ඨබ්බෙහි ච දිබ්බෙහි - මොදමානො අනෙකධා.

41 දිබ්බෙහි රමණීයෙහි - නච්චෙහි වාදිතෙහි ච,
පදුනෙකසහස්සෙහි - ධුයමාන ගුණාකරො.

42 පත්වා සොළසමං වස්සං - සුතිසඞ්ඛස්ස ඉජ්ඣගො,
දසසත්වා'සෙස සිප්පං තං - ලොකෙ විජ්ජති යං තදා.

43 සුතිසඞ්ඛං පමොදෙන්තො - දෙවෙ ච මනුජෙ'පි ච,
ලද්ධා යසොධරං දෙවිං - නුකුලං ජාති ජාතියං.

44 සොණ්ණදප්පණ සඞ්කාස - සොමමානනවිභූසිතං,
නීලනීරජසඞ්කාස - විසාලායත ලොචනං.

45 සිඞ්ගාර මන්දිරාකාරෙ - ධජොපමභමුද්වයං,
හෙමකාහලසඞ්කාස - නාසිකං රූපලක්ඛියං.

46 නීලවෙල්ලිතධම්මිල්ල - ජීමූතොභාස කොටියං,
නිච්චවිජ්ජුල්ලතාවභාස - මනුඤ්ඤකණ්ණපාසකං.

47 සාතකුම්භනිභාභාස - පයොධරඝටද්වයං,
සුවණ්ණද්දිතටාකාර - නිජ්ඣරාකාරධාරකං.

48 දෙහදෙවද්දුමාලම්බ - පාරොහාභභුජද්වයං,
අඞ්ගුලිපල්ලවතාතම්බ - බිම්බුචාරුනඛාවලිං.

49 දෙහමාලාලීමාලාභ - රොමරාජිවිරාජිතං,
රූපණ්ණවතරඞ්ගාභ - වලිත්තය විචිත්තකං.

50 සොණ්ණරම්භාසමාවට්ට - පීණොරුද්වය සුන්දරං,
සුනීරකලිකාකාර - චාරුජඞ්ඝා විභූසිතං,



51 පච්චක්ඛරූපලක්ඛිං'ව - ලීලානිච්චය සන්නිභං,
ගුණානමාකරං සාධු - වෙලං'ව රතිසාගරෙ.

52 කන්තා විසන්තරාජා'ව - කන්දප්පො'ව සුරූපවා,
සසී'ව දස්සනීයො ච - සූරියො විය තෙජවා.

53 අචලත්තෙන මෙරු'ව - ගම්භීරෙනණ්ණවො විය,
බ්‍රහ්මස්සරො පියංවාදී - පසාදෙය ච අනූපමො.

54 වසන්තො සො මහාවීරො - පුරස්මිං කපිලව්හයෙ.
දිස්වා නිමිත්තෙ චතුරො - උය්‍යාන ගමනක්ඛණෙ,

55 පබ්බජ්ජාභිරතො නාථො - රන්ත්වා උය්‍යානභූමියං,
ඵුල්ලචම්පකාසොක - නාගාදු'මෙහි මණ්ඩිතං.

56 ඵුල්ලපඞ්කජකල්හාර - ජලාලයසතාකුලං,
මන්දමන්දනිලායාත - නානාමොදෙහි වාසිතං.

57 සරාසරං සමායාත - මධුබ්බතනිසෙවිතං,
ඵලපුප්ඵභරුද්දුම - ද්විජසඞ්ඝනිකූජිතං.

58 නච්චන්තං මත්තමොරානං - නිච්චං මණ්ඩපසන්නිභං,
දිබ්බනං මිගසඞ්ඝානං - කීළාමණ්ඩපසන්නිභං.

59 සමීරසිසිරොදර - ධාරාසීකරවාරිහි,
ධාරාමණ්ඩප සන්නිහි - ජනානන්දකරං වරං.

60 උය්‍යානවනමාගම්ම - දෙවරාජා'ව නන්දනං,
කීළන්තො නිජ පුත්තස්ස - සුත්වාන ජාතසාසනං.

61 නිවත්තො විස්සකම්මෙන - සහස්සනෙත්තො'ව භූසිතො,
පුරං පවිසමානො'ව - කිසාගොතමි භාසිතං.

62 සුත්වාන නිබ්බුතපදං - තද'චිත්තානුකූලකං,
සන්තුට්ඨො සාධුරාගො ච - ලක්ඛග්ඝං හාරභාසුරං.

63 හාරං තිස්සාය පෙසෙත්වා - ගන්ත්වාන සකමන්දිරං,
දෙවරාජ විලාසෙන - නිසීදි පවරාසනෙ.

64 අථා'ගම්ම තදා නෙක - නාටිකා පරිවාරයුං,
වජ්ජන්ති භෙරියො නානා - පගායනු නාචි නාරියො,

65 නානාලය සමාකිණ්ණං - ගීතං ගායන්ති කාචි'පි,
ධමන්ති සුසිරං කාචි - කාචි වාදෙන්ති තන්තියො.

66 චාරු බිම්බාධරා රම්ම - පයොධරභරා සුභා,
විසාලා'යතනීලක්ඛා - සොමසොම්මානනා තදා.

67 නච්චන්ති පුරතො තස්ස - හෙරිමණ්ඩලමජ්ඣගා,
දෙවකඤ්ඤා'ව රඞ්ගම්හි - රඤ්ඤාව නීරන්තරං.

68 දිස්වාන සො තමච්ඡරියං - විරත්තො විසයෙ තදා,
උරගතාලං'ව අද්දක්ඛි - සබ්බන්තං හෙරිකාලතං.

69 පරිදෙවං වූපට්ඨාසි - ගීතං සංසාර සාගරෙ,
වායුවෙගවිකාරං'ව - නච්චං චීතොතසි කායකො.

70 තඤ්'ගං සරමොස්සජ්ජ - පබ්බජ්ජාසිරිමුබ්බහෙ,
ඉච්චෙවං චින්තයන්තො සො - සුපන්තො'ව සයී තහිං.

71 යං නිස්සාය මයං එත්ථ - නච්චගීතෙසු ව්‍යාවටා,
සො'යං'දානි සුපි අම්හෙ - කස්ස'දානි කරොම තං?

72 ඉති චින්තිය තෙ තත්ථ - තූරියෙ තූ සකෙ සකෙ,
ආලම්බ සයිතා කඤ්ඤා - සුසඤ්ඤඤ්ඤාදමිනිස්සිතා.

73 බාදන්ති කාචි දන්තානි - කාචි ලාලා වහන්තියො,
කාචි රුදන්තියො තත්ථ - විලපන්ති අථාපරා.

74 කාකච්ඡන්ති'පි සෙමහම්පි - ගිලන්ති ච වමන්ති ච,
කරොන්ති නාදං නාසාය - සරූකී ච බිපන්ති ච.

75 මුත්තායන්ති තදා කාචි - රහස්සං විවරන්ති ච,
දුග්ගන්ධං වාති තං ඨානං - සුසානං ආමකං යථා.

76 පබුද්ධො අඩ්ඪරත්තම්හි - ගතො තත්ථ නිසීදිය,
අද්දක්ඛි තාසං තෙකාති - විකාරානි තහිං තදා.

77 තස්සෙ'වං පෙක්ඛමානස්ස - භවෙ සංවිග්ගචෙතසො,
ආදිත්තං'ව උපට්ඨාසි - මතෙ බලු භවත්තයං.

78 දුවාතලසමාදීත්ත - මහාරඤ්ඤ යථා ගජො,
තතො'වා'සි නරින්දස්ස - ගෙහතො ගන්තෙ මතී.



79 තතො වුට්ඨාය සයනා - කරොන්තො අභිනික්ඛමං,
චිත්තෙකාසි මහාරාජා - පස්සිතුං සකමත්‍රජං.

80 පවිසිත්වා තතො ගබ්භං - සනිකං සන්තමානසො,
පස්සිත්වා සහ පුත්තෙන - නිද්දායන්තිං යසොධරං.

81 විරාගතං මහාපෙමං - ධාරයං සකමානසෙ,
බුද්ධො හුත්වා'පි'මං සක්කා - පස්සිතුං ඉති චින්තිය.

82 ගතො නාථො තතො ඨානා - බොධියා බද්ධමානසො,
තදහෙවා'සි බුද්ධො'ති - කාමුකො තො න චින්තයෙ.

83 සිනෙරුමුද්ධරන්තො'ව - පාදුද්ධරිය නික්ඛමං,
ඡන්නමාහුය ආනීතං - කණ්ඩකං තුරගාධිපං.

84 අස්සරාජං සමාරූය්හ - සහ ඡන්නෙන රත්තියං,
දෙවෙහි විවටද්වාරා - පටිපජ්ජි මහාපථං.

85 චක්කවාලෙසු සෙසෙසු - දෙවතා සුසමාගතා,
දීපධූපධජෙහෙව - ගන්ධමාලෙහි පූජයුං.

86 පුරතො සට්ඨිසහස්සානි - දණ්ඩදීපානි ධාරයුං,
තථා දක්ඛිණපස්සම්හි - වාමපස්සෙ ච පච්ඡතො.

87 ගගනා පුප්ඵවස්සානි - වස්සාපෙසුං ච දෙවතා,
මන්දාරං ච කොකාසදං - සුගන්ධං චිත්තපාටලිං.

88 චම්පකාසොකපුන්නාග - නාගපූගාගසම්භවං,
මාලතී වස්සිකියාදී - නානා වල්ලීහි සම්භවං.

89 පදුමුප්පල කල්හාර - කුමුදාදම්බු සම්භවං,
සුගන්ධමබු මතනාහි - ජප්පදල්ලිහි භූජිතං.

90 පුප්ඵවස්සං පවස්සිත්ථ - තිංසයොජනමිස්සජ්ජෙ,
පයාතො තත්ථ තුරගො - දුක්ඛතො අගමි තදා.

91 එවං පූජාවිධානෙහි - ගන්ත්වා'නොමං මහානදිං,
සිතසෙතනසඞ්කිණ්ණං - බහුමීන කුලාකුලං.

92 තීරට්ඨො පස්සි සො ධීරො - ගම්භාහාරිං රසාවහං,
කරොන්තිං විවිධාකාති - ඵෙණ පුප්ඵොපහාරකං.

93 අස්සෙන තං මහා'නොමං - ලඞ්ඝාපෙත්වා මහාමතී,
පරතීරෙ පතිට්ඨාසි - විමලෙ වාලුකාතලෙ.

94 පබ්බජිතුං මයෙත්ථෙ'ව - යුත්තං නො මෙ පපඤ්චිතුං,
ඉති චින්තිය ඔහාය - ධාරිතාභරණානි සො.

95 ඡන්නස්ස පටියාදෙත්වා - කන්ථකඤ්ච හයාධිපං,
නිසිතං ඛග්ගමුග්ගය්හ - සමොලිං ඡින්දි කුන්තලං.

96 එවමාවජ්ජයං නාථො - සචෙහං සුගතො භවෙ,
තිට්ඨතු ගගනෙ ගන්ත්වා - ඉති උක්ඛිපි'ම්බරං.

97 තතො සක්කො මහග්ගෙන - මණිචඞ්ගොටකෙන තං,
පටිග්ගහෙත්වා සිරසා - නෙත්වා දෙවපුරං වරං.

98 කාරෙත්වා මණිථූපං සො - නිධෙත්වා තං සිරොරුහං,
අච්චහං පතිමානෙති - සහ දෙවෙහි නෙකධා.

99 මහාබ්‍රහ්මොපනීතට්ඨ - පරික්ඛාරං මහාමතී,
පටිග්ගහෙත්වා කාසාවං - නිවසෙත්වා පාරුතො තදා.

100 පුබ්බ විය'ම්බරං ගය්හ - අම්බරෙ ඛිපි නායකො,
පටිග්ගහෙත්වා තං බ්‍රහ්මා - නෙත්වා බ්‍රහ්මපුරං වරං.

101 ද්වාදසයොජනුබ්බෙධං - කත්වා ථූපවරං සුභං,
තත්ථ තං නිදහිත්වාන - පණ්ජානෙති සබ්බදා.

102 සම්පුණ්ණ මනසඞ්කප්පො - පබ්බජ්ජාසිරිභූ'බ්බහං,
ඡාදෙන්තො කමලෙනෙ ච - ධරං වික්කමි නායකො.

103 තතො අම්බවනං ගන්ත්වා - වින්දන්තො පීතිජං සුඛං,
වීතිනාමයි සත්තාහං - රම්මෙ පාදපමණ්ඩපෙ.

104 තතො රාජගහං ගන්ත්වා - පාරුපිත්වාන චීවරං,
ගහෙත්වා මණිවණ්ණං සො - පත්තං කරතලම්බුජං.

105 ද්වත්තිංසලක්ඛණූපෙතො - අනුබ්‍යඤ්ජන මණ්ඩිතො,
බ්‍රහ්මුජ්ජුගත්තො භගවා - පුරසෙට්ඨමුපාගමි.

නිමි.

# පද්‍ය'ච බොධිනී

## සමන්තකූට වණ්ණනා ව්‍යාඛ්‍යාව.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

සතත විතත කිත්තිං ධස්තකන්දප්පදප්පං
තිභවහිත විධානං සබ්බ ලොකෙකකෙතුං
අමිතමතිමනග්ඝං සන්තිදං මෙරු සාරං
සුගත මහ මුදාරං රූපසාරං නමාමි.

**අන්වය:-** සතතවිතතකිත්තිං ධස්තකන්දප්පදප්පං තිභව හිතවිධානං සබ්බ ලොකෙකකෙතුං අමිතමතිං අනග්ඝං සන්තිදං මෙරුසාරං රූප සාරං උදාරං සුගතං අහං නමාමි.

**පදාර්ථ:-** සතත, නිරතුරුව; විතත, පැතුරුණු; කිත්තිං, කීර්ති ඇති; ධස්ත, නසනලද; කන්දප්පදප්පං, අනඞ්ගයාගේ අභිමාන ඇති; තිභව, තුන්ලොවට; හිතවිධානං, වැඩ සිදුකරන් නා වූ; සබ්බලොක, මුලුලොවට; එකකෙතුං, අසහාය ධ්වජයක් වැනි වූ; අමිතමතිං, අපමණ නුවණ ඇති; අනග්ඝං, අනගි වූ; සන්තිදං, සාන්ති නම්වූ නිවණ ශෙණ දෙන්නාවූ; මෙරුසාරං, මහමෙරමෙන් සපිරසාරවූ; රූපසාරං, රූපයෙන් සාර වූ; උදාරං, මහත් වූ; සුගතං, සුගතයන් වහන්සේ; අහං, මම; නමාමි, වදිමි;

**භාවය:-** නිතර පැතුරුණු "ඉතිපිසො භගවා අරහං" යනාදි වශයෙන් කියනලද කීර්ති ඇති නැසූ අනඞ්ගයාගේ දර්පය (ආඩම්බරය) ඇති කාම රූප අරූප සඞ්ඛ්‍යාත ලොකත්‍රයට වැඩ සිදුකරන්නාවූ මුලුලොවට අද්විතීය ධ්වජයක් වැනිවූ අපමණ නුවණ ඇති අනගිවූ නිවණ දෙන්නාවූ චතුර්විධ වෛශාරද්‍යඥානාදි ගුණයෙන් මහාමෙරු පර්වතය මෙන් සපිර සාර වූ ද්වාත්‍රිංශත් මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත රූපයෙන් සාර වූ ගුණයෙන් මහත්වූ සර්වඥයන් වහන්සේ මම සකසා වදිමි.

**ක්‍රියා කාරක පද සම්බන්ධ:**

අහං සුගතං නමාමි.

**උක්තානුක්ත:-** නමාමි යන (නමු නමනෙ) ධාතු වර්තමාන විභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්ත ඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් අහං යනු උක්ත කර්තෘයි. සුගතං යනු අනුක්ත කර්මයි.

**විශේෂණ විශේෂ්‍ය:**

සුගතං යනු විශේෂ්‍යයි. සතතවිතතකිත්තිං, ධස්තකන්දප්ප දප්පං, තිභවහිතවිධානං, සබ්බලොකෙකකෙතුං අමිතමතිං, අනඝං, සන්තිදං, මෙරුසාරං, රූපසාරං, උදාරං, යන මොහු තුල්‍යාධිකරණ විශේෂණයෝ යි.

**සමාස:-** සතතවිතතකිත්තිං, ධස්ත කන්දප්පදප්පං, තිභවහිත විධානං, සබ්බලොකෙකකෙතුං, අමිතමතිං, අනඝං, (සන්තිදං,) මෙරුසාරං, සුගතං, රූපසාරං,

**විග්‍රහ:-** විතතා ච සා කිත්ති චාති විතත කිත්ති; සතතං විතත කිත්ති යස්ස සො, සතතවිතතකිත්ති තං, කන්දප්පස්ස දප්පො, කන්දප්පදප්පො ධස්තො කන්දප්පදප්පො යෙන සො ධස්ත කන්දප්පදප්පො තං; තිණ්ණං භවානං සමාහාරො තිභවං, තිභවස්ස හිතං, තිභවහිතං තිභවහිතං, විධාතුං සීලමස්සාති තිභව හිත විධානො, තං; සබ්බො ච සො ලොකො චාති. සබ්බ ලොකො කෙතු, විය කෙතු, එකො ච සො කෙතුචාති එක කෙතු සබ්බලොකස්ස එකකෙතු සබ්බලොකෙක කෙතු; තං, අමිතා මති යස්ස සො අමිත මති, තං, නත්ථි අඝො යස්ස සො අනඝො තං; සන්තිං දදාතීති සන්තිදො (සන්තිසද්දූප පද දා-දානෙ) තං; මෙරුනො සාරො විය සාරො යස්ස සො මෙරුසාරො තං, සොභනා ගති යස්ස සො සුගතො, තං; රූපෙන සාරො, රූපසාරො තං; රූප සාරං

**පරිකථා:-** කවිකුලතිලකායමානවූ ශ්‍රීමත් වෛදේහ මහා ස්ථවිරපාදයෝ සමන්තකූට වර්ණනාඛ්‍ය ග්‍රන්ථරත්නය රචනා කරන්නාහු පළමුකොට රත්නත්‍රය ප්‍රණාමය කරණුවෝ "සතත විතත කිත්තිං" යනාදී මාලිනී වෘත්තාත්මක පද්‍යත්‍රය රචනා කළෝ.



**සතත විතත කිත්තිං.**

තථාගතයන් වහන්සේ නිරතුරු පතළ කීර්ති ඇතිසේක. කීර්තිය නම් යමෙකු පිළිබඳව පවත්නා ගුණ කථනයයි. තථාගතයන් වහන්සේගේ නව අරහාදී ගුණ තුන්ලෝ වැස්සන් අතර නිරන්තරයෙන් පවතී. යමෙකු පිළිබඳ ගුණකථනය නිරතුරු ලොව පවත්නේ නම් ඒ උතුමා ලෝ වැස්සන් විසින් ඉතා ආදරයෙන් සිහි කරණු ලබන බව හැඟේ. යම් යම් අය පිළිබඳ ගුණ කථනය නිතරම නො පවතී. එහෙත් තථාගතයන් වහන්සේගේ ගුණ ඝොෂය නිරන්තරයෙන් ම ලොව පැතිර පවත්නා බැවි කීමෙන් උන්වහන්සේගේ අත්‍යුත්තම ගුණ කදම්බය ලෝ වැස්සන් විසින් භක්ත්‍යාදරයෙන් නිතර සිහි කරණු ලබන බව ප්‍රකාශ කළහ. ලොව පැතිර පවත්නා තථාගත ගුණයෝ නවදෙනෙක් වෙත්. ඒ ගුණ නවය මෙසේ යි.

i අරහං ii සම්මා සම්බුද්ධො, iii විජ්ජාචරණ සම්පන්නො
iv සුගතො v ලොකවිදූ vi අනුත්තරො පුරිසදම්මසාරථී
viii සත්ථා දෙවමනුස්සානං vii බුද්ධො ix භගවා.

**i අරහං.**

කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද, සංසාර චක්‍රයාගේ අර (දැති) නැසූ හෙයින් ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද, සිව්පසය ලැබීමට සුදුසු හෙයින්දැයි යනාදී ගුණයන් කාරණකොට ගෙණ අර්හත් නම්.

**ii සම්මා සම්බුද්ධො.**

සියලු දතයුතු ධර්මයන් පරොපදෙශ රහිතව ස්වයම්භූ ඥාන යෙන් සම්පූර්ණයෙන් ම අවබොධ කළ හෙයින් සම්‍යක් සම්බුද්ධ නම්.

**iii විජ්ජා චරණ සම්පන්නො.**

අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයන් ගෙන් යුක්ත හෙයින් විද්‍යාචරණ සම්පන්න නම්.

**iv සුගතො.**

සොභන ගති ඇති හෙයින් ද සුන්දරවූ නිර්වාණයට ගිය හෙයින් ද යනාදී කරුණෙන් සුගත නම්.

**v ලොකවිදූ.**

සත්වලොක, සංස්කාර ලොක, අවකාශ ලොක යන ලොකත්‍රය ස්වභාව වශයෙන් ද සමුදය (හටගැනීම) වශයෙන් ද දත් හෙයින් ලොකවිදූ නම්.

vi අනුත්තරො පුරිසදම්ම සාරථි.

තමන් වහන්සේට වඩා උත්තරි තරයෙක්හු නැති බැවින් අනුත්තර නම්. දමනය කළයුතු අදාන්ත පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙක් වැනිහුයි අනුත්තර "පුරිස දම්ම සාරථි" නම්.

viii සත්ථා දෙවමනුස්සානං.

දිට්ඨ ධම්මික (=මෙලොව සම්පරායික (=පරලොව) වශයෙන් දෙව් මිනිසුන්ගේ උභය ලොකාභිවෘද්ධිය සඳහා අනුශාසනය කරණ හෙයින් සත්ථා නම්.

viii බුද්ධො.

චතුරාර්‍ය්‍ය සත්‍යයන් (දුක්ඛ-සමුදය-නිරොධ-මග්ග)අවබොධ කළ හෙයින්හා අන්‍යයන්ට අවබොධ කරවන හෙයිනුත්"බුද්ධ"නම්.

ix භගවා.

භග්ග (විනාශ) කළ රාග ද්වෙෂ මොහ ඇති හෙයින් ද භාග්‍යවත් හෙයින් ද යනාදි කරුණින් භගවත් නම්.

මේ තථාගතයන් වහන්සේගේ නව ගුණයෝ යි.

ධස්ත කන්දප්ප දප්පං.

තථාගතයන් වහන්සේ අනඞ්ගයාගේ දර්පය නැසූසේක. කන්දප්ප නම් අනඞ්ගයා; කාමදෙව, මනොභව ආදී නාමයෝද අනඞ්ග පර්‍ය්‍යාය වෙත්, පැරණියෝ රාගය දෙවියකු කොට සැලකූහ. ශරීරයක් නැත, යන අර්ථයෙන් ඔහුට අනඞ්ගයයි ද කියනු ලැබේ. යමෙකුට රාග සිතක් ඇතිවුව හොත් ඔහුට අනඞ්ග සැර වැදිනැයි කියති. අනඞ්ගයාගේ කාර්‍ය්‍යය වනුයේ සත්වයන්ගේ සිත්වල කාමොද්දීපනය කිරීම යි. ඒ අවස්ථාවේදී හෙතෙම දුන්නකින් විදියි. විත් කෑ ස්ත්‍රියට හෝ පුරුෂයාට රාග සිත ඇති වේ.

අනඞ්ගයාගේ දුන්න උක් දඬුවකි. දුනුදිය බමර වැලකි. ශර පසකි. එනම්:-

උන්මාදනස්තාපනශ්ච-ශොෂණස්තම්භනස්තථා,
සම්මොහනශ්ච කාමස්‍ය-පඤ්චබාණාඃ ප්‍රකීර්තිතාඃ.

(1) උමතුවීම (2) තැවීම (3) වියැලීම (4) ශරීරය තදවීම (5) මුලාවීම යනුයි. මේ පසම මල් පසක් කොටද දක්වත් එනම්.

අරවින්දමශොකඤ්ච-චූතඤ්ච නවමල්ලිකා
නීලොත්පලඤ්ච පඤ්චෛතෙ-පඤ්චබාණස්‍ය ශායකාඃ.

යි දක්වෙන (2) නෙළුම (2) අශොක (3) අඹ (4) දෑසමන් (5) නිලුපුල් යන මේවා ය.



මෙනිසා ම අනඞ්ගයාට "පඤ්චබාණ" යන නාමයද ව්‍යවහාර කෙරෙත්. යමෙක් කාමයෙන් උමතු වී නම් "උන්මාදන" නම් ශරය වැදුනේ යයිද, තැවුනේ නම් "තාපන" නම් ශරය වැදුනේ යයිද යනාදී වශයෙන් දක්වති.

අනඞ්ග දෙවියන් අතරද රූපයෙන් සියල්ලන් අබිබවා සිටී. ඔහුට වැඩියෙන් රූ සිරින් යුත් කෙනෙක් නැත. ඔහුගේ භාර්‍ය්‍යාව රතී නම්. ඈද ස්ත්‍රීන් අතුරෙහි රූපශ්‍රීන් අග්‍රප්‍රාප්ත වූවා ය. තමන් සියල්ලන්ගේ ම සිත්වල කාමොද්දීපනය කරණ හෙයින් ද තමහට වඩා රූසිරෙන් අන්‍යයෙකු නැති හෙයින් ද මහත් වූ දර්පයෙන් යුක්ත ය.

තථාගතයන් වහන්සේගේ සිත්හි රාගය ඉපදවීමට අනඞ්ග සමර්ථ නො වී ය. එහෙයින් මේ කාරණයෙන් තථාගතයන් වහන්සේට කන්දර්පයා පැරදිනි. එසේම රූපශොභාවෙන්ද සර්වාඞ්ග රූපය සර්වප්‍රකාරයෙන් ම අනඞ්ගයා පැරද වූයේය. මේ හෙතුකොට ගෙණ පැරදුනු අනඞ්ගයා දුන් දර්ප රහිත වූවෙක් ය. තථාගතයන් වහන්සේ කන්දර්පයාගේ දර්පයට හේතුවූ කරුණු දෙකම ස්වකීය රූප ශ්‍රීයෙන් හා නිකෙලෙශිත්වයෙන්ද මර්දනය කළහෙයින් ධස්ත කන්දප්ප දප්පං යී කීහු.

තිභව හිත වුඩ්ඪානං.

තිභව නම් කාම-රූප-අරූප යන ලොකත්‍රයයි. ස්වර්ග- මර්ත්‍ය - පාතාල වශයෙන් හා සත්වලොක - සංස්කාරලොක - අවකාශලොක වශයෙන්ද ලොකය ත්‍රිවිධකොට දක්වත්. මේ භවත්‍රයට ම තථාගතයන් වහන්සේ හිත වැඩ සලසන සේක. හිත වැඩ නම් අමාර්ගගාමී සත්වයන් යහ මගට පැමිණවීමෙන් ස්වර්ග මොක්ෂ සම්පත් සාධාලීම යි.

සබ්බ ලොකෙක කෙතුං.

කෙතු නම් ධජය යි. නගර ප්‍රාසාදයන්ගේ මස්තකයෙහි හා සෙනාවගේ පුරොභාගයෙහි ද පිහිටුවනු ලැබේ. යමක ශොභාව හා ධෛර්‍ය්‍යය ඇතිකරන්නේ ධ්වජයෙනි. මෙය සියල්ලට ම වඩා උච්චතරස්ථානයක් භජනය කරණ හෙයින් ධ්වජය පිළිබඳ ශ්‍රෙෂ්ඨත්වය ප්‍රස්ඵුටය. ධ්වජය අසහාය ධ්වජයක් වූවහොත් සංකෙතකමියෙන් ම බබලන සුලුවූයේ වෙයි. තථාගතයන් වහන්සේ ද ලොකත්‍රය සඞ්ඛ්‍යාත මුලු ලොවට ම අසහාය ධ්වජයක් වැනි සේක. මෙයින් උන්වහන්සේ ලෝවැස්සන් විසින් මහත් ගෞරවයෙන් හා භක්ත්‍යාදරයෙන් උසස් කොට සලකනු ලබන බැව් හැඟවූහ.

සබ්බ ලොක නම් යට දැක්වූ පරිදි තුන්ලොවයි. එකතෙකු යන තන්හි එක ශබ්දය (1) සඞ්ඛ්‍යාය (2) අතුල්‍යය (3) අසහායය (4) අන්‍යය යන අර්ථ සතරෙන් අසහායත්වයෙහි වැටේ.

අභිනමතිං.

තථාගතවරයෝ අප්‍රමාණ වූ නුවණින් යුක්තයහ.

1 ඉන්ද්‍රිය පරොපරිය ඤාණය
2 ආසයානුසය ,,
3 යමක පාටිහීර ,,
4 මහා කරුණා සමාපත්ති ,,
5 සබ්බඤ්ඤුත ,,
6 අනාවරණ ,,

යන ෂඩ් අසාධාරණ ඥානයන්ගෙන්ද,

1 ඨානාඨාන ඤාණය
2 විපාක ,,
3 සබ්බත්ථ ගාමිනී ,,
4 අනෙක ධාතු ,,
5 ඉන්ද්‍රිය පරො පරියත්ත ,,
9 අධිමුත්ති ,,
7 ඣානාදි සංකිලෙසාදී ,,
8 පුබ්බෙනිවාසානුස්සති ,,
9 දිබ්බ චක්ඛු නොහොත් චුතුපපත්ති
10 ආසවක්ඛය ,,

යන දසබල ඥානයෙන් දූයි යනාදී අපමණ ඥානයන්ගෙන් උන්වහන්සේ දෙව් මිනිසුන් අතර ප්‍රසිද්ධයහ.

අනඝං සන්තිදං.

සන්ති නම් නිර්වාණයයි. එය අතිශයින් ම අනඝ වේ. නිර්වාණය ශාන්ත රසයෙන් යුක්තය. එහෙයින් 'ශාන්ති' යනු නිවණට නමෙකි. සියලු කෙලෙසුන් නැසීමෙන් මෙය ලැබිය යුතුය. මොක්ඛ-විමුත්ති ආදීහු ද නිර්වාණයට පර්යාය නාමයෝය. සසර මුහුද මැද දුක් විඳිනා සත්‍වයන්ට එයින් නිදහස්වී ඒකාන්ත පරම සැපය ලැබීමට හේතුවූයේ නිර්වාණයයි. නිවණට පැමිණි හැම සත්‍වයෙක් ම ශාන්ත රසයෙන් ප්‍රීත වෙයි. එහෙයින් ම එය අනඝ නම් වේ.



මේරු සාරං.

මේරු පර්වතය මහා සාගරයෙහි පිහිටියේය. යොදුන් අසූ සාර දහසක් (84000) සාගර ජලයෙන් වැසී තිබේ. ජලයෙන් මත්තෙහි යොදුන් අසූසාර දහසක් (84000) ඇත්තේය. මහ මෙර මස්තකයෙහි චාතුර්මහාරාජික දිව්‍යලෝකය පිහිටියේය. යටහාගයෙහි යොදුන් දසදහසක් පමණ වූ අසුර භවනය ඇත්තේය. මේ පර්වතයේ සතර පැත්ත වර්ණ සතරකින් බබලන්නේය.

“පාචීන පස්සං රජතං – දක්ඛිණං ඉන්දනීලකං
පච්ඡිමං ඵලිකං පස්සං – උත්තරං කඤ්චනාමයං.” යි

කී පරිදි නැගෙනහිර පාර්ශ්වය රජත ප්‍රභාවෙන්ද,

| | | | |
|---|---|---|---|
| දක්ෂිණ | ,, | ඉන්ද්‍රනීල මාණික්‍ය | ,, |
| පශ්චිම | ,, | ස්ඵටික මාණික්‍ය | ,, |
| උත්තර | ,, | සවර්ණ | ,, යුක්තය. |

මේ පර්වතය වටා පූර්ව විදේහය – අපරගොයානය – උතුරුකුරු දිවයින – ජම්බුද්වීපය යන චතුර් මහාද්වීපයෝ පිහිටා තිබෙත්.

මේරු පර්වතය අචලය. ස්ථිරය. කොතරම් ප්‍රචණ්ඩ වාතයකින් හමුදු නොසෙල්විය හැක්කේය. එසේ ම වස්තු සාරත්වයෙන් සාර වූයේද වෙයි. තථාගතයන් වහන්සේ ද චතුර්විධ වීර්‍යාධිෂ්ඨානයෙන් ද ලාභ – අලාභ – අයස – යස – නින්දා – ප්‍රශංසා – සුඛ-දුක්ඛ යන අට තන්හි අකම්ප්‍යමාන ගුණයෙන්ද, යුක්ත හෙයින් මහමෙර වැනියහ. ශීල සමාධ්‍යාදී වූ ගුණ සාරත්වයෙන් ද තථාගතයන් වහන්සේ යුක්තයහ.

චතුර්විධ වීර්‍යාධිෂ්ඨාන නම්:—

1 නූපන් අකුසලයන්ගේ නූපදීම පිණිසද
2 උපන් අකුසලයන්ගේ ප්‍රහාණය පිණිසද
3 නූපන් කුසලයන්ගේ ඉපදීම පිණිසද
4 උපන් කුසලයන්ගේ පැවැත්ම පිණිසද

පවත්නා වීර්‍යය චතුර්විධ වීර්‍ය නම්.

තථාගතයන් වහන්සේ මේ වීර්‍යයෙන් යුක්තයහ.

උදාරං.

තථාගතයන් වහන්සේ සීල සමාධ්‍යාදී ගුණයන්ගෙන් යුත් බැවින් උදාරයහ.

**රූප සාරං.**

ද්වාත්‍රිංශත්මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන යන් ගෙන්ද යුත් හෙයින් තථාගතයන් වහන්සේ රූපයෙන් සාරවූසේක.

### දෙතිස් මහා පුරිස් ලකුණු (32.)

(1) සුප්පතිට්ඨිත පාදො (2) හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාර පරිපූරානි (3) ආයත පණ්හී (4) දීඝඞ්ගුලි (5) මුදු තලුන හත්ථපාදො (6) ජාල හත්ථ පාදො (7) උස්සංඛපාදො (8) එණි ජඞ්ඝො (9) ඨිතකො අනොණමන්තො උභොහි පාණි තලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති (10) කොසොහිත වත්ථ ගුය්හො (11) සුවණ්ණ වණ්ණො කඤ්චන සන්නිභත්තචො (12) සුඛුමච්ඡවී සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙන උපලිප්පති (13) එකෙකලොමො එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි (14) උද්ධග්ග ලොමො උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජන වණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තක ජාතානි (15) බ්‍රහ්මුජ්ජුගත්තො (16) සත්තුස්සදො (17) සීහ පුබ්බද්ධකායො (18) චිතන්තරංසො (19) නිග්‍රොධ පරිමණ්ඩලො යාවතක්වස්ස කායො (20) සම වට්ටක්ඛන්ධො (21) රසග්ග සග්ගී (22) සීහ හනු (23) චත්තාලීස දන්තො (24) සමදන්තො (25) අවිවර දන්තො (26) සුසුක්කදාඨො (27) පහූත ජිව්හො (28) බ්‍රහ්මස්සරෙ කරවීකභාණී (29) අභිනීල නෙත්තො,(30) ගොපඛුමො (31) උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූලසන්නිභා (32) උණ්හීස සීසො.

### අසූ අනුව්‍යඤ්ජන (80).

චිත්තඞ්ගුලිතා - අනු පුබ්බඞ්ගුලිතා - වට්ටඞ්ගුලිතා - තම්බනඛතා - තුඞ්ගනඛතා - සිනිද්ධනඛතා - නිග්ගුළ්හ ගොප්ඵකතා - සම පාදතා - ගජ සමාන කක්කමතා - සීහ සමානකක්කමතා - හංස සමානකක්කමතා - උසභ සමානකක්කමතා - දක්ඛිණාවත්ත ගතිතා - සමන්තතො චාරු ජානු මණ්ඩලතා - පරිපුණ්ණ පුරිස ව්‍යඤ්ජනතා - අච්ඡිද්ද නාභිතා - ගම්භිර නාභිතා - දක්ඛිණාවත්ත නාභිතා - ද්විරද කරසදිස ඌරුභුජතා - සුවිභත්ත ගත්තතා - අනුපුබ්බ ගත්තතා - මට්ඨ ගත්තතා - අනුස්සන්නානුස්සන්න සබ්බගත්තතා - අලීන ගත්තතා - තිලකාදි රහිත ගත්තතා - අනුපුබ්බ රුචිර ගත්තතා - විසුද්ධ ගත්තතා - කොටි සහස්ස හත්ථි බලධාරණතා



- තුඞ්ගනාසතා - සුරත්ත දිජමංසතා - සුද්ධදන්තතා - සිනිද්ධ දන්තතා - විසුද්ධින්ද්‍රියතා - වට්ටදාඨතා - රත්තොට්ඨතා - ආයත වදනතා - ගම්භීරපාණි ලෙඛතා - ආයතලෙඛතා - උජුක ලෙඛතා - සුරුචිරසණ්ඨානලෙඛතා - පරිමණ්ඩලකායප්පභාවන්තතා - පරිපුණ්ණ කපොලතා - ආයතවිසාල නෙත්තතා - පඤ්චප්පසාද වන්ත නෙත්තතා - ආකුඤ්චිතග්ගපඛුමතා - මුදුතනුකරත්තජිව්හතා - ආයතරුචිරකණ්ණතා - නිග්ගණ්ඨිසිරතා - නිග්ගුළ්හ සිරතා - ඡත්තනිභචාරුසීසතා - ආයත පුථුලලාට සොභතා - සුසණ්ඨාන භමුකතා - සණ්හභමුකතා - අනුලොමභමුකතා - මහන්තභමුකතා - ආයතභමුකතා - සුකුමාලගත්තතා - අතිවියසොම්මගත්තතා - අතිවියඋජ්ජලිතගත්තතා - විමල ගත්තතා - කොමල ගත්තතා - සිනිද්ධ ගත්තතා - සුගන්ධතනුතා - සමලොමතා - කොමල ලොමතා - දක්ඛිණ වත්ත ලොමතා - භින්නඤ්ජනසදිස නීලලොමතා - සිනිද්ධලොමතා - අතිසුඛුම අස්සාසපස්සාසධාරණතා - සුගන්ධමුඛතා - සුගන්ධමුද්ධනතා - සුනීල කෙසතා - දක්ඛිණ වත්ත කෙසතා - සුසණ්ඨාන කෙසතා - සිනිද්ධකෙසතා - සණ්හකෙසතා - අලුලිතකෙසතා - සමකෙසතා - කොමල කෙසතා - කෙතුමාලාරතන රඤ්ජිතතා"යි.

**හතදුරිතතුසාරං මොහපඞ්කාපතාපං**
**මනකමලවිකාසං ජන්තූනං සෙසකානං**
**කුමතිකුමුදනාසං බුද්ධපුබ්බාචලග්ගා**
**උදිතමහමුදාරං ධම්මභානුං නමාමි.**

**අන්වය:-** හතදුරිතතුසාරං, මොහපඞ්කාපතාපං සෙසකානං ජන්තූනං මනකමලවිකාසං කුමතිකුමුදනාසං බුද්ධපුබ්බාචලග්ගා උදිතං උදාරං ධම්මභානුං නමාමි.

**පදාර්ථ:-** හතදුරිතතුසාරං, නසනලද පව් නමැති පිනි ඇති; මොහපඞ්කාපතාපං, අවිද්‍යා නමැති (මඩ) වියළන්නාවූ; සෙසකානං, යථාපත්වූ නිර්වාණ මාර්ගය ගවේෂණය කරන්නාවූ; (නොහොත්) නිරවශේෂවූ; ජන්තූනං, සත්වයන්ගේ; මන කමල විකාසං, චිත්ත නමැති පද්මයන් ප්‍රබෝධ කරන්නාවූ; කුමති, දුර්බුද්ධි නැමැති, කුමුද නාසං, කුමුදු විනාශ කරන්නාවූ; බුද්ධ, සර්වඥ නැමති; පුබ්බාචලග්ගා, උදය පර්වතාග්‍රයෙන්; උදිතං, පහළවූ; උදාරං, මහත්වූ, ධම්මභානුං, සද්ධර්ම නමැති සූර්යයා; අහං, මම; නමාමි, වදිමි;

භාවය:- යම් ධර්ම නමැති සූර්යයෙක් පව් නමැති පිනි නසා අවිද්‍යා නමැති මඩ වියලවී ද, සියලුම සත්වයන්ගේ සිත් නමැති ඒ පියුම් පුබුදුවා දුර්මති නමැති තොඳ ( කෛරවයන් ) විනාශ කෙළේද, සර්වඥ නමැති උදය පර්වතාග්‍රයෙන් පහළ වූ ඒ සද්ධර්ම නැමැති සූර්යයා මම සතතා වදිමි.

**ක්‍රියා කාරක පදසම්බන්ධ:**

අහං ධම්මභානුං නමාමි.
ඉ: නා: සුගමයි.

**විශේෂණ විශේෂ්‍ය:**

ධම්මභානුං යනු විශේෂ්‍යයි. හතදුරිතතුසාරං, මෝහපඞ්කාපතාපං, මනකමල විකාසං කුමති කුමුද නාසං, උදිතං, උදුරං යනු තද් විශේෂණයෝ යි. ජනනුතං යනු විශේෂ්‍ය යි සෙසකා තං යනු විශේෂණ යි.

සමාස:- හතදුරිතතුසාරං, මෝහපඞ්කාපතාපං, මන කමලවිකාසං, කුමතිකුමුදනාසං, බුධපුබ්බාචලග්ගා, ධම්මභානුං.

විග්‍රහ:- දුරිතො එව තුසාරො දුරිත තුසාරො, හතො දුරිත තුසාරො යෙන සො හතදුරිතතුසාරො; තං, මොහො එව පඞ්කො මොහපඞ්කො, මොහපඞ්කං; උපතාපෙතීති මොහ පඞ්කාපතාපො, තං; මනමෙව කමලං, මනකමලං; තං විකාසෙතීති මන කමල විකාසො, තං, කුච්ඡිතාමති කුමති, කුමති, එව කුමුදානි කුමති කුමුදානි, තානි නාසෙතීති කුමති කුමුද නාසො තං, පුබ්බො ච සො අචලො චෙති පුබ්බාචලො, තස්ස අග්ගො බුධො එව පුබ්බාචලග්ගො; තස්මා, ධම්මො එව භානු ධම්ම භානු තං.

පරිකථා:- 'හත දුරිත තුසාරං' ධර්මය කෙලෙසුන් නසයි. එහෙයින් හතදුරිත තුසාරං යි කියූ; දුරිත නම් කෙලශයෝ ය. සිත කිලිටු කරණ අර්ථයෙන් කෙලශයෝ යයි ද අපායට පමුණු වන අර්ථයෙන් පාපයයි ද කියත්. ඔහු නම් රාග - ද්වේෂ - මෝහ මද - මාන - දෘෂ්ටි - විචිකිත්සා - ස්ත්‍යානමිද්ධ - ඖද්ධත්‍ය - අහ්‍රීක අනොත්තප්‍ය යන මොහුයි.

මේ සියලු කෙලශයෝ ධර්ම නමැති සූර්යයා විසින් විනාශ කරණු ලබත්. ධර්මය සූර්යයාට උපමිත හෙයින් දුරිත (පව්) පිනිවලට සමාන කළහ.



**මෝහ පඞ්කාපතාපං**

යථාතථාවබෝධයක් නො මැති ව මූලාවන ස්වභාවය මෝහ නම්. සත්වයන් සසර දුකෙහි බැඳ තබන මූලික කෙලෙස් මුල් තුණින් මෙය ද එකකි. මෝහය පහකිරීම සසරින් නික්මීමට හේතුවකි. "පඤ්චස්කන්ධය දුකය, තෘෂ්ණාව, දුක් උපදවන මුල් හේතුව ය. තෘෂ්ණාව නැතිකිරීමට මගඵල නුවණට අරමුණු වන ශාන්ත ධර්මය නිවණය. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය නිවන් ලබන පිළිවෙතය යන චතුරාර්ය සත්‍යය වසා ලන ස්වභාවය ද යටත් පිරිසෙයින් හොඳ නො හොඳ කුසල් අකුසල් කටයුතු නො කටයුතු සදොස් නිදොස් ආදිය පිළිබඳ නො දැනුමද මෝහ නම්." ධර්ම නමැති සූර්යයා මේ මෝහ පඞ්කය වියලීමට සමර්ථ වන්නේ ය.

**මන කමල විකාසං**

මෙහි සිත් පියුම්වලට සමාන කරණ ලදී. හිරු පියුම් පුබුදුවන්නාක් මෙන් ධර්මය නිර්වාණාර්ථි වූ සත්වයන්ගේ සිත් නිවන් මග හෙළිකර දීමෙන් පුබුදු කරයි.

**කුමති කුමුද නාසං**

දුර්බුද්ධි ඇත්තෝ නම් මිසදිටුවෝ යි. තථාගත ධර්මය ඔවුන් ගේ දුර්බුද්ධිය නැති කිරීමට සමර්ථය. පෙර දඹදිව දුර්මතික වූ මිස දිටුවෝ කොටස් 62 කට බෙදී සිටියෝ ය. දෙසැට මිසදිටුවෝ නම් ඔහු ය.

**දෙසැට මිසදිටු (62)**

| | | | | |
|---|---|---|---|---|
| i | කෙවල ශාස්වත | වාදීහු | 4 | පූර්වාන්ත කල්පික 18 |
| ii | එකත්‍ය ,, | ,, | 4 | |
| iii | අන්තානන්තික | ,, | 4 | |
| iv | අමරා වික්ෂේපික | ,, | 4 | |
| v | අධිච්ච සමුප්පන්න | ,, | 2 | |
| vi | සංඥී | වාදීහු | 16 | අපරාන්ත කල්පික 44 |
| vii | අසංඥී | ,, | 8 | |
| viii | නෙවසංඥානාසංඥ | ,, | 8 | |
| ix | උච්ඡේද | ,, | 7 | |
| x | දෘෂ්ට ධර්ම නිර්වාණ | ,, | 5 | |

සියලු දෘෂ්ටි ගතිකයෝ (62) දෙදෙනෙකි

**බුධ පුබ්බාචලග්ගා**

සූර්යයා පූර්ව දිශාවෙහි වූ පර්වතයකින් උදාවේයයි ද පශ්චිම දිශාවෙහි වූ පර්වතයකින් අස්තයට යේ යයි ද, කිවිහු තැකූහ. එහෙයින් ධර්ම නමැති සූර්යයාගේ පහළවීම සිදුවන්නේ බුධ නමැති උදය පර්වතාග්‍රයෙන් යයි කීහ. සද්ධර්මය සර්වඥයන් වහන්සේගෙන් ප්‍රකාශිත නිසා එසේ කීම යෙදේ.

උදාරං

ධර්මය ගුණයෙන් මහත් ය. එහෙයින් ම උදාරය.

ඒ ගුණ නම්:—

| | |
|---|---|
| ස්වාක්ඛාත | ගුණ |
| සන්දිට්ඨික | ,, |
| අකාලික | ,, |
| එහිපස්සික | ,, |
| ඕපනයික | ,, |
| පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහි | ,, |

යන මේ ගුණයෝයි.

**සකලවිමලසීලං ධූතපාපාරිජාලං**
**සුරනරමහනීයං පාහුණෙය්‍යාහුණෙය්‍යං**
**උජ්ජුපථ පටිපන්නං පුඤ්ඤක්ඛෙත්තං ජනානං**
**ගණං මහමභිවන්දෙ සාරදං සාදරෙන**

**අන්වය:-** සකල විමල සීලං, ධූතපාපාරිජාලං, සුරනර මහනීයං, පාහුණෙය්‍යාහුණෙය්‍යං, උජ්ජුපථ පටිපන්නං, ජනානං, පුඤ්ඤක්ඛෙත්තං සාරදං, ගණං සාදරෙන, අහං අභිවන්දෙ;

**පදාර්ථ:-** සකල විමල සීලං, අශේෂ නිර්මල ශීලස්කන්ධ ඇති; ධූතපාපාරිජාලං, ධූත, කම්පාකොට හරණ ලද; පාපාරිජාලං, පාප නමැති ශත්‍රු සමූහයා ඇති; සුරනර, දෙවිමිනිසුන් විසින්, මහනීයං, පිදියයුතුවූ; පාහුණෙය්‍යං, අමුතු පඬුරු පිදීමට සුදුසුවූ; ආහුණෙය්‍යං, සියලු සත්කාරයට සුදුසුවූ; උජ්ජුපථ පටිපන්නං, සෘජු මාර්ගයට පිළිපන්; ජනානං, සත්වයන්ට; පුඤ්ඤක්ඛෙත්තං, පින්කෙත් වූ; සාරදං, උත්තම ඵලදායකවූ; ගණං, ආර්ය්‍යසඞ්ඝ රත්නය; අහං, මම; සාදරෙන, සාදරයෙන්; අභිවන්දෙ, සකසා වඳිමි;

**භාවාර්ථ:-** අතිශයින් පිරිසිදු වූ ප්‍රාතිමොක්ෂසංවර සීලය ආදිකොට ඇති, ශීලස්කන්ධයෙන් යුක්ත වූ කම්පිත කොට හැරි කෙලෙස් සතුරන් ඇති, දෙවියන් හා මිනිසුන් විසින් පිදිය යුතු වූ, සෘජුවූ මාර්ගයට පිළිපන්, සැදැහැවතුන්ට පින්කෙත්වූ ආර්ය්‍යමහා සඞ්ඝරත්නය ආදරයෙන් සකසා වඳිමි.

**ක්‍රි: ස:** "අහං ගණං අභිවන්දෙ" යනු ක්‍රියා කාරක පද සම්බන්ධ යි.



**උ: කා:** අභිවන්දෙ යන (වදි අභිවාදනත්ථුතිසු.) වර්තමාන විභක්ති කර්තෘකාරක ආත්මනෙපද උත්තමපුරුෂ එකවචනාන්ත ඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් අහං යනු උක්ත කර්තෘ යි. ගණං යනු අනුක්ත කර්ම යි.

**විශේෂණ විශේෂ්‍ය.**

ගණං යනු විශේෂ්‍යයි. සකල විමලසීලං, ධූතපාපාරිජාලං, සුරනර මහනීයං, පාහුනෙය්‍යාහුණෙය්‍යං, උජ්ජුපථපටිපන්නං පුඤ්ඤක්ඛෙත්තං සාරදං යනු තද්විශේෂණයෝ යි.

**සමාස:-** සකලවිමලසීලං, ධූතපාපාරිජාලං, සුරනරමහනීයං පාහුණෙය්‍යාහුණෙය්‍යං, උජ්ජුපථපටිපන්නං, පුඤ්ඤක්ඛෙත්තං (සාරදං)

**විග්‍රහ:-** විමලං ච තං සීලං චෙති විමලසීලං, සකලං විමල සීලං යස්ස සො සකල විමල සීලො තං; පාපා එව අරයො පාපාරයො පාපාරීනං ජාලං පාපාරිජාලං, ධූතං පාපාරිජාලං යෙන සො ධූතපාපාරිජාලො තං; සුරා ච නරා ච සුරනරා තෙහි මහනීයො සුරනර මහනීයො තං, ආනෙත්වා හුනිතබ්බං ආහුනං තං පටිග්ගහෙතුං යුත්තොති ආහුණෙය්‍යො පාහුනං වුච්චති ආගන්තුක දානං තං පටිග්ගහෙතුං යුත්තොති පාහුණෙය්‍යො පාහුණෙය්‍යො ච සො ආහුණෙය්‍යො චාති පාහුණෙය්‍යාහුණෙය්‍යො තං, උජු ච සො පථො චාති උජුපථො උජුපථං පටිපජ්ජිත්වාති උජුපපටිපන්නො තං; බීජානි බිජියන්ති බිපන්නානීසමිංති වා ඛෙත්තං; පුඤ්ඤස්ස ඛෙත්තං පුඤ්ඤඛෙත්තං තං (සාරං දදාතීති සාරදො (සාරසද්දූපපද දා-දානෙ) තං සාරදං

**පරිකථා:-** "සකල විමල සීලං"

ශිරෝර්ථයෙන් හා සීතලාර්ථයෙන් සීල නම් වේ. සත්වයෙකුගේ ප්‍රධාන අවයවය - උත්තමාංගය - ශීර්ෂයයි. ශීර්ෂයෙන් විරහිතව කෙනෙකුට ජීවත්විය නොහේ. එහෙයින් ශීර්ෂය ප්‍රධාන අවයවය වේ. ශීලය ගුණ ධර්ම නමැති ශරීරයේ ශීර්ෂය යි. ශීලය නැත්නම් සියලු ගුණ සමුදාය ම වැනසේ. මේ නිසා සීලය සියලුම ගුණධර්මයන්ට ශ්‍රෙෂ්ඨ වේ. කෙලෙස් ගිනි නිවාලූ යි සීතලාර්ථයෙන් සීල නම් වේ. තථාගතයන් වහන්සේගේ ඖරස පුත්‍රවූ ආර්ය්‍ය සඞ්ඝරත්නය ප්‍රාතිමොක්ෂ සංවරාදි සියලුම නිර්මලශීලයෙන් පරිපූර්ණය.

සීලයාගේ ප්‍රභේද බොහෝය. විස්තර විශුද්ධි මාර්ගයෙන් බලා දතයුත්තේ ය. සිවු පිරිසුදු සිල් පමණක් මෙහි ලුහුඬින් විස්තර කරණු ලැබේ.

**සිවු පිරිසිදු සිල් නම්.**

(1) පාතිමොක්ඛසංවරසීලය (2) ඉන්ද්‍රිය සංවර සීලය. (3) ආජීව පාරිශුද්ධිසීලය. (4) පච්චය සන්නිස්සිත සීලයයි යන සතරයි

**(1) පාතිමොක්ඛ සංවර සීලය.**

භික්ෂු භික්ෂුණී ප්‍රාතිමෝක්ෂදෙකට අයත් ශික්ෂාපද සමූහය කයින් හා වචනයෙන් කෙරෙණ දුසිරිත් වළකනා හෙයින් හා සුසිල් බැව් වශයෙන් කය වචන දෙක හසුරුවාලන හෙයින් පාතිමොක්ඛ සංවරසීල නම්.

**(2) ඉන්ද්‍රිය සංවර සීලය.**

මනස සමැති කොට ඇති ඉඳුරන් රූප ශබ්දාදී අරමුණු විෂයෙහි සංවර කිරීම් වශයෙන් චක්ඛු සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන සදෙරින් සිතට වැද ගන්නා රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම යන සැවැදෑරුම් අරමුණෙහි රාගාදී කෙලෙස් නූපදවාසිහි නමැති දෙරින් ඇස්, කන්, නාසාදී දොරටු වසා ගෙණ සිටීම් වශයෙන් පැවති සීලය ඉන්ද්‍රිය සංවර සීල නම්.

**(3) ආජීව පාරිශුද්ධි සීලය.**

අධර්ම ජීවිකාවෙන් තොරව දැහැමෙන් සෙමෙන් ලත් සිවුපසය වළඳා දිවි පැවැත්වීම් වශයෙන් පැවැති සීලය ආජීවපාරිශුද්ධි සීලය යි.

**(4) පච්චය සන්නිස්සිත සීලය.**

චීවර-පිණ්ඩපාත-ශයනාසන ග්ලානප්‍රත්‍යය යන සිවුපසය වැළඳීමේ දී තෘෂ්ණා වසග නොව සීත වළක්වා ගැණීම ආදිය සඳහා සිවුරු පරිභොග කරමි යි කියා ද, බඩසර රුහ ගැණීම සඳහා පිණ්ඩපාතය වළඳමියි කියාද, මේ ආදීවශයෙන් සිවු පසය ප්‍රත්‍යවේක්ෂා කොට පරිභොග කිරීම පච්චයසන්නිස්සිත සීල නම්.

**"ධුත පාපාරිජාලං"**

අෂ්ටාර්‍ය පුද්ගල මහා සඞ්ඝරත්නය රාග ද්වේෂාදී සියලු පාපයන් මාර්ග පිළිවෙළින් නැසූහෙයින් ධුත-පාපාරිජාල නම්. සෝවාන් - සකෘදාගාමී - අනාගාමී - අර්හත් යන මාර්ග සතරින් කෙලෙස් නැසිය යුතු වේ. සමුච්ඡේද වශයෙන් කෙලෙස් නසනු තුරු සසරින් ගැලවිය නො හැකි වේ,



සක්කාය දිට්ඨි
විචිකිච්ඡා
සීලබ්බත පරාමාස
} සෝවාන් මාර්ගයෙන් ද

කාමරාග
ව්‍යාපාද
කාමරාග-ව්‍යාපාද
} සකෘදාගාමී මාර්ගයෙන් තුනීකිරීමෙන්ද තුනී වූ කාමරාගය හා ව්‍යාපාද අනාගාමී මාර්ගයෙන් ද

රූපරාග
අරූපරාග
මාන
උද්ධච්ච
අවිජ්ජා
} අර්හත් මාර්ගයෙන් ද යි

තථාගත ශ්‍රාවකයෝ කෙලෙස් නැසූ සේක.

**"පාහුණෙය්‍යාහුණෙය්‍යං"**

පාහුණෙය්‍ය දුරසිටද්දු ගෙණවුත් සිල්වතුන් කෙරෙහි පිදිය යුත්ත ආහුණ නම්. සිවුපසයට ආහුණ යනු නමකි. ඒ ආහුණය පිළිගැණීමට සුදුස්සෝ පාහුණෙය්‍යයෝ යි. එනම් ආර්‍යශ්‍රාවක සඞ්ඝ සමූහය යි.

**"පාහුණෙය්‍ය"**

බැහැරින් ආ හිතවත් නෑදැයනට දෙනු සඳහා පිළියෙල කළ ආගන්තුක දානය පාහුණ නම්; ඒ පාහුණය පිළිගැණීමට සුදුස්සෝ පාහුණෙය්‍යයෝයි. එනම් ආර්‍යශ්‍රාවක සඞ්ඝ සමූහයයි.

මෙසේ ආහුණෙය්‍ය පාහුණෙය්‍ය සඞ්ඛ්‍යාත වූ විවිධ දානය පිළිගැන්වීමට ද මොහු අර්හයෝ වෙත්නුයි මහා සඞ්ඝයා වහන්සේ පාහුණෙය්‍යාහුණෙය්‍ය නම් වනසේක.

**"උජුපථ පටිපන්නං"**

සඞ්ඝරත්නය සෘජුවූ මාර්ගයට පිළිපන්නෝ ය. ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය සෘජුවූ මාර්ගයයි නිර්වාණාවබොධයට පවත්නා සරලවූත් සෘජුවූත් මාර්ගය එය ම බැවිනි.

"ඒ අරි අටඟ මග මෙසේ යි."

| | | | |
|---|---|---|---|
| 1 | සම්මා දිට්ඨි | 5 | සම්මා ආජීව |
| 2 | සම්මා කම්මන්ත | 6 | සම්මා වායාම |
| 3 | සම්මා වාචා | 7 | සම්මා සති |
| 4 | සම්මා සඞ්කප්ප | 8 | සම්මා සමාධි |

මේ අඞ්ග අටින් යුක්තවූයේ අරිඅටඟ මග යි. උජුපථ යනු ද මෙය යි. මෙයට පිළිපන් හෙයින් ආර්‍යයන් වහන්සේ උජුපථ පටිපන්න නම් වන්නාහ.

"පුඤ්ඤක්ඛෙත්තං"

සඞ්ඝරත්නය යහපත් කෙතක් වැනි ය. දානමානාදි පින්කම් බිජුවට වැනි ය. යහපත් කුඹුරෙහි වපුරණ බිජුවටින් නිසිකලට ලැබෙන ශස්‍යයෙන් ගොවියාගේ අභිමත සිද්ධිය වන්නාක් මෙන් සැදැහැවතා විසින් සඞ්ඝත්නය කෙරෙහි කරණු ලබන දානමානාදි පුණ්‍යක්‍රියාවන්ගෙන් ද දිට්ඨධම්මික සම්පරායික වශයෙන් මහත් ඵල ලැබීම කරණ කොට ගෙණ හෙතෙමේ දෙලොව ම සැප විඳියි. එහෙයින් සඞ්ඝරත්නය පින් කෙතක් වැනි ය.

"සාරදං"

සඞ්ඝරත්නය උත්තමඵලදායක ය. සත්වයන්ට දෙව් මිනිස් නිවන් යන ත්‍රිවර්ග සම්පත්තිය සාධාදීමට හේ සමර්ථ ය එහෙයින් ඒ සාරද නම්.

"අභිවන්දෙ"

සක්කා වඳිමි; සක්කා වැඳිම නම් භය-ලොභ-කුල-ආචාරාදියෙන් විනිර්මුක්තව ශ්‍රද්ධාපූර්වඞ්ගම භක්තිභාරවනත චිත්තයෙන් කම්පල අදහා කරණ නමස්කාරය යි. මේ ග්‍රන්ථකර්තෘ පාදයන්ගේ නමස්කාරය ද එසේයි. එහෙයින් උන්වහන්සේගේ වන්දනාව භයලොභාදියෙන් කලිමට නො වීය. මේ නිසා ම උන්වහන්සේ වැඳිම අභිමතාර්ථ සාධනයෙහි සමර්ථවී ය. ඒ වන්දනාව ද කායික වාචසික මානසික වශයෙන් ත්‍රිවිධ වේ. විස්තර ග්‍රන්ථාන්තරයෙන් දතයුතුයි.

ඉති කලිතපණාමො හන්ත්වා සබ්බොපසග්ගෙ
සුගතවිමලපාදම්භොජසම්පාතපූතං
සුමනසිඛරිරාජං වණ්ණයිස්සං සුරානං
වසතිමතුලමෙතං සාධු ජනතා සුණන්තු.

අන්වය:- ඉති කලිත පණාමො සබ්බොපසග්ගෙ හන්ත්වා සුගත විමල පාදම්භොජ සම්පාත පූතං සුරානං වසතිං සුමන සිඛරිරාජං වණ්ණයිස්සං ජනතා සාධු අතුලං එතං සුණන්තු.

පදාර්ථ:- ඉති, මේ පරිද්දෙන්; කලිත, කරණ ලද; පණාමො, ප්‍රණාම හේතුවෙන්; සබ්බොපසග්ගෙ, සියලු උපද්‍රව; හන්ත්වා, නසා; සුගත, සර්වඥයන්වහන්සේගේ, විමල, නිර්මලවූ; පාදම්භොජ, පාදපද්මය; සම්පාත, තැබීමෙන්; පූතං, පවිත්‍රවූ; සුරානං දෙවියන්ගේ; වසතිං, වාසස්ථාන වූ; සුමන සිඛරිරාජං, සමන්ත



කූට පර්වත රාජයා; වණ්ණයිස්සං, වර්ණනා කරන්නෙමි, සාධු ජනතා සත්පුරුෂයෝ; අතුලං, අසදෘශවූ; එතං, මේ කියනු ලබන වර්ණනාව; සුණන්තු, අසත්වා.

භාවය:- බුද්ධ ධර්ම සඞ්ඝ සඞ්ඛ්‍යාත රත්නත්‍රයට කළ නමස්කාර හේතුවෙන් රොග පීඩා දි සියලු උපද්‍රව නැති කොට බුදුරදුන් ගේ සිරිපා පියුම් තැබීමෙන් පවිත්‍රවූ දෙවියන්ගේ වාසස්ථානයක් වූ සමන්කූළ පව්ව පද්‍ය කාව්‍යයකින් මම වර්ණනා කරන්නෙමි. සත්පුරුෂයෝ අසදෘශවූ සමන්තකූට වර්ණනාව මනාකොට අසත්වා.

ක්‍රියා කාරක පදසම්බන්ධ:-

අහං සුමන සිඛරිරාජං වණ්ණයිස්සං,
ජනතා එතං සුණන්තු යනු ක්‍රියා කාරක පද සම්බන්ධයි.

උ: කෘ: වණ්ණයිස්සං යන (වර්ණ සංවණ්ණනෙ) භවිස්සන්ති විභක්ති කර්තෘකාරක පරස්සෙපද උත්තම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් අහං යනු උක්ත කර්තෘයි. සුමනසිඛරිරාජං යනු අනුක්ත කර්මයි. සුණන්තු යන (සු සවණෙ) පංචමී විභක්ති කර්තෘ කාරක පරස්සෙපද ප්‍රථම පුරුෂ බහු වචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් ජනතා යනු උක්ත කර්තෘයි. එතං යනු අනුක්ත කර්මයි. හන්ත්වා යන පෙර කිරියට ද අහං යනුම උක්ත කර්තෘයි. සබ්බොපසග්ගෙ යනු අනුක්ත කර්මයි.

විශෙෂණ විශෙෂ්‍ය:

සුමනසිඛරිරාජං යනු විශෙෂ්‍යයි. සුගතවිමලපාදම්භොජ සම්පාතපූතං (සුරානං) වසතිං යනු තුල්‍යාධිකරණ විශෙෂණයෝයි. එතං යනු විශෙෂ්‍යයි. අතුලං යනු තු- විශෙෂණයි.

සමාස:- කලිතපණාමො සබ්බොපසග්ගෙ සුගතවිමලපාදම්භොජසම්පාතපූතං සුමනසිඛරිරාජං අතුලං සාධුජනතා.

විග්‍රහ:- කලිතො පණාමො යෙන සො කලිතපණාමො. සබ්බෙව තෙ උපසග්ගා චෙති සබ්බොපසග්ගා, තෙ, පාද මෙව අම්භොජං පාදම්භොජං විමලං ච තං පාදම්භොජං චෙති විමලපාදම්භොජං සුගතස්ස විමලපාදම්භොජං සුගතවිමලපාදම්භොජං, තස්ස සම්පාතෙන පූතො සුගතවිමලපාදම්භොජ

සම්පාතපූතො තං, සිඛරිනං රාජා සිඛරිරාජා සුමනො ච සො සිඛරිරාජා චෙති සුමනසිඛරිරාජා තං, නත්ථිතුලො යස්ස තං අතුලං, තං, සාධවො ච තෙ ජනා චාති සාධුජනා.

**පරිකථා:–** **කලිතපණාමා**— ප්‍රණාමයාගේ ප්‍රභෙද යට දක්විත. ග්‍රන්ථ රචනය කරන්නාවූ ඒ ඒ ආචාර්‍ය්‍යවරයෝ **ආශීර් නමස්ක්‍රියා වස්තුනිර්දේශ** යන තුන්ක්‍රමයකින් ග්‍රන්ථාරම්භය කෙරෙත්.

ශිශුපාල වධ මහා කාව්‍ය කර්තෘවූ ශ්‍රීමත් මාඝයෝ ශ්‍රියඃ පතිඃ ශ්‍රීමති ශාසිතුං ජගද්" යනාදි පද්‍යයෙන් වස්තුනිර්දේශාත්මක ස්වග්‍රන්ථය රචනා කළහ.

ශ්‍රීමත් වෛදෙහ මහා ස්ථවිරපාදයෝ රත්නත්‍රයට නමස්කාර කිරීම් වශයෙන් "සතත විතත කිත්තිං" යනාදි ගාථාත්‍රය රචනා කළහ. මෙය පූර්වෝක්ත තුන් ක්‍රමයෙන්ම ඉතා පැසසිය යුතු ක්‍රමය වේ. මේ නමස්කාර හේතුවෙන් ග්‍රන්ථ කර්තෘන්ගේ මූඛ්‍යාධ්‍යාශය වූ ග්‍රන්ථයාගේ අවිඝ්න පරිසමාප්තිය අවිකල්ප යෙන්ම සිදු කෙරේ එහෙයින්ම "ඉති කලිතපණාමා" යනාදි පද්‍යයෙන් ග්‍රන්ථ කර්තෘපාදයෝ ප්‍රණාම ප්‍රතිඵල දක්වූහ.

**සබ්බොපසග්ගා.**

රොග පීඩා චිත්ත සන්තාප බන්ධුව්‍යසන ආදිවූ උපද්‍රවයෝයි. ඒ සියලු උවදුරු ප්‍රණාම හේතුවෙන් දුරුවූහ.

**සුගත විමල පාදම්භොජ සම්පාත පූතං.**

තථාගතයන් වහන්සේ තෙවරක් ලක්දිවට වැඩම කළහ කැලණියේ මණිඅක්ඛික නාරදුන්ගේ ආරාධනයෙන් තෙවන වර ලක්දිවට වැඩ උන්වහන්සේ සුමන දෙවිරදුන්ගේ ඇරයුමෙන් සමන් කුළට වැඩමවා ශ්‍රීපාද ලාඤ්ඡනය පිහිටුවූහ. එහෙයින් සමන් කුළ තථාගත පාදස්පර්ශයෙන් අබිසෙස් ලදුයේ අන් සියලු පර්වතයනට ශ්‍රේෂ්ඨ වූයේ වෙයි. නිර්මල ශීලාදි ගුණධර්මයන්ගෙන් චොරදනා තථාගතයන් වහන්සේගේ ශ්‍රී පාදස්පර්ශය ලැබීම ඓහික පාරත්‍රික ශුභ සිද්ධියට හේතුවේ. සත්වයන්ගේ සන්තාන ගත කෙලෙස් නසා නිවන් ඵල ලැබීමටද මෙය හේතුවේ. එහෙයින් ම සමන්තකූට පර්වත රාජයා බුදු රදුන්ගේ ශ්‍රීපාද ලාඤ්ඡන ස්පර්ශයෙන් පවිත්‍රීභූත විය.



**සුමන සිඛරි රාජං**

සිඛරි යනු පර්වතයන්ට නමකි. සිඛා (මුදුන්) ඇත්තේ සිඛරි නම්. සිඛරයන්ට ප්‍රධාන වූයේ සිඛරි රාජ නම් වේ. සුමන සිඛරය (සමන්තකූට පර්වතය) අන් සියලු පර්වතයන්ට වඩා ශ්‍රේෂ්ඨ වේ. එහෙයින්ම පර්වත රාජ වේ. සුමනාලය සමන්තකූට යනුද මීට පර්‍ය්‍යාය නාමයෝය. සුමන දෙවියන්ගේ ආලය (වාසස්ථාන ය) නිසා සුමනාලයද සියලු කූටයනට වඩා උස්ව සිටි හෙයින් හෝ සියලු අතින්ම කූටව සිටි නිසා හෝ සමන්තකූට යයිද කියති.

**සුරානං වසතිං.**

සමන් කුළ පර්වත දෙවියන්ගේ වාසස්ථානයකි. සුමන දෙවියන්ගේ වාසය මෙහි ප්‍රසිද්ධය. අන්‍යවූද නොයෙක් දෙවිවරුන් මෙහි අධිගෘහිත ව සිටින හෙයින් සුරානං වසතිං යනු මීට අන්වර්ථය.

**අතුලං.**

මේ සමන්තකූට වණ්ණනාව අතුල්‍යවූ රචනාවෙක යනු ග්‍රන්ථ කර්තෘන්ගේ හැඟීමය. පාලිභාෂාවෙන් රචිත දාඨාවංශ-ජිනචරිත ආදී පද්‍ය ග්‍රන්ථයන්ට වඩා මේ ග්‍රන්ථය මහාකාව්‍ය ලක්ෂණයන්ගෙන් අන්‍යූන කොට රචිත අතිශය චමත්කාර ජනක පද්‍ය බන්ධනයක් බැව් විඥයන් විසින් සමාදෘතය. සංස්කෘත මහා කවීන්ගේ කෘතීන් පරිශීලනය කිරීමෙන් ලත් බුද්ධි ප්‍රභාවයකින් යුත් වෛදෙහ තෙරණුවන් මේ ග්‍රන්ථයද තදනුරූපව රචිත බැව් පාඨකයන්ට නිරායාසයෙන් වැටහේ. පාලි භාෂාවෙන් රචිත පද්‍ය ග්‍රන්ථයන් ගැණ සලකන විට මේ සමන්තකූට වණ්ණනාව අසදෘශ ග්‍රන්ථයක් බැව් හැඟේ. එය උන්වහන්සේම ලියූ අතුලං යන විශේෂණය මීට යෝග්‍ය නොවන්නේ නොවේ.

5 **සවණා ලපනා චෙව–සතියා චාපි වන්දනා**
**යස්ස සම්මා සුඛී හොති–නිබ්බාණඤ්චාධිගච්ඡති.**

**අන්වය:–**යස්ස සවණා ලපනා චෙව සතියා ච අපි වන්දනා සම්මා සුඛී හොති නිබ්බාණං ච අධිගච්ඡති.

**පදාර්ථ:–**යස්ස, යම් බුදුකෙනෙකුන්ගේ; සවණා, (ගුණ) ඇසීමෙන්ද; ලපනා චෙව, (ගුණ) කීමෙන්ද, සතියාච, (ගුණ) සිහිකිරීමෙන්ද; අපි, නැවත; වන්දනා (යම් බුදුකෙනෙකුන්ට) වැඳීමෙන්ද; සම්මා, මනාකොට; සුඛීහොති, (යම්ගෙයකින්) කර්තෘතෙම සුව ඇත්තෙක් වේද; නිබ්බාණංච අධිගච්ඡති, නිවණටත් පැමිණේද;

**භාවාර්ථ:-** යමෙකුට සුවපත් වීමටත් නිවන් ලැබීමටත් බුදුන් වැඳීම බුදුගුණ කීම හා සිහිකිරීමත් හේතුවේ.

**ක්‍රි: ස:** සො සුඛී හොති. යොතිබ්බානඤ්ච අධිගච්ඡති යනුයි.

**ව: නා:** හොති (භූ-සත්තායං) යන වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛ පද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් සො යනු අධ්‍යාහෘත උක්ත ප්‍රකෘති කර්තෘයි සුඛී යනු උක්ත විකෘති කර්තෘයි.

අධිගච්ඡති (අධි පූර්ව ගමු ගතියං) යන වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් සො යනුම අධ්‍යාහෘත උක්ත කර්තෘයි නිබ්බාණං යනු අනුක්ත කර්මයි.

6 තස්මා සප්පුරිසෙහෙ'දං පසත්ථෙහෙ'ති තිසම්පදං
සවණීයං හි සාධූහි-අවික්ඛිත්තෙන චෙතසා.

**අන්වය:-** තස්මා තිසම්පදං පසත්ථෙනෙහි සප්පුරිසෙහි ඉදං සාධූහි අවික්ඛිත්තෙන චෙතසා සවණීයං හි.

**පදාර්ථ:-** තස්මා, එහෙයින්; තිසම්පදං, ත්‍රිවර්ගසම්පත්තිය; පසත්ථෙනෙහි, පතන්නාවූ; සප්පුරිසෙහි, සත්පුරුෂයන් විසින්; ඉදං, මේ ප්‍රකරණය; සාධූහි, ශොභන ධර්මයන් කාරණ කොට ගෙණ අවික්ඛිත්තෙන චෙතසා, අවික්ෂිප්ත චිත්තයෙන් යුක්ත ව; සවණීයන්හි, ඇසිය යුත්තේය.

**භාවය:-** එහෙයින් දෙව් මිනිස් නිවන් යන ත්‍රිවග සැපත් පතන්නනු විසින් මේ සමන් කුළු වරුණ එකඟ සිතින් ඇසිය යුතුමය.

**ක්‍රි: ස:** සප්පුරිසෙහි ඉදං සවණීයං (හොති).

**ව: නා:** සවණීයං යන කෘදන්ත ක්‍රියාවෙන් කියනලද හෙයින් ඉදං යනු උක්තනාමයි. සප්පුරිසෙහි යනු අනුක්ත කර්තෘයි.

**වි: විශෙෂ්‍ය:** සප්පුරිසෙහි යනු විශෙෂ්‍යයි. පසත්ථෙනෙහි යනු තුල්‍යාධිකරණ විශෙෂණයි. චෙතසා යනු විශෙෂ්‍යයි. අවික්ඛිත්තෙන යනු විශෙෂණයි.

**සමාස:-** තිසම්පදං, අවික්ඛිත්තෙන, සප්පුරිසෙහි.

**විග්‍රහ:-** තිණ්ණං සම්පත්තීනං සමාහාරො තිසම්පදං. න වික්ඛිත්තො අවික්ඛිත්තො තෙන අවික්ඛිත්තෙන. සන්තො පුරිසො සප්පුරිසො තෙහි සප්පුරිසෙහි.



**සම්බන්ධ:-** බුදුගුණ ඇසීම හා කීමත් සිහිකිරීමත් එසේම බුදුන් වැඳීමත් දෙලොව සැප ලැබීමට හා නිවන් සුව ලැබීමටත් උපයොගී වන බැව් දක්වා මේ සමන්තකූට වර්ණනා කාව්‍යය ශ්‍රවණය කිරීම හා කීමද යට දක්වූ ත්‍රිවර්ග සම්පත්තියම ලැබීමට හෙතුවන බැව් කිහ. එහෙයින් අවික්ෂිප්තවූ සිතින් යුක්තව මෙය ශ්‍රවණය කිරීමට අනුශාසනය කළහ.

**"තිසම්පදං"**

ස්වර්ග සම්පත්තිය
මනුෂ්‍ය ,,
නිර්වාණ ,, යන මොහු ත්‍රිවර්ග සම්පත්තීනුයි.

**"අවික්ඛිත්තෙන චෙතසා"**

(1) අවකුජ්ජ ප්‍රඥ (2) උච්ඡඞ්ග ප්‍රඥ (3) පුථු ප්‍රඥ යයි ශ්‍රවණය කරන්නෝ තිදෙනෙක් වෙත්.

i යටිකුරු කළ කළයක ජලය වත්කරන්නාක් මෙන් අධොමුඛ ප්‍රඥ ඇති පුද්ගලයාගේ ධර්මශ්‍රවණයෙන් ඔහුට කිසි ඵලයක් නොලැබේ. ඔහු අසා කිසිවක් සිත්හි රඳවා නොගන්නා හෙයිනි. මේ අවකුජ්ජ ප්‍රඥ පුද්ගල නම්වේ.

ii යමෙක් උච්ඡඞ්ගයෙහි (ඔඩොක්කුවෙහි) ඵල ආදියක් තබාගෙණ සිට ඒ පිළිබඳ සිහියක් නොමැතිව නැගී සිටීද, එවිට උච්ඡඞ්ගයෙහි (ඔඩොක්කුවෙහි) තිබුනු සියලුම ඵලසමූහය බිම පතිත වේ. එසේම බණ අසා නැගී යන විට එතැන්හිදීම සියල්ල අමතක කොට යන තැනැත්තා උච්ඡඞ්ග ප්‍රඥ පුද්ගල නම්.

iii යමෙක් අවික්ෂිප්ත ව ධර්මය අසා සිතේ තබාගණීද හේ පුථුප්‍රඥ පුද්ගල නම් වේ. මෙහිදී වෙදෙහ ස්වාමිපාදයන් අනුශාසනය කරණලද්දේද පෙරකී අවකුජ්ජ ප්‍රඥ උච්ඡඞ්ග ප්‍රඥ පුද්ගයන් මෙන් නොව පුථුප්‍රඥ පුද්ගලයා මෙන් අවික්ෂිප්ත ව මෙය ශ්‍රවණය කරණ ලෙසටය.

7 යො ලොකතිලකො නාථො-පූරෙත්වා දස පාරමී
ජාතොසි තුසිතෙ කායෙ-සන්තුසිතො'ති විස්සුතො.

**අන්වය:-** ලොකතිලකො යො නාථො දස පාරමී පූරෙත්වා තුසිතෙ කායෙ සන්තුසිතොති විස්සුතො ජාතො ආසි.

**පදාර්ථ:-** ලොකතිලකො, තුන්ලොවට තිලකයක් වැනිවූ; යො නාථො, යම් ස්වාමිකෙනෙක්; දසපාරමී, දසපාරමී ධර්මයන්; පූරෙත්වා, පුරා; තුසිතෙකායෙ, තුසිත දෙවනිකායෙහි; සන්තුසිතො ඉති, සන්තුසිත දිව්‍යපුත්‍රයා යයි; විස්සුතො, ප්‍රසිද්ධ වූයේ; ජාතො ආසි, උපන්නේ වීද;

**භාවය:-** කාම-රූප-අරූප යන තුන්ලොවට තිලකයක් සමාන බොධිසත්ත්වයන් දස පැරුම්දම් පුරා තුසී පුරයෙහි සන්තුසිත නමින් දෙව්රජ ව උපන්නේය.

**ක්‍රි: ස:** නාථො පාරමී පූරෙත්වා තුසිතෙ කායෙ ජාතො ආසි යනුයි.

**ද: නා:** ආසි (අස-භුවි) යන අජ්ජතනී විභක්ති කර්තෘකාරක පරස්සෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියාපදයා විසින් නමිත හෙයින් නාථො යනු උක්ත ප්‍රථමා කර්තෘයි. ජාතො යනු උක්ත විශෙෂ්‍ය කර්තෘයි. තුසිතෙ කායෙ යනු අනුක්තාධාරයි.

**වි: විශෙෂ්‍ය:** නාථො විශෙෂ්‍යයි. යො, ලොකතිලකො, සන්තුසිතොති විස්සුතො, ජාතො, තද්විශෙෂණයෝයි. කායෙ විශෙෂ්‍යයි, තුසිතෙ, තද්විශෙෂණයි.

**සමාස:** ලොකතිලකො දසපාරමී

**විග්‍රහ:** ලුජ්ජති පලුජ්ජතීති ලොකො (ලුජ-නාසෙ). තිලකො විය තිලකො, ලොකස්ස තිලකො ලොකතිලකො පරමානං භාවො තමමං වා පාරමී දස ච තා පාරමියො චාති දසපාරමියො

**පරිභාෂා:** "ලොකතිලකො" තිලක නම් නළල මැද සිරියල් ආදියෙන් තබන තිත්තුවකි. සියලු අබරණින් සැරසී පසුවම කරණුයේ තිලක තැබීමයි. තිලක තැබීමෙන් පසු මුහුණේ ඇතිවන ශොභාව සිත්ගන්නා සුලුය. දඹදිව වැස්සන් අතර මෙය ඉතා පෙර සිට පැවත එන චාරිත්‍රයකි. ලංකාවේ ද්‍රවිඩයන් අතරද මෙය පවතී. ඒ ඒ කුලයන් හඳුනා ගැනීමටද කෙතුවත අයුරින් තිලකය තැබීමට පිළියෙල කරගන්නා ලද්දේ උසු කුලභෙදයෙන් වෙලි සිටින දඹදිව වැස්සන් විසිනි. තිලකය ඉතා ආදරයෙන් සැලකීමට පුරුදුවූයේ ඉතා පෙරසිටය. ඒ නිසා යමෙක් ලොකයාගේ ගෞරවාදරයට පාත්‍රවූයේ නම් ඌ ලොවට තිලකයක් වැනියයි කියති.

තථාගතයන් වහන්සේද මුළුලොවම ප්‍රියවූ දෙවිමිනිසුන් විසින් භක්තිප්‍රණාමයෙන් සලකනු ලබන උතුමෙකි. එහෙයින් උන්වහන්සේ ලොවට තිලකයක් වැනිසේක.



**දස පාරමී.**

පරම සංඛ්‍යාත බෝසත් උතුමන්ගේ ස්වභාව හෝ ක්‍රියාව පාරමී නම් වේ. බුද්ධභාවය ලබාගැනීම පිණිස සියලුම බෝසත්හු පාරමී ධර්මයන් පූරණය කෙරෙති. ඒ පාරමිතාවෝ දස දෙනෙක් වෙති. විස්තර වශයෙන් සමතිසකි. ඒ මෙසේයි

(1) දාන පාරමිතාව (2) සීල පාරමිතාව (3) නෙක්ඛම්ම පාරමිතාව (4) පඤ්ඤා පාරමිතාව (5) විරිය පාරමිතාව (6) ඛන්ති පාරමිතාව (7) සච්ච පාරමිතාව (8) අධිට්ඨාන පාරමිතාව (9) මෙත්තා පාරමිතාව (10) උපෙක්ඛා පාරමිතාව යනුයි.

මේ දසයම දාන පාරමී
දාන උප ,,
දාන පරමාර්ථ ,, යනාදී වශයෙන් එකක් එකක් තෙපරිද්දකින් වැඩිවීමෙන් පාරමීහු සමතිසක් වෙත්.

**"තුසිතෙ කායෙ"**

කාය ශබ්දය මෙහි සමූහයෙහි වැටේ. තුසිත යනු සදෙව් ලොවින් එකක නමෙකි, එහි පිහිටීම මෙසේය.

මිනිස් ලොව සිට යොදුන් දෙසාළිස් දහසක් (42000) උස්වූ තැන යුගන්ධර පර්වතය මස්තකයෙහි චාතුර්මහාරාජික දිව්‍ය ලොකය පිහිටියේය. එයින් දෙසාළිස් දහසක් යොදුන් (42000) මතුයෙහි සුමෙරු මස්තකයෙහි ත්‍රායත්‍රිංශත් දිව්‍යලොකය පිහිටියේය. ඉනින් උපරිස්ථානයෙහි පිහිටි දෙව්ලොව යාම දිව්‍ය ලොකයයි. තුෂිත දෙව්ලොව පිහිටියේ යාම දෙව්ලොවටත් මතු යෙහිය. මේ දෙව්ලෝ මතුයෙහි ක්‍රමයෙන් නිර්මාණරතී පරනිර් මිත වසවර්තියයි අන්‍යවූ ද, දෙව්ලෝ දෙකක් පිහිටා තිබේ.

සියලුම බොධිසත්වයෝ පැරුම් පුරා බුදුවන ආත්ම භාවයට මුල් ආත්මභාවයේ තුෂිත පුරයෙහි ඉපිද සැප විඳිති මේ තුෂිත දෙව් සමූහය අතර අප බෝසත් තුමාද සන්තුෂිත නමින් උපනි.

8 ආරාධිතො සුරාදීහි-කාලො මාරිස තෙ අයං
තිණ්ණො තාරයිමං ලොකං-බහූ අප්පරජක්ඛකා.

එතදත්ථාය තෙ වීර-පූරිතා දස පාරමී
බාහුං පිතුස්ස පූතොකාව-ලොකො ආලම්බතෙ තුවං.

**අන්වය:-** මාරිස තෙ අයං කාලො තිණ්ණො ඉමං ලොකං තාරය අප්පරජක්ඛා බහූ (හොන්ති).

වීර තෙ එතදත්ථාය දසපාරමී පූරිතා පිතුස්ස බාහුං පුත්තො ලොකො තුවං ආලම්බතෙ සුරාදිහි ආරාධිතො.

**පදාර්ථ:-** මාරිස, නිදුකානන් වහන්ස; තෙ, නුඹවහන්සේට; අයං කාලො, මේ කල් වන්නේය; තිණ්ණො, සසරින් එතරවූයේ; ඉමං ලොකං, මේ ලෙව් වැසි ජනයා; තාරය, සසරින් එතර කරව; අප්පරජක්ඛකා, ප්‍රඥ චක්ෂුසෙහි අල්පවූ රාගාදි රජස් ඇත්තෝ; බහූ (හොන්ති), බොහෝ වෙත්.

**වීර,** වීරයන් වහන්ස; තෙ, නුඹවහන්සේ විසින්; එතදත්ථාය, මේ අර්ථය පිණිස; දසපාරමී, දානාදි දසපාරමී ධර්මයෝ; පූරිතා, පුරණ ලද්දාහ; පිතුස්ස බාහුං, පියා අත (එල්බෙන්නාවූ); පුත්තො ඉව, පුතෙකු මෙන්; ලොකො ලෝවැසි තෙම; තුවං, නුඹවහන්සේ; ආලම්බතෙ, එල්බෙයි (යයි); සුරාදිහි, දිව්‍ය බ්‍රහ්මාදීන් විසින්; ආරාධිතො, ආරාධනය කරණලද්දේය.

**භාවය:-** නිදුකානනි! ඔබවහන්සේට බුදුවීමට මේ කාලයයි. සසරින් එතර වූවෙක්ව මේ ලෝ වැසි ජනයාද සසරින් එතර කරණු මැනව. ප්‍රඥාචක්ෂුසෙහි ස්වල්පවූ රාගාදී රජස් ඇත්තෝ බොහෝ සිටින්නාහ.

වීරයන් වහන්ස! ඔබවහන්සේ විසින් මේ බුදුබව පිණිසම දසපාරමී ධර්මයෝ පුරණලදහ. පියෙකු අත එල්බෙන පුතකු මෙන් ලෝවැස්සා නුඹවහන්සේ වෙත එල්බේයයි දෙව් බඹුන් විසින් ආරාධනය කරණ ලද්දේය

**ක්‍රි:** ස: මාරිස තෙ අයං කාලො භවති, තිණ්ණො ඉමං ලොකං තාරය බහූ අප්පරජක්ඛකා (හොන්ති) යනුයි.

උ: නා: භවති (භූ-සත්තායං) යන අධ්‍යාගෘත වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්සෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් කාලො යනු උක්ත කර්තෘයි. මාරිස යනු සම්බොධනයයි. තෙ යනු සම්බන්ධයි

තාරය (තර-සන්තරණෙ) යන පඤ්චමී විභක්ති කර්තෘ කාරක ප්‍රයොජ්‍ය පරස්සෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් තිණ්ණො යනු උක්ත කර්තෘයි. ලොකං යනු අනුක්ත කර්මයි.



හොන්ති (භූ-සත්තායං) යන අධ්‍යාගෘත වර්තමානාවිභක්ති කර්තෘ කාරක පරස්සෙපද ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් අප්පරජක්ඛකා යනු උක්ත කර්තෘයි.

**ක්‍රි:** ස: "වීර එතදත්ථාය තෙ දසපාරමියො පූරිතා (හොන්ති) ලොකො තුවං ආලම්බතෙ සුරාදිහි යො ආරාධිතො (හොති) යනුයි

පූරිතා යන කර්මකාරක කෘදන්ත ක්‍රියාව විසින් කථිත හෙයින් තෙ යනු කර්තෘයෙහි අනුක්ත ෂෂ්ඨියි දසපාරමියො යනු උක්ත ප්‍රකෘති කර්මයි. පූරිතා යනු උක්ත විකෘති කර්මයි. වීර යනු සම්බොධනයි. එතදත්ථාය යනු තාදර්ථයෙහි චතුර්ථියි.

ආලම්බතෙ (ආ පුබ්බ-ලම්බ-ගතියං) යන වර්තමාන විභක්ති කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියාපදයා විසින් කථිත හෙයින් ලොකො යනු උක්තකර්තෘයි. තුවං යනු අනුක්ත කර්මයි.

**වි:** විශෙෂ්‍ය: කාලො යනු විශෙෂ්‍යයි. අයං යනු විශෙෂණයි. ලොකං යනු විශෙෂ්‍යයි. ඉමං යනු විශෙෂණයි. අප්පරජක්ඛකා යනුවිශෙෂ්‍යයි. බහූ යනු විශෙෂණයි.

**සමාස:** සුරාදිහි, අප්පරජක්ඛකා, එතදත්ථාය, දසපාරමී.

විග්‍රහ: සුරා ආදී යෙසං තෙ සුරාදයො තෙහි, අප්පං රජං අප්පරජං අක්ඛීසු අප්පං රජං යෙසං තෙ අප්පරජක්ඛා අප්පරජක්ඛා එව අප්පරජක්ඛකා, එසො අත්ථො එතදත්ථො තාය එතදත්ථාය.

**පරිකථා:** "සුරාදිහි ආරාධිතො" බෝසතුන් තුසිත දෙව් ලොව දෙව්සැපත් අනුභව කරමින් සිටිත කල්හි දස දහස් සක්වළ දෙව්බඹහු බුදුවනු සඳහා මිනිස්ලොව ඉපදීමට මෙසේ ආරාධනා කළහ.

**කාලොයංතෙ මහාවීර-උප්පජ්ජ මාතු කුච්ඡියං**
**සදෙවකං තාරයන්තො-බුජ්ඣස්සු අමතං පදං.**

"පින්වත් මහා වීරය මේ වනාහි නුඹවහන්සේගේ කාලය වෙයි. මාතෘ කුක්ෂියෙහි ඉපිද දෙවගණයා සහිතවූ (ලොකයා) මතු සසරින් තාරණය කරන්නේ (නිර්වාණ සංඛ්‍යාතවූ) අමෘත පදය අවබොධ කළ මැනවි යනුයි.

"තිණ්ණො" සියලු කෙලෙසුන් නසා චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කර ගැනීමෙන් සංසාරෞඝය ලබාගැනීම සඳහා තිණ්ණාසි කියනලදී.

"අප්පරජක්ඛා" ලොකයෙහි අප්ප රජක්ඛ=මහා රජක්ඛ පුද්ගලයෝ සිටිත්. අල්ප රජක්ඛයෝ නම් ප්‍රඥා චක්ෂුසෙහි ස්වල්පවූ රාගාදී කෙලෙස් ඇත්තෝයි. පෙර බුදුවරයන් හමුව පින්දහම් කොට කෙලෙස් බල බිඳ නැණින් හා පිණින් මේරූ පුද්ගලයෝයි. ඔවුනට ධර්මාවබොධය කරලීම සුකරය. හිරු රැස් වැටුනු පියුම් කැකුළු මෙන් බුදු කෙනෙකුන් වෙතින් දහම් ඇසීමෙන් මගපල පිළිවෙළින් නිවන් සුව ලබාගැනීමට ඔව්හු සමර්ථ වෙත්.

මහා රජක්ඛ නම් ප්‍රඥාචක්ෂුසෙහි බහලවූ රාගාදී කෙලෙස් ඇත්තෝයි. ඔවුනට ධර්මාවබොධය දුෂ්කරය.

"බාහුං පිතුස්ස පුත්තොව—ලොකො ආලම්බතෙ තුවං"

පියෙකු අත එල්බෙන පුතෙකුමෙන් ඔබ හමුවන තුරු ඔබගෙන් පිහිටක් ලබාගැනීම සඳහා ලොවැසි ජනයා බලාපොරොත්තුවෙන් සිටිති. බුදු කෙනෙකුන්ගේ පහළවීම අපේක්ෂා කරණ ජනයා ඔබ ගැණ නොඉවසිල්ලෙන් සිටිති. බෝසතුන්ට මිනිස් ලොව ඉපදීමේ අභිලාෂය ජනවනු සඳහා මෙසේ කීහ.

**10 තෙසං තං වචනං සුත්වා-මහාසත්තො මහාමතී**
**විලොකනෙ විලොකෙත්වා-පඤ්චාමලවිලොචනො.**

**අන්වය:-** මහාමති අමවිලොචනො මහාසත්තො තෙසං තං වචනං සුත්වා පඤ්ච විලොකනෙ විලොකෙත්වා.

**පදාර්ථ:** මහාමති, මහත් නුවණ ඇති; අමලවිලොචනො, නිර්මල ප්‍රඥා චක්ෂුස්ඇති; මහාසත්තො, ඒ මහාබොධිසත්වතෙම; තෙසං, ඔවුන්ගේ; තං වචනං, ඒවචනය; සුත්වා, අසා; පඤ්චවිලොකනෙ, පස්බැලුම්; විලොකෙත්වා, බලා;

**භාවය:** මහ පිණැති ඒ බෝසත් තෙමේ ඒ දෙවිබඹුන්ගේ වචන අසා පස් මහබැලුම් බලා (මෙය 24වෙනි ගාථාව හා සම්බන්ධයි)

**විශෙෂණ විශෙෂ්‍ය:**

මහාසත්තො විශෙෂ්‍යයි. මහාමති- අමලවිලොචනො තද්විශෙෂණයෝයි. වචනං විශෙෂ්‍යයි. තෙසං භින්නාධිකරණ විශෙෂණයි.



**සමාස:-** මහාසත්තො, මහාමති, අමලවිලොචනො,

**විග්‍රහ:-** මහන්තො ච සො සත්තො චාති මහාසත්තො මහතී මති යස්ස සො මහාමති, අමලානි විලොචනානි යස්ස සො අමලවිලොචනො.

**පරිකථා:-** මහාසත්තො- මහත්වූ වීර්‍ය්‍ය ගුණාදියෙන් හා අධ්‍යාශය මහත්බැවින්ද දස පෙරුමන් සපිරීමෙන්ද සෙසු සත්නට වඩා මහත්නුයි බෝසත්වරු මහසත් නාමයට සුදුසුවෙත්.

**මහාමති.**

බෝසත්වරු ස්වභාවයෙන් මහ නැණැතියෝය. සේනක මහෞෂධ ආදී ජාතීන්හි පළවුණු බෝසතුන්ගේ නුවණ අතිශය විශ්මය ජනකය. හේ ප්‍රඥා පාරමිතා පූරණයෙන් අතිශයින් මහත්විය.

**විලොකනෙ විලොකෙත්වා.**

බුදුවීමට කලැයි දෙව් බඹුන් විසින් ආරාධිත බෝසත් තෙමේ පස් මහ බැලුම් බැලීය.

**කාලං දීපං ච දෙසං ච - කුලං මාතරමෙවච**
**එතෙ පඤ්ච විලොකෙත්වා - උප්පජ්ජන්ති තථාගතා.**

(1) කාලය, (2) දෙසය, (3) දීපය, (4) කුලය, (5) මව්ය යනපස පස් මහ බැලුම් නම් වේ.

**(1) කාලය,** මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු සියයට වඩා ඌනවද අවුරුදු ලක්‍ෂයකට වඩා අධිකවද පවත්නා කල්හි බොධිසත්ව වරු බුද්ධත්වය සඳහා මිනිස් ලොව නූපදිත්. අප බොධිසත්වයන් වහන්සේ අවුරුදු (100) සියයට පරමායුෂ පවත්නා කාලයෙහි මිනිස් ලොව උපන්හ.

**(2) දෙසය,** බුදුවනු සඳහා උපදනා බෝසත්හු මධ්‍ය දෙශයෙහි විනා අන් පෙදෙසක නූපදිත්. ඒ මධ්‍යදෙශයෙහි සීමාවෝ මෙසේ වෙත්. නැගෙනහිරින් කජංගල නම් නිගමද. ගිනිකොණින් සරලවතී ගඟද, බස්නාහිරින් ථූන නම් බමුණුගමද, උතුරින් උසිරද්ධජ නම් පර්වතයද යන මොහුයි.

මෙකී සීමාවලින් පරික්ෂිප්ත වූයේ මිහිඟු බෙරයකට සමාන සටහන් ඇත්තේද වේ. මේ මධ්‍යදෙශය මහා මණ්ඩල යන නාමයෙන්ද ප්‍රසිද්ධය.

**(3) දීපය,** චාතුර් මහාද්වීපයන් අතුරෙන් ජම්බුද්වීපයෙහිම සියලු බුදුවරු උපදිත්. අන් දිවයිනක කිසි කලෙක බුදුවරු නූපදිත් මැයි.

**(4) කුලය,** බුදුවන කාලයේදී ලොව පවත්නා උසස් කුලයෙහිම ඉපදීම බෝසතුන්ගේ ධර්මතාවෙකි. ඇතැම් කාලයන්හි බමුණු කුලය සියලු කුලයනට වඩා ශ්‍රෙෂ්ඨ කොට සලකනු ලැබේ. සමහර කාලවලදී ක්‍ෂත්‍රිය කුලය උසස් කොට සලකනු ලැබේ. අප බෝසතුන් උපදින කල ක්‍ෂත්‍රිය කුලය උසස් කොට සලකන ලද හෙයින් උන් වහන්සේ ක්‍ෂත්‍රිය කුලයෙහි උපන්නේය.

**(5) මාතෘ,** තමන් වහන්සේට පිළිසිඳ ගැණීමට සුදුසු මාතෘ කුක්ෂියක් පිරික්සීම පස්වෙනි විලොකනයයි. බෝසතුන් ඉපදී සත්දිනකින් බෝධිසත්ව මාතාවගේ මරණය සිදුවීම ස්වභාවයකි. එහෙයින් බෝසත් උපදින කුස අන් කුමර කුමරියකුට පිළිසිඳ ගැණීමට අවකාශ නැත්තේය.

එහෙයින් තමන් වහන්සේගේ ප්‍රතිසන්ධියට සුදුසු කල්වයස් පිරිපුන් උත්තමියක් ස්වකීය මාතෘන් ලෙස සැලකීමේදී මහාමායා බිසව උන්වහන්සේට දක්නට ලැබිණ

11 **ජම්බුදීපග්ග කමලෙ - කණ්ණිකාව මනොරමා**
**පුරී කපිලවත්ථු'සි - විසාණාව සුධාසිනං.**

**අන්වය:-** ජම්බුදීපග්ග කමලෙ මනොරමා කණ්ණිකා ඉව සුධාසිනං විසාණා ඉව කපිල වත්ථු පුරී ආසි.

**පදාර්ථ:-** ජම්බුදීප, දඹදිව් නමැති; අග්ග කමලෙ, උතුම් පියුමෙහි; මනොරමා, සිත්කළුවූ; කණ්ණිකා ඉව, කෙමියක් වැනිවූද; කපිලවත්ථු, කිඹුල්වත් නම්; පුරී, නගරියක්; ආසි, වූ;

**භාවය:-** දඹදිව් නමැති පියුමෙහි කණිකාවක් වැනිවූද දෙවියන්ගේ විසාණා නම් නුවර වැනිවූද කිඹුල්වත් නම් වූ පුරියක් වූවාය.

**ක්‍රියා කාරක පදසම්බන්ධ:**

ජම්බුද්පගග කමලෙ කණ්ණිකා ඉව කපිල වත්ථු පුරී ආසි යනුයි.



**උ: කා:** ආසි යන (අස-භූවි) අජ්ජතනී විභක්ති කත්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් පුරී යනු උක්ත කර්තෘ යි ජම්බුදීපග්ග කමලෙ යනු අනුකතාධාරයි. කණ්ණිකා යනු තදුපමානයි.

**විශෙෂණ විශෙෂ්‍ය:**

පුරී විශෙෂ්‍යයි. කපිලවත්ථු තද්විශෙෂණයි කණ්ණිකා යනු විශෙෂ්‍යයි මනොරමා යනු තද්විශෙෂණයි.

**සමාස:-** ජම්බුදීපග්ගකමලෙ කපිලවත්ථු.

**විග්‍රහ:-** ජම්බුයා පඤ්ඤාතො ලක්ඛිතො දීපො ජම්බුදීපො අග්ගංච තං කමලංචෙති. අග්ග කමලං ජම්බුදීපො එව අග්ග කමලං ජම්බුදීපග්ගකමලං තස්මිං, කපිලස්ස නිවාසට්ඨාන භූතා වත්ථු කපිල වත්ථු.

**පරිකථා:-** ජම්බුදීප- හිමාලයෙහි පිහිටි කල්පස්ථායි දෙව් රුකක්වූ ජම්බු වෘක්ෂයෙන් ලක්ෂිත වූ ද්වීපය ජම්බුද්වීප නම්. දැන් ඉන්දියා නමින් ප්‍රසිද්ධවූ දෙශයයි. බුද්ධාදී උතුමන්ට ජන්මභූමි නොවන හෙයින් සුලුකොට සැලකීමෙන් දඹදිවින් බාහිර රට වල් ජම්බුද්වීපයාගේ පිරිවරවූ කොදෙව්යයි කියන ලදහ. දඹදිව යොදුන් දසදහසක් (10000) විශාලය. මහාමණ්ඩල-මධ්‍යමණ්ඩල-අන්තා මණ්ඩල යයි කොටස් තුනකට බෙදන ලදී. මහා මණ්ඩලය යොදුන් 900 කි. මධ්‍ය මණ්ඩලය යොදුන් 600 කි. අන්තා මණ්ඩලය යොදුන් 300 කි.

**කපිලවත්ථු.**

කපිලවාස්තු පුරය **රොහිණී** නදිය අසබඩ පිහිටියේය. මෙය ශාක්‍ය ජන පදයේ අගනුවරයි. අතීතයෙහි වුසූ බෝසත් **කපිල** ඍෂිහුගේ'වාසස්ථානයෙහි ඉදිකළ හෙයින් කපිල වාස්තු නම්විය. මෙයින් සැවැත් පුරයට දුර යොදුන් 15 ක් පමණය. රජගහ නුවරට යොදුන් 60 ක් පමණය. කපිල වාස්තු පුරයට දැන් පදරියා යි ව්‍යවහාර කරත්. රොහිණී නදිය කොහානා යන නමින් ප්‍රසිද්ධයි.

**විසාණා.**

කුවෙර රජහුගේ රාජධානිය විසාණ නම්. එහෙයින් ඒ රජ වෛශ්‍රවණය යි කියනු ලැබේ. කුවේර තෙමේ මහා නිධාන වලින් පිරුණු ධන ධාන්‍යාදීයෙන් අනූනවූ නගරයක අධිපතියාය යනු ප්‍රසිද්ධය ඔහුගේ පුරය සියලු යස ඉසුරෙන් බබලයි.

දඹදිව පියුමකට උපමා කොට කිඹුල්වත් පුරය එහි කෙමි යට සමාන කරණ ලදී. කෙමිය මධ්‍ය මණ්ඩලයෙහි පිහිටා තිබේ. එහෙයින් මේ උපමා උපමෙය සම්බන්ධ අතිශයින් යොග්‍ය වේ. පද්මොපමාවෙන් කිඹුල්වත් පුරයගේ අතිශය ශ්‍රෙෂ්ඨත්වය හැඟවූහ.

12 සිඞ්ගී නික්ඛමයාභාස – තුඞ්ගසිඞ්ගසමඩ්ඪිතො
මණිසීහ පඤ්ජරාකිණ්ණා – පාසාදා යත්ථ භාසරෙ.

**අන්වය:-** යත්ථ සිඞ්ගී නික්ඛමය, ආභාස තුඞ්ග සිඞ්ග සමඩ්ඪි තො මණිසීහ පඤ්ජරා කිණ්ණ පාසාදා භාසරෙ.

**පදාර්ථ:-** යත්ථ, යම් පුරයෙක්හි; සිඞ්ගිනික්ඛමයා, සිඟි වර්ණ යෙන් කරනලද්දාවූ; ආභාස, ආලොක ඇත්තාවූ; තුඞ්ග, උස්වූ; සිඞ්ග, ශෘඞ්ගයෙන්, සමඩ්ඪිතො, යුක්තාවූ; මණිසීහ පඤ්ජර, මිණිසි මැදුරෙන්; ආකිණ්ණා, ගැවසී ගත්තාවූ; පාසාදා, ප්‍රාසාද යෝ; භාසරෙ, බබලත්ද?

**භාවය:-** යම් පුරයෙක්හි සිඟි සවර්ණයෙන් කළ ආලොකවත් උස්වූ කොත්වලින් යුක්තවූ මණිමය සීමැදුරු කවුළු වලින් ගැවසීගත්තාවූ ප්‍රාසාදයෝ බබලත්ද.

**ක්‍රියා කාරක පද සම්බන්ධ:**

යත්ථ පාසාදා භාසරෙ යනුයි.

**උ: කා:** භාසරෙ යන (භාස-දිත්තියං) වර්තමානා විභක්ති කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් පාසාද යනු උක්ත කර්තෘ යි. යත්ථ යනු ආධාරයි.

**වි: විශෙෂ්‍ය:** පාසාද විශෙෂ්‍යයි. සිඞ්ගිනික්ඛමයාභාසතුඞ්ග සිඞ්ගසමඩ්ඪිතො මණිසීහපඤ්ජරාකිණ්ණා යනු තද්විශෙෂණ යෝය.

**සමාස:** සිඞ්ගිනික්ඛමයාභාස, තුඞ්ග සිඞ්ග සමඩ්ඪිතො මණි සීහපඤ්ජරා කිණ්ණා.

**විග්‍රහ:** සිඞ්ගිච සො නික්ඛො චාති සිඞ්ගිනික්ඛො තෙන කතං සිඞ්ගිනික්ඛමයං තස්ස 'ආභාසො සිඞ්ගිනික්ඛමයාභාසො තුඞ්ගානිච තානි සිඞ්ගානි චෙති තුඞ්ග සිඞ්ගානි සිඞ්ගිනික්ඛමයා



භාසානි තුඞ්ගසිඞ්ගානි සිඞ්ගිනික්ඛමයාභාසතුඞ්ග සිඞ්ගානි තෙහි සමඩ්ඪිතො සිඞ්ගිනික්ඛමයාභාස තුඞ්ගසිඞ්ගසමඩ්ඪිතො සීහ රූප යුත්තානි පඤ්ජරානි සීහ පඤ්ජරානි මණීහි කතානි සීහ පඤ්ජරානි මණිසීහපඤ්ජරානි තෙහි ආකිණ්ණා මණිසීහ පඤ්ජරා කිණ්ණා.

**පරිකථා:-** "සිඞ්ගිනික්ඛමය" නික්ඛ යනු (5) පස් කළඳට හා රත්රන් වලට නමකි. මෙහි නික්ඛ ශබ්දය සවර්ණවාචී වේ. සිඞ්ගි යනු උතුම් රුවන් වෙසෙසෙකි. මේ රුවණින් කරණලද උස්වූ කොත්වලින් හා සීමැදුරු කවුළුවලින්ද ඒ නගරයෙහි ප්‍රාසාදයෝ බබලන්නාහ.

"සීහපඤ්ජර"

සීමැදුරු කවුලු පුරාණ රාජාදී උතුමන්ගේ ප්‍රාසාදවල මස්තකයෙහි නගරය අවට පෙනෙනසේ සාදනු ලබන ප්‍රාසාදඞ්ගයක කවුළුවට නමකි. සීහ ශබ්දය ශ්‍රෙෂ්ඨාර්ථ යෙහිද වැටේ. සීහ පඤ්ජර නම් සිංහයාගේ ඉල ඇට පෙලයි. එවැනි කොට කරණ ලද කවුලුවද සීහපඤ්ජර නමැයි ඇතැමෙක් කියති.

13 සඝනෙ ගගනෙ නිච්චං-සතෙරත සතාහිව
අනිලෙරිතපජ්ජොත-සොණ්ණ කෙතු අහු යහිං.

**අන්වය:-** යහිං සඝනෙ ගගනෙ සතෙරතසතාහි ඉව අනිලෙරිතපජ්ජොතසොණ්ණකෙතූ නිච්චං අහූ.

**පදාර්ථ:-** යහිං; යම් නගරයෙක්හි, සඝනෙ, මෙඝසහිතවූ; ගග නෙ, අහස් තලෙහි; සතෙරතසතාහිඉව, සියගණන් විදුලි මැනිවූ අනිලෙරිත, සුළඟින් සෙලවුණු; පජ්ජොත, බබලන්නාවූ, සො ණ්ණකෙතු, සවර්ණධවජයෝ; නිච්චං, සතතයෙන්; අහු, වූද;

**භාවය:-** යම් නගරයක වලාකුල් සහිත අහස් තලෙහි බබලන සියගණන් විදුලි සෙයින් සුළඟින් සෙලවෙමින් නිතර බබලන සවර්ණධවජයෝ වූවාහුද.

**ක්‍රි: ය:** යහිං සොණ්ණකෙතු අහු යනුයි.

**උ: කා:** අහු (භූ-සත්තායං) යන අජ්ජතනී විභක්ති කර්තෘ කාරක පරස්සෙපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිතහෙයින් සොණ්ණකෙතු යනු උක්ත කර්තෘයි යහිං යනු අනුක්තාධාරයි,

**වි: විශෙෂ්‍ය:** ගගනෙ යනු විශෙෂ්‍යයි සඝනෙ විශෙෂණයි අනිලෙරිතපජ්ජොතසොණකෙතු උපමෙයයි. සතෙරත සතානි තදුපමානයි.

**සමාස:** සඝනෙ, සතෙරතසතානි, අනිලෙරිතපජ්ජොතසොණකෙතු.

**විග්‍රහ:** සහ ඝනෙහි යං වත්තතී තං සඝනං තස්මිං සඝනෙ සහතං ඊරති කම්පතීති සතෙරො තෙ එව සතෙරතා සතෙරතානං සතානි සතෙරතසතානි, අනිලෙහි ඊරිතා අනිලෙරිතා අනිලෙරිතා ච තෙ පජ්ජොතා චෙති අනිලෙරිතපජ්ජොතා, සොණෙහි කතා කෙතු සොණකෙතු අනිලෙරිත පජ්ජොතාව තෙ සොණකෙතු චාති අනිලෙරිතපජ්ජොතසොණකෙතු.

**පරිකථා:** වැසිවලාකුලින් ගැවසුණු අහසෙහි සිය ගණන් විදුලි පවත්නේ යම්සේද එසේම මේ කිඹුල් වත්පුර අහසද පහ මුදුන්වල සුළඟින් සෙලවෙන රතින් කළ ධජ කරණ කොට ගෙණ විදුලිසිරි උසුලයි. මෙයින් නගරයෙහි ප්‍රාසාද යන්ගේ ප්‍රාංශුභාවයත් ධජ රතින් නිර්මිතයයි කීමෙන් නුවරුන්ගේ ධනාඪ්‍යභාවයත් ධජයන් සියගණනකැයි කීමෙන් නුවරුන් නිරතුරුවම උත්සවශ්‍රීයෙන් කල් යවන බවත් හැඟවූහ. ධජ ඇදීමෙන් නුවර සරසනු ලබන්නේ උත්සවයනටය. ධජයන් සියගණන් වන්නේ එවිටය. මේ නුවරුනට සෑම දවස්හිම උත්සව පවතී. යම් රටක නිරතුරුව උත්සව පවත්නේ නම් ඒ රටේ පර සතුරු උවදුරු ඇතිනමත් සෞභාග්‍ය සම්පත්ති යත් එකසේ ප්‍රකාශ කෙරේ.

14 ජනානං නීල නෙත්තෙහි-වදනෙහි තු යා පුරී
මධුපාලි සමොනද්ධ-කඤ්ජිනී සිරිමාවහෙ.

**අන්වය:-** යා පුරී ජනානං නීල නෙත්තෙහි වදනෙහි තු මධුපාලි සමොනද්ධ කඤ්ජිනී සිරිං ආවහෙ.

**පදාර්ථ:-** යා පුරී, යම්පුරියක්; ජනානං, ජනයන්ගේ; නීලනෙත්තෙහි, නීලවර්ණ නෙත්‍රයෙන්ද; වදනෙහි තු, වක්ත්‍රයෙන්ද; මධුපාලි, භෘඞ්ග පඞ්ක්තීන් විසින්; සමොනද්ධ, ගැවසී ගත්තාවූ; කඤ්ජිනීසිරිං, පද්මිනී විලාසයක්; ආවහෙ, උසුලන්නීද;

**භාවය:-** යම් පුරියක් ජනයන්ගේ නිල් පැහැ ඇති නෙත් වලින් හා මුහුණු වලින් භ්‍රමර සමූහයා විසින් ගැවසුණු පියුම් විලක ශොභාව උසුලන්නීද.



**ක්‍රි: ස:** යා පුරී කඤ්ජිනී සිරිං ආවහෙ.

**උ: කා:** ආවහෙ (ආපූර්ව වහ-පාපුණනෙ)යන සත්තමී විභත්ති කර්තෘකාරක පරස්සපද ප්‍රථම පුරුෂ එකවචනාඛ්‍යාතක්‍රියා පදයා විසින් කථිත හෙයින් පුරී යනු උක්ත කර්තෘයි. මධුපාලි සමොනද්ධකඤ්ජිනීසිරිං යනු අනුක්ත කර්මයි.

**වි: විශෙෂ්‍ය:** පුරී විශෙෂ්‍යයි. යා විශෙෂණයි.

**සමාස:** නීලනෙත්තානි, මධුපාලිසමොනද්ධකඤ්ජිනීසිරිං.

**විග්‍රහ:** නීලානි ච තානි නෙත්තානි චාති නීලනෙත්තානි තෙහි, මධූනං පාලි මධුපාලි මධුපාලීහි සමොනද්ධා මධුපාලි සමොනද්ධා මධුපාලිසමොනද්ධා ච සා කඤ්ජිනී චාති මධුපාලි සමොනද්ධ කඤ්ජිනී තස්සා සිරි මධුපාලි සමොනද්ධ කඤ්ජිනීසිරි, තං මධුපාලි සමොනද්ධ කඤ්ජිනී සිරිං.

**පරිකථා:-** මේ ගාථාවෙන් කිඹුල්වත් පුරය පියුම් විලකට සමාන කරණ ලදී. පද්මයන්ගෙන් හා භෘඞ්ග ශ්‍රේණීන් ගෙන් යුක්ත වීම පියුම් විලක ලක්ෂණ දෙකකි. කපිල වස්තු පුර නැමති පද්මිනියගේ (පියුම් විලේ) ද මේ ලක්ෂණ පවතී. එහි පවත්නා පද්මයෝ නම් ස්ත්‍රී පුරුෂයන්ගේ මුහුණුය. භෘඞ්ගයෝ නම් නීල වර්ණ නෙත්‍රයෝය. මෙයින් නගරයේ ස්ත්‍රී පුරුෂයන්ගේ ශොභාතිශයය වර්ණනය කළහ.

15 රඞ්ග තුඞ්ග තුරඞ්ගෙහි-ගජ්ජිතෙහි ච යා පුරී
සඝොසුන්නතුඞ්ග කල්ලොල-ලොලසාගර සන්නිභා

**අන්වය:-** යා පුරී රඞ්ග තුඞ්ග තුරඞ්ගෙහි ගජ්ජිතෙහි ච සඝොසුන්නතුඞ්ග කල්ලොල ලොලසාගර සන්නිභා.

**පදාර්ථ:-** යා පුරී, යම් පුරියක්; රඞ්ග, නෘත්‍ය ග්‍රහණය කළාවූ; තුඞ්ග, උස්වූ; තුරඞ්ගෙහි ච, අසුන් කරණකොටගෙණද; ගජ්ජිතෙහි ච, (හස්ත්‍යාදීන්ගේ) ගර්ජනයෙන් ද; සඝොස, ඝොෂ සහිතවූ; උන්නතුඞ්ග, උස්ව නැගුනාවූ; කල්ලොල, රළ පතරින්; ලොල, චුලිතවූ; සාගර සන්නිභා, සමුද්‍රය සමාන වී ද;

**භාවය:-** යම් පුරියක් නැටුම් ගත් අශ්වයන් කරණ කොට ගෙණ ද හස්ති අශ්වාදීන්ගේ නාදය කරණ කොට ගෙණ ද හඬ නගා උස්ව පැන නැංගාවූ රළ පතරින් කැළඹුනු සාගරය සමාන වූවාද.

**ක්‍රි: ස:** යා පුරී සාගර සන්නිභා (ආසි).

උ: ස: ආසි (අස–භුවි) යන අධ්‍යාගෘත අජ්ජතනී විභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් පුරී යනු උක්ත ප්‍රථමා කර්තෘයි. සාගරසන්නිභා යනු උක්ත විකෘති කර්තෘයි.

වි: විශෙෂ්‍යා: පුරී විශෙෂ්‍යයි, සසොපුත්තුඞ්ගකල්ලෝල ලොලසාගරසන්නිභා යනු තුල්‍යාධිකරණ විශෙෂණයි

සමාස: රඞ්ගතුඞ්ගතුරඞ්ගනී, සසොපුත්තුඞ්ග, කල්ලෝල ලොලසාගරසන්නිභා.

විග්‍රහ: රඞ්ගාච තුඞ්ගාච රඞ්ගතුඞ්ගා, රඞ්ගතුඞ්ගාච තෙ තුරඞ්ගා චෙති රඞ්ගතුඞ්ගතුරඞ්ගා, තෙහි, සහ සොසෙති යෙ වත්තන්ති තෙ සසොසා. සසොසාච උත්තුඞ්ගාච සසොපුත්තුඞ්ගා. සසොපුත්තුඞ්ගා ච තෙ කල්ලෝලා චෙති සසොපුත්තුඞ්ග කල්ලෝලා. ලොලොච සො සාගරො චෙති ලොලසාගරො. සසොපුත්තුඞ්ගකල්ලෝලෙහි ලොලසාගරො, සසොපුත්තුඞ්ගකල්ලෝලලොලසාගරො, තස්ස සන්නිභා සසොපුත්තුඞ්ගකල්ලෝලලොලසාගරසන්නිභා.

පරිකථා:- ඇත් අස් ආදීන්ගේ නැටීමක් නැත්තේය. එහෙත් ජවයෙන් යුක්තවූ අශ්වයෝ නිරන්තරයෙන් ඔබ මොබ පැන ඇවිදිති. මෙය කාව්‍ය කර්තෘහු නැටීමක් ලෙස සැලකූහ. මේ නගරය දුවන්නාවූද පනින්නාවූද අශ්වයන්ගෙන් හා ඔවුන්ගේ හෙෂාරවයෙන්ද ශොභිත වූවා යම් සේ නගා උස්ව නැගෙන රළ පතිරින් ගැවසුණු මහ සයුර බඳු වූවාය.

මේ ගාථාවෙන් නගරයේ අශ්වයන් වැණූහ. ජවබල ආධික්‍යය හා ප්‍රාංශුත්වය ද උසස් අශ්වයන්ගේ ලක්ෂණයෝ වෙති. එහෙයින් මේ නගරය ශ්‍රෙෂ්ඨ අසරු හමුදුවකින් නිරතුරු යුක්තවූ බැව් මෙයින් කියැවිණි.

> අවහමානාව දෙවානං–පුරලබ්‍යා භුජා ඉව
> මන්‍දනිලෙරිතා තුඞ්ග–නානාරාගද්ධජා යහිං

අන්වය:- යහිං දෙවානං අවහමානා ඉව පුරලබ්‍යා භුජා ඉව මන්‍දනිල ඊරිතා තුඞ්ග නානා රාගද්ධජා (භාසන්ති)

පදාර්ථ:- යහිං, යම් නගරයෙක්හි; දෙවානං, දෙවියන්; අවහමානා ඉව, කැඳවන්නන් වැනි; පුරලබ්‍යා, නගරශ්‍රීයගේ; භුජා ඉව බාහුන් මෙන්; මන්‍දනිල, මන්‍දමාරුතයෙන්; ඊරිතා. කම්පිතවූ; තුඞ්ගා, උස්වූ; නානා රාගද්ධජා, නානා වර්ණධ්වජයෝ, (භාසන්ති, බබලත්ද;)



භාවාර්ථ:- යම් පුරයෙක්හි දෙවියන් කැඳවන්නන් වැනිවූ නගරශ්‍රීයගේ බාහුන් වැනිවූ මඳ සුළඟින් සෙලවෙන නන් පැහැති කොඩි බබලද් ද,

ක්‍රි: ස: යහිං තුඞ්ග නානා රාගද්ධජා (භාසන්ති).

උ: ස: භාසන්ති (භාස–දිත්තියං) යන අධ්‍යාගෘත වර්තමාන විභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් තුඞ්ගනානාරාගද්ධජා යනු උක්ත කර්තෘයි. යහිං යනු අනුක්තාධාරයි.

වි: විශෙෂ්‍ය: තුඞ්ගනානාරාගද්ධජා යනු විශෙෂ්‍යයි. අවහමානා භුජා මන්‍දනිලෙරිතා යනු තද්විශෙෂණයෝ වෙත්.

සමාස: පුරලබ්‍යා, මන්‍දනිලෙරිතා, තුඞ්ගනානාරාගද්ධජා.

විග්‍රහ: පුරී එව ලක්ඛි පුරලක්ඛි තස්සා, මන්‍දො ච සො අනිලො චෙති මන්‍දනිලො තෙන ඊරිතා මන්‍දනිලෙරිතා, අනෙකප්පකාරා රාගා නානාරාගා, නානාරාගා ච තෙ ධජා චෙති නානාරාගද්ධජා, තුඞ්ගා ච තෙ නානාරාගද්ධජා චෙති තුඞ්ගනානා රාගද්ධජා.

පරිකථා:- "පුරලක්ඛ්‍යා" මෙහි පුර සම්පත්තිය ලක්ෂ්මිය වශයෙන් සැලකූහ. ලක්ෂ්මී නම් ශ්‍රී කාන්තාවයි. ඕ විෂ්ණුහුගේ භාර්‍යාව ය. ශ්‍රී සෞභාග්‍යයට ද සම්පත්තියට ද ධනයට ද අධිපති දෙවතා මෝතොමෝය. යම් තැනෙක හෝ යමකු කෙරෙහි සම්පත්තිය හෝ සෞභාග්‍යය හෝ වේනම් එහි ශ්‍රී කාන්තාව සිටීයයි කියනු ලැබේ. කපිලවාස්තු පුරයෙහි සම්පත්තිය ඉතා විශාලය. ඒ සම්පත්තිය කොතරම් ද යතහොත් දෙවියන් පවා මෙහි කැඳවන තරම් අධිකව පවත්නීය. නගරයේ සෑම තන්හි ධ්වජයෝ නංවන ලදහ. එයද සම්පත්ත්‍යාධික්‍යය ප්‍රකාශ කිරීමේ ලකුණකි. සම්පත්තිය මූර්තිමත් (ශරීරවත්) වූවහොත් නගරයේ ධ්වජයෝ ඒ සම්පත්ති ශ්‍රීයගේ බාහුන් වැනියහ. ධ්වජයන් සුළඟින් සෙලවීම අත් වැනීමක් වැන්න. අත් වනන්නේ කුමට ද? දෙවියන් කැඳවීමටය. ඔවුන් මෙහි කැඳවනුයේ දෙව්ලොව සම්පත්තියට ද වඩා අධිකතර සම්පත්තියක් කපිලවාස්තු පුරයෙහි තිබෙන හෙයිනි. මේ කවිහු පුරසම්පත්තිය උත්ප්‍රෙක්ෂා කළ පරිදියි. මෙයින් නගරයේ ධනාඪ්‍යත්වය කීහ.

17 නානාවෙසධරා යස්මිං-නානා භූසන භූසිතා
නානා සම්පත්ති සංයුත්තා-නානා විජ්ජාසු පාරගා.

**අන්වය:-** යස්මිං නානාවෙසධරා නානා භූසණ භූසිතා නානා සම්පත්ති සංයුත්තා නානා විජ්ජාසු පාරගා (හොන්ති).

**පදාර්ථ:-** යස්මිං, යම් නගරයෙක්හි; නානාවෙසධරා, නානා වේසධාරීහුද; නානා භූසණ භූසිතා, නානාභරණයෙන් සැරසුනාහුද; නානා සම්පත්ති සංයුත්තා, නොයෙක් සම්පත්තියෙන් යුක්ත වූවාහුද; නානා විජ්ජාසු පාරගා, නොයෙක් විද්‍යාවන්හි පරතෙරට ගියාහුද; (හොන්ති, වෙත් ද).

**භාවය:-** යම් නගරයෙක නොයෙක් වෙස් දරන්නෝද නන් අබරණින් සැරසුණාහු ද නොයෙක් සම්පත්තියෙන් යුක්ත වූවාහු ද නොයෙක් විද්‍යාවන්හි පරතෙරට ගියාහුද වෙද්ද,

**ක්‍රි: ස:** යස්මිං නානාවෙසධරා (හොන්ති)
,, නානාභූසණ භූසිතා ,,
,, නානාසම්පත්ති සංයුත්තා ,,
,, නානාවිජ්ජාසු පාරගා ,,
යනුයි.

**උ. ක:** හොන්ති (භූ-සත්තායං) යන අඛ්‍යාත වත්තමානා විභක්ති කර්තෘ කාරක ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් නානාවෙසධරා යනු උක්ත කර්තෘයි. යස්මිං යනු අනුක්තාධාරයි. සෙස්ස සුගමයි.

**වි: විශෙෂණ:** සුගමයි.

**සමාස:** නානාවෙසධරා, නානාභූසණභූසිතා, නානා සම්පත්ති සංයුත්තා, නානා විජ්ජාසු.

**විග්‍රහ:** නානාප්පකාරා ච තෙ වෙසා චෙති නානාවෙසා නානාවෙසෙ ධාරෙන්තීති නානාවෙසධරා, නානප්පකාරානි භූසණානි, නානාභූසනානි, තෙහි භූසිතා නානාභූසණභූසිතා, නානප්පකාරා ච තෙ සම්පත්තියො චෙති නානාසම්පත්තියො තාහි සංයුත්තා නානාසම්පත්තිසංයුත්තා, නානප්පකාරා ච තා විජ්ජායො චාති නානාවිජ්ජායො, තාසු නානාවිජ්ජාසු.



**පරිකථා:** නානාවෙසධරා- මේ පුරයෙහි නොයෙක් වෙස් දරන්නෝ වූහ. මෙහි වෙස ශබ්දය ආකාරාර්ථයෙහි වැටේ, උස් මිටි ආදී වශයෙන් රූපයෙන් නොයෙක් ආකාරවත්වූ ද ඥාන ධන ගුණ ආදියෙන් නානා ආකාරවත්වූ ද ප්‍රභුත්වාදියෙන් යුක්තවූ දැයි යන මේ ආදී වශයෙන් නොයෙක් වෙස් දරන්නෝ එපුර සිටියහ.

**"නානා භූසණ භූසිතා"**

නොයෙක් රන් රිදී මුතු මැණික් ආදී අබරණින් සැරසුනෝ නානා භූෂණ භූෂිත යෝය.

**නානා සම්පත්ති සංයුත්තා"**

ධන ධාන්‍යාදී නොයෙක් සම්පත්තියෙන් අඩ්‍යවූවාහු නානා සම්පත්ති යුක්තයෝය.

**"නානා විජ්ජාසු පාරගා"**

නොයෙක් විද්‍යාවන් සම්පූර්ණයෙන් දතුවෝ "නානා විජ්ජාසු පාරගා" යි යෙති.

විද්‍යාවෝ අටළොසෙකි. (18) (1) ශික්‍ෂා (2) කල්‍ප (3) ව්‍යාකරණ (4) නිරුක්ති (5) ඡන්දස් (6) ජ්‍යොතිශ් (7) ඍග්වෙද (8) යජුර්වේද (9) සාමවේද (10) අථර්වේද (11) මීමාංසා (12) න්‍යාය (13) ධර්මශාස්ත්‍ර (14) පුරාණ (15) ආයුර්වේද (16) ධනුර්වේද (17) ගන්ධර්ව ශාස්ත්‍රය (18) අර්ථ ශාස්ත්‍රය යන මොහුයි. අති කුදු අෂ්ටාදශ විද්‍යාවක් දක්වත් එනම්:—

"ශ්‍රුතිස්මෘතිර්ව්‍යාකරණං ඡන්දො විචිති රෙවච
නිරුක්තිජ්‍යොතිශාං ශික්‍ෂා මොක්‍ෂ ඥානං ක්‍රියාවිධිඃ,
ධනුර්වේදො හස්ති ශික්‍ෂා කාමතන්ත්‍රඤ්ච ලක්‍ෂණං
පුරාණඤ්චාශ්වනීතිශ්ච තථා තර්කෝ'ථ වෛද්‍යකම්
වදන්ත්‍යෂ්ටාදශෛතානි විද්‍යාස්ථානානි පණ්ඩිතාඃ"
යනුවෙන් පැවසේ.

18 නවයොබ්බන උද්දාමා-රූපෙන ච මනොහරා
සංවෙච්ඡසු නිරතා නිච්චං-අනඞ්ගකුඩ්ඩ කුලා සියුං.

**අන්වය:-** නවයොබ්බන උද්දාමා රූපෙන මනොහරා ච නිච්චං සංවෙච්ඡසු නිරතා අනඞ්ගකුට්ඨ කුලා සියුං.

**පදාර්ථ:-** නවයොබ්බන, අභිනව යෞවනයෙන්; උද්‍රුමා, අතිශයින් උඩඟුවූවාහු ද; රූපෙන, රූප ශොභාවෙන්; මනොරමා ච, මනොඥවූවෝ ද; නිච්චං, නිරන්තරයෙන්; සචෙච්ඡු, සත්‍යයෙහි; නිරතා, ඇලුනාහු ද, අනක්කුට්ඨකුලා, ආක්‍රොශ නොකරණලද වංශවත්හුද; සියුං යම් පුරියක වෙද් ද;

**භාවය:-** රූප ශොභාවෙන් මනහරවූ යොවුන් බැවින් උඩඟුවූ තරුණියෝ ද සස් බස්නි ඇලුනාහුද වංශවත් උතුමෝ ද යම් නුවරෙක වාසය කෙරෙද් ද.

**ක්‍රි: ක:** යසමිං නවයොබ්බන උද්‍රුමා සියුං
,, රූපෙන මනොහරා ,,
,, සචෙච්ඡු නිරතා ,,
,, අනක්කුට්ඨ කුලා ,,

**උ: ක:** සියුං (අස-භුවි) යන සප්තමි විභක්ති කතෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනානාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කපිත හෙයින් නවයොබ්බනඋද්‍රුමා යනු උක්ත කතෘයි. යසමිං යනු අනුක්තාධාරයි. සෙස්සද මේ නයයි.

**වි: විශෙෂ්‍ය:** යුගමයි.

**සමාස:** නවයොබ්බන උද්‍රුමා, මනොහරා, අනක්කුට්ඨකුලා

**විග්‍රහ:-** යුවස්ස භාවො යොබ්බනං, නවංච තං යොබ්බනං චෙති නවයොබ්බනං නවයොබ්බනෙන උද්‍රුමා නවයොබ්බන උද්‍රුමා මනො හරන්තීති මනොහරා අකොසීයිත්ථාති අක්කුට්ඨානි න අක්කුට්ඨානි අනක්කුට්ඨානි, අනක්කුට්ඨානි කුලානි යෙසං තෙ අනක්කුට්ඨකුලා.

**පරිකථා:-** නවයොබ්බන උද්‍රුමා-යොබ්බන නම් යොවුන් බවයි. යොවුන් බව නම් තරුණ කමයි. ඒ තරුණ කම අලුත්වූ වස් වනවිට අතිශයින්ම ගව් සහිතය. පුරුෂයකු උද්‍රුම වන මද-යෞවන මදය-වස්තු මදය-ආරොග්‍ය මදය යනාදී වශයෙන් (16) සොළසකි. උද්‍රුම නම් ස්වභීය සීමාව පැනයාමයි. සීමොල්ලංඝනය විනාශයට හේතුය. එහෙත් යොවුන් විශෙෂිදී ඇතිවන උද්‍රුමය වළකාලීම දුෂ්කරය. කපිලවාස්තුවෙහි තරුණයෝද මේ නව යොවුනෙන් උද්‍රුමයෝය. මේ නගරය මොවුන්ගෙන්ද හැඩසී ගත්තේය.



අනක්කුට්ඨ කුලා.

ජාති වාදයෙන් ආක්‍රොශ නොකරණ ලද්දවූ කුලයෝ අනක්කුට්ඨ කුල යෝ නම් වෙත්. ඔවුහු නම් වංශවත්හුය. කපිල වාස්තුයෙහි වුසූ වංශවතුන්ට ජාතියෙන් පහත්ය කියා හෝ සකිලිටය කියා හෝ නොපැරණිය කියා හෝ කිසිවෙකුට ආක්‍රොශ (නින්ද) නොකළ හැක

19 නිච්චං ඛිලා විදද්ධාගී - නරනාරීහි සෙවිතා
යා පුරී සාධු රූපා'සි - මධුරාලාපිනීහි ච.

**අන්වය:-** යා පුරී නිච්චං ඛිලා විදද්ධාහි නරනාරීහි මධුරාලාපි නීහි ච සෙවිතා සාධුරූපා ආසි.

**පදාර්ථ:-** යා පුරී, යම් පුරියක් තොමෝ; නිච්චං, නිරන්තර යෙන්; ඛීලා විදද්ධාහි, ක්‍රීඩාවන්හි දක්ෂවූ; නරනාරීහි, පුරුෂස්ත්‍රීන් විසින්ද; මධුරාලාපිනීහි ච, මියුරු ගී කියන්නන් විසින්ද; සෙවිතා, සෙවුනා ලද්දී; සාධුරූපා ආසි, මනොහර රූප ඇත්තියක් වූවාද;

**භාවය:-** යම් නගරියක් නිරතුරු ක්‍රීඩාවන්හි නිපුණවූ නර නාරීන්ගෙන් හා මියුරු ගී කියන ස්ත්‍රීන්ගෙන් මනහරවූවාද,

**ක්‍රියා කාරක පද සම්බන්ධ:-**

යාපුරී සාධුරූපා ආසි යනුයි.

**උ: ක:** ආසි (අස-භුවි) අජ්ජතනී විභක්ති කතෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ එකවචනානාඛ්‍යාත ක්‍රියාපදයා විසින් උක්ත හෙයින් පුරී යනු උක්ත ප්‍රකෘති කතෘයි සාධුරූපා යනු උක්ත විකෘති කතෘයි.

**විශෙෂණ විශෙෂ්‍ය;**

පුරී යනු විශෙෂ්‍යයි. සෙවිතා සාධුරූපා තුල්‍යාධි කරණ විශෙෂණයෝයි. නරනාරීහි විශෙෂ්‍යයි. ඛිලාවිදද්ධාහි විශෙෂණයි.

**සමාස:-** ඛිලාවිදද්ධාහි, නරනාරීහි, සාධුරූපා, මධුරාලාපිනීහි.

**විග්‍රහ:** ඛීලාසු විදද්ධා ඛීලාවිදද්ධා තානි, නරා ච නාරියො ච නරනාරියො තාහි සාධු රූපං යස්සා සා, සාධුරූපා මධුරා (ගීති.) ලපිතුං සීලමෙතාසන්ති මධුරාලා පිනියො තාහි මධුරාලාපිනීහි.

20 තස්මිං සද්ධාදයොපෙතො - ඔක්කාක කුල කෙතුකො
සුද්ධොදනවහයො ආසි - විස්සුතො භුවනත්තයෙ.

**අන්වය:-** තස්මිං සද්ධාදයාඋපෙ තෙ ඔක්කාක කුල කෙතුකො භුවනත්තයෙ විස්සුතො සුද්ධොදනවහයො ආසි.

**පදාර්ථ:-** තස්මිං, ඒ නුවරෙහි, සද්ධාදයා උපෙතො, ශ්‍රද්ධාවෙන් හා දයාවෙන් යුක්තවූ, ඔක්කාක කුල කෙතුකො, ඔක්කාක කුල යට ධවජයක්වූ, භුවනත්තයෙ, ලොකත්‍රයෙහි; විස්සුතො, ප්‍රසිඞවූ; සුද්ධොදනවහයො, සුද්ධොදන නම් නරපතියෙක්; ආසි, වී;

**භාවය:-** ඒ පුරයෙහි ශ්‍රද්ධාවෙන් හා දයාවෙන් යුක්තවූ ඉක්ෂ්වාකු වංශයට ප්‍රධානවූ තුන්ලොවෙහිම ප්‍රසිද්ධවූ සුද්ධොදන නම් නරපතියෙක් වීය,

**ක්‍රියා කාරක පදසම්බන්ධ:**

තස්මිං සුද්ධොදනවහයො ආසි යනුයි.

උ: නා: සුගමයි.

**විශෙෂණ විශෙෂ්‍ය:**

සුද්ධොදනවහයො විශෙෂ්‍යයි. සද්ධාදයොපෙතො ඔක්කාක කුල කෙතුකො විස්සුතො තද්විශෙෂණයෝයි.

**සමාස:-** සද්ධාදයොපෙතො ඔක්කාකකුලකෙතු කො සුද්ධොදනවහයො විස්සුතො.

**විග්‍රහ:-** සද්ධා ච දයා ච සද්ධාදයා තාය උපෙතො සද්ධාදයොපෙතො ඔක්කාකස්ස කුලං, ඔක්කාකකුලං කෙතු විය කෙතු ඔක්කාකකුලස්ස කෙතු ඔක්කාකකුලකෙතු ඔක්කාකකුල කෙතු එව ඔක්කාකකුලකෙතුකො අවහයතීති අවහයො, සුද්ධොදනො ඉති අවහයො යස්ස සො සුද්ධොදනවහයො, විසෙසෙන සුතො විස්සුතො, භුවනානං තයං භුවනත්තයං තස්මිං භුවනත්තයෙ,

**පරිකථා:-**

**සද්ධාදයොපෙතො.**

i **සද්ධා**—ශ්‍රද්ධාව නම් තමා හා එක්ව යෙදෙන චිත්ත චෛතසිකයන් අරමුණෙහි පහදවන්නාවූ ඒකාන්ත කුශල චෛතසිකයෙකි. ඕ ලෞකික-ලොකොත්තර වශයෙන් ද්විප්‍රකාරය. එහි මාර්ගඵල සිත්වල යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය නිර්වාණාරම්මණයෙහි සිත පහදවන හෙයින් ලොකොත්තර ශ්‍රද්ධා නම්ද ලෞකික කුසල් සිත්වල යෙදෙන කල්හි ලෞකික ශ්‍රද්ධා නම්ද වේ. සම්ප්‍රසාදන සම්ප්‍රස්කන්දන යයි ශ්‍රද්ධාව පිළිබඳ ලක්ෂණ දෙකකි.



රාගාදී කෙලෙසුන් යටපත් කොට අරමුණු විෂයෙහි සිත පැහැදවීම සම්ප්‍රසාදනයයි.

දන ශීලාදී පින්කම් කිරීමේදී උපදින මසුරු බැව් ආදිය පසුබා ඉදිරිපත්වීම සම්ප්‍රස්කන්දන යයි දත යුතුයි.

ii **දයා නම්:-**

**යතනාදපි පරකෙලශං - හර්තුං යා හෘදි ජායතෙ**
**ඉච්ඡා භූමිසුරශ්‍රෙෂ්ඨ - සා දයා පරිකීර්තිතා.**

යන ශ්ලොකයෙන් කියනලදී.

එම්බා, බ්‍රාහ්මණ ශ්‍රෙෂ්ඨය! උත්සාහයෙන් වුවද මෙරමාගේ දුක හරණට යම් කැමැත්තක් හෘදයෙහි උපද්ද ඕතොමෝ දයායයි කියන ලද්දීය. යනු එහි අර්ථයි. සුදොවුන් රජතෙමේ මේ ගුණ ධර්ම දෙකින් යුක්තවූයේ යයි කියන ලදි.

**ඔක්කාක කුල කෙතුකො.**

මහාසම්මත රජතෙමේ මිනිසුන් අතර ආදිම රාජ්‍යය රොජ වරරොජාදී ඔහුගේ පුත්‍රානුපුත්‍ර පරම්පරාවෙහි තව මැනිව රජ බවට පැමිණි මඛාදෙව රජුගේ පරපුරෙහි 84000ක් ක්ෂත්‍රියයෝ වූහ. ඔවුනට පසුව ඔක්කාක වංශිකයෝ තිදෙනෙක් වූහ. ඉන් තෙවැනි ඔක්කාක රජුට (තස්සකිර රඤ්ඤො කථනකාලෙ ඔක්කාවිය මුඛතො පභා නිච්ඡරති තස්මා තං ඔක්කාකොති සංජානිංසු). යනුමෙන් ඔක්කාක වංශයේ ප්‍රභවය දක්වූහ. මෙහෙසියෝ පස් දෙනෙක් වූහ. ඇලා අතුරෙන් මැඩිමහලු තැනැත්තියට (1) ඔක්කාමුඛ (2) කරණ්ඩු (3) හත්ථිනීක (4) සිනිපුර යයි පුත්‍රයෝ සතර දෙනෙක්ද, (1) පියා (2) සුප්පියා (3) ආනන්ද (4) විජිතා (5) විජිතසෙනා යයි දියණිවරු පස්දෙනෙක් දූසි දරුවෝ නව දෙනෙක් වූහ. ඉන්පසු ඒ මෙහෙසිය කාලක්‍රියා කෙළෙන් අන් බිසොවක් අග මෙහෙසි බැව්හි තැබූහ. ඇයට ජන්තු නම් පුතෙක් වීය. පසු කාලෙක රජ තෙමේ වරයක ප්‍රකාර දෙවෙනි බිසවගේ පුත් ජන්තු කුමරුට රජකම දෙනු සඳහා අනික් කුමර කුමරියන් නව දෙන රටින් පිටුවහල් කළහ. ඔව්හු වනයෙහි තපස් කරමින් සිටි කපිල ඍෂිහුගේ අසපුව කරාගොස් ඔහුගේ අනුශාසනා පරිදි එහි නුවරක් කරවා ජාති සම්භෙද භීතියෙන් සිය සොහොයුරියන් සරණපාවාගෙණ වාසය කළහ. මෙපවත් ඇසූ ඔක්කාක රජතෙමේ "සක්‍යා වතභො රාජකුමාරා" යි (පින්වත්නි! රාජකුමාරයෝ ඒකාන්තයෙන් ශාක්‍යයෝයයි) කී ;වචනය කාරණ කොට ගෙණ එතැන් පටන් ඔව්හු ශාක්‍යයෝ වූහ. (මේ ශාක්‍ය වංශයේ ප්‍රභවයයි.)

## "සූර්‍ය වංශයෙහි රාජ පරම්පරාව."

මහාසම්මත (මනුරජ)
රොජ
වරරොජ
කල්‍යාණ
වරකල්‍යාණ
උපොසථ
මන්ධාතු
වර
උපවර
චෙතිය
මුචල
මුචලින්ද
සගර
සාගර
භරථ
භගීරථ (භගීරස)
රුචි
සුරුචි
ප්‍රතාප
මහාප්‍රතාප
පනාද
මහාපනාද
සුදර්ශන
මහාසුදර්ශන
නේරු
මහානේරු
අර්චිස්මත්
(මේ රජහු අටවිසිදෙන කුසාවතී රාජගෘහ මිථිලා යන නුවර තුණෙහි රජය කරවූහ).
අර්චිෂ්මත්
සාගර
මඛාදෙව (මිථිලායෙහි මේ පරපුරෙහි ම)

නිමි
කාලරජක
ජේමකර
අශෝක
(මේ පුරයෙහි රජුන් බොහෝ දෙනෙක් බරණැස් රජය කරවූහ.)
දිලීප
රඝු
අජ
දශරථ
රාම
(මේ පෙළපතෙහි මෑත විජය)
(පිළිවෙළින් දරු මුනුබුරු පසළොස් දෙනෙක්)
ඔක්කාක
කුස
සුජාත

ශාක්‍ය වංශය:
ඉක්ෂ්වාකු
උල්කාමුඛ (ආදි සතර දෙනෙක්)
(කපිලවාස්තු පුරාරම්භය)
නිපුර
(දරු මුණුපුරු අටදෙනෙක්)
සීහපුර
(දරු මුණුපුරු පරපුරෙහි)
ජයසේන
සිංහහනු
සුද්ධෝදන
සිද්ධාර්ථ
(භාග්‍යවතුන් වහන්සේ)






(=) මේ ලකුණින් අඹු සැමි බව දක්වේ.

21 යස්සංඝි කමලෙ සබ්බ - භූභුජානං මහීතලෙ
කිරීට මණි භිඞ්ගාලි - කීළන්තීව නිරන්තරං

**අන්වය:-** මහීතලෙ සබ්බභූභුජානං කිරීටමණිභිඞ්ගාලී යස්ස අඞ්ඝිකමලෙ නිරන්තරං කීළන්ති ඉව (හොන්ති.)

**පදාර්ථ:-** මහීතලෙ, පොළොව තලයෙහි; සබ්බ භූභුජානං, සියලු රජවරුන්ගේ; කිරීට මණී, කිරීටයන්හි මාණික්‍ය නැමති; භිඞ්ගාලි, භෘඞ්ග පඞ්ක්තිහු; යස්ස, යම් රජෙකුගේ; අඞ්ඝි කමලෙ, පා පියුම්හි; නිරන්තරං, සතතයෙන්; කීළන්ති ඉව, ක්‍රීඩා කරන්නාක් මෙන්; (හොන්ති, වෙද්ද,)

**භාවය;-** පොළෝ තෙලෙහි වූ සියලු රජවරුන්ගේ ඔටුනු වල මැණික් නැමැති බමර පෙළ යම් රජෙකුගේ පාපියුම්හි නිරතුරුව කෙළින්නාක් මෙන් වේද්ද.

**ක්‍රියා කාරක පද සම්බන්ධ.**

කිරීට මණි භිඞ්ගාලි යස්ස අඞ්ඝිකමලෙ නිරන්තරං කීළන්ති ඉව (හොන්ති)

**උ. ක.** හොන්ති යන (භූ සත්තායං) අධ්‍යාහෘත ආඛ්‍යාත ක්‍රියාවෙන් උක්ත හෙයින් කිරීටමණිභිඞ්ගාලි උක්ත ප්‍රථමා නාමයි කීළන්ති යනු උක්ත විභක්ති නාමයි. යස්ස යනු සම්බන්ධයි. අංඝි කමලෙ යනු ආධාරයි. නිරන්තරං යනු ක්‍රියා විශෙෂණ යි.

**විශෙෂණ විශෙෂ්‍ය.**

සුගමයි.

**සමාස:-** අංඝිකමලෙ, සබ්බභූභුජානං, මහීතලෙ, කිරීට මණි භිඞ්ගාලි නිරන්තරං.

**විග්‍රහ:-** අංඝිඑව කමලං, අංඝිකමලං තස්මිං, භූං පඨවිං භුජන්තීති භූභුජා (භුජ භොගෙ) සබ්බෙව තෙ භූභුජා චෙති සබ්බ භූභුජා; තෙසං, මහියා තලං, මහීතලං, තස්මිං, කිරීටෙසු මණයො කිරීටමණයො, භිඞ්ගානං අලි, භිඞ්ගාලි කිරීට මණයො එව භිඞ්ගාලී කිරීට මණි භිඞ්ගාලි; නත්ථි අන්තරං යස්ස තං නිරන්තරං,



**පරිකථා:-**

මේ ගාථාවෙන් සුදෙවුන් මහ රජුගේ රාජාධිරාජත්වය වැණූහ. සුදෙවුන් රජ තෙමේ පොළෝ තෙලෙහි සියලුම රජුන්ගේ ශ්‍රෙෂ්ඨයා ය. වික්‍රමයෙන්ද, තේජසින්ද, බලයෙන්ද ඔහුට සම කෙනෙක් නැති හෙයින් සෙසු නරවරයෝ ඔ රජු වෙත පැමිණ සිරිපා වඳිති. ඔටුනු පළන් හිස් පාමුල තබා වඳින විට කිරීටයන්හි වූ මාණික්‍යා පඞ්ක්තිහු පාද යුග්මය ස්පර්ශ කෙරෙති. රජුගේ පතුල් පියුම්වලට ද ඔටුනුවල මැණික් බමර පෙළටද සමාන කොට මැණික් පාදයන්හි නැවරීම බමර පෙළ පියුම්හි ක්‍රීඩාකිරීමක් සේ ගැනූහ බමරුන් කෙළියි යි කීමෙන් ඔවුන් පියුමෙහි සතුටින් ගැසිරෙණ බැව් කීහ. පීඩා රාහිත්‍යයත් ඉෂ්ටාර්ථ ලාභයත් ප්‍රීතියට හේතුවෙයි. අන් රජවරු සුදෙවුන් රජුගේ පාපියුම් නැමදීමෙන් සතුටින් ඉපිළ ගියහ කෙතරම් ප්‍රතාපයෙන් හා වික්‍රමයෙන්ද බලයෙන්ද අගනැග් පත් වුව සුදෙවුන් රජුගෙන් සෙසු රජුනට පීඩාවක් නො මැකිවේ. එහෙයින් ම ඔව්හු භක්ති ප්‍රෙමයෙන් සුදෙවුන් රජුට නිරතුරු අවනත භාවය දක්වූ බව මෙයින් ප්‍රතීය මානවේ.

22 යස්ස පත්ථතෙජෙන - පූරිතොනාපි දිවාකරො
වහතීව’ම්බරෙ ලීලං - ඔසධීපතිනො දිවා

**අන්වය:-** අම්බරෙ යස්ස පත්ථට තෙජෙන පූරිතො දිවාකරො අපි දිවා ඔසධිපතිනො ලීලං වහති ඉව (ආසි)

**පදාර්ථ:-** අම්බරෙ, අහසෙහි; යස්ස, යමෙකුගේ; පත්ථට තෙජෙන, පතළවූ තෙදින්; පූරිතො, පුරාභ්‍යන්තරයෙහි වූ; දිවාකරො අපි, හිරු තෙමේද; දිවා, දවහල්හි වූ; ඔසධි පතිනො චන්ද්‍රයාගේ; ලීලං, ශොභාව; වහති ඉව, උසුලන්නාක්මෙන්; (ආසී විද;)

**භාවය:-** අහසෙහි පතළ යමෙකුගේ තෙජස කරණකොට ගෙණ නුවරතුලට පැමිණි හිරු තෙමේ දහවල් චන්ද්‍රයාගේ ශොභාව උසුලන්නාක් මෙන් වීද,

**ක්‍රියා කාරක පද සම්බන්ධ.**

දිවාකරො ඔසධිපතිනො ලීලං වහතීව ආසී.

**උ. ක.** සුගමයි.

**විශෙෂණ විශෙෂ්‍ය.**

දිවාකරො විශෙෂ්‍යයි. පූරිතො තද්විශෙෂණයි. ඔසධි පතිනො විශෙෂ්‍යයි. දිවා භින්නාධිකරණ විශෙෂණයි.

සමාස:- පත්ථට තෙජෙන, පුරතො, දිවාකරො, ඔසධිපතිනො

විග්‍රහ:- පත්ථටො ච තෙජො චාති, පත්ථටතෙජො, තෙන, පුරස්ස අතො, පුරතො දිවා කරොතී'ති. දිවාකරො (කර-කරණෙ) ඔසධීනං පති ඔසධීපති, තස්ස ඔසධී පතිනො.

පරිකථා.

අනුන් තවන ගතිය තෙද නමි. සුදෙවුන් රජුටද මෙය අනූනව පැවති බැව් පෙණේ. කවි සමයෙහි තෙජස රශ්මියක් කොටද එය රක්ත වර්ණ කොටද සැලකූහ. කපිලවාස්තුවෙහි වාසයකරණ සුදෙවුන් රජුගේ තේජස නගරාභ්‍යන්තර ගත අඳසෙහි ද පැතිර පවතී. එය කෙතරම් මහත්ද යතු දහසක් තෙද ඇති හිරු අහසින් යනුයේ මේ නගරයාගේ මස්තකාකාශයට පැමිණෙන විට නිස්තෙජසකව් දවල් පායා තිබෙන චන්ද්‍රයා මෙන් වී යයි කීමෙන් හැඟේ. චන්ද්‍රයා සොම්රැස් ඇත්තෙකි; ඔහුගේ ප්‍රභාවය පවත්නේ රාත්‍රි කාලයෙහි ය. හෙද දිවාකාලයෙහි වූ චන්ද්‍රයාගේ නම් කිසිසේත් ඇති නො වේ. සුදෙවුන් තෙදින් සූර්යයාද දවල් පෑවූ චන්ද්‍රයාගේ ස්වභාවයට පත්වී නම් මෙතුමාගේ අසහායවූ තේජස වැණීමට අන් කවර කථා ද?

23 යස්ස දානපවාහො තු - නා නා යාචක ජන්තුනං
මනොදධීසු වෙලන්තො - තික්කමන්තොව සන්තතං

අන්වය:- යස්ස දානප්පවාහො තු නානායාචකජන්තුනං මනොදධීසු වෙලන්තං සන්තතං අතික්කමන්තො ඉව. (ආසි)
පදාර්ථ:- යස්ස, යම් රජෙකුගේ; දානප්පවාහො තු, දාන නමැති ජලප්‍රවාහය තෙම; නානායාචකජන්තුනං; නොයෙක් යාචක ජනයන්ගේ; මනොදධීසු, චිත්තාර්ණවයන්හි; වෙලන්තං, වෙරළ කෙළවර; සන්තතං, නිරතුරුව; අතික්කමන්තො ඉව, ඉක්ම වන්නෙකු මෙන්; (ආසි-වීද)

භාවය;-යම් රජ කෙනෙකුන්ගේ පරිත්‍යාග නැමැති ජලප්‍රවාහය නොයෙක් යාචක ජනයන්ගේ සිත් නැමැති සාගරයන්ගේ වෙරළ නිරතුරුව ම ඉක්මවා යන්නාක් මෙන් වීද,

ක්‍රියා කාරක පදසම්බන්ධ:-

යස්ස දානප්පවාහො නානායාචකජන්තුනං මනොදධීසු වෙලන්තං අතික්කමන්තො (ආසි)



උ: ශ: ආසි යන ආඛ්‍යාත ක්‍රියාවෙන් කථිත හෙයින් දානප්පවාහො උක්ත ප්‍රකෘති කර්තෘයි. අතික්කමන්තො, උක්ත විකෘති කර්තෘයි. වෙලන්තං අනුක්ත කර්ම යි. යස්ස යනුද නානායාචක ජන්තුනං යනුද සම්බන්ධයි. මනොදධීසු අනුක්තාධාරයි.

විශෙෂණ විශෙෂ්‍ය:

සුගමයි.

සමාස:- දානප්පවාහො; නානායාචකජන්තුනං; මනොදධීසු; වෙලන්තං.

විග්‍රහ:- දානස්ස පවාහො, දානප්පවාහො, අනෙකෙ ච තෙ යාචකා චෙති, නානා යාචකා නානායාචකා ච තෙ ජන්තු චෙති නානා යාචකජන්තු. තෙසං, මනො එව උදධි මනොදධි තෙසු වෙලාතං අන්තො වෙලන්තො තෙ වෙලන්තං.

පරිකථා:-

දානප්පවාහො දාන නම් පරිත්‍යාගයයි. එය නන් වැදෑරුම්වේ. රජුන්ට අයත් දාන-ප්‍රියවචන-අර්ථචර්යා-සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තුවටද මෙය අයත් වේ. එහෙයින් දානය ප්‍රජා පාලකයකුට අයත් උසස් ගුණයෙකි.
දානවස්තු දසයෙක් වෙති. එනම්;—

අන්නං පානං ඝරං වත්ථං - යානං මාලා විලෙපනං
ගන්ධා සෙය්‍යා පදීපෙය්‍ය - දානවත්ථු සියුං දස.

(1) ආහාරය, (2) පානය කරණ අෂ්ටවිධ පානවර්ගාදිය, (3) ආවාසය, (4) වස්ත්‍රය, (5) යාන වාහනය, (6) මල්මාලාය, (7) ඇඟ ගානා සඳුන් සුණු ආදී විලෙපනය, (8) කපුරු කට්ටකුමංචල් ආදී සුවඳය, (9) සයනය, (10) ප්‍රදීපයට හිත හිතෙල් ආදිය යනුයි.

දානයේ ප්‍රභෙද හා දියයුතු ක්‍රමයන්ද යනාදී වශයෙන් විස්තර ඉතා බොහෝ බැවින් නො දක්වීය හැක. ග්‍රන්ථාන්තරයෙන් බලා දත යුතුයි. පවාහ නම් අතරතුර නොකැඞී පවත්නා දියට නමෙකි. (ජලප්‍රවාහය නො කැඞී පවත්නා ජලස්කන්ධය යනාදී තන්හි ඒ පෙණේ.) යමක් අතරතුර විච්ඡෙද නොකොට කෙරේ නම් ඊට මේ නම යෙදේ. සුදෙවුන් රජතෙමේ යාචකයනට දන් දෙයි. එය අතරතුර නොනවත්වා දිනපතාම දෙයි. එහෙයින් ඒ දාන ප්‍රවාහයෙකි. රජුගේ දානප්‍රවාහය (දාන නැමැති ජලධාර) යාචකයන්ගේ සිත් නැමැති සාගරයන් පිරී වෙරළද ඉක්මවා

යන ලෙසට පවතී. කෙතරම් ජලය වැටුනත් සාගරය තෘප්ත නොවේ. වෙරළ ඉක්මවා නොයාම සාගරයේ විශේෂ ලක්ෂණ යෙකි. එහෙත් මේරජුගේ දන නැමැති ජල පහරින් යාචක යන්ගේ සිත් නැමැති සාගර පිරී ඉතිරී වෙරළද ඉක්මවා යන් නේ ය යි කීමෙන් රජහුගේ පරිත්‍යාග මහත්වයත් දන් දීමේ අභි ලාෂයත් වර්ණනා කළහ.

**24 මතියා සුරමන්තීව - ධනෙන ධනදො විය**
**රූපෙන කුසුමෙසුව:- යො ජුම්භති මහීතලෙ**

අන්වයඃ:- යො මතියා සුරමන්තී ඉව ධනෙන ධනදො විය රූපෙන කුසුමෙසු ඉව මහීතලෙ ජුම්භති.

**පදාර්ථ:-** යො, යමෙක් තෙමේ; මතියා, ප්‍රඥයෙන්; සුරමන්තී ඉව, බෘහස්පති මෙන්ද; ධනෙන, වස්තුවෙන්; ධනදො විය, කුවේර යාමෙන්ද; රූපෙන, රූපයෙන්; කුසුමෙසු ඉව, අනඞ්ගයාමෙන්ද; මහීතලෙ, පොළො තෙලෙහි; ජුම්භති, බබලාද;

**ක්‍රියා කාරක පදසම්බන්ධ:**

යො මහීතලෙ ජුම්භති.

**ල: සා:** ජුම්භති (ජුම්භ-ජුම්භනෙ) වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒකවචනාඛ්‍යාත ක්‍රියා පදය විසින් කථිත හෙයින් යො යනු උක්ත කර්තෘයි. මහීතලෙ, යනු අනුක්තාධාරයි.

**විශේෂණ විශේෂ්‍ය;**

යො, විශේෂ්‍යයි. සුරමන්තී, ධනදො, කුසුමෙසු තද්විශේෂණ යෝ යි.

**සමාසඃ:-** සුරමන්තී, ධනදො, කුසුමෙසු, මහීතලෙ.

**විග්‍රහ:-** සුරානං මන්තී, සුරමන්තී, ධනං දදාතීති ධනදො (ධන සද්දූපපද දා-දානෙ) කුසුමානි එව ඉසු යස්ස සො, කුසුමෙසු මහියා තලං මහීතලං, තස්මිං මහීතලෙ.

**සටහන.**

**සුරමන්ති** සුරමන්ති නම් සුරගුරු බෘහස්පති යන නාමයෙන් ද ප්‍රසිද්ධ දෙවියන්ගේ ආචාර්ය වරයා ය. මෙතෙම දෙවියන් අතර ද නැණින් වැඩිහිටි තැනැත්තාය. එහෙයින් ලොව මොහුට වැඩි නැණවතෙක් නැත.



**ධනදෙ.**

ධනද නම් කුවේරයා ය මොහුගේ වාසස්ථානය අලකා පුර ය යි. මොහු අයත් නිදන (9) නවයකි.
ඔව්හු නම්.—

පද්මොසක්‍රියාං මහා පද්මඃ - ශඞ්ඛෝ මකරකච්ඡපෞ
මුකුන්ද කුන්ද නීලාශ්ච - ඛර්වශ්ච නිධයො නව.
යනුවෙන් දක්වන ලදී.

(1) පද්මය, (2) මහා පද්මය, (3) ශඞ්ඛය, [4) මකරය, (5) කච්ඡපය, (6) මුකුන්දය, (7) කුන්දය, (8) නීලය, (9) ඛර්වය යන මොවුහුය. කුත්සිතවූ (විකාරවූ) වේරක් (ශරීරයක්) ඇති හෙයින් මොහු කුවේර නම් වේ. මොහුට පාද තුනෙකි. දත් අටකි. නෙත්‍රයක් උවමනා තන්හි කරිද්වර්ණවිශ්නයක් තිබේ. මේ තෙමේ යක්ෂයනට රජ වේ. කින්නරානට අධිපති වේ. උතුරු දිග්පාලක බැවින් වරම් දෙවිවරුන් අතුරෙන් ද කෙනෙකි. ධන යෙන් මොහුට සමානයෙක් නැත්තේ ය. නමුත් සුදෙවුන් රජ තෙමේ ධනයෙන් මේ කුවේරයාට සමාන වේ.

**කුසුමෙසු.**

කුසුම් (මල්) ඉසු (ශර) වශයෙන් යමෙකුට වේ ද? හේ කුසු මෙසු නම් වේ. අනඞ්ගයායයි; විස්තර යට දක්වන ලදී. මොහුට වඩා රූප ශොභාවෙන් අධිකවූවෙක් දෙව් ලොව ද නැත්තේ ය. සුදෙවුන් රජතෙමේ රූපයෙන් මොහුට සමාන ය. මේ ගාථාවෙන් රජුගේ නුවණත්, ධනයත්, රූපත් වර්ණනාකළහ.

**25 තස්සාභිසිත්තා රජ්ජෙන - මහාමායාති විස්සුතා**
**චන්දිකා විය චන්දස්ස - ගිරිජාව කපාලිනො.**

**26 ලක්ඛීව වාසුදෙවස්ස - සීතාව රාම රජ්ජිනො**
**මහෙසී'සි වරාරොහා - සුන්දරී සුන්දරම්බරා.**

**අන්වයඃ:-** චන්දස්ස චන්දිකා විය කපාලිනො ගිරිජා ඉව වාසු දෙවස්ස ලක්ඛී ඉව රාමරජ්ජිනො සීතා ඉව වරාරොහා සුන්දර ම්බරා රජ්ජෙන අභිසිත්තා මහාමායාති විස්සුතා සුන්දරී තස්ස මහෙසී ආසි.

**පදාර්ථ;-** චන්දස්ස, චන්ද්‍රයාගේ; චන්දිකා විය, මරීචිය වැනි වූ, කපාලිනො, රුද්‍රයාගේ; ගිරිජා ඉව, පාර්වතිය වැනි වූ; වාසුදෙ වස්ස; විෂ්ණුහුගේ; ලක්ඛී ඉව, ශ්‍රීකාන්තාව වැනි වූ; රාමරජ්ජිනො,

රාමරජුගේ; සීතා ඉව, සීතාදේවිය වැනි වූ; වරාරොහා, උත්තම කාය ප්‍රදෙශ ඇති; සුන්දරාධරා, සුන්දර වූ තොල් ඇති; රජ්ජෙන, රාජ්‍යයෙන්; අභිසිත්තා, අභිෂෙක කරණ ලද්දා වූ; මහාමයාති විස්සුතා, මහාමායායයි ප්‍රසිද්ධ වූ; සුන්දරී, සුන්දරාඞ්ගතාතොමෝ; තස්ස, ඒ සුද්ධොදන රජහට; මහෙසී ආසි, මෙහෙසී වී.

භාවය:- සඳුගේ රැස්වැනි වූ ද, ඊශ්වරයාගේ පාර්වතිය වැනි වූ ද, විෂ්ණුහුගේ ලක්ෂ්මිය වැනිවූ ද, රාමරජුගේ සීතා දේවිය වැනි වූද මනහර ශරීර ශොභා ඇති සොඳුරු දෙතොල් ඇති රාජ්‍යයෙන් අභිෂෙක කරණ ලද්දා වූ මහාමායා ය යි ප්‍රසිද්ධ වූ සුන්දරාඞ්ගතාව සුදෙවුන් මහරජහට අග මෙහෙසිය වූවා ය.

ක්‍රි: ස: මහාමායා තස්ස මහෙසී ආසි.

උ: කා: ආසි (අස-භුවි) යන අජ්ජතනී විභත්ති කර්තෘ කාරක පරස්සෙපද එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදය විසින් උක්ත හෙයින් මහාමායා උක්ත ප්‍රකෘති කර්තෘ යි. මහෙසී උක්ත විකෘති කර්තෘ යි. තස්ස, යනු සම්බන්ධයි.

**විශෙෂණ විශෙෂ්‍ය.**

සුගම යි.

සමාස:- වරාරොහා, සුන්දරාධරා, රාමරාජිනො, විස්සුතා.

විග්‍රහ:- විසෙසන සුතා, විස්සුතා, රාමො ච සො රාජා චෙති රාමරාජා, තස්ස, උත්තමො ආරොහො යස්සා සා වරා රොහා සුන්දරා අධරා යස්සා සා සා සුන්දරාධරා.

**පරිකථා.**

මහාමායා කොලිය වංශයෙහි වූ අඤ්ජන නම් ශාක්‍ය රජුගේ දියණිය වූ මෝතොමෝ සුදෙවුන් රජහට අගමෙහෙසුන් වූවා ය. කොලිය වංශය පිළිබඳ ප්‍රවෘත්තිය මෙසේ යි.

(20වෙනි ගාථාවට ලියූ පරිකථා බලනු.)

අරණ්‍යගත වූ ඔක්කාක රජුගේ දරුවන් නවදෙනාගෙන් පුත්‍රයන් සතර දෙන සවකීය සහෝදරියන් සතර දෙනෙකුන් සරණ පාවාගෙණ විසූ බැව් යට කියනලදී. සහෝදරියන් අතර වැඩිමහලු තැනැත්තිය මේ සැමගේ මවු තනතුරෙහි තැබූහ. කල් යාමේ දී වැළඳුනු කුෂ්ට රෝගයක් නිසා ඇය වනයෙහි ගෙණ ගොස් හැර දමූහ. මේ කාලයේදී රාම නම් බරණැස් රජතෙමේද කුෂ්ට රෝගයක් වැළඳී වල් වැදී සිටියේය. හෙතෙමේ ගස් වල කොළ පොතු ආදිය අනුභව කිරීම කරණ කොටගෙණ සුවවූ



කුෂ්ටරෝගය ඇත්තෙක් විය. දිනක් රාමරජ හා ඒ කුමරියද ඔවුනොවුන් හමුව පිළිසඳර කථා කොට රජුගේ උපදෙසින් පිළියම් ලැබ කුෂ්ටරෝගයද සුවවූ පසු ඔව්හු අඹු සැමියන් වශයෙන් කල්යැවූහ. පසුව එහි ම නුවරක් පිහිටුවා රාම රජ තෙමේ ඇයත් සමග සැපසේ වාසය කෙළේය. තමා පෙර විසූ කොලොම් නම් රුක පිහිටිතැන ඉදිකර වූ හෙයින් ඒ නුවරද කෝලිය නගර යන නමින්ම ප්‍රසිද්ධ විය. එතැන් පටන් ඔවුන්ගෙන් පැවත එන ක්ෂත්‍රියයෝ කොලියයෝ නම් වූහ. මේ කොලියයන්ගේ උත්පත්තිය යි. ශාක්‍ය-කෝලිය දෙපක්ෂයේ රජවරු පෙර සිට ම ආවාහ විවාහ ආදියෙන් එකාට සම්බන්ධයහ. එහෙයින් අඤ්ජන නම් කෝලිය රජුගේ දූවූ මහාමායා තොමෝ ශාක්‍ය වංශයෙහි වූ සිංහහනු රජුගේ පුත්‍ර සුද්ධොදන රජහට අග මෙහෙසි වූවාය.

"කපාලිනො" කබලක් අත ඇති හෙයින් හෝ කපාලි නම්. "කපාලි" (=ඊශ්වර) තිනෙත්‍ය එනම් බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර යන ත්‍රිමූර්තියෙන් තුන්වන මූර්තිය යි. හෙවත් පරමේශ්වරයාගේ සංහාර ශක්ති ස්වරූපවූ ශිව දෙවියා යි. මේ තෙමේ බ්‍රහ්මයා විසින් මවන ලද්දේ තපස් කොට එහි උත්පත්තිය ලැබ සන්‍යාසි වේශය ගත්තේ ය. මොහුගේ වස්ත්‍රය ව්‍යාඝ්‍ර සමකි. පර්ය සර්පයෙකි. උතුරු සළුව වාසුකී නාගරාජයා යි. ප්‍රධාන අවිය ත්‍රිශූලයයි. දුන්න පිනාක නම් වේ. මෙය යුද්ධකාලයේදී ආයුධයක් ලෙස වත් අන්‍ය කාලයන්හි වාද්‍ය යන්ත්‍රයක් ලෙසවත් සලකති. මේ තෙමේ ත්‍රිපුර නම් අසුරයා නැසූ හෙයින් ත්‍රිපුරාරි යයි ද, කිරිසයුර ඇලලීමේදී හලාහල විෂ පානය කිරීමෙන් නිල්වන් ගෙල ඇත්වූ හෙයින් නීලකණ්ඨ යයි ද, නෙත් තුණක් ඇති හෙයින් ත්‍රිනෙත් යයි ද කියනු ලැබේ. මොහුගේ තුන්වන ඇස පිහිටියේ නලලෙහි ය. ඉන් නිකුත් වන වහ්නියෙන් හෙතෙමේ සතුරන් හණ කෙරේල. වරක් මොහු විසින් ලලාටාක්ෂියෙන් නිකුත්කළ වහ්නියෙන් කාමදෙවයාද හළු කරණ ලදී.

"ගිරිජා" (=පාර්වතී) නම් හිමාලය පර්වතයාගේ දුව යි. මෝතොමෝ ප්‍රථමයෙන් දක්ෂහුගේ දුහිතෘ ව ඉපිද සතී නමින් ප්‍රසිද්ධ වූවා මහෙශ්වරයාගේ භාර්‍යා වූවා ය. පසුව පියා කෙරෙහි කෝ සතුටු වූවා දුහිතෘත්වයෙන් මිදීම සඳහා ධ්‍යාන බලයෙන් ශරීර ත්‍යාගය කොට හිමාලයාට දූව මෙනකාවගේ කුසෙහි උපන්නී ය, එතැන් පටන් ඕ පාර්වතී ගිරිජා යන නම්වලින් ප්‍රසිද්ධ වූවා ය.

**"වාසුදේව"** යනු විෂ්ණුට නමෙකි. බ්‍රහ්ම - විෂ්ණු - ඊශ්වර යන ත්‍රිමූර්තියට අයත් මේ තෙමේ බ්‍රහ්මයා විසින් මැවූ ලෝකය ආරක්‍ෂා කරණ තැනැත්තේ ය. ඊශ්වරයා ලෝකය නසන්නේ ය. විෂ්ණු පිළිබඳ තවත් කථාවෝ බොහෝ ය. මතභේද රාශියෙකි. තථාගතයන් වහන්සේ පිරිනිවන් මඤ්චක යේදී ආරක්‍ෂා කිරීමට ශක්‍රයාට භාරදුන් ලඞ්කා ශාසනය ඔහු වෙතුවෙන් රක්ෂිත තැනැත්තා ද මේය. මේ නිසා ලඞ්කා වාසීන් මොහුට දක්වන සැලකිල්ල ද ඉතා මහත් ය

**ලක්‍ෂ්මී"** පෙර ඍෂි ශාපයෙන් බෙලහීන වූ සුරයෝ අසුර යන්ට පැරදී විෂ්ණු දෙවියන්ගෙන් පිහිට ඉල්වූහ. හෙතෙමේ කිරිමුහුද කලඹා අමෘතය ගෙණ බී ශක්තිය ලබා යුද කර වයි. ඔවුන්ට අවවාද කෙළේය. සුරාසුරයෝ මිතුරු වී **"වාසුකී"** නාගරාජයාගේ දරණ වැලින් මන්දර පර්වතය වෙලා කිරිමුහුද ඇලලූහ. එකල්හි සාගර පත්ලේ තිබී පහත සඳහන් චතුර්දශ රත්නයෝ පහළවූහ එනම්:-

> **ලක්‍ෂ්මීඃ** කෞස්තුභ පාරිජාතක සුරාධන්වන්තරිශ්චන්ද්‍රමාඃ
> ගාවඃ කාමදුඝාඃ සුරේශ්වර ගජෝ රම්භාදිදේවාඞ්ගනාඃ,
> **අශ්වඃ** සප්තමුඛෝ විෂං හරිධනුඃ ශඞ්ඛාමෘතඃ චාම්බුධෙ
> රත්නානීහ චතුර්දශ ප්‍රතිදිනං කුර්වන්තු තේ මඞ්ගලම්.

යනුවෙන් දැක්වුනු (1) ශ්‍රී (2) කෞස්තුභය (3) පාරිජාතකය (4) සුරා (5) ධන්වන්තරී (6) චන්ද්‍ර (7) කාමධේනු (8) සුරේන්ද්‍ර හස්ති (=ඓරාවන) (9) රම්භාදි (10) සප්තමුඛ අශ්ව (11) කාලකූට විෂය (12) විෂ්ණුහුගේ දුන්න (13) ශඞ්ඛය (14) අමෘතය යන මොව්හුය.

මෙහි වස්තු තුදුසෙන් ශ්‍රී නමින් පහළ වූ කාන්තාව විෂ්ණුහුගේ භාර්‍ය්‍යාව වූවාය.

**"රාමරාජිනො"** දඹදිව අයෝධ්‍යා දෙශයෙහි රජ කළ **දශරථ** රජුගේ පුත්‍රතෙමේ රාම නම් වී. මොහුගේ භාර්‍ය්‍යාව අසිරිමත් රූසිරෙන් යුත් තැනැත්තියෙකි, මැය මිථිලා නුවර ජනක රජුගේ දියණිය යි, සීතා යනු ශිව්වට නමකි. ජනක රජුට හීවියෙන් පහළවූ හෙයින් සීතා නම් වූවා ය ලඞ්කාවෙහි රාවණා රජතෙමේ මැය කෙරෙහි ප්‍රලෝභ කොට දණ්ඩකාරණ්‍ය යෙහි දී රාම කුමරුගෙන් වෙන්වූ සීතාව පැහැර ගෙණ ලඞ්කාවට ආයේ ය.



මේ ගාථාවෙන් සුද්ධෝදන රජුගේ බිසොවවූ මහමායා දේවිය වැණුහ. පාර්වතිය, සඳරුස-ලක්‍ෂ්මී-සීතා යන මොවුනට සමාන කිරීමෙන් මහමායා දේවියගේ රූපාතිශය ද සෞම්‍යභාවය ද ශ්‍රෙෂ්ඨත්වය ද පාරිශුද්ධත්වය ද එකසේ ප්‍රකාශ කළහ.

> 27 **තස්සා කුච්ඡිකරණ්ඩමහි-අනග්ඝරතනං විය**
> **බත්තිංසාහි නිමිත්තෙහි-විම්හාපෙන්තො සදෙවකං.**

**අන්වය:-** තස්සා කුච්ඡිකරණ්ඩමහි අනග්ඝරතනං විය බත්තිංසාහි නිමිත්තෙහි සදෙවකං විම්හාපෙන්තො.

**පදාර්ථ:-** තස්සා, ඒ මහමායා දේවියගේ; කුච්ඡිකරණ්ඩමහි, කුස නැමැති පුම්බුගෙහි; අනග්ඝරතනං විය, අනගි මිණිරුවනක් මෙන්; බත්තිංසාහි නිමිත්තෙහි, දෙතිස් පූර්ව නිමිත්තෙන්; සදෙවකං, දෙවියන් සහිතවූ ලොකයා; විම්හාපෙන්තො, විස්මය ප්‍රාප්ත කෙරෙමින්,

> 28 **සිතම්බුජකරො සන්තො-සිතෙභච්ඡාපකො විය**
> **කත්වා පදක්ඛිණං මාතුං-පටිසන්ධිමගණ්හි සො.**

**අන්වය:-** සිත අම්බුජකරො සිතෙභච්ඡාපකො විය සන්තො සො මාතුං පදක්ඛිණං කත්වා පටිසන්ධිං අගණ්හි.

**පදාර්ථ:-** සිත අම්බුජකරො, සුදු පියුමක් ගත් සොඬ ඇති; සිතෙභච්ඡාපකො වියසන්තො, සුදු ඇත්පොව්වකු මෙන් වෙමින්; සො, ඒ මහසත් තෙමේ; මාතුං, මව; පදක්ඛිණං කත්වා, පැදකුණු කොට; පටිසන්ධිං අගණ්හි, පිළිසිඳ ගත්තේය.

**භාවය:-** (27-28) ඒ මහමායා දේවියගේ කුස නැමති කරඬුවෙහි අනගි මිණිරුවනක් මෙන් දෙතිස් පෙර නිමිති පහළ කෙරෙමින් දෙවියන් සහිත ලොකයා විස්මිත කෙරෙමින් කෙළ පියුමක් ගත් සොඬ ඇති සුදු ඇත්පොව්වකු සේ වෙමින් ඒ මහසත් තෙමේ මව පැදකුණු කොට පිළිසිඳ ගත්තේ යි. (මහාමායා දෙවියගේ කුස බෝසතුන් පිළිසිඳගත් අයුරු සිහිනෙන් දුටු ක්‍රමයයි.)

**ක්‍රි: ස:** සො සදෙවකං සිතෙභච්ඡාපකො විය සන්තො විම්හාපෙන්තො මාතුං පදක්ඛිණං කත්වා පටිසන්ධිං අගණ්හි.

ලි: නා: අගණ්හි (ගහ-උපාදානෙ) යන අජ්ජතනී විභක්ති කර්තෘකාරක ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියාපදය විසින් කථිත හෙයින් සො යනු උක්ත කර්තෘයි. පටිසන්ධිං යනු අනුක්ත කර්මයි. කත්වා යන පෙර කිරියට ද සො යනු ම කර්තෘයි. මාතුං යනු ඊට ප්‍රකෘති කර්මයි. පදක්ඛිණං යනු විකෘති කර්මයි. සනෙත්වා යන කෘදන්ත ක්‍රියාවට සො යනු උක්ත ප්‍රකෘති කර්තෘයි. සිතෙභච්ඡාපකො යනු විකෘති කර්තෘයි. විමහාපෙනෙත්වා, යන කෘදන්ත ක්‍රියාවට ද සො යනු ම කර්තෘයි. සදෙවකං යනු අනුක්ත කර්මයි.

වි: විශෙෂ්‍ය: කුච්ඡිකරණ්ඩම්හි විශෙෂ්‍යයි. තස්සා හිත්‍යාධිකරණ විශෙෂණයි. නිම්මිතෙත්‍යාති විශෙෂ්‍යයි, බත්තිංසාහි තුල්‍යාධිකරණ විශෙෂණයි. සිතෙභච්ඡාපකො විශෙෂ්‍යයි. සිතම්බුජකරෙ සනෙත්වා තුල්‍යාධිකරණ විශෙෂණයි. සො උපමෙයයි. සිතෙභච්ඡාපකො තදුපමානයි.

සමාස: කුච්ඡිකරණ්ඩම්හි, අනග්ඝරතනං, සදෙවකං, සිතම්බුජකරෙ, සිතෙභච්ඡාපකො, පදක්ඛිණං.

විග්‍රහ: කුච්ඡි එව කරණ්ඩො කුච්ඡිකරණ්ඩො, තස්මිං, රතිං ජනෙතීති රතනං, (රතිසද්දූපපද තනු විත්ථාරෙ) අග්ඝනං පූජනං අග්ඝං, අග්ඝ පූජාය, න අග්ඝං අනග්ඝං අනග්ඝං ච තං රතනං චෙති අනග්ඝරතනං, සහ දෙවෙහි යො වත්තතී සො සදෙවකො, තං, අම්බුම්හි ජාතො, අම්බුජො, (අම්බුසද්දූපපද ජන ජනනෙ) සිතො ච සො අම්බුජො චෙති. සිතම්බුජො සිතම්බුජෙන යුතො කරො යස්ස සො සිතම්බුජකරො, ඉභස්ස ඡාපකො ඉභ ඡාපකො, සිතො ච සො ඉභච්ඡාපකො චෙති සිතෙභච්ඡාපකො, උත්තමං දක්ඛිණං, පදක්ඛිණං, තං,

පරිකථා:- අනග්ඝරතනං, මෙහි රතන ශබ්දයෙන් මාණික්‍ය විශෙෂයෙක් කියනු ලැබේ. ලොකයෙහි උත්තම වස්තු වශයෙන් සලකන රතන ජාතීන්ට ලෝවැස්සා මහත් ආදරයක් දක්වනු ලැබේ. ඒ රතනය අනඝ වී නම් (මිල නියම නො කළ හැකි තරම් අගී නම්) ඊට දක්වෙන ආශාව අධිකතර බැව් කිවයුතු නො වේ.

"චිත්තීකතං මහග්ඝං ච-අතුලං දුල්ලභදස්සනං
අනොමසත්තපරිභොගං-රතනං තෙන දුල්ලභං."

කියූ පරිදි චිත්තීකෘතාදී කාරණයන්ගෙන් රත්න යයි කියනු ලැබේ. මෙහි කුස පිළිසිඳ ගත් බෝසතුන් අනගි මිණිරුවනකට සමාන කරණලදි. මිණිරුවන අනගි නම් එය කරඬුවෙක තැන්පත් කළ යුතු වේ. බෝසත් නැමැති මිණිරුවන මහාමායා



දේවියගේ කුස නැමැති කරඬුවෙහි පිළිසිඳ ගැනීම් වශයෙන් තැන්පත්වූ බැව් මේ ගාථාවෙන් කියන ලදි. බෝසතුන් කුස පිළිසිඳ ගණිත් ම දෙතිස් පෙර නිමිති පහළවූහ.

## (32) දෙතිස් පෙර නිමිති.

(1) දස දහසක් සක්වළ මහා පෘථුවිය කම්පාකොට මහා ගර්ජනා පැවැත්ම, (2) දස දහසක් සක්වළ සියලුම දිව්‍ය බ්‍රහ්මාදීන්ගේ ආලෝක මැඩපවත්වා ඒකාලෝක කිරීම, (3) ජාත්‍යන්ධයන්ගේ ඇස් පෙණීයාම, (4) ජාති ගොළුවන්ට සතුටින් ගී නාද පවත්වන්ට හැකිවීම, (5) ජාති බධිරයන්ට වීණා ගීතිකා ශබ්ද ඇසීමට ලැබීම, (6) උත්පත්තියෙහි පටන් දෙපයින් යා නොහැකිව සිටි පිළක්ට ඍජු ගමන් යාමට හැකිවීම, (7) උත්පත්තියෙහි පටන් කුදුව සිටියන්ගේ ශරීර කුදු බව හැරී ඍජු සිරුර ඇතිව උස් තැන්වල තිබුනු කුදු මහත් ඵලයන් සිය කැමැත්ත ලෙස ගෙණ අනුභව කිරීමට හැකිවීම, (8) බන්ධනගත සතුන් එයින් මිදී කැමැතිසේ හැසිරීම, (9) දස දහසක් සක්වළ තෙළෙස් ලක්ෂ සැට දහසක් නරකවල ගිනි නිවීයාම, (10) සා පිපාසායෙන් පුහු ප්‍රෙතයන්ට බත් පැන් ලැබී සතුටුවීම, (11) උපන්දා සිට මරබියෙන් ඇවිදින තිරිසන් සතුන් බිය නැතිව ඇවිදීම, (12) සියලු සතුන්ගේ අසාධ්‍ය රොග සුව වී ප්‍රිය තෙපුල් කීම, (13) දශකුලෙහි ඇතුන් කුඤ්චනාද කිරීම, (14) සියලු සතුන් එකිනෙකා අප්‍රිය තෙපුල් නොකියා ප්‍රිය වචන කීම, (15) අශ්වයන් සතුටින් හෙසාරව පැවැත්වීම, (16) සිංහයන් සතුටින් නාද කිරීම, (17) සියලු සිවුපාවුන් සතුටින් නාද කිරීම, (18) සියලු දෙව් මිනිසුන් පැළඳි කඩක - කවක - නූපුරාදී ආභරණ බැබලීම, (19) දස දහසක් සක්වළ බුදු රැස් වැනිවූ රැස් විහිදීයාම, (20) චණ්ඩමාරුතයෙන් දුරුවූ වනමල් සුවඳින් සුගන්ධිත වූ මඳ සුළඟ හැමීම, (21) අකාලයෙහි සිහිල් වැසි වැසීම, (22) පෘථුවිය පලාගෙණ නැගී නාඹතල් කඳන් වැනිවූ දියදාරාවන් පිදී කඳන් මෙන් ඒ ඒ අත පැතිරයාම, (23) සියලු පක්ෂීන් අහසින් නො ගොස් පොළොවට බැස මධුරාකාරයෙන් නාද කිරීම, (24) ගං හෝ ඇළ දොළ උඩුගම් බලා යාම, (25) සමුද්‍ර ජලය ලවණ රස පියා මධුර රසවීම, (26) සකල සාගරයන් පස් පියුමෙන් සැරසී සිටීම, (27) දියෙහි හා ගොඩ පිපෙන මල් එකවර පිපී සුවඳ විහිදීම, (28) දස දහසක් සක්වළ ගස් වැල්වල අග දක්වා මල් පිපීයාම, (29) දස දහසක් සක්වළ පොළොව පලාගෙණ සත්

බුමු මල් පිපීම, (30) අහසෙහි සෑම තැන පියුම් පිපී උඩබලා නැගී පිහිටීම, (31) දසදහසක් සක්වළ සෑම තන්හිම මල්වැසි වැස එක මල් ආසනයක් මෙන් වීම, (32) පොළොව පලාගෙණ නැගී ධ්වජ මාලාවෙන් බඹලොව දක්වා වසා ගැණීම යන මොහු වෙත්.

“පදක්ඛිණං” යමක් ගෞරව කරණු ලබන ගුරුවර දෙමවු පියාදීන් පැදකුණු කොට වැඳීම පෙර පැවැති චාරිත්‍රයෙකි. “පැදකුණු” නම් ගෞරව කරණු ලබන්නා දෙසට තමන්ගේ දකුණත සිටින සේ වටා ගමන් කිරීමයි.

මේ ගාථාවෙන් බෝසතුන් කුස පිළිසිඳගත් අයුරු දක්වූහ. සුදු පියුමක් සොඬින් ගත් සුදු ඇත්පොව්වකු දේවිය වටා පැදකුණු කොට කුස තුළට පිවිසුනු අයුරක් මහමායා දේවිය සිහිනෙන් දුටුවාය. මෙයින් බෝසතුන් කුස පිළිසිඳ ගත් බැව් සිහිනය පරීක්ෂාකළ බමුණු පඬිවරයෝ ප්‍රකාශ කළහ. උතුමන් ගේ කුස පිළිසිඳ ගැණීම ආදී විශෙෂ අවස්ථාවන්හිදී පෙර නො වූ විරූ අසිරිමත් දේ සිදුවීම ලොව සැමකල්හි පවතී. අප බෝසතුන් මවුකුස පිළිසිඳ ගණ්ද්දී ම පෙර නිමිති දෙතිසක් පහළවූ බැව් පෙනේ.

29 දසෙකාදසමාසෙන-තස්සේ'වං ආසි චෙතනා
පස්සිතුං සකඤාතීනං-ගන්ත්වාන නගරං තදා.

**අන්වය:-** තදා දසෙකාදසමාසෙන නගරං ගන්ත්වාන සකඤාතීනං පස්සිතුං තස්සා එවං චෙතනා ආසි.

**පදාර්ථ:-** තදා, එකල්හි, දසෙකාදසමාසෙන, දසමසකින් හෝ එකොළොස් මසකින්, නගරං ගන්ත්වාන, නුවරට ගොස්; සකඤාතීනං, සිය නෑයන්; පස්සිතුං, බලන්නට; තස්සා, ඒ මහාමායා දේවීන්ට; එවං, මෙසේ; චෙතනා ආසි, සිතුවිල්ලක් විය.

**භාවය:-** බෝසතුන් මවුකුසින් බිහිවන්නට සුදුසුවූ කාල යෙහි දසමසකින් හෝ එකොළොස් මසකින් සිය නුවරට (දෙව්දහ නුවරට) ගොස් නෑයන් දැකීමෙ සිතක් දේවියට පහළ විය.

**ක්‍රි: ස:** තස්සා චෙතනා ආසි. යනුයි.

**උ: කා:** පුගමයි.

**සමාස:** දසෙකාදසමාසෙන, සකඤාතීනං.



**විග්‍රහ.** එකෙන අධිකාදස එකාදස, දසන්නං වා එකාදසන්නං වා මාසානං සමාහාරෝ දසෙකාදසමාසං, තෙන; අත්තනො ඤාතයො සකඤාතයො, තෙසං සකඤාතීනං.

**පරිකථා:-** “දසෙකාදස මාසෙන”

(දසමසකින් හෝ එකොළොස් මසකින්) යි සමන්තකූට වණ්ණනාවෙහි කී වෙදෙහ ස්වාමිපාදයෝ උන්වහන්සේගේම කෘතියක් වූ “රසවාහිනියෙහි” දසමාසද්ධමාසමෙවන යි ගර්භාශ ස්ථිත්‍යාව දක්වූහ.

මේ පිළිබඳ මත භෙදයෝ බොහෝ වෙත්.

(විස්තර කැමතියන් පරිකථා සහිත දහම්සොඬ කව බැලිය යුතුයි.)

මත භෙද කෙසේ වෙතත් බෝසතුන් සම්පූර්ණ නොඅඩු දසමසක් මවුකුසෙහි විසූ බැව් සිතිය යුතු යි.

30 නිවෙදෙත්වා තමත්ථං සා-රඤ්ඤො තෙන සුසජ්ජිතෙ
සපරිච්ඡදා තදා මග්ගෙ-ගච්ඡන්ති අන්තරාපථෙ.

**අන්වය:-** තදා සා රඤ්ඤො තමත්ථං නිවෙදෙත්වා තෙන සුසජ්ජිතෙ මග්ගෙ සපරිච්ඡදා ගච්ඡන්ති අන්තරාපථෙ.

**පදාර්ථ:-** තදා, එකල්හි; සා, ඕතොමෝ; රඤ්ඤො, සුදොවුන් මහ රජහට; තමත්ථං, ඒ අභිලාෂය; නිවෙදෙත්වා, දන්වා; තෙන, ඒ රජහු විසින්, සුසජ්ජිතෙ, මොනවට සදනලද; මග්ගෙ මාර්ගයෙහි; සපරිච්ඡදා, පිරිවර සහිත වූවා; ගච්ඡන්ති, යන්නී; අන්තරාපථෙ, අතර මගදී;

31 දෙවතානං මනොනන්ද-කරං නන්දන සන්නිභං
දිස්වාන ලුම්බිනිං නාම-උය්‍යානං මනනන්දනං.

**අන්වය:-** දෙවතානං මනොනන්දකරං නන්දනසන්නිභං මනොනන්දනං ලුම්බිනිං නාම උය්‍යානං දිස්වාන.

**පදාර්ථ:-** දෙවතානං, දෙවියන්ගේ; මනොනන්දකරං, විනොද කරවූ; නන්දනසන්නිභං, නඳුන් වනය වැනි වූ; මනොනන්දනං, සිත්කළු වූ; ලුම්බිනිං නාම, ලුම්බිනී නම් වූ; උය්‍යානං, උයන; දිස්වාන, දැක;

32 තස්මිං කීළිතුමුස්සාහා-පවිසිත්වාන තං වනං
කීළන්ති උපගන්ත්වාන-මඞ්ගලං සාලපාදපං.

අන්වය:- තස්මිං කීළිතුං උස්සාහා තං වනං පවිසිත්වාන කීළන්ති මඞ්ගලං සාලපාදපං උපගන්ත්වාන.

පදාර්ථ:- තස්මිං, ඒ සල්වෙනෙහි; කීළිතුං, ක්‍රීඩාකරන්නට; උස්සාහා, උත්සාහයෙන්; තං වනං, ඒ වනයට; පවිසිත්වාන, පිවිස; කීළන්ති, ක්‍රීඩා කරන්නී; මඞ්ගලං සාලපාදපං, මඟුල් සල් රුක වෙත; උපගන්ත්වාන, එළඹ;

33 විලොල පල්ලවාකිණ්ණං-සුඵුල්ල කුසුමොනතං
ගණ්හෙත්වා සාලසාඛං සා-සුරත්ත කර පල්ලවා.

අන්වය:- සා සුරත්ත කර පල්ලවා විලොල පල්ලවාකිණ්ණං සුඵුල්ල කුසුමොනතං සාලසාඛං ගණ්හෙත්වා.

පදාර්ථ:- සා, ඒ මහාමායා දෙවිතොමෝ; සුරත්ත, අති රක්තවූ, කරපල්ලවා, අත්තල නමැති ලපලු පතින්, විලොල, විශෙෂයෙන් චංචලවූ; පල්ලවාකිණ්ණං; ලපලුයෙන් ගැවසී ගත්තාවූ; සුඵුල්ල, සුප්ඵුල්ලවූ; කුසුමොනතං, පුෂ්පභාරයෙන් අවනතවූ; සාල සාඛං, සල් අත්තක්; ගණ්හෙත්වා, ගෙණ;

34 දෙවෙහි ගහිතා රක්ඛා-මහමානෙ සදෙවකෙ
ජනෙසි තනයං මායා-තත්‍රට්ඨා ලොකලොචනං.

අන්වය:- සදෙවකෙ මහමානෙ තත්‍රට්ඨා මායා දෙවෙහි ගහිතාරක්ඛා ලොකලොචනං තනයං ජනෙසි.

පදාර්ථ:- සදෙවකෙ, දෙවිගන් සහිත ලොකයා; මහමානෙ, පූජාවිධි පවත්වන කල්හි; තත්‍රට්ඨා, ඒ සල් රුක වෙත සිටියාවූ; මායා, මහාමායා දේවිතොමෝ; දෙවෙහි, දෙවියන් විසින්; ගහිතා රක්ඛා, ගන්නාලද ආරක්ෂා ඇත්තී; ලොකලොචනං, තිලොවට ඇසක් වැනිවූ; තනයං, පුත් රුවන; ජනෙසි, වැදූ;

භාවය:- (30 - 31 - 32 - 33 - 34)



එකල්හි ඒ මහාමායා දේවිතොමෝ සුදොවුන් රජහට සිය අදහස් දන්වා ඒ රජහු විසින් සරසනලද මාර්ගයෙහි පිරිවර සහිත ව යන්නී අතර මගදී දෙවියන්ගේ සිත් තුටු කරණ නඳුනුයන වැනි වූ ලුම්බිනී නම් උයන දුක එහි ක්‍රීඩා කරණ අදහස් ඇති ව උයනට පැමිණ මඟුල් සල් රුක වෙත ගොස් මල් බරින් නැමුනු සල් අත්තක් සුරතින් අල්වා ගෙණ සිටින්නී දෙවියන් සහිත ලොකයා විසින් මහ පුද පවත්වන කල්හි තිලොවට ඇසක් වැනි පුත් රුවන ප්‍රසූත කළාය.

ක්‍රි: ස: සා තමත්ථං නිවෙදෙත්වා තෙන සුසජ්ජිතෙ මග්ගෙ ගච්ඡන්ති උය්‍යානං දිස්වාන වනං පවිසිත්වාන සාලපාදපං උපගන්ත්වාන සාලසාඛං ගහෙත්වා ඨිතා තනයං ජනෙසි.

උ: ස: ජනෙසි යන (ජන - ජනනෙ ධාතු) අජ්ජතනී විභක්ති කර්තෘ කාරක ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් සා යනු උක්ත ප්‍රකෘති කර්තෘයි. තත්‍රට්ඨා යනු උක්ත විකෘති කර්තෘයි. තනයං යනු අනුක්ත කර්මයි. නිවෙදෙත්වා දිස්වාන පවිසිත්වා උපගන්ත්වාන ගහෙත්වා යන පෙර කිරියට ද සා යනු ම උක්ත කර්තෘයි. තමත්ථං උය්‍යානං වනං සාලපාදපං සාලසාඛං යන මොව්හු නිවෙදෙත්වා යනාදී පූර්වක්‍රියාවන්ට පිළිවෙළින් කර්මයෝ වෙත්. සුසජ්ජිත යන අප්‍රක්‍රියාවට තෙන යනු අනුක්ත කර්තෘයි. මග්ගෙ යනු උක්තාධාරයි. ගච්ඡන්ති යන අප්‍ර ක්‍රියාවටද සා යනු ම උක්ත කර්තෘයි.

වි: විශෙෂ්‍ය: අත්ථං විශෙෂ්‍යයි. තං විශෙෂණයි. මග්ගෙ විශෙෂ්‍යයි. සුසජ්ජිතෙ විශෙෂණයි. උය්‍යානං විශෙෂ්‍යයි. මනොනන්දකරං නන්දනසන්නිභං මනනන්දනං ලුම්බිනිං විශෙෂණයෝයි. වනං විශෙෂ්‍යයි. තං විශෙෂණයි සාලපාදපං තුල්‍යාධිකරණ විශෙෂ්‍යයි. මඞ්ගලං විශෙෂණයි. සාලසාඛං විශෙෂ්‍යයි. විලොල පල්ලවාකිණ්ණසුඵුල්ලකුසුමොනතං විශෙෂණයෝයි. තනයං විශෙෂ්‍යයි. ලොකලොචනං තුල්‍යාධිකරණ විශෙෂණයි. මායා විශෙෂ්‍යයි. සා ගච්ඡන්ති උය්‍යානං සුරත්තකර පල්ලවා ගහිතා රක්ඛා තත්‍රට්ඨා යනු තද්විශෙෂණයෝ වෙත්.

සමාස:- සුසජ්ජිතෙ, සපරිච්ඡද, අනන්තරපථෙ, මනොනන්දකරං, නන්දන සන්නිභං, මනනන්දනං, සාලපාදපං, විලොල පල්ලවාකිණ්ණං, සුඵුල්ලකුසුමොනතං, සාල සාඛං සුරත්තකර පල්ලවා, ගහිතා රක්ඛා, සදෙවකෙ තත්‍රට්ඨා, ලොකලොචනං.

**විග්‍රහ:** සුට්ඨු සජ්ජිතො සුසජ්ජිතො තස්මිං, සහ පරිච්ඡදෙන යො වත්තතීති සො පරිච්ඡදො, පථස්ස අන්තරං අන්තරාපථො තස්මිං ආ භුසො නන්දයතීති ආනන්දො, (ආ පුබ්බ නන්ද සමිද්ධියං) මනස්ස ආනන්දො මනොනන්දො මනොනන්දං කරෙතීති මනොනන්දකරො තං, නන්දනස්ස සභාගො නන්දන සභාගො, තං නන්දයතීති නන්දන මනස්ස නන්දනං මනනන්දනං තං, සාලො ච සො පාදපො චාති සාලපාදපො තං, විසෙසෙන ලොලානි විලොලානි විලොලානි ච තානි පල්ලවානි චෙති විලොල පල්ලවානි තෙහි ආකිණ්ණො විලොල පල්ලවා කිණ්ණො තං, සුට්ඨු ඵුල්ලානි සුඵුල්ලානි සුඵුල්ලානි ච තානි කුසුමානි චෙති සුඵුල්ලකුසුමානි, තෙහි ඔනතං සුඵුල්ල කුසුමො නතා තං, සාලස්ස සාඛා සාලසාඛා තං, අතිසයෙන රත්තො සුරත්තො, තරො එව පල්ලවො සුරත්තතර පල්ලවො යස්සා සා සුරත්තතරපල්ලවා, ගහිතා ආරක්ඛා යෙහි සො ගහිතාරක්ඛා, තස්මිං තත්‍ර අට්ඨාසීති තත්‍රට්ඨා, ලොචනං විය ලොචනං ලොකස්ස ලොචනං ලොකලොචනං.

**පරිකථා:-** "නන්දන සභාගිනං"

දෙවියන්ගේ උයන නන්දන නම් වේ. ප්‍රාකාර පුෂ්කරණී ආදියෙන් හා නානා වෘක්ෂලතා ආදියෙන් ද සමලඞ්කෘතවූ එය ඔවුන්ගේ ප්‍රීතිවර්ධනය සඳහා සෑදී සිටී. සියලුම සුරසුන්දරීන්ගේ මන දෙළ පිරවීමෙහි සමත්වූ නඳුනුයන කොතරම් චිත්තාකර්ෂණීය ද යත හොත් එහි ක්‍රීඩාශක්ත ඇතැම් දෙවියෝ ප්‍රීති මදයෙන් මත් වූ වාහු භොජනානුභව කාලය පවා විස්මෘත කොට කළුරිය කෙරෙති.

සුදෙවුන් රජහුගේ ලුම්බිනී වනොද්‍යානය ද මේ නන්දන වනයාගේ ශොභාව උද්වහනය කරන්නේ ය.

"ලුම්බිනී"

ලුම්බිනී" නම් රජකුමරියකගේ නමින් ඉදි කරණ ලද හෙයින් මේ උද්‍යානය ද ලුම්බිනී නම් විය. මෙය අප බොධිසත්ත්වයන්ගේ ජාත භූමිය යි. දෙව්දහ නුවරටත් කිඹුල්වත් පුරයටත් අතර මෙය පිහිටියේය. පසු කාලයක ධර්මාශොක රජතුමා විසින් බොධිසත්වොත්පත්තිය සඳහන් කොට සෙල් ටැඹක් පිහිටුවන ලදී. මේ ශිලා ලිපිය තවමත් දක්නා ලැබේ. දැන් ලුම්බිනියට රුම්න්දෙයි ය යි කියති.



දෙවෙහි ගහිතාරක්ඛා.

බෝසතුන් මවුකුස පිළිසිඳ ගත් දිනයේ පටන් සිවුවරම් රජවරු බෝධිසත්ව මාතාවට හා බෝධිසත්ව කුමාරයානටද ආරක්ෂාව සැලසූහ. මවු කුසින් බිහිවන අවස්ථාවෙහි දී ද සිවු වරම් රජවරුන් ඇතුළු බොහෝ දිව්‍ය සේනාව උන් වහන්සේගේ ආරක්ෂාවට සිටියහ.

ලොක ලොචනං.

බෝසත් කුමරු ලොවට ඇසක් වැනියි, කිමෙන් උන්වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රිය ජනකවීද යනු පැවසූහ. ලොකයාගේ ඇසට තරම් ප්‍රේමයක් අන් කිසිදු අවයවයකට නැතිතරම්ය. ඇස නැතිකලට ජීවිතයෙන් නියම ප්‍රයෝජන නොලැබෙන හෙයින් ඔව්හු එසේ ඊට ආදරය කෙරෙති. බුදුවරයන්ගේ ලොව පහළවීමෙන් සසර දුකෙහි ගැලී සිටින සත්වයනට දිට්ඨධම්මික-සම්පරායික වශයෙන් සිදුවන විශාල ලාභය වාග් විෂයාතික්‍රාන්තය. බුදුවරයකු ලොවපහළ නොවී නම්ලොකවාසීහු මොහාන්ධකාරයෙන් වැසී සසර දුකින් මිදීමට පිහිටක් නැත්තාහු අප්‍රමාණ දුඃඛ රාශියක නිමග්න වූවෝ වෙත්. දෙවියන් සහිත ලොකයා සසර දුකින් මුදා අනන්ත ශුභ සිද්ධියක් සිදුකරන්නෝ බුදුවරයෝ යි. ඒ බුද්ධත්වය සඳහා උපන් බොධිසත්ව කුමාරයන් ලෝ වැසියනට ඇසක් මෙන් ප්‍රියවී යයි කියන ලද්දේ මේ කාරුණු සැලකීමෙනි.

(30–34) යන මේ ගාථාවලින් බොධි සත්වයන් වහන්සේගේ මවු කුසින් බිහිවීම විස්තර කරණ ලදී. ඇතැම් මහායානික ග්‍රන්ථයන්හි බොධිසත්වයන් මහාමායා දේවියගේ දකුණැලයෙන් සෑඩියෙන් නික්මුණු බව සඳහන්වේ. ප්‍රතිසන්ධිග්‍රහණ දවසෙහි මෙන් මෙදින ද දෙතිස් පෙර නිමිති පහළ විය. යශෝධරා දෙවි-ඡන්න අමාත්‍ය-කාළුදායි-අජානීය ඇත් රජ-කන්ථක අශ්ව රජ-මහබෝරුක-සතර මහනිධාන යන මොවුන්ගේ උත්පත්තියද මේ දවසෙහි ම සිදුවිය.

35 බ්‍රහ්මානො ලොක පාලා ච - මනුස්සා කමතො තදා
සොණ්ණ ජාලාජිනාදිහි - ගණ්හිංසු ජනනන්දනං

**අන්වය:-** තදා බ්‍රහ්මානො ලොකපාලා ච මනුස්සා ච සොණ්ණජාල අජිනාදිහි කමතො ජනනන්දනං ගණ්හිංසු.

**පදාර්ථ:-** තදා, එකල්හි; බ්‍රහ්මානො, බ්‍රහ්ම රාජයෝද; ලොකපාලා ච, ලොක පාලක දෙවියෝද; මනුස්සා ච, මනුෂ්‍යයෝද; සොණ්ණජාල, රන් දැලය; අජිනාදීහි, අඳුන් දිවිසම් යනාදීයෙන්; ජනනන්දනං, ජනනන්දකර වූ බෝධිසත්වයන් වහන්සේ; ගණ්හිංසු, පිළිගත්තාහුය.

**භාවය:-** බෝසතුන් මවු කුසින් බිහිවූ කල්හි බ්‍රහ්මයෝද, දෙවියෝද, මනුෂ්‍යයෝද රුවන්දැල් අඳුන් දිවිසම් දුහුල් පිළී යනාදියෙන් උන්වහන්සේ පිළිගත්හ.

**ක්‍රි: ස:** බ්‍රහ්මානො ජනනන්දනං ගණ්හිංසු
ලොකපාලා " "
මනුස්සා " "
**උ: නා:** සුගමයි.

**සමාස:-** ලොකපාලා, සොණ්ණජාලාජිනාදීහි, ජනනන්දනං

**විග්‍රහ:-** ලොකං පාලෙන්තීති ලොකපාලා, සොණ්ණේන කතා ජාලා සොණ්ණ ජාලා, සොණ්ණජාලා ච අජිනානි ච සොණ්ණජාලාජිනානි සොණ්ණජාලාජිනානි ආදි යෙසන්ති සොණ්ණජාලාජිනාදයො තෙහි, ජනං නන්දෙතුං සීලමස්සාති ජනනන්දනො තං.

**පරිකථා:-** බ්‍රහ්මානො අනාගාමී බ්‍රහ්මරාජයෝ සතර දෙනෙක් රන්දැලින් බෝ සතුන් පිළිගත්හ.

**ලොකපාලා.**

ලොකයා ආරක්ෂා කිරීමට ලෝක පාලක දෙවිවරු කොටසක් සිටිති. ධෘතරාෂ්ට්‍ර-විරූඪ-විරූපාක්ෂ-වෛශ්‍රවණ යන දෙවිවරු සතරදෙන ලෝකපාලක දෙවිවරු වෙත්.

ලොකපාලක නමින් දෙවිවරු අට දෙනෙකුන් සිටින බැව්ද ඇතැම් ග්‍රන්ථයන්හි දක්වා තිබේ.

ඉන්ද්‍රො වහ්නිඃ පිතෘ පතිර් නෛර්ඍතො වරුණො මරුත්,

කුවෙර ඊශඃ පතයඃ පූර්වාදීනාං දිශාන් ක්‍රමාත්

යනුවෙන් දක්වන ලද

(1) ඉන්ද්‍ර, (2) අග්නි, (3) යම, (4) නෛඍත,(නිරිත), (5) වරුණ (6) මරුත් (වායු) (7) කුවෙර, (8) ඊශ (ඊශාන), යනු මොහු අට දිගට අධිපති හෙයින් ලෝකපාල නම් වෙති.



**සොණ්ණජාලා ජිනාදීහි.**

සොණ්ණජාල නම් රන් හුයින් කළ සිහිඳු සොම්පහස් ඇති දැලකි.

**අජින.**

නම් අඳුන් දෙවියන්ගේ සමයි. ආදි ශබ්දයෙන් දුහුල්පිළි ගතයුතුයි. දුහුල් පිළිනම් ඉතා සියුම් උසස් රෙදි වෙසෙසකි.

36 **මහිං පතිට්ඨිතො ධීරො - පෙක්ඛමානො තතොදිසා**
**උත්තරාභිමුඛො සත්ත - පදං ගන්ත්වාම්බුජෙ ඨිතො.**

**අන්වය:-** තතො ධීරො, මහිං පතිට්ඨිතො දිසා පෙක්ඛමානො උත්තරාභිමුඛො සත්ත පදං ගන්ත්වාම්බුජෙ ඨිතො.

**පදාර්ථ:-** තතො, ඉක්බිති; ධීරො, ප්‍රාඥවූ ඒ බොධිසත්වතෙම; මහිං, පෘථිවියෙහි පතිට්ඨිතො, පිහිටියේ; දිසා පෙක්ඛමානො, දිශා විලොකනය කොට; උත්තරාභිමුඛො, උතුරුදිගට අභිමුඛවූයේ; සත්ත පදං, සත් පියවරක්; ගන්ත්වා, ගොස්; අම්බුජෙ, පියුම්පිට; ඨිතො, සිටියේ.

37 **දිසන්තමවලොකෙත්වා - ඵුල්ලම්බුජලොචනො**
**නිච්ඡාරෙසාසභිං වාචං - අග්ගො සෙට්ඨොති ආදිනා.**

**අන්වය:-** ඵුල්ල අම්බුජලොචනො දිසන්තං අවලොකෙත්වා, අග්ගො සෙට්ඨොති ආදිනා ආසභිං වාචං නිච්ඡාරෙසි.

**පදාර්ථ:-** ඵුල්ල, ප්‍රබුද්ධ වූ; අම්බුජලොචනො, නිලුපුල්වැනි ඇස් ඇති බෝසත් තෙම; දිසන්තං දිශාන්තය; අවලොකෙත්වා, බලා; අග්ගො සෙට්ඨො ඉති, අග්‍රයෙමි, ශ්‍රෙෂ්ඨයෙමි; ආදිනා, මේ ආදීන්; ආසභිං වාච; අභීතසිංහනාදයක්; නිච්ඡාරෙසි, නිකුත් කළ සේක.

**භාවය:-** (36-37) ඉක්බිති ප්‍රාඥවූ බොධිසත්ව තෙම පොළොවෙහි පිහිටියේ දිශාවලොකනය කොට පියුම්පිටින් උතුරුදිගට සත් පියවරක් ගොස් ලොවට මම අග්‍රයෙමියි = ශ්‍රෙෂ්ඨයෙමි යි. අභීත වූ ශ්‍රෙෂ්ඨ නාදයක් කළසේක.

**ක්‍රි: ස:** ධීරො ආසභිං වාචං නිච්ඡාරෙසි.

**උ: නා:** සුගමයි.

**සමාස:** උත්තරාභිමුඛො සත්තපදං අම්බුජෙ දිසන්තං ඵුල්ලම්බුජලොචනො.

**විග්‍රහ:** උත්තරාය අභිගතං මුඛං අභිමුඛං යස්ස සො උත්තරාභිමුඛො, සත්තානං පදානං සමාහාරො සත්තපදං තං අම්බුම්හි ජාතො අම්බුජො (අම්බු සද්දූප පද ජන-ජනනෙ) තස්මිං දිසාතං අනෙනා දිසනෙනා තං, සුඵුඵුල්ලානි සුඵුල්ලානි අම්බුනී අජනිංසූ ති අම්බුජානි (අම්බු සද්දූප පද ජන-ජනනෙ) සුඵුල්ලානි ච තානි අම්බුජානි චෙති. සුඵුල්ලම්බුජානි සුඵුල්ලම්බුජානි විය ලොචනානි යස්ස සො සුඵුල්ලම්බුජලොචනො.

**පරිකථා:-**

**දිශා,** දිශාවෝ දශ දෙනෙක් වූහ.

(1) පූර්ව, f2) පශ්චිම, (3) උත්තර, (4) දක්ෂිණ, (5) ඊශාන, (6) අග්නි, (7) නිරිත, (8) වයඹ උඩ=යට යන මොහුවෙත්.

**සුඵුල්ලම්බුජලොචනො.**

බෝසත් තෙමේ සුපිපි නිලුපුලකට බඳු ඇස් ඇත්තේය. අසූ අනුව්‍යඤ්ජන දෙතිස් මහාපුරිස් ලකුණුවලට ඇතුළත් ශරීර ලක්ෂණයක්වූ නීලොත්පලායමාන නෙත්‍ර යුග්මයක් බෝධිසත්ව කුමාරයන්ට පිහිටා තිබුනේය. එහෙයින් සුඵුල්ලම්බුජලොචනො යි කීහ.

38 බ්‍රහ්මාමරනරාදීහි - පූජිතොච නමස්සිතො
කමෙන අභිවඩ්ඪන්තො - පුණ්ණපක්ඛෙ සසී යථා.

**අන්වය:-** බ්‍රහ්ම-අමර-නර ආදීහි පූජිතොච, නමස්සිතොච, පුණ්ණපක්ඛෙ සසී යථා කමෙන අභිවඩ්ඪන්තො.

**පදාර්ථ:-** බ්‍රහ්ම, බ්‍රහ්මයෝය; අමර, දෙවියෝය; නර, මනුෂ්‍යයෝය; ආදීහි, යනාදීන් විසින්; පූජිතො ච, පුදනලද්දේද; නමස්සිතො ච, නමස්කාර කරණ ලද්දේද; පුණ්ණපක්ඛෙ, ශුක්ල පක්ෂයෙහි; සසී යථා, චන්ද්‍රයාමෙන්, කමෙන, ක්‍රමයෙන; අභිවඩ්ඪන්තො, වැඩෙන්නේ;

**භාවය:-** දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් විසින් වැඳුම් පිදුම් කරණ ලද්දාවූ බෝසතානෝ ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයාමෙන් ක්‍රමයෙන් වැඩෙන්නේත්.

**ලක්ෂ:-** පූජිතො (පූජ=පූජායං) නමස්සිතො (නම=නමනෙ) යන කර්ම කාරක කෘදන්ත ක්‍රියාවන් විසින් අනුක්ත හෙයින් බ්‍රහ්මාමරනරාදීහි යනු අනුක්ත කර්තෘ යි. මහාසත්තො යනු අධ්‍යාහෘත උක්ත කර්ම යි.



අභිවඩ්ඪන්තො යන (අභි පූර්ව වඩ්ඪ-වඩ්ඪනෙ) කර්තෘකාරක කෘදන්ත ක්‍රියාවෙන්ද මහාසත්තො යනුම උක්ත කර්තෘයි.

**වි: විශේෂ්‍ය:-** (මහාසත්තො විශේෂ්‍යයි] පූජිතො නමස්සිතො අභිවඩ්ඪන්තො යනු තද්විශේෂණයෝ යි. මහාසත්තො උපමෙයයි. සසී යනු උපමායි.

**සමාස:-** බ්‍රහ්මාමරනරාදීහි, පුණ්ණපක්ඛෙ. අභිවඩ්ඪන්තො.

**විග්‍රහ:-** බ්‍රහ්මා ච අමරා ච නරා ච බ්‍රහ්මාමරනරා තෙ ආදී යෙසං තෙත බ්‍රහ්මාමරනරාදයො, තෙහි, පුණ්ණස්ස පක්ඛො පුණ්ණපක්ඛො තස්මිං, අභාවෙන වඩ්ඪන්තො අභිවඩ්ඪන්තො.

**පරිකථා.**

පූර්ණ පක්ෂය යි.

පූර්ණ පක්ෂය නම් සඳ වැඩෙන පක්ෂයයි. චන්ද්‍රයා පිළිබඳ පක්ෂ දෙකකි. කෘෂ්ණ පක්ෂය පූර්ණ පක්ෂය යනු ඒ දෙකයි. කෘෂ්ණ පක්ෂය චන්ද්‍රයාගේ හායන (පිරිහෙන) පක්ෂය වේ. ඒ පක්ෂයේදී චන්ද්‍රයා ක්‍රමයෙන් හීන වී ගොස් පක්ෂය සම්පූර්ණ වූ විට සම්ප්‍රකාරයෙන් ම නැති වේ.

කෘෂ්ණ පක්ෂය අවසන් වූ විට ලබන පූර්ණ පක්ෂයේදී අනුක්‍රමයෙන් වැඩී ගිය චන්ද්‍රයා පක්ෂය සම්පූර්ණවූ විට අහස් කුස බබලමින් ප්‍රභාවත් ව දර්ශනය වේ. චන්ද්‍රයා පිළිබඳ කලා (16) සොළසක් වේ. කලාව නම් කොටසකි. චන්ද්‍රයා කලාවෙන් කලාව වැඩෙන්නේ වේ. පූර්ණ පක්ෂය සම්පූර්ණ වීමත් සමගම චන්ද්‍රයාගේ කලා සොළසත් සම්පූර්ණ වේ. පුරාණ කථා අනුව නම් චන්ද්‍රයාගේ වැඩීම මෙසේය. දෙවියන්ගේ අමෘතය රැස්කොට තබනුයේ මෙහිමය. එක් පක්ෂයක ඔව්හු අමෘතය රැස්කොට තබා අනිත් පක්ෂයේදී එය අනුභවයට පටන් ගණිත්. අමෘතය තැන්පත් කරණ කාලය පුරපක්ෂයයි ද අමෘතය අනුභව කිරීමෙන් අවසන් වන පක්ෂය අව-පක්ෂය කෘෂ්ණ පක්ෂය යන නම් වලින්ද හඳුන්වනු ලැබේ.

සා ලපයක් ඇති හෙයින් චන්ද්‍රයාට සසින් යයි නමකි. චන්ද්‍රයාගේ සා ලපය ඇතිවූ පරිදි සස ජාතකයෙහි පෙනේ.

අප මහබෝසතාණන් වහන්සේ අතීතයෙහි සස යෝනියෙහි උපන්හ. දිනක් සවත් මිත්‍ර පිරිසක් සමග සිල් රකිමින් සිටි ඔහු "ම වෙත යදියකු පැමිණියොත් ඇඟමස් දන්දෙමි යි සිතූහ. බෝසතුන්ගේ උදාරාධ්‍යාශය බලයෙන් ශක්‍රදෙවේන්ද්‍රයන්ගේ පඬුපුල් සලස්න හුණුවී ගියෙන් හෙතෙමේ යාචක වෙසක් මවා ගෙණ එතනට පැමිණ අනුභවයට යමක් ඉල්වීය. සාවා සිය අදහස ඉටුකිරීම සඳහා පැමිණි මේ අවස්ථාව ඉතා අගනේ යයි සිතා තමන්ගේ ශරීර මාංශය හැර දියයුතු අන් කිසිවක් නැතැයි කීය. යදියාද එය ඉල්ලූයෙන් ඔහු ලවාම ගිනි ගොඩක් දල්වා එහි පැන්නේය. මෙයින් ප්‍රමුදිතවූ ශක්‍රතෙමේ සෘද්ධි බලයෙන් සාවා රැගෙණ දෙව් ලොවට ගොස් පූජා සත්කාර කොට සාවාගේ ශ්‍රෙෂ්ඨ ක්‍රියාව කල්පාන්තය තෙක් නොනැසී පවතීවායි පතා රූපය සඳමඬලෙහි ඇන්දේය.

මේ සඳමඬලෙහි සාවාගේ රූපය ඇතිවූ ආකාරයයි.

යමෙකුගේ වැඩීම ඉතා සෞභාග්‍යවත්ව නිරොගීව සීඝ්‍රව සිදුවේ නම් ඒ වැඩීම පුරපස වැඩෙන සඳට සමාන කෙරේ.

39 බ්‍රහ්මූනං ජනිතඣායාය - මන්දාරකුසුමන්තරෙ
සානන්දාමන්දදෙවෙහි - ධූතචාමරමජ්ඣගො.

**අන්වය:-** බ්‍රහ්මූනං ජනිත ඣායාය මන්දාර කුසුමන්තරෙ සානන්ද අමන්ද දෙවෙහි ධූත චාමර මජ්ඣගො.

**පදාර්ථ:-** බ්‍රහ්මූනං, බ්‍රහ්මයන්ගේ; ජනිතඣායාය, සේසත් සෙවෙනෙහි; මන්දාර කුසුමන්තරෙ, මඳාරාමල් අතුරෙහි; සානන්ද, සන්තොෂ සහිතවූ; අමන්ද, ඉතා බෙහෝවූ; දෙවෙහි, දෙවියන් විසින්; ධූත, සලනලද; චාමර මජ්ඣගො, වල්විදුනා මධ්‍යගත වූයේ;

**භාවය:-** බඹුන් ඉසට ලූ සේසත් සෙවෙනෙහි හා පිදූ මඳාරා මල් අතුරෙහි ද වූ බෝසත් තෙමේ සතුටුවූ දෙවියන් විසින් සල නලද වල්විදුනා පවන් විඳිනුයේ.

**විශෙෂණ විශෙෂ්‍ය:**

මහාසත්තො විශෙෂ්‍යයි. ධූතචාමරමජ්ඣගො තුල්‍යාධි කරණ විශෙෂණයි.

**සමාස:-** ජනිතඣායාය, මන්දාරකුසුමන්තරෙ, සානන්දාමන්ද දෙවෙහි, ධූතචාමරමජ්ඣගො.



**විග්‍රහ:-** ආතපං ඣාදෙතීති ඣායා (ඡද-අපවාරණෙ) ජනිතානං ඣායා ජනිතඣායා තාසං, මන්දාරානි ච තානි කුසුමානි චෙති මන්දාරකුසුමානි තෙසං අන්තරං මන්දාරකුසුමන්තරං තස්මිං, සහ ආනන්දෙන යෙ වත්තන්තීති තෙ සානන්දා, න මන්දා අමන්දා, අමන්දා ච තෙ දෙවා චෙති අමන්දදෙවා සානන්දාච තෙ අමන්දදෙවා චෙති සානන්දාමන්දදෙවා තෙහි, ධූතානි ච තානි චාමරානි චෙති ධූතචාමරානි, ධූතචාමරානං මජ්ඣො, ධූතචාමර මජ්ඣො ධූතචාමර මජ්ඣං අගමාසීති ධූතචාමරමජ්ඣගො.

**පරිකථා.**

**මන්දාර කුසුම.**

මෙය දෙව් ලොව තිබෙන මල් වර්ගයෙකි.

"පඤ්චෛතෙ දෙවතරවො - මන්දාරඃ පරිජාතකඃ
සන්තානඃ කල්පවෘක්ෂශ්ච - පුංසි වා හරිචන්දනම්.

යනුවෙන් කියන ලද (1) මන්දාරය, (2) පාරිජාතය, (3) සන්තානය, (4) කල්පවෘක්ෂය, (5) හරිචන්දනය යන මොවුනු දෙව් ලොව පවත්නා අභීෂ්ටාර්ථප්‍රදායි වෘක්ෂයෝ වෙත්. දෙවියන් බෝසතුන්ට මේ මඳාරාමල් පිදූ බැව් මෙයින් හඟවයි.

**ධූතචාමර මජ්ඣගො.**

චාමර නම් සෙමර මුව වර්ගයාගේ වාලධියෙන් සාදනු ලබන විජිනි විශෙෂයෙකි. රජාදී උතුමන්ට පවන් සලනු ලබන්නේ මේ චාමරවාලධියෙනි. බ්‍රහ්මයන් බෝසතුන්ට සේසත් දැරූ බවත් මඳාරාමල් පිදූ බවත් දෙවියන් වල්විදුනාවෙන් පවන් සැලූ බවත් මෙයින් කීහ.

40 දිබ්බෙහි රූපසද්දෙහි-ගන්ධෙහි ච රසෙහි ච
ඵොට්ඨබ්බෙහි ච දිබ්බෙහි-මොදමානො අනෙකධා.

41 දිබ්බෙහි රමණීයෙහි-නාටකෙහි වාදිතෙහි ච
පදූනක සහස්සෙහි-පූජමාන ගුණාකරො.

**අන්වය:-** දිබ්බෙහි රූපසද්දෙහි ගන්ධෙහි ච රසෙහි ච දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි ච දිබ්බෙහි රමණීයෙහි නාටකෙහි වාදිතෙහි ච අනෙකධා මොදමානො පදූනක සහස්සෙහි පූජමාන ගුණ ආකරෙ.

**පදාර්ථ:-** දිබ්බෙහි, දිව්‍යමයවූ; රූපසද්දෙහි ච, රූපශබ්දයන් ගෙන් ද; ගන්ධෙහි ච, සුගන්ධයෙන් ද; රසෙහිච, රසයෙන් ද දිබ්බෙහි ච, දිව්‍යමයවූ; ඵොට්ඨබ්බෙහි ච, ස්පර්ශයෙන් ද; දිබ්බෙහි දිව්‍යමය වූ; රමණීයෙහි, සිත්කලුවූ; නච්චෙහි, නෘත්‍යයෙන් ද; වාදිතෙහි ච, වාද්‍යයෙන් ද; අනෙකධා, අනෙකප්‍රකාරයෙන්; මොදමානො, සතුටුවන්නේ; පදනෙකසහස්සෙහි, නොයෙක් දහස් ගණන් පදයෙන් ද; ථූයමාන, ස්තුති කරණු ලබන්නාවූ; ගුණා ගුණයනට; ආකරො, උත්පත්ති ස්ථානයක් වූයේ.

**භාවය:-** දිව්‍යමය වූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍ය යන මෙයින් හා සිත් කලුවූ නෘත්‍ය-ගීත-වාද්‍ය යෙන්ද සතුටු කරණු ලබන්නාවූ ගුණ සමූහයට ආකරයක් වැනිවූ (බෝසත්තෙමේ)

**වි: විශෙෂණ:** මොදමානො ථූයමානො ගුණාකරො යනු බොධිසත්තො යන්නට තුල්‍යාධිකරණ විශෙෂණයෝ යි.

**සමාස:** රූපසද්දෙහි, පදනෙකසහස්සෙහි, ථූයමානගුණාකරො.

**විග්‍රහ:** රූපානි ච සද්දා ච රූපසද්දා තෙහි, අනෙකානං සහස්සං අනෙකසහස්සං පදානං අනෙකසහස්සං පදනෙකසහස්සං තෙහි, ථූයමානා ච තෙ ගුණා චෙති ථූයමානගුණා තෙසං ආකරො ථූයමානගුණාකරො. දෙවානං හිතං දිබ්බං රමණස්ස ඨානං රමණීයං, ඵුසිතබ්බොති ඵොට්ඨබ්බො (ඵුස-සම්පස්සෙ). අනෙකෙහි විභාගෙහි අනෙකධා.

**පරිකථා:-** බොධිසත්වයන් වහන්සේ දිව්‍යමයවූ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ යන මෙයින් හා නෘත්‍ය ගීත වාද්‍යයෙන්ද සිත් සතුටුකරමින් කරුණා මෛත්‍රී කාමොපශාන්තාදි වර්ණනීය මහගු ගුණ සමුද්‍රයන්ට ආකරයක් (උත්පත්ති ස්ථානයක්) වැනිව ගිහි ගෙයි පස්කම් රස අනුභව කළ පරිදි මේ පද්‍යයෙන්ගෙන් කීහ.

42 පත්වා සොළසමං වයසං-ඤාතිසඞ්ඝස්ස මජ්ඣගො
දස්සෙසි සො'සෙසසිප්පං තං-ලොකෙ විජ්ජති යං තදා.

**අන්වය:-** ඤාතිසඞ්ඝස්ස මජ්ඣගො සොළසමං වයසං පත්වා තදා ලොකෙ යං විජ්ජති තං අසෙසසිප්පං දස්සෙසි.



**පදාර්ථ:-** ඤාතිසඞ්ඝස්ස, නෑ සමූහයාගේ; මජ්ඣගො, මධ්‍යගතවූ බොසත්තෙමේ; සොළසමං වයසං, සොළොස් හැවිරිදි වයසට; පත්වා, පැමිණ; තදා, එකල්හි; ලොකෙ, ලොකයෙහි; යං, යම් ශිල්පයක්; විජ්ජති, විද්‍යමාන වේද; තං, ඒ; අසෙසසිප්පං, සියලු ශිල්පය; දස්සෙසි, දැක්වී,

**භාවය:-** සොළසැවිරිදි වියෙහිදී නෑ සමූහයා මැදදී නොයෙක් ශිල්පයන් දැක්වී.

**ක්‍රි: ස:** ලොකෙ යං විජ්ජති.

**උ: කා:** විජ්ජති යන (විද-සත්තායං) වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් යං යනු උක්ත කර්තෘයි. ලොකෙ යනු අනුක්තාධාරයි. පත්වා යන පෙරකිරියට හා දස්සෙසි යන පෙරකිරියටද මහාසත්තො යනු කර්තෘයි. වයසං, අසෙසසිප්පං යනු පිළිවෙළින් පූර්ව ක්‍රියාවන්ගේ කර්මයෝ යි.

**වි: විශෙෂණ:** මජ්ඣගො යනු මහාසත්තො යන්නට තුල්‍යාධිකරණ විශෙෂණයි.

**සමාස:** ඤාතිසඞ්ඝස්ස, මජ්ඣගො, අසෙසසිප්පං.

**විග්‍රහ:** ඤාතීනං සඞ්ඝො ඤාතිසඞ්ඝො, තස්ස, මජ්ඣං අගමාසීති මජ්ඣගො, අසෙසං ච තං සිප්පං චෙති අසෙස සිප්පං තං.

**පරිකථා:-** සිදුහත් කුමරුට සොළසැවිරිදිවූ කල්හි සුදොවුන් රජතෙමේ ශාක්‍ය කෝලිය යන උභය පක්ෂයෙහිවූ ක්ෂත්‍රිය යන්ගේ ඒ ඒ කුලයෙන් එක එක කුමරිය බැගින් සිය පුතනුවන් වෙත එවනු මැනවැයි ඔවුන්ට දන්වා යැවීය. එවිහුත් සිදුහත් කුමරුන් කිසි ශිල්පයක් නොදන්නා හෙයින්ද ඉතාම සියුමැලි කුමරකු හෙයින්ද ඔහු වෙත අප දියණිවරුන් යවනු නොහැකියි සුදොවුන් රජුට දැන්වූහ. මේ බව දැනගත් සිදුහත් කුමරතෙමේ සියලුම ශාක්‍ය කෝලිය නෑ සමූහයා කිඹුල්වතට රැස් කරවා ඔවුන් මැදදී ලොව පවත්නා යම් ශිල්ප සමූහයක් වේ නම් ඒ සියල්ලම දක්වා ඔවුන්ගේ සැක දුරු කෙළේය. එකලට සිදුහත් කුමරු සියලු ශිල්පයන්හි පාරප්‍රාප්තව සිටි බැව් මෙයින් පැවසේ.

43 ඤාතිසංඝං පමොදෙන්තො-දෙවෙ ච මනුජෙපි ච
ලද්ධා යසොධරං දෙවිං-නුකූලං ජාතිජාතියං.

අන්වය:- ඤාතිසංඝං දෙවෙ ච මනුජෙපි ච පමොදෙන්තො ජාතිජාතියං අනුකූලං යසොධරං දෙවිං ලද්ධා.

පදාර්ථ:- ඤාතිසංඝං, නෑ සමූහයාද; දෙවෙච, දෙවියන්ද; මනුජෙ අපි ච, මිනිසුන්ද; පමොදෙන්තො, සතුටු කරවන්නේ; ජාති ජාතියං, ජාතියෙක් ජාතියෙක්හි; අනුකූලං, හිතට අනුකූලවූ; යසොධරං දෙවිං, යසොධරා නම්වූ දේවීන්; ලද්ධා, ලැබ;

භාවය:- නෑ සමූහයා සහ දෙවිමිනිසුන්ද සතුටු කරවමින් ජාතියක් ජාතියක් පාසාම තම සිතට රුචිවූ යශොධරා දේවිය ලැබගෙණ, (කෙබඳු යශොධරා දේවියක් ලබාදයත්?)

උ: කා: පමොදෙන්තො (ප පූර්ව මුද-හාසෙ) යන අපූර්ව ක්‍රියාවටද ලද්ධා යන (ලභ-ලාභෙ) පූර්ව ක්‍රියාවටද මහාසත්තො යනු කර්තෘයි. ඤාතිසංඝං, දෙවෙ, මනුජෙ, යනු පමොදෙන්තො යන කෘදන්ත ක්‍රියාවටද යසොධරං දෙවිං යනු ලද්ධා යන පූර්ව ක්‍රියාවටද කර්ම යි.

වි: විශෙෂ්‍ය: දෙවිං විශෙෂ්‍යයි. අනුකූලං, යසොධරං, යනු තද්විශෙෂණයෝයි.

පරිකථා:- මේ ගයින් බෝසත් කුමරුන් යශොධරා දේවිය සරණපාවාගත් පරිදි කීහ. යශොධරා දේවිය අනන්ත කල්පයක සිට පැරුම් පුරණ බෝසතාණන් වහන්සේට ප්‍රිය භාර්‍ය්‍යාව වූවාය. ඕතොමෝ බොධිසත්වයන් වහන්සේට ජාතියක් පාසාම මහත් ප්‍රෙමාවබද්ධ චිත්තයකින් ක්‍රියා කල බැව් මහොෂධ චන්දකින්නර ජාතක කථාවන්ගෙන් පැහැදිලි වේ.

44 සොණ්ණදප්පණ සඞ්කාස-සොම්මානන විභූසිතං
නීලනීරජසඞ්කාස-විසාලායත ලොචනං.

අන්වය:- සොණ්ණ දප්පණ සඞ්කාස සොම්ම ආනන විභූසිතං නීලනීරජසඞ්කාසවිසාලායත ලොචනං

පදාර්ථ:- සොණ්ණදප්පනසඞ්කාස, රන්කැටපතක් බඳුවූ; සොම්ම, සෞම්‍යවූ; ආනන, මුහුනින්; විභූසිතං, විශෙෂයෙන් අලඞ්කෘතවූ; නීලනීරජසඞ්කාස, නිලුපුල් සමානවූ; විසාල, පුලුල්වූ; ආයත, දික්වූ; ලොචනං, ඇස් ඇති;



භාවය:- රන් කැටපතක් බඳු සොම් මුහුණක් ඇති නිලුපුල් වැනි දිගු පුලුල් ඇස් ඇති (යශොධරාව),

වි: විශෙෂ්‍ය: යසොධරාදෙවිං විශෙෂ්‍යයි. සොණ්ණදප්පණ සඞ්කාසසොම්මානනවිභූසිතං, නීලනීරජසඞ්කාසවිසාලායත ලොචනං යනු තද්විශෙෂණයෝ යි.

සමාස: සොණ්ණදප්පනසඞ්කාසසොම්මානනවිභූසිතං, නීල නීරජසඞ්කාසවිසාලායතලොචනං.

විග්‍රහ: සොණ්ණෙන කතො දප්පණො, සොණ්ණ දප්පණො, සොණ්ණදප්පණස්ස සඞ්කාසො, සොණ්ණදප්පණසඞ්කාසො, සොම්මං ච තං ආනනං චාති සොම්මානනං, සොණ්ණ දප්පණ සඞ්කාසං ච තං සොම්මානනං චෙති සොණ්ණදප්පණසඞ්කාස සොම්මානනං, තෙන විභූසිතං, සොණ්ණ-පෙ-සොම්මානනවිභූසිතං, නීරෙසු ජාතානි නීරජානි නීලානි ච තානි නීරජානි චෙති නීල නීරජානි නීලනීරජානං සඞ්කාසං නීලනීරජසඞ්කාසං,

පරිකථා:- රතින් කල කැටපතක් බඳු යශොධරා දේවියගේ මුහුණ සොමි පැහැයෙන් බබලයි. නෙත් යුවල දිගුපුලුලින් හා නිල් පැහැයෙන් යුක්තය. එහෙයින්ම නිලුපුල්වලට සමානය. රතින් කල කැටපත අතිශයින් සිත්ගන්නා සුලුය. පැහැයෙන් හා මටසිලුටු ගතියෙන් එය බබලන හෙයිනි. මුහුණක් එබඳු කැටපත් වැනි වුවහොත් එය අතිශයින්ම චමත්කාර ජනක වන බැව් කිවයුතු නොවේ. යශොධරා දෙවියගේ මුහුණ රන් කැට පතට සම කිරීමෙන් ඇයගේ අසාධාරණ වක්ත්‍ර ශොභිමය විදහා පෑහ. නිල්වූ දිගු පුලුල් ඇස් ඇතිවීම පුණ්‍ය ලක්ෂණයෙකි. මෙහි නීලවර්ණය පවත්නේ නිල් වූවමනා තන්හි පමණකි. කාන්තාවන්ගේ රූපශොභාව පවත්නේ විශෙෂයෙන්ම දිඝීවූ නීල නෙත්‍ර යුග්මය කෙරෙහිය. යශොධරා දේවිය එසින් අනූන බැව් මෙයින් කියනලදි.

45 සිඞ්ගාර මන්දිරද්වාරෙ-ධජොපමහමුද්ධජං
හෙම කාහල සඞ්කාස-නාසිකං රූපලක්ඛියා.

අන්වය:- රූපලක්ඛියා සිඞ්ගාරමන්දිරද්වාරෙ ධජොපම හමුද්ධජං හෙමකාහලසඞ්කාසනාසිකං.

**පදාර්ථ:-** රූපලක්ඛියා, රූපශ්‍රීයගේ; සිඞ්ගාරමන්දිරද්වාරෙ, ශෘඞ්ගාර මන්දිර ද්වාරයෙහි, ධජොපම, ධ්වජයක් බඳුවූ; භමුද්වයං, භ්‍රූ යුග්මයක් ඇති; හෙමතාලසඞ්කාස, රන්තොරණුවකට බඳුවූ; නාසිකං, නාසයක් ඇති;

**භාවය:-** රූප නමැති ලක්ෂ්මියගේ ශෘඞ්ගාර රස නමැති ද්වාරයෙහි බඳින ලද කොඩියක් වැනිවූ, බැම සඟලක් ඇති රන්තොරණුවක් වැනි නැහැයක් ඇති (යශොධරාව).

**වි: විශෙෂ්‍ය:** යසොධරාදෙවිං විශෙෂ්‍යයි. ධජොපම භමුද්වයං හෙමතාලසඞ්කාසනාසිකං තද්විශෙෂණයි.

**සමාස:** සිඞ්ගාරමන්දිරද්වාරෙ, ධජොපමභමුද්වයං, හෙමතාලසඞ්කාසනාසිකං, රූපලක්ඛියා.

**විග්‍රහ:** සිඞ්ගාරමෙව මන්දිරං සිඞ්ගාරමන්දිරං සිඞ්ගාර මන්දිරස්ස ද්වාරං සිඞ්ගාර මන්දිරද්වාරං තස්මිං, ධජානං උපමා ධජොපමා ධජොපමං භමූනං ද්වයං භමුද්වයං, ධජොපමං භමුද්වයං යස්සා සා ධජොපම භමුද්වයා තං. හෙමෙන කතො තාලො හෙමතාලො හෙම තාලස්ස සඞ්කාසො හෙමතාලසඞ්කාසො හෙමතාල සඞ්කාසා නාසිකා යස්සා සා හෙමතාල සඞ්කාසනාසිකා තං, රූපමෙව ලක්ඛී රූපලක්ඛී තාය රූපලක්ඛියා.

**පරිකථා:-** මේ ගාථාවෙන් යශොධරාවගේ දෙබැම හා නැහැය වැණුහ. දෙබැම රූප නමැති ලක්ෂ්මියගේ ශෘඞ්ගාරරස නමැති මන්දිරද්වාරයෙහි බඳිනලද ධ්වජ දෙකක් වැනියයි කීමෙන් භ්‍රෑ යුග්මය පිළිබඳ උත්කර්ෂවත් වර්ණනයක් කළහ. මෙහි රූපය-ලක්ෂ්මිය (ශ්‍රීකාන්තාව) වශයෙන් සැලකූහ ලක්ෂ්මිය ශොභාවටද අධිපති කාන්තාවය. අධික රූපලාවණ්‍යයෙන් යුත් අයට ශ්‍රී දේවිය අභිගෘහිතයයි දනුදු කියත්. රූපය මූර්තිමත් (ශරීරවත්) දෙවියෙකු කොටද ඇගේ ශෘඞ්ගාරය මන්දිරයක් කොටද සලකා දෙබැම ඒ මන්දිර දොරටුවෙහි තගනලද ධ්වජ යුග්මයක් ලෙස සැලකීම කෙසේ යෙදේද? ධ්වජය ප්‍රාසාදාදියෙහි උපරිම භාගයෙහි යොදන්නකි. ඒ සියල්ලටම පළමුව පෙණේ. දෙබැමද සියල්ලන්ටම ප්‍රකටව දෘශ්‍යමානවන ශරීරයේ උපරිම භාගයේ පවත්නක් බැවින් උපමා උපමෙයත්වය සම්බන්ධ සාම්‍යත්වය ලැබේ. නාසිකාව තොරනැවකට සමාන කොට දක්වීම බොහෝ පඬිවරුන්ගේ සිරිතකි. ශ්‍රී රාහුල හිමියෝද විභීෂණ දිව්‍යරාජයාගේ නැහැයට පැරැදි තොරණුව ඒ හා සමානත්වය ලබනුවස් රජුන් දෙවියන් සෙවනය කරමින් හඬා ඉවහෙසෙනබව සැලලිහිණි අස්නෙහි කීහ.



“ශ ස ගා න හලු කැන තැන සිද'ගහන් සැ දී
තොලගා එහිම් දිගු තුගු නැහැයට පැර දී
ස ම ගා රදුන් දෙවියන් සම්හින් නිසැ දී
මු ර ගා අහෝ මිණිකාලම් වෙහෙස වි දී”

46 නීලවෙල්ලිත ධම්මිල්ල-ජීමූතොභය කොටියං
නිච්ච විජ්ජුල්ලතා චක්ක-මනුසදෘස කණ්ණ පාසකං.

**අන්වය:-** නීලවෙල්ලිත ධම්මිල්ල ජීමූතොභයකොටියං නිච්ච විජ්ජුල්ලතාචක්ක මනුසදෘස කණ්ණපාසකං.

**පදාර්ථ:-** නීල, නිල්පැහැ ඇත්තාවූ; වෙල්ලිත, අත්බඹරු; ධම්මිල්ල, කෙශකලාප නැමැති; ජීමූත, මෙඝයාගේ; උභය කොටියං, දෙකෙළවරෙහි; නිච්චං, නිරන්තරයෙන්; විජ්ජුල්ලතා චක්ක, විදුලිකලඹක් මෙන්; මනුසදෘස, මනොඥවූ; කණ්ණපාසකං, කන්වැල් සඟලක් ඇතිවූ;

**භාවය:-** නිල්පැහැ ඇති අත් බඹරුවූ (අයින් කැමුනු) කෙශකලාප නමැති මෙඝයාගේ වලාකුලෙහි දෙකෙළවර නිරතුරුව පවත්නාවූ විදුලි කලඹක් මෙන් මනහරවූ කන් දෙකක් ඇයි.

**වි: විශෙෂ්‍ය:** පුගම්යි.

**සමාස:** නීලවෙල්ලිත ධම්මිල්ල, ජීමූතොභයකොටියං, නිච්ච විජ්ජුල්ලතාචක්කනම්නුසදෘස කණ්ණපාසකං.

**විග්‍රහ:** එකතො නාඛා ධරීයති බන්ධියතීති ධම්මිල්ලො, (ධර ධාරණෙ - ඉල) නීලො ච වෙල්ලිතො ච නීලවෙල්ලිතො නීලවෙල්ලිතො ච සො ධම්මිල්ලො චෙති නීලවෙල්ලිත ධම්මිල්ලො; ජීවනං ජලං මූතං හදුම්නෙනාති. ජීමූතො; නීලවෙල්ලිත ධම්මිල්ලො එව ජීමූතො නීලවෙල්ලිත ධම්මිල්ල ජීමූතො උභයා ච සා කොටි චෙති උභයකොටි නීලවෙල්ලිතධම්මිල්ලජීමූතස්ස උභයකොටි. නීල-සෙ-කොටි, තස්සං, විජ්ජු එව ලතා විජ්ජුලතා තාය චක්කං විජ්ජුල්ලතාචක්කං, නිච්චං විජ්ජුල්ලතා චක්කමිව මනුසදෘසකණ්ණපාසකා යස්සා සා නිච්චවිජ්ජුල්ලතාචක්ක මනුසදෘසකණ්ණපාසකා, තං.

**පරිකථා:**- මේ ගාථායෙන් යශෝධරාවගේ නීලවර්ණවූ කෙශ කලාපයත් කර්ණපාශ යුග්මයත් වර්ණනා කළහ. නිල්වන් මේඝයක දෙපසෙහි විදුලි යුග්මයක් පවත්නේ යම්සේද යශෝධරාවගේ නිල්වන් කෙශකලාපය දෙපසෙහි පවත්නා කර්ණපාශ යුග්මයද එමෙනි. මේඝය නිල්පැහැයෙන් යුක්තය. කෙශකලාපයද එසේය. විදුලිය රන්වන් පැහැයෙන් යුක්තය. කර්ණපාශ යුග්මයද එසේය.

යශෝධරාවගේ කෙශකලාපය නිල්පැහැයෙන් යුක්තවූවාක් මෙන්ම අගින් නැමී පවත්නේද වෙයි. සුන්දර ස්ත්‍රීන්ගේ ධම්මිල්ලය දිග හැරී විට කොණ්ඩා යුග්මය තෙක් වැටී කෙශාග්‍රයෙන් උඩට නැමී පවතින්නේ ය. බොහෝ කිවිවරු කෙශ කලාපය මේඝයට සමාන කෙරෙති. වෙදෙහ හිමියන්ද යශෝධරාවගේ නිල්වන් කෙශකලාපය මේඝයට උපමිත කෙළේ එහෙයිනි.

පාශ නම් සතුන් ඇල්ලීමට යොදන මලපුඩුවට නමකි. ඉතිරින් කෙරෙහි තරුණ ජනයන් බැඳෙන හෙයින් ඉතිරින්ගේ දෙකන් පාශයකට උපමිත කිරීමද සුදුසු ය. පෙර ඉතිරින්ගේ කර්ණයෝ ආබරණ පැළඳීමට පිළියෙල කිරීම නිසා කන්වැල් ඔවිලි දෙකක් මෙන් නොහොත් පාශ දෙකක් මෙන් පහතට එල්බෙමින් පැවැත්තාහ. එය රන්වන් පැහැයෙන් යුක්ත වනවිට විදුලිය දෙකක් වැනිය. කෙශකලාපය මේඝයකට සමාන කල විට කර්ණපාශ යුග්මය විදුලියට උපමිත කිරීම යොග්‍ය වේ.

47 **සාතකුම්භ නිභාභාස-පයෝධර ඝටද්වයං**
**සුවණ්ණද්දිතටායාත-නිජ්ඣරාකාර හාරකං.**

**අන්වය:**- සුගමයි.

**පදාර්ථ:**- සාතකුම්භනිභ, උතුම්වූ රන්වන් පැහැයෙන් මෙන්; ආභාස, බැබළුම් ඇත්තාවූ; පයෝධර, පියයුරු නැමැති; ඝටද්වයං, පුන් කලස් දෙකක් ඇතිවූ; සුවණ්ණද්දිතට, ස්වර්ණපර්වතය කින්;(රන්පව්වක උස්බිමකින්) ආයාත, පැමිණියාවූ; නිජ්ඣරාකාර, ගඟුල් හැල්ලක් බඳුවූ; හාරකං, මුතුහරක් ඇත්තාවූ.

**භාවය:**- ශ්‍රෙෂ්ඨ ස්වර්ණයකගේ පැහැය මෙන් අතිශයින් බබලන්නාවූ පියයුරු නැමැති පුන් කලස් දෙකක් ඇති රන් පව්වක උස් බිමකින් පැමිණි ගඟුල් හැල්ලක් වැනි මුතුහරක් ඇති.



**වි: විශෙෂ්‍ය:** ගාථාවේ පදචයම සමස්තයෝයි යශොධරං යන්නට තුල්‍යාධිකරණ විශෙෂණ යි.

**සමාස-විග්‍රහ:**-සාතකුම්භස්ස නිභා, සාතකුම්භනිභො, සාතකුම්භනිභො අභාසො, යෙසං තෙ සාතකුම්භනිභාභාසො, පයෝධරා එව ඝටා,පයෝධරඝටා,සාතකුම්භනිභාභාසා ච තෙ පයෝධර ඝටා චෙති සාතකුම්භනිභාභාස පයෝධරඝටා, තෙසං ද්වයං, සාතකුම්භ-පෙ-ඝටද්වයං,සුවණ්ණෝ ච සො අද්දි චෙති සුවණ්ණද්දි-සුවණ්ණාද්දිතො තටො සුවණ්ණද්දි තටො සුවණ්ණද්දි තටා ආයාතො නිජ්ඣරො සුවණ්ණද්දිතටායාතනිජ්ඣරො - තස්ස ආකාරො - සුවණ්ණද්දිතටායාතනිජ්ඣරාකාරො, හාරො එව හාරකො, සුවණ්ණද්දිතටායාතනිජ්ඣරාකාරො හාරකො යස්සා සා සුවණ්ණද්දි-පෙ-හාරකා, තං.

**පරිකථා:**- මේ පද්‍යයෙන් යශෝධරාවගේ පයෝධර යුග්මය හා මුතුහර ද වැණූහ. රන්වන් පැහැයෙන් බබලන පියයුරු යුවල පුන්කලස් දෙකක් වැනි ය. සාතකුම්භ නම් උතුම් රත්රන් විශෙෂයක. එය පියුම් කෙසරු පැහැය වැනි පැහැයෙන් යුක්තය. (සතකුම්භ පදුම්කෙසර වණ්ණං තබ්බණ්ණෙසදිසත්තා සාතකුම්භං) යශෝධරා දේවියගේ පයෝධරවය රන්වන් පැහැයෙන් හා පීනත්වයෙන්ද යුක්ත (සම්පූර්ණවූ) හෙයින් රන්වන් පුන් කලස් දෙක්කට අතිශයින් සාම්‍යය. මුත්හර රන් පර්වතයක උස්බිමකින් පැමිණි ගඟුලැල්ල (කන්දෙන් ගලාබසින දියපාර) ක් වැනියයි කීහ. මුතු සුදු පාටය. එහෙයින් එයින් කළ හරද (මාලයද) සුදු පැහැයෙන් යුක්තය. පහතට එල්බෙන සේ ග්‍රීවායෙහි පැළඳී මුත්හර උරසපල මතුයෙහි වැතිර පවතී. එහෙයින් යශෝධරාව පැළඳි මුත්හර ගඟුලැල්ලකට සමානය. මේ මුත්හර නැමති ගඟුලැල්ල ගලා බස්නේ රන්පව්වකිනි. මේ රන්පව්ව නම් රන්වන් පැහැයෙන් බබලන යශෝධරාවගේ ශරීරය යි.

තට නම් උස් ස්ථානයයි. සමීපය-තීරය ආදී වෙනත් අර්ථයන්හිද මෙය පවතිතත් ප්‍රකෘතක අර්ථයම මෙහිදී ගතයුතු වේ. මුතුහර පළඳින්නෝ ශරීරයෙහි මතුභාගයෙහි ය. එහෙයින් මුත්හර නැමැති දිය පහර ශරීර නැමැති රන්පව්වේ උස්තැනකින් පැමිණියක් මෙනැයි සැලකීම සුදුසුය.

48 **දෙහ දෙවදුමාලම්බ-පාරොහාභභුජද්වයං**
**අඞ්ගුලිපල්ලවගතම්බු-බින්දුචාරු නඛාවලිං.**

අන්වයඃ- සුගමයි.

පදාර්ථඃ- දෙහ, සිරුර නැමැති; දෙවදුම, සුර තුරෙහි; ආලම්බ, හට ගෙණ එල්ලෙන්නාවූ; පාරොහාභ, අරළු වැනිවූ; භුජද්වයං, බා යුවලක් ඇති; අඞ්ගුලි, ඇඟිලි නැමැති, පල්ලවග්ග, පලුපත් අගැරුඳුනු; අම්බු බින්දු, දියබිඳු බඳුවූ; චාරු, මනහරවූ; නඛාවලිං, නිය පෙළ ඇති;

භාවයඃ- ශරීර නැමැති දිව්‍ය වෘක්ෂයෙහි හටගෙණ එල්ලෙන්නාවූ, ප්‍රරොහ (අරළු) වැනිවූ භාහු යුග්මයක් ඇති ඇඟිලි නැමැති පල්ලවාග්‍රයෙහි (දලු අග) රැඳුනාවූ දිය බිඳුන් වැනිවූ මනොඥවූ නඛ පඞ්ක්තියක් ඇති.

විඃ විශෙෂ්‍යඃ සුගමයි.

සමාසඃ- පාදද්වය සමාස පදවයකි

විග්‍රහඃ- දෙවානං දුමො දෙවදුමො, දෙහො එව දෙවදුමො, දෙහදෙවදුමො-ආලම්බා ච තෙ පාරොහා චෙති ආලම්බ පාරොහා දෙහ දෙවදුමො අලම්බ පාරොහා-දෙහ දෙවදුමාලම්බපාරොහා- දෙහදෙවදුමාලම්බපාරොහා නං ආභා=දෙහ=පෙ=පාරොහාභා භා- දෙහ පෙ=පාරොහාභා එවභුජා දෙහ=පෙ=පාරොහාභභුජා--තෙසං ද්වයං=දෙහදෙවදුමාලම්බ පාරොහාභභුජද්වයං, අඞ්ගුලි එව, පල්ල වා අඞ්ගුලිපල්ලවා අඞ්ගුලිපල්ලවානං අග්ගානි, අඞ්ගුලිපල්ල වග්ගානි=අම්බූනං බින්දූ අම්බුබින්දූ-අඞ්ගුලිපල්ලවග්ගානං අම්බුබින්දූ- අඞ්ගුලිපල්ලවග්ගම්බු බින්දූ=නඛානං ආවලි=නඛාවලි=චාරු ච සා නඛාවලි චෙති චාරුනඛාවලි=අඞ්ගුලිපල්ලවග්ගම්බුබින්දූ එව චාරු නඛවලි යස්සා, සා-අඞ්ගුලි-පෙ-නඛාවලිකං.

පරිකථා.

දෙවදුමා.

දෙව් ලොවැ ඇතැයි සලකනු ලබන දුම (වෘක්ෂ) යෝ පස් දෙනෙක් වෙති; (9 වන ගාථාවට ලියූ පරිකථා බැලිය යුතුයි.)

දෙවදුමය මෙහි ගන්නා ලද්දේ යශොධරා දේවියගේ ශරීරය හා සමාන කිරීම සඳහා ය. එතුමියගේ බාහුයුග්මය මේ දෙවදුමයෙන් හටගන්නා ප්‍රරොහයන් හා සදෘශය. ප්‍රරොහ නම් අරළු නමින් ව්‍යවහාර වන නුග ආදී ගස්වල අතුවලින් පහතට එල්ලෙන මූල්ය. එහෙයින් ඇතැම් ගස්වලින් පහතට එල්ලෙන මේ ප්‍රරොහ ඉතාමත් මනහරය. ඒ දිව්‍ය වෘක්ෂයකගේ වුව



හොත් අතිශයින් මහත්වූ ශොභාතිශයයක් උපුලන බැව් කිවයුතු නොවේ. දිව්‍ය වෘක්ෂයකාගේ සාඛාවලින් පහතට එල්ලෙන ප්‍රරොහ යම් සේ ද යශොධරාවගේ බාහු යුග්මය ද එබඳුය යනු කවිහුගේ ආශයය යි.

මේ පද්‍යයේ ද්විතීය පාදයෙන් යශොධරාවගේ ඇඟිලිපෙළ හා නඛ පඞ්ක්තිය වර්ණනා කළහ. ඇඟිලි පල්ලවයන්ටත් නිය දිය බිඳුවලටත් සමාන කරණ ලදී. පල්ලව යනු ලා දලුවලට නමකි. රක්ත වර්ණයෙන් හා මෙලොක් බැවින් අනුනවූ කොමේ රු කොල-ලාදලු සියුමැලි රතු පැහැති ඇඟිලිවලට සමානය. එහෙයින් යශොධරාවගේ ඇඟිලිපෙළ වැණූ සැටි ඉතා කදිම ය.

නිය පෙළ ඒ දලු කෙළවර පිහිටි දියබිඳු වැනිය. නිය සුදු පැහැය වේ. දිය බිඳුද එසේමය. දලුවක අග රැඳුනු පිනි බිඳු මෙන් ඇඟිලි අග සුදු නිය පෙළ පිහිටියේය.

49 දෙහමාලාලි මාලාභ - රොමරාජිවිරාජිතං
රූපණ්ණව තරඞ්ගාභ - වලිත්තය විචිත්තකං.

අන්වයඃ- සුගමයි.

පදාර්ථඃ= දෙහ මාලා, සිරුරු නැමැති මල්දම්හි; අලි මාලාභ; බමර පෙළකට බඳුවූ; රොමරාජි, රොම රාජියකින්; (ලොම් වැල කින්) විරාජිතං, හෙබියාවූ; රූපණ්ණව, රූප නැමැති සාගරයාගේ; තරඞ්ගාභ, රළපෙළක් වැනිවූ; වලිත්තය, රැලි තුණකින්; විචිත්තකං විසිතුරුවූ;

භාවයඃ- (යශොධරාවගේ) සිරුරු නැමති මල් දම්හි බඹර පෙළක් වැනිවූ රොම් වැලකින් හෙබියාවූ රූප නැමති සාගරයේ රළ පෙළක් වැනි රැලි තුණකින් විසිතුරුවූ,

සමාසඃ- සුගමයි.

විඃ විශෙෂ්‍යඃ සුගමයි.

විග්‍රහඃ- දෙහො එව මාලා දෙහමාලා-අලීනං මාලා අලිමාලා දෙහ මාලාය අලිමාලා-දෙහමාලාලිමාලා-රොමානං රාජි රොමරාජි-දෙහ මාලාලි මාලාය ආභා යස්ස සා දෙහමාලාලි මාලාභා, දෙහමාලාලිමාලාභා ච සා රොමරාජි චෙති - දෙහ -පෙ- රොමරාජි දෙහමාලාලිමාලාභරොමරාජියා විරාජිතා-දෙහමා

"නුපුඹුදු තැඹිලිම ල්
ඇඟෙ යුග දගට මතක ල්
පැමිණ සැඟවුනු තු ල්
කොලපු ඇතුළුව් පැමිණි හැමක ල්"
යනුවෙන් කීහ.

රන්වන් පැහැති ක්‍රමයෙන් සිහින් ව ගියාවූ නොපිපුනු තැඹිලි මල රන්වන් සිරුරැති කාන්තාවගේ ජඞ්ඝාවට කෙසේනම් සමාන නො වේ ද?

51 පච්චක්ඛරූපලක්ඛිං ච-ලීලානිචය සන්නිභං
ගුණානමාකරං සාධු-වෙලංව රතිසාගරෙ

අන්වයඃ- පච්චක්ඛරූපලක්ඛිං ච ලීලානිචයසන්නිභං ගුණානමාකරං රතිසාගරෙ සාධුවෙලං ඉව (යසොධරාදෙවිං ලභිං)

පදාර්ථඃ- පච්චක්ඛ, ප්‍රත්‍යක්‍ෂවූ; රූප, රූපනමැති; ලක්ඛිං ඉව, ශ්‍රී දේවිය වැනිවූ; ලීලානිචයසන්නිභං, ලීලා පුංජයක් වැනිවූ; ගුණ, ශීලාදිගුණයන්ට; ආකරං, උත්පත්තිස්ථානයක් වූ; රති සාගරෙ, රතිසමුද්‍රෙහි; සාධු, යහපත්වූ; වෙලං ඉව, වෙරළක් වැනිවූ; (යසොධරංදෙවිං, යශෝධරා දේවීන්, ලභිං, ලැබ;)

භාවයඃ- ප්‍රත්‍යක්‍ෂවූ රූපඇති ශ්‍රීකාන්තාව වැනිවූ ලීලා පුංජයක් වැනිවූ ශීලාදිගුණයන්ට උත්පත්තිස්ථානයක්වූ රතිසමුද්‍රෙහි වෙරළක් වැනිවූ; (යශෝධරා නම් දේවිය ලැබ)

උ: කා: ලභිං යන අධ්‍යාහෘත පූර්වක්‍රියාවට (යශෝධරං දෙවිං) යනු අධ්‍යාහෘත කර්මයි.

වි: විශෙෂ්‍යඃ යසොධරං දෙවිං, අධ්‍යාහෘත විශෙෂ්‍යයි. පච්චක්ඛරූපලක්ඛිං, ලීලානිචය සන්නිභං, ආකරං, සාධුවෙලං, තත් තුල්‍යාධිකරණ විශෙෂණයෝයි.

සමාසඃ පච්චක්ඛරූපලක්ඛිං, ලීලානිචයසන්නිභං සාධුවෙලං, රතිසාගරෙ,

විග්‍රහඃ අක්ඛං ඉන්ද්‍රියං පතිගතං නිස්සිතං අක්ඛෙනවා පතිගතං පච්චක්ඛං, පච්චක්ඛං ච තං රූපං චෙති පච්චක්ඛරූපං පච්චක්ඛරූපෙන යුත්තා ලක්ඛී පච්චක්ඛරූපලක්ඛී තං, ලීලානං නිචයො ලීලානිචයො ලීලානිචයස්ස සන්නිභා යස්සාසා ලීලානිචය සන්නිභා තං, රති එව සාගරො රතිසාගරො.



පරිකථා:- "පච්චක්ඛරූපලක්ඛිං ච"

කවීන් සෞභාග්‍යයට ද රූපයට ද ධනයට ද අධිපති ලක්ෂ්මී නමින් දෙවතාවක් ඇතැයි සැලකූ බැව් (26) වන ගාථාවට ලියූ පරිකථාවෙහි කියනලදි. යමෙකු රූපසම්පත්තියෙන් හෝ ධන යෙන් හෝ සෞභාග්‍යයෙන් හෝ අධික නම් ඔහු හෝ ඇය වෙත ශ්‍රී දෙවිය වේ යයි කියති. සත්‍ය වශයෙන් සලකන් හොත් සෞභාග්‍යයට ශ්‍රී යනු අභිධානයක් විනා එබඳු දෙවියෙක් නො මැත්තේය. එහෙත් සෞභාග්‍යාදියෙන් යුක්තවූවනු දෙවියකු මෙන් සෙස්සනට වඩා විශිෂ්ට ශෝභාවක් උසුලන බැව් නම් සත්‍යයකි. ඒ දෙවියකුගේ අනුභාවයකින් සිදුවූවක් නොව සෞභාග්‍ය නිසා ඇතිවන්නකි. තමන්ගේ ශක්තියෙන් සෞභාග්‍යවතුන් කරලීමට සමත්වූ සෞභාග්‍යාදිය යම් ලෙසක එකතුවී මූර්තියක් (ශරීරයක්) වූවහොත් ඒ ශරීරය කෙතරම් ශ්‍රෙෂ්ඨ සෞන්දර්යයක් උද්ධගනය කෙරේද යනු කිවයුතු නොවේ. යශෝධරා දේවිය සකල ඓශ්වර්යයෙන් අනූනවූ තැනැත්තියක බැවින් එතුමිය සෞභාග්‍යාදිය එක් කොට තැනූ රූපයක් වැනි යයි කීමෙන් කවීහු ඇයගේ සෞභාග්‍යය - ධනය - රූපය - යන මේවා වර්ණනා කළහ.

ලීලානිචයසන්නිභං.

ලීලා යනුද විලාස යනුද එකාර්ථයි.

"ශක්තිස්ථානාසනාදීනාං-මුඛනෙත්‍රාදිකර්මණාම
විශෙෂස්තු විලාසඃස්‍යාත - දිෂ්ටසංදර්ශිතාදිනා" යි

කී පරිදි යාම සිටීම හිඳීම් යනාදීන්ගේ ද මුඛනෙත්‍රාදි ක්‍රියාවන් ගේ ද ඉෂ්ටය දැක්වීම් වශයෙන් වන්නාවූ ක්‍රියාවිශෙෂ විලාසනම්. සාමාන්‍යයෙන් ස්ත්‍රීන් ශෘඞ්ගාරාදියෙන් යටගත් පුරුෂයන් තමන් වෙත ආකර්ෂණය කරවන හසිත ලපිත විලොකිතාදී ක්‍රියාවිශෙෂ යන්ට මේ නමෙකි.

යශෝධරා දේවිය ස්ත්‍රීන් පිළිබඳ ලීලාවිලාසයෙන් කෙතරම් අනූනද යත හොත් ලොව පවත්නා ස්ත්‍රී ලීලාවන් සියල්ලම පිඩු කළාක් වැනි ය යි කීහ.

"ගුණානමාකරං"

ආකර යනු උත්පත්තිස්ථානයට නමෙකි. රන් රිදී ආදිය උපදින තැනට රන් ආකරය රිදී ආකරයයි කියති. එසේම

ලාලිමාලාභරොමරාජිවිරාජිතා තං, රූපමෙව අණ්ණවො-රූපණ්ණවො-රූපණ්ණවස්ස තරඞ්ගා රූපණ්ණවතරඞ්ගා-රූපණ්ණවතරඞ්ගානං ආභා-රූපණ්ණවතරඞ්ගාභා-රූපණ්ණව තරඞ්ගාභා ච තා වලී චෙති.-"රූප-පෙ-තරඞ්ගාභවලි-තාෂතයං රූපණ්ණව තරඞ්ගාභවලිත්තයං-තෙන විචිත්තකාරූප-පෙ-වලිත්තය විචිත්තකා-තං.

**පරිකථා:-**

යශොධරා දේවියගේ සිරුර මල් දමක් වැනිය. ලොම්වැල බඹර පෙළ වැනිය. එසේම ඇගේ සිරුර සයුරකි, වලිත්‍රය එහිවූ රළ පෙළය. මෙයින් කවීහු යසොධරාවගේ සිරුරෙහිවූ රොම රාජිය හා වලිත්‍රය වැණූහ. යශොධරාවගේ ශරීරය මල් දමකට රූපිතය. පැහැපත් සුකොමල සිහින් සිරුරකින් දුටුවන් මනනුවන් පොබයන ඇගේ සිරුර මල්දමක සිරි උසුලයි. මල් දම පැහැයෙන් හා සියුමැලි කමින් දකන් සිත් ගන්නා සුලුය. එහෙයින් ඒ සිරුර මල්දමට අතිශයින් සමානය. යශොධරාවගේ සිරුරෙහි පිහිටි රොම රාජිය බඹර පෙළට උපමිතය. එය නිල් පැහැයෙන් යුක්තය. බඹර පෙළද කවිසමයෙහි නිල්පැහැ ඇත්තක් කොට සලකති. එහෙයින් නිල්වන් බමරුන්ගේ හා රොමරාජියගේ සාදෘශ්‍යයක් පෙණේ. **රොමරාජිය** නම් නාභියෙන් පහත පිහිටි ලොම් වැලයි. ශරීරය මාලාදාමයක් නම් රොමරාජිය භ්‍රමර පඞ්ක්තියකට උපමිත කිරීම යුක්ති යුක්තය. යශොධරා දේවියගේ රූපය සාගරයකි. සාගරයෙක් නම් තරඞ්ග ඇතිවියයුතු. මේ රූප සාගරයෙහි තරඞ්ග නම් වලිත්‍රයයි. රැළිවලට වලි යනු නමෙකි. මෙතුමියගේ උදරයෙහි සරසට පවත්නා ඉරිතුණක් වේ. ඊට රැළි යයි ද කියති. ගැඹුරින් හා පුලුලින්ද විශාලත්වයෙන්ද සාගරයාගේ ප්‍රමාණයක් නැත. යශෝධරාවගේ රූප ශොභාවද එසේ යි. කොතරම් කියුවත් කියා නිමකළ නොහැක කොතරම් බැලුවත් බලා තෘප්ත නො වන වර්ණනාවිෂයාතික්‍රාන්තවූ ඒ රූපශ්‍රිය අපමණ ගැඹුරැති සුවිසල් මහසයුරට හැර අන් කිසිවකට සමාන කළ නො හැක්කේ ම ය.

50 **සොණ්ණ රම්භා සමාවට්ට - පීණොරූ'ධය සුන්දරං**
**සන්නීර කලිකාකාර - චාරු ජඞ්ඝා විභූසිතං,**

**අන්වය:-** සුගමයි.



**පදාර්ථ:-** සොණ්ණ රම්භා, රන් කෙසෙල් කදන් මෙන් සමාවට්ට, මොනවට වටවූ; පීණ, පිරුණාවූ; ඌරුවය, වටොර සුවලින්; සුන්දරං, සොඳුරුවූ: සන්නීර කලිකාකාර, නැඹිලිමල් කැකුලු බඳුවූ; චාරු, මනහරවූ; ජඞ්ඝා, කෙණ්ඩා යුගලයෙන් විභූසිතං, අලඞ්කෘත වූ;

**භාවය:-** රන් කෙසෙල් කඳන් දෙකක් මෙන් මටම පිරුණා වූ වටොර සුවලින් යහපත්වූ නොපිපුණු නැඹිලිමල් දෙකකටබඳු මනහර කෙණ්ඩා දෙකකින් අලංකාරවූ.

**විශෙෂණ විශෙෂ්‍ය:**

සුගමයි.

**සමාස,-** සුගමයි.

**විග්‍රහ:-** සොණ්ණා ච තෙ රම්භා චෙති සොණ්ණරම්භා-සමන්තතො ආවට්ටා-සමාවට්ටා-සමාවට්ටා ච-පීණා ච-සමාවට්ටපීණා සමාවට්ටපීණා ච තෙ ඌරූ චෙති සමාවට්ටපීණොරූ-සොණ්ණරම්භා විය සමාවට්ටපීණොරූ-සොණ්ණරම්භා සමාවට්ටපීණොරූ-තෙසං වයං - සොණ්ණරම්භාවට්ටපීණොරුවයං- තෙන සුන්දරා-සොණ්ණ -පෙ- වයසුන්දරා තං, සන්නීරානං කලිකා සන්නීරකලිකා - තාය ආකාරො-සන්නීරකලිකාකාරො චාරූ ච තා ජඞ්ඝා චෙති චාරුජඞ්ඝා-සන්නීර කලිකාකාරා ච තෙ චාරු ජඞ්ඝා චාති සන්නීරකලිකාකාරචාරුජඞ්ඝා-තාහි විභූසිතා සන්නීර කලිකාකාරචාරුජඞ්ඝාවිභූසිතා; තං,

**පරිකථා:-**

කෙසෙල්කඳ වටය මටය සිලුටුය. එය මුල භාගයෙන් මහත්වූයේ ක්‍රමයෙන් සිහින් ව ගියේය. මෙය සවර්ණමය වුව හොත් එහි ඇති සුන්දරත්වය අතිශය චිත්තාකර්ෂණීය විය යුතු බැව් කිවයුතු නො වේ. එසේම වටොර යුග්මයද වටය මටය සිලුටුය. මහත්ය යනාමෙකී ගුණයන්ගෙන් අනූනවූයේම දකනු මන පොබයන සුලුය. මෙහෙයින් සලකන විට දකන් සිත් පැහැර ගන්නා සුලු කදලිස්කන්ධය කවීවරයන් විසින් වටොරුවට උපමිත කිරීම අයුක්ත නො වේ.

මෙතුමියගේ ජඞ්ඝා යුග්මය නුපුබුදු නැඹිලිමල්වලට සමානය. පූර්වෝක්ත උපමාව මෙන්ම නුපුබුදු නැඹිලිමල ජඞ්ඝාවට උපමිත කිරීමද කවිවරයන් විසින් සමාදෘත වූවකි. සිරි රහල් හිමියෝ බැමිණියගේ ජඞ්ඝා වර්ණනය කරන්නාහු,

යශොධරාව ගුණයන් උපදින ස්ථානයකි. එහෙයින් යශොධරා දේවිය ගුණයනට ආකරයකි. ගුණ නම් ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා ආදියයි. යශොධරා දෙවිය මේ ගුණයන්ගෙන් යුක්ත බැව් කී පරිදියි.

“වෙලං'ව රතිසාගරෙ”

රති-යනු ආශාවයි. අනඞ්ගභාගස්ථ-මෛථුනය ආදී අර්ථයන් හි ද මෙය වැටෙතත් පුරුෂයන් ස්ත්‍රීන් කෙරෙහි දක්වන ආශාව-ඇල්ම මෙහිදී රතිශබ්දයෙන් ගතයුතු වේ. පුරුෂයන්ගේ ස්ත්‍රීන් කෙරෙහි ඉච්ඡානුකූලව රමණය කිරීමේ ආශාව අධිකතර වේ. ඔවුන්ගේ මනානුකූල ලෙස ආශා පූරණයෙහි කිසිම කාන්තාවක් ප්‍රබල නොවන්නීය. ඒ නිසාම මෙහි රතිය සාගරයට සමාන කළහ. සාගරය ගැඹුරින් හා පුළුලින් මෙතෙකැයි පමණ නොකළ හැකි හෙයින් විශාලය. ඒ විශාලවූ සාගරයාගේ සීමාව නම් වෙරළය. වෙරළට පැමිණි පසු සාගරයාගේ සීමාව දක්ක හැකි හෙයිනි. අතෘප්තිකරත්වයෙන් රතියද සාගරය බඳුය. සාගරයාගේ සීමා රහිතත්‍වය මෙන් රතියගේද මනොරථ පූරණය වීමේ සීමාවක් නැත. වෙරළ සාගරයාගේ සීමාව වන්නාක් මෙන්ම රතිසාගරයාගේ වෙරළද යශොධරාව වන්නීය. සීමාරහිත අතෘප්තිකර ආශ්වාදයක් වූ රතිය සාගරයක් හෙයින් ඒ සාගරයාගේ ද වෙරළක් සීමාවක් දැකීම අතිශය දුෂ්කර බැව් මෙයින් පෙණේ. එහෙත් යශොධරාව රතිසාගරයෙහි වෙරළ වැනි යයි කීමෙන් එතුමිය පුරුෂයන්ගේ මනදොළ පිරීමෙහි අතිශයින්ම සමත්වූ ආශ්වාදනීයවන ස්ත්‍රීරත්නයක් ය යනු මෙයින් වර්ණිත කළහ.

52 කනෙතා ච වසනතරාජා'ච-කනදපෙපා ච සුරූපවා
සසී'ව දසසනීයො ච-සූරියො විය තෙජවා.

අන්වය:- වසනතරාජා ඉව කනෙතා සුරූපවා කනදපෙපා ඉව සසී ඉව දසසනීයො ච සූරියො විය තෙජවා.

පදාර්ථ:- වසනතරාජා ඉව, වසත් රජු මෙන්; කනෙතා, මනොඥවූ; කනදපෙපා ඉව, අනඞ්ගයා මෙන්, සුරූපවා, යහපත් රූ ඇති; සසී'ව, චන්ද්‍රයා මෙන්; දසසනීයො ච, දැකුම් කටයුතු වූ; සූරියො විය, සූර්‍ය්‍යයා මෙන්, තෙජවා, තෙජස් ඇත්තාවූ;



53 අචලතෙතන මෙරු'ච-ගමභීරෙනණණවො විය
බ්‍රහමසසරො පියංවාදී-පඤ්ඤාය ච අනුපමො.

අන්වය:- අචලතෙතන මෙරු ඉව ගමභීරෙන අණණවො විය බ්‍රහමසසරො පියංවාදී පඤ්ඤාය ච අනුපමො.

පදාර්ථ:- අචලතෙතන, නිසල බැවින්, මෙරු ඉව, මහමෙර වැනිවූ, ගමභීරෙන, ගැඹුරු ගුණයෙන්; අණණවො විය, සාගරය වැනිවූ; බ්‍රහමසසරො, බඹහුගේ වැනි හඬ ඇත්තාවූ, පියංවාදී ප්‍රිය තෙපුල් බණන සුලුවූ, පඤ්ඤාය ච, නුවණින් ද; අනුපමො, උපමා රහිත වූයේ;

54 වසනතො සො මහාවීරො-පුරසමිං කපිලවහයෙ
දිසවා නිමිතෙත චතුරො-උයයානගමනසජජෙ.

අන්වය:- කපිලවහයෙ පුරසමිං වසනෙතා සො මහාවීරො උයයාන ගමනසජජෙ චතුරො නිමිතෙත දිසවා.

පදාර්ථ:- කපිලවහයෙ පුරෙ, කපිල වාස්තුනම් පුරයෙහි; වසනෙතා, වාසය කරන්නාවූ; සො මහාවීරො, ඒ මහාවීර බෝසත් තෙමේ; උයයානගමනසජජෙ, උයන් යන මාර්ගයේදී; චතුරො නිමිතෙත, සිවු වැදෑරුම් නිමිති; දිසවා, දැක;

52, 53, 54.

භාවය:- වසත් රජු මෙන් මනහරවූ අනඞ්ගයා මෙන් යහපත් රූ ඇති සඳු මෙන් දැකුම් කටයුතු වූ හිරු මෙන් තෙද ඇත්තාවූ නිසල බැවින් මහමෙර වැනිවූ ගැඹුරු ගුණයෙන් සයුර වැනිවූ බඹහුගේ හඬ වැනි හඬ ඇත්තාවූ පියතෙපුල් බණන සුලුවූ නුවණින් උපමා රහිතවූ කපිලවාස්තු පුරයෙහි වසන්නා වූ බෝසත් තෙමේ උයන් මාර්ගයේ දී ජරා ව්‍යාධි මෘත පැවිදි යන සිවුනිමිති දැක.

උ: කෘ: දිසවා යන (දිස=පෙකඛණෙ) පෙර කිරියට මහාවීරෙ යනු උකත කර්තෘ යි. චතුරෙ නිමිතෙත යනු අනුකත කර්මයි,

වි: විශෙෂ්‍ය: මහාවීරෙ විශෙෂ්‍යයි. වසනතරාජා, කනෙතා, කනදපෙපා, සුරූපවා, සසී, දසසනීයො, සූරියො, තෙජවා, මෙරු, අණණවො, බ්‍රහමසසරො, පියංවාදී, අනුපමො, වසනෙතා, තුල්‍යාධිකරණ විශෙෂණ පදයෝ යි. අචලතෙතන, ගමභීරෙන, පඤ්ඤාය, භිනනාධිකරණ විශෙෂණ යි.

සමාස: වසන්තරාජා, සුරූපවා, අචලත්තෙන, බ්‍රහ්මස්සරො. පියංවාදී, අනූපමො, මහාවීරො, කපිලවහයෙ, උය්‍යාන ගමනජ්ඣාසෙ,

විග්‍රහ: වසන්තො ච සො රාජ වෙති වසන්තරාජා සොභනං රූපං සුරූපං තං අස්ස අත්ථීති සුරූපවා, දස්සනබ්බො දස්සනීයො, තෙජො අස්ස අත්ථීති තෙජවා, න චලො අචලො අචලස්ස භාවො අචලත්තං. තෙන, බ්‍රහ්මානං සරො විය සරො යස්ස සො බ්‍රහ්මස්සරො, පියං වදති සීලෙනා'ති පියංවාදී, නත්ථි උපමා යස්ස සො අනූපමො, මහන්තො ච සො වීරො චාති මහාවීරො කපිල ඉති අවහයො යස්ස සො කපිලවහයො තස්මිං, උය්‍යානස්ස ගමනං උය්‍යානගමනං උය්‍යානගමනස්ස අජ්ඣාසං උය්‍යානගමනජ්ඣාසං තස්මිං,

පරිකථා:- "කන්දප්පො ච සුරූපවා"

කන්දප්ප නම් අනඞ්ගයායි (අනඞ්ග පිළිබඳ විස්තර ප්‍රථම ගාථාවට ලියූ පරිකථාවෙන් දත හැකිය. මහසත් රූපයෙන් අනඞ්ගයාට සමානය.

"සසීව දස්සනීයො"

ශසී නම් චන්ද්‍රයායි විස්තර යට දක්වන ලදි (38 වන ගාථාවට ලියූ පරිකථාව බලනු.) චන්ද්‍රයා සෞම්‍ය ගුණයෙන් යුක්තය. සෞම්‍යගුණය නම් අනුන්ගේ සිත් සතුටු කරවන නො තවන ශක්තියයි. චන්ද්‍රයා එයින් අනූනය. මහසත් තෙමේ ද සෞම්‍ය ගුණෙන් සඳු වැනිය.

"සූරියො විය තෙජවා"

හිරු තෙද ඇත්තෙකි. තෙදින් හිරු හා සමයෙක් නැත්තේය. දහසක් රැස් ඇති හෙතෙමේ අනුන් තවන අපමණ තෙදින් ද යුක්තය. එහෙයින් සිදුහත් කුමරතෙමේ ද තෙද ඇත්තෙකි. කෙතරම් තේජස්වී කෙනෙකුන් ද? යත් හේ තෙදින් සමාන වන්නේ සූර්යයාට පමණය.

"අචලත්තෙන මේරු'ව"

අචල බවනම් ස්ථිර ස්වභාවයයි. සිවුදිගින් හමන ප්‍රචණ්ඩ වාතයෙන් කම්පිත නොවන මේරු පර්වතය මෙන් අප බෝසත් තෙමේ ද ස්ථිරයි. අචපලයි "ඡන්ද දොස භය මොහා" යන සිවු අගතියෙන් නො නැමෙන්නේ ය. එබැවින් අචපලය. මහමෙර වැනිය.



පරිශීලනය සෙනසුන තුළ පමණයි

"ගම්භීරෙනණ්ණවො විය"

අණ්ණව නම් සාගරයයි. එය අතිශයින් ම ගැඹුරුය. එබඳු ගැඹුරු අන් ස්ථානයක් නැත්තේ ය. එහෙයින් ගැඹුරෙන් අග්‍ර වූයේ සාගරයයි බෝසත් තෙමේ ද ගැඹුරු ගුණයෙන් සාගරය වැනිය. බෝසතුන්ගේ ගැඹුරු ගුණය නම් සිත්හි පවත්නා මිණිය නොහැකි, සිතිය නොහැකි අදහස් පිළිබඳ ගැඹුරු බවයි. කෙනෙකුට යමෙකුගේ සිත්හි පවත්නා අදහස් පහසුවෙන් තේරුම්ගත හැකි නොවේ නම් හේ ගැඹුරු ගුණයෙන් යුක්තය. කිසිවෙකුට බෝසතුන්ගේ සිත්හි පවත්නා අදහස් මෙසේ යයි තේරුම් ගැණීමට නොහැකි තරම් ගැඹුරුය. එහෙයින් හේ සයුරමෙන් ගැඹුරු ගුණයෙන් යුක්තයයි කීහ.

"බ්‍රහ්මස්සරො"

මෙහි බ්‍රහ්ම ශබ්දය ශ්‍රෙෂ්ඨාර්ථයෙහි වේ. එහෙයින් බෝසතුන්ට ශ්‍රෙෂ්ඨවූ ස්වරයක් (කටහඬක්) ඇත්තේ ය. බ්‍රහ්මස්සරො යන්නෙන් බ්‍රහ්මයාගේ මුඛස්වර (කටහඬද) ය ගණු ලැබේ. හේ අඞ්ග අටකින් යුක්තය. බුද්ධත්වයට පත් සර්වඥයන් වහන්සේලාට ද එබඳු ස්වරයක් ඇත්තේ ය. ඒ අෂ්ටාඞ්ග සමන්නා' ගත බ්‍රහ්මස්වරයයි. හේ මෙසේයි:-

(1) පහසුවෙන් ශබ්දය මුවෙන් පිටවීම (=විස්සට්ඨතා)
(3) අදහස වහා අවබොධ කරවන බව (=විඤ්ඤෙය්‍යතා)
(3) මිහිරි බව (=මඤ්ජුතා)
(4) කණට සැප එළවන බව (=සවණීයතා)
(5) අතර කිඳුම් රහිතබව (=බින්දුතා)
(6) පැහැදිලි බව (=අවිසාරිතා)
(7) ගැඹුරු බව (=ගම්භීරතා)
(1) ඇත ඇසෙන බව (=නින්නාදිතා)

නිමිත්තෙ චතුරො.

(1) ජරා, (2) ව්‍යාධි, (3) මෘත (4) ප්‍රව්‍රජිත යන නිමිති සතරයි. දිනක් බෝසත් තෙමේ සුදු අසුන් සතර දෙනෙකුන් යෙදූ රථයෙකින් උයන් කෙළි පිණිස යනුයේ සැරයටියක් අතින් ගත් ඇඟ රැලි වැටුනු කුදුගැසුනු හිසකේ රැවුල් පැසුනු මහල්ලෙකු ද, තමාගේ මල මුත්‍රයෙහි ගැලී සිටිනා අනුන් විසින් නැගුටුවනු ලබන්නාවූ ද නොහා ලබන්නාවූ ද, දරුණු රෝගයකින් පීඩිතවූ,

ලෙඩෙකු ද, මළකඳක් ද, පැවිදි රුවක් ද දුටුයේය. මේ නිමිති රූප දෙවතාවන් විසින් මවාපාන ලදැයි අටුවාහි පෙණේ. පෙරනිමිති දැකීම පිළිබඳ මත භෙද පවතී. එක දවසකදී නිමිති සතරම දක්නා ලදැයි ද දවස් සතරකදී දක්නා ලදැයි ද මාසකීප යකදී දක්නා ලදැයි ද යනාදී වශයෙනි.

55 පබ්බජ්ජාභිරතො නාථො - රන්ත්වා උය්‍යාන භූමියං
සුඵුල්ලචම්පකාසොක - නාගාදුමෙහි මණ්ඩිතං.

අන්වය:- පබ්බජ්ජාභිරතො නාථො උය්‍යානභූමියං රන්ත්වා සුඵුල්ලචම්පකාසොක නාගාදුමෙහි මණ්ඩිතං.

පදාර්ථ:- පබ්බජ්ජාභිරතො, පැවිදි වීමෙහි ඇලුනාවූ; නාථො අනාථයනට නාථවූ බෝසත් තෙමේ; උය්‍යාන භූමියං, උද්‍යාන භූමියෙහි; රන්ත්වා, රමණය කොට; සුඵුල්ල මනාකොට පිපිනු; චම්පක, සපුය; අසොක, හොපලුය; නාගාදි, නාගස්ය යනාදීවූ; දුමෙහි, වෘක්ෂයන්ගෙන්; මණ්ඩිතං, හෙබියාවූ;

පූ: ක්‍රි: රන්ත්වා (රමු-රමණෙ) යන පූර්වක්‍රියාවට නාථො යනු කර්තෘයි. උය්‍යාන භූමියං යනු ආධාරයි.

විශෙෂණ විශෙෂ්‍ය;

නාථො විශෙෂ්‍යයි. පබ්බජ්ජාභිරතො, තුල්‍යාධිකරණ විශෙෂණයි.

සමාස:- පබ්බජ්ජාභිරතො, උය්‍යානභූමියං, සුඵුල්ලචම්පකාසොකනාගාදුමෙහි.

විග්‍රහ:- අභි අරයුජ්ජීවිත්‍යාති (රමු-රමණෙ) අභිරතො පබ්බජ්ජාය අභිරතො පබ්බජ්ජාභිරතො, උය්‍යානස්ස භූමි උය්‍යානභූමි තස්සං චම්පකා ච අසොකා ච නාගා ච චම්පකාසොකනාගා, සුට්ඨු ඵුල්ලා, සුඵුල්ලා සුඵුල්ලා ච තෙ චම්පකාසොකනාගා චෙති, සුඵුල්ලචම්පකාසොකනාගා- තෙ ආදි යෙ සංතො සුඵුල්ලචම්පකාසොකනාගාදයො සුඵුල්ලචම්පකාසොකනාගාදයො ච තෙ දුමා චෙති සුඵුල්ලචම්පකාසොකනාගාදුමා තෙහි.

56 ඵුල්ලපඞ්කජකල්හාර - ජලාලය සතාකුලං
මන්ද මන්දනිලායාත - නානාමොදෙහි වාසිතං.

අන්වය:- ඵුල්ලපඞ්කජකල්හාර ජලාලයසතාකුලං මන්ද මන්ද නිලායාත නානා මොදෙහි වාසිතං.



පදාර්ථ:- ඵුල්ල, පිපියාවූ; පඞ්කජ, පියුම්ය; කල්හාර, හෙල්මැලිය යන මෙයින් යුක්තවූ; ජලාලය සතාකුලං, සිය ගණන් ජලාශ්‍රයන්ගෙන් ගැවසිගත්තාවූ; මන්ද මන්දනිලායාත, මඳ මඳ පවනින් පැමිණියාවූ; නානා මොදෙහි, අනෙක පරාගයෙන්; වාසිතං, සුවඳ කවන ලද්දාවූ;

භාවය:- පිපුනු සියුම් හෙල්මැලි යන මෙයින් ගැවසුනු සිය ගණන් පොකුණු වලින් යුක්තවූ මඳ සුළඟින් පැමිණි මල් රෙණින් සුවඳ කවන ලද.

වි: විශෙෂ්‍ය: උය්‍යානං යනු විශෙෂ්‍යයි. ඵුල්ලපඞ්කජකල්හාර ජලාලය සතාකුලං, වාසිතං. යනු තුල්‍යාධිකරණ විශෙෂණයි. මන්දමන්ද නිලායාත නානා මොදෙහි, යනු භින්නාධිකරණ විශෙෂණයි.

සමාස:- ඵුල්ලපඞ්කජකල්හාරජලාලයසතාකුලං, මන්දමන්ද නිලායාතනානාමොදෙහි.

විග්‍රහ:- පඞ්කෙ ජාතානි පඞ්කජානි පඞ්කජානි ච කල්හාරානි ච පඞ්කජකල්හාරානි ඵුල්ලානි ච තානි පඞ්කජකල්හාරානි චාති ඵුල්ලපඞ්කජකල්හාරානි, ජලානං ආලයො ජලාලයො, ඵුල්ලපඞ්කජකල්හාරෙහි යුත්තා ජලාලයො ඵුල්ලපඞ්කජකල්හාර ජලාලයො තෙසං සතං ඵුල්ලපඞ්කජකල්හාරජලාලයසතං තෙන ආකුලං ඵුල්ලපඞ්කජකල්හාරජලාලයසතාකුලං,

මන්දො ච මන්දො ච මන්දමන්දො මන්දමන්දො ච සො අනිලො චාති මන්දමන්දනිලො තෙන ආයාතා මන්දමන්දනිලායාතා අමොදන්තා අනෙනාති ආමොදො (ආ පූර්ව මුද-හාසෙ) අනෙකා ච තා අමොදා චෙති නානා මොදා මන්දමන්දනිලායාතා ච තා නානා මොදා චෙති මන්දමන්දනිලායාත නානා මොදා තෙහි.

57 සරාසරං සමායාත - මධුබ්බතනිසෙවිතං
ඵලපුප්ඵරසුද්දාම - ද්විජසඞ්ඝනිකූජිතං

අන්වය:- සරාසරං සමායාත මධුබ්බතනිසෙවිතං ඵල පුප්ඵ රසුද්දාම ද්විජසඞ්ඝනිකූජිතං.

පදාර්ථ:- සරාසරං, විලින් විලට; සමායාත, සංචාරණය කරන්නාවූ; මධුබ්බතනිසෙවිතං' බඹර පෙළින් සෙවුනාවූ; ඵල පුප්ඵරස, මල්ඵල රසයෙන්; උද්දාම, උසස්වූ මදඇති; ද්විජසඞ්ඝ නිකූජිතං, පක්ෂිසමූහයා විසින් රැව් පිළිරැව් දෙනලද්දාවූ;

භාවය:- විල්වලට පැමිණ හැසිරෙන්නා වූ බඹර පෙළින් සේවිතාලද මල් ඵලරස පානයෙන් උසස් වූ මද ඇති පක්ෂි සමූහයා විසින් රාව පිළිරාව දෙන ලද්දවූ

**විශේෂණ විශේෂ්‍ය:**

සමායාතමධුබ්බතනිසෙවිතං ඵලපුප්ඵරසුද්ධුම ද්විජසඞ්ඝ නිකූජිතං යන මොහු (උය්‍යානං) යන්නට තුල්‍යාධිකරණ විශේෂණයෝයි.

සමාස:- සමායාතමධුබ්බතනිසෙවිතං ඵලපුප්ඵරසුද්ධුම ද්විජ සඞ්ඝනිකූජිතං.

විග්‍රහ:- මධුං වතයන්ති භුඤ්ජන්තීති මධුබ්බතො (වත-භොජනෙ) සමායාතා ච තෙ මධුබ්බතා චෙති සමායාතමධුබ්බතා නිසෙවියන්ති නිසෙවිතං (සිවු-සෙවායං) සමායාත මධුබ්බතෙහි නිසෙවිතං සමායාත මධුබ්බත නිසෙවිතං ඵලානි ච පුප්ඵානි ච ඵලපුප්ඵානි ඵලපුප්ඵානං රසො ඵලපුප්ඵරසො තං,තෙන උද්ධුමා ඵලපුප්ඵරසුද්ධුමා ඵලපුප්ඵරසුද්ධුමා ච තෙ ද්විජා චෙති ඵලපුප්ඵරසුද්ධුම ද්විජා තෙසං සඞ්ඝො, ඵලපුප්ඵරසුද්ධුම ද්විජසඞ්ඝො තෙන නිකූජිතං ඵලපුප්ඵරසුද්ධුම ද්විජ සඞ්ඝනිකූජිතං.

58 **නච්චන්තමත්තමොරානං - නිච්චං මණ්ඩපසන්නිභං**
**දිබ්බන්තමිගසඞ්ඝානං - කීළාමණ්ඩපසන්නිභං**

අන්වය:- නිච්චං නච්චන්තමත්තමොරානං මණ්ඩපසන්නිභං දිබ්බන්තමිගසඞ්ඝානං කීළාමණ්ඩප සන්නිභං.

පදාර්ථ:- නිච්චං, නිරන්තරයෙන්; නච්චන්ත, නටන්නාවූ; මත්ත මොරානං, මත්වූ මොනරුන්ට, මණ්ඩප සන්නිභං, රඟමඩලක් වැනිවූ; දිබ්බන්ත, ක්‍රීඩාකරන්නාවූ; මිගසඞ්ඝානං, මෘග සමූහයන්ට; කීළාමණ්ඩප සන්නිභං, කෙළි මඩුල්ලක් වැනිවූ;

භාවය:- නිරතුරු නටන මත් මොනරුන්ට රඟමඩලක් වැනිවූ ක්‍රීඩාකරණ මෘගයන්ට කෙළිමඩුල්ලක් වැනිවූ

**විශේෂණ විශේෂ්‍ය:**

කීළාමණ්ඩප සන්නිභං, යනු (උය්‍යානං) යන්නට තුල්‍යාධිකරණ විශේෂණයි. නච්චන්ත මත්ත මොරානං දිබ්බන්තමිග සඞ්ඝානං, භින්නාධිකරණ විශේෂණයි.



සමාස:-නච්චන්තමත්තමොරානං මණ්ඩපසන්නිභං දිබ්බන්ත මිගසඞ්ඝානං කීළාමණ්ඩප සන්නිභං.

විග්‍රහ:- මත්තා ච තෙ මොරා චෙති නච්චන්තමත්තමොරා නච්චන්තා ච තෙ මත්තමොරා චෙති නච්චන්තමත්තමොරා තෙසං මණ්ඩපස්ස සන්නිභො මණ්ඩපසන්නිභො තං,දිබ්බන්තා ච තෙ මිගා චෙති දිබ්බන්තමිගා දිබ්බන්තමිගානං සඞ්ඝා දිබ්බන්තමිග සඞ්ඝා, තෙසං කීළාය මණ්ඩපො කීළාමණ්ඩපො තස්ස සන්නිභො කීළාමණ්ඩපසන්නිභො තං,

59 **සමීර සිසිරොදාර - ධාරාසීකර වාරිහි**
**ධාරාමණ්ඩප පන්තීහි - ජනානන්දකරං වරං.**

අන්වය:- සමීර සිසිරොදාරධාරාසීකරවාරිහි ධාරාමණ්ඩප පන්තීහි ජනානන්දකරං වරං.

පදාර්ථ:- සමීර, මාරුතයෙන්; සිසිර, සිසිල්වූ; උදාර, මහත්වූ; ධාරා, ජලධාරාවෙන් ද, සීකරවාරිහි, ජලකණිකා ජලයෙන් ද; ධාරා මණ්ඩප පන්තීහි, ජල යන්ත්‍රමණ්ඩපපඞ්ක්තියෙන් ද; ජනානන්දකරං, ජනයන්ගේ සිත් සතුටු කරන්නාවූ; වරං, උතුම් වූ;

භාවය:- සුළඟින් සිසිල්වූ මහත්වූ ජලධාරාවෙන් ද, ජලකණිකා ජලයෙන් ද, ජලයන්ත්‍ර මණ්ඩප පෙළින්ද ජනයාගේ සිත සතුටු කරන්නාවූ (එහෙයින් ම) උතුම් වූ.

වි: විශේෂ්‍ය:- ජනානන්දකරං වරං යනු (උය්‍යානවනං යන්නට) තුල්‍යාධිකරණ විශේෂණයෝ ය. සමීරසිසිරොදාරධාරාසීකරවාරිහි ධාරාමණ්ඩපපන්තීහි භින්නාධිකරණ විශේෂණයෝ යි.

සමාස:- සමීරසිසිරොදාරධාරාසීකරවාරිහි ධාරාමණ්ඩප පන්තීහි ජනානන්දකරං.

විග්‍රහ: සමීරෙන සිසිරා සමීරසිසිරා සමීරසිසිරා ච තා උදාරා චා'ති සමීරසිසිරොදාරා සමීරසිසිරොදාරා ච තා ධාරාචා'ති සමීර සිසිරොදාරධාරා, සිඤ්චන්තීති සීකරො (සිච-සෙකෙ) සමීරසිසිරොදාරධාරා ච සීකරවාරී ච සමීරසිසිරොදාරධාරා, සීකරවාරී තෙහි.

60 **උය්‍යානවනමාගම්ම-දෙවරාජා'ව නන්දනං**
**කීළනෙනානිජ්ජුනනස්ස-සුඛාන ජනසාසනං.**

**අන්වය:-** උය්‍යානවනං ආගම්ම නන්දනං දෙවරාජා ඉව කීළන්තො නිජපුත්තස්ස ජාතසාසනං සුණාත.

**පදාර්ථ:-** උය්‍යානවනං, උයන් වනයට; ආගම්ම, පැමිණ; නන්දනං, නන්දනොද්‍යානයට (පැමිණියාවූ); දෙවරාජා ඉව, සක් දෙව්රජුමෙන්, කීළන්තො, ක්‍රීඩා කරන්නේ; නිජපුත්තස්ස, තම පුත්‍රයාගේ; ජාතසාසනං, උපන් හස්න; සුණාත, අසා;

**භාවය:-** නඳුන් වනයට පැමිණි සක්දෙව් රජුමෙන් උයනට පැමිණි මහසත් තෙමේ ක්‍රීඩා කරණුයේ සිය පුතු උපන් පුවත අසා,

**ව: කා:** සුණාත (සු-සවණෙ) යන පූර්වක්‍රියාවටද කීළන්තො (කීළ-කීළනෙ) යන කෘදන්ත ක්‍රියාවට ද (මහාසත්තො යනු උක්ත කර්තෘයි.) ජාතසාසනං යනු සුණාත යන පූර්වක්‍රියාවට කර්මයි. උය්‍යානවනං යනු ආගම්ම (ආ පූර්ව-ගමු-ගතියං) යන පූර්ව ක්‍රියාවට කර්මයි.

**වි: විශෙෂ්‍ය:** මහාසත්තො යනු විශෙෂ්‍යයි. දෙවරාජා යනු විශෙෂණයි. උය්‍යානවනං යනු විශෙෂ්‍යයි. නන්දනං යනු විශෙෂණ යි.

**සමාස:** උය්‍යානවනං, දෙවරාජා, නිජපුත්තස්ස, ජාතසාසනං.

**විග්‍රහ.** උය්‍යානං ච තං වනං චාති උය්‍යානවනං, දෙවානං රාජා දෙවරාජා, අත්තනො පුත්තො නිජපුත්තො තස්ස, ජාතස්ස සාසනං ජාතසාසනං.

**පරිකථා:- පඞ්කජ කල්හාර"**

පඞ්කෙ ජාතං පඞ්කජං, පඞ්කයෙහි උපනී නු යි පඞ්කජ නම. පියුම්වලට නමෙකි. අම්බු-ආරුඪ-අම්බුජාරුඪ යන ත්‍රිභෙද යෙන් පඞ්කජ යනු අම්බුජාරුඪ ශබ්දයෙකි. කල්හාර යනු හෙල් මැලියි. පතෝල මල් වැනි සුදුමල් වෙසෙස් ඇති ඔලුකොල වැනි කොල ඇති ජලජ වර්ගයකි. මීට පාලියෙහි"සොගන්ධික-කල්හාර-දක-සීතලික, කියා ද සංස්කෘතයෙහි සෞගන්ධික - කහ්ලාර කියා ද ව්‍යවහාර කරත්.

**"ජලාලයසතාකුලං"**

ජලාලය නම් විල් පොකුණු ආදියට නමකි. ජලයට ආලය (වාසස්ථානය) වූයේ ජලාලය වේ. මෙහි උද්‍යාන භූමියෙහි වූ පුෂ්කරණීහු ගණු ලැබෙත්. මෙබඳු සිය ගණන් පුෂ්කරණීහු එහි ඇත්තාහ.



**"මඤ්ජුමඤ්ජුකිලාසාන නානාමොදෙහි වාසිතං"**

වාසිත යනු සුවඳ කවන ලද්දට නමෙකි. උයන සුවඳවත් වූයේ මඳ සුලඟින් ගෙණ එන මල් රේණුයෙනි.

**"ද්විජසඞ්ඝනිකූජිතං"**

ද්විජ යනු බ්‍රාහමණයන්ට හා අණ්ඩජ සත්වයන්ට ද දත්තයන්ට ද අභිධානයකි. අණ්ඩජ සත්වයන් දෙවන වර උපදින්නේ බීජයෙනි. එහෙයින් ඔව්හු ද්විජ නම් වෙත්. (ද්විජ) බමුණන්ගේ දෙවන උත්පත්තිය වන්නේ පූනනූල කරලැමෙනි. පක්ෂි සමූහයා විසින් දෙකලද නාදයෙන් මේ වනය පොෂිත බැවි මෙයින් වර්ණනා කරණ ලදි.

61 නිවත්තො විස්සකම්මෙන-සහස්සක්ඛොʼව භූසිතො
පුරං පවිසමානොʼථ-කිසාගොතමි භාසිතං.

**අන්වය:-** නිවත්තො විස්සකම්මෙන භූසිතො සහස්සක්ඛොව පුරං පවිසමානොʼව කිසාගොතමි භාසිතං.

**පදාර්ථ:-** නිවත්තො, නැවැත්තේ; විස්සකම්මෙන, විස්කම් දෙව්පුත්හු විසින්; භූසිතො, සරසන ලද්දේ; සහස්සක්ඛො ඉව, සක්දෙව් රජු මෙන්; පුරං, පුරයට; පවිසමානො එව, පිවිසෙන්නේ ම; කිසාගොතමි භාසිතං, කිසාගොතමිය විසින් කියන ලද්ද වූ;

**භාවය:-** (පුත උපන් අස්න අසා) නැවැත්තේ විශ්වකර්මයා විසින් සරසන ලදු ව සක්දෙව් රජුමෙන් පෙරළා නුවරට පැමිණෙන්නේ ම කිසාගොතමිය විසින් කියන ලද්දවූ,

**ව: කා:** සුගමයි.

**වි: විශෙෂ්‍ය.** නිවත්තො භූසිතො පවිසමානො යනු මහාසත්තො යන්නට තුල්‍යාධිකරණ විශෙෂණයෝ යි. (නිපූර්ව වතු-වත්තනෙ) භූෂ අලඞ්කාරෙ, පපූර්ව විස-පවෙසනෙ.)

**සමාස:** සහස්සක්ඛො, කිසාගොතමි භාසිතං.

**විග්‍රහ:** සහස්සං අක්ඛීනි (=ඤාණානි) යස්ස සො සහස්සක්ඛො, කිසාගොතමියා භාසිතං කිසාගොතමිභාසිතං.

**පරිකථා:- "විස්සකම්ම"**

"විශේෂඥ කර්මව්‍යාපාරෝ යස්‍ය ස විශ්වකර්මා" යනු සංස්කෘත ශබ්දිකයන්ගේ මේ පිළිබඳ නිරුක්තියි. සියලු කාර්‍ය්‍යයන්හි දක්‍ෂවූ තැනැත්තේ විශ්වකර්මය යනු මෙයින් හැඟේ. මොහු ශක්‍රයාගේ සියලු කාර්‍ය්‍යයන් සම්පාදනය කිරීමෙහි ප්‍රධානවූ කාර්මික ශිල්පියාය. බෞද්ධ ග්‍රන්ථයන්හි මොහුගේ කාර්‍ය්‍යයන් සවිස්තරව දක්වා තිබේ.

**"සහස්සනෙත්තො'ව කුපිතො"**

දහසක් ඇස් ඇත්තේ සහස්සක්ඛ නම් වේ. මේ ඇස් දහස නුවණ නමැති ඇස්යයි බෞද්ධ ග්‍රන්ථයන්හි දක්වා තිබේ. දහසක් දෙනාගේ නුවණින් සිතන දේ ශක්‍රතෙමේ ස්වකීය ඥානයෙන් එකවර සිතීමෙහි සමර්ථ වේ. බෞද්ධමතය මෙසේ වුවත් පුරාණගත මතය අනිකකි.

බ්‍රහ්මයා විසින් පළමුකොට මවනලද ස්ත්‍රිය අහල්‍යා නම්. ඇය ගෞතම ඍෂියට පාවා දෙනලදී. අහල්‍යාව කෙරෙහි පිළිබඳ සිත්ඇති ඉන්ද්‍ර දිනක් චන්ද්‍රයා ද සහායකොටගෙණ ගෞතම ඍෂින්ගේ අසපුව කරා පැමිණියේය. කුකුළුවෙස් ගත් චන්ද්‍රයා මධ්‍යම රාත්‍රියෙහි අසපුව ලඟ සිට හඬලීය. ඍෂිතෙමේ බ්‍රහ්මමුහූර්තය පැමිණියේයයි සිතා ස්නානය පිණිස බැහැර ගියේය. මේ අතර ඉන්ද්‍රයා ගෞතම ඍෂින්ගේ වෙශයෙන් අවුත් අහල්‍යාව හා සැතපින. මේ ප්‍රවෘත්තිය දත් ඍෂිතෙමේ අහල්‍යාව කෙරෙහි සැකකොට ගලක් කෙළේය. ඉන්ද්‍රයාට කළ ශාපයෙන් ඔහුගේ ශරීරයෙහි ස්ත්‍රීචිහ්නයෝ දහසක් පහළවූහ. මෙයින් ලජ්ජිත වූ ශක්‍රයාගේ බලවත් යාඥයෙන් ස්ත්‍රීචිහ්නයෝ නෙත්‍ර බවට පමුණුවනලදහ යනු පුරාණකථාවයි.

"අකුලාංලූ කල තුඹමල් සා ඇති විදුපී කල සඟොඳුන් දෙලොස් යොදුන් සා දිවසලු දසදහසක් පටින් වෙලා" බොධිසත්වයන් වහන්සේ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් සක්දෙව් රජු මෙන් සරසන ලදහ.

**"කිසාගොතමී"**

සිද්ධාර්ථ කුමාරයන්ට යශෝධරා කිසාගොතමී මනොහරා යි මෙහෙසියෝ තුන්දෙනෙක් වූහ යි ද කිසාගොතමී දණ්ඩපාණි ශාක්‍යරජුගේ දියණියයි ද ඇතැම් ග්‍රන්ථයන්හි සඳහන් වේ.



**62 සුත්වාන නිබ්බුතපදං-සද චිත්තානුකූලකං**
**සන්තුට්ඨො සානුරාගො ච- ලක්ඛග්ඝං තාරභාසුරං.**

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** සද, එකල්හි; චිත්තානුකූලං, සිතට අනුකූල වූ; නිබ්බුතපදං, නිබ්බුතපදය; සුත්වාන, අසා; සන්තුට්ඨො, සතුටුවූයේ; සානුරාගො ච, අනුරාග සහිත වූයේ; ලක්ඛග්ඝං, ලක්‍ෂයක් අග නාංවූ; තාර, මහත්වූ; භාසුරං, බබලන්නාවූ;

**භාවය:-** (කිසාගොතමී විසින් කියනලද) චිත්තානුකූලවූ "නිබ්බුතා නූන සා මාතා" යනාදීන් ප්‍රකාශිත නිර්වෘතපදය අසා සතුටුවූයේ අනුරාග සහිත සිත් ඇත්තේ ලක්‍ෂයක් වටනාවූ මහත්වූ බබලන්නාවූ,

**උ: කා:** සුගමයි.

**වි: විශෙෂ්‍ය:** නිබ්බුතපදං විශෙෂ්‍යයි, චිත්තානුකූලකං තුල්‍යාධිකරණ විශෙෂණයි. (හාරං-විශෙෂ්‍යයි.) තාරභාසුරං, ලක්ඛග්ඝං තුල්‍යාධිකරණ විශෙෂණයි. සන්තුට්ඨො, සානුරාගො, (මහාසත්තො යන්නට) විශෙෂණයි.

**සමාස:** නිබ්බුතපදං, චිත්තානුකූලකං, සානුරාගං, ලක්ඛග්ඝං තාරභාසුරං,

**විග්‍රහ:** නිබ්බුතො ඉති පදං නිබ්බුතපදං, චිත්තස්ස අනුකූලං චිත්තානුකූලං චිත්තානුකූලමෙව, චිත්තානුකූලකං තං, සං අතුස්සීති සන්තුට්ඨො, සහ අනුරාගෙන යො වත්තතී සො සානුරාගො, ලක්ඛං අග්ඝතීති ලක්ඛග්ඝං (ලක්ඛසඞ්ඛ්‍යපද අග්ඝ-පූජායං) භාසතීති භාසුරො (භාදිත්තියං උරො) තාරං ච භාසුරං ච තාරභාසුරං, තං.

**63 හාරං කිස්සාය පෙසෙත්වා-ගන්ත්වාන සකමන්දිරං**
**දෙවරාජවිලාසෙන-නිසීදි පවරාසනෙ.**

**අන්වය:-** හාරං කිස්සාය පෙසෙත්වා සකමන්දිරං ගන්ත්වාන දෙවරාජ විලාසෙන පවරාසනෙ නිසීදි.

**පදාර්ථ:-** භාරං, මුත්හර; තිස්සාය, ඒ කිසාගෝතමියට; පෙසෙත්වා, යවා; සකමන්දිරං, සවකීය භවනයට; ගන්ත්වා, ගොස්; දෙවරාජ විලාසෙන, සක්දෙව් රජමෙන්; පවරාසනෙ, උතුම් අස්නෙහි; නිසීදි වැඩහුන් සේක;

**භාවාර්ථ:-** මුත්හර ඒ කිසාගෝතමිය වෙත යවා සිය මාලිගයට පිවිසියේ සක්දෙව්රජ ලෙසින් උතුම් වූ අස්නෙහි වැඩහුන්සේක.

**ක්‍රි: ස:** මහාසත්තො භාරං තිස්සාය පෙසෙත්වා සකමන්දිරං ගන්ත්වාන පවරාසනෙ නිසීදි.

**ළ: ක:** නිසීදි (සද-විසරණගත්‍යවසාදනෙසු) යන අජ්ජතනී විභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදය විසින් කථිත හෙයින් (මහාසත්තො යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි) පවරාසනෙ යනු අනුක්තාධාරයි. පෙසෙත්වා ගන්ත්වා යන පූර්වක්‍රියාපදයන්ට ද මහාසත්තො යනුම කර්තෘයි. භාරං සකමන්දිරං යනු පිළිවෙළින් කර්මයෝයි. තිස්සාය යනු සම්ප්‍රදානයි.

**වි: විශෙෂ්‍ය:** (මහාසත්තො යනු විශෙෂ්‍යයි,) දෙවරාජ විලාසෙන යනු භිණ්ණාධිකරණ විශෙෂණයි.

**සමාස:** අත්තනො මන්දිරං සකමන්දිරං තං, දෙවානං රාජා දෙවරාජා දෙවරාජස්ස විලාසො දෙවරාජවිලාසො තෙන, ආසන්ති අස්මිං'ති ආසනං (ආස-උපවෙසනෙ) පවරං ච තං ආසනං චෙ'ති පවරාසනං තස්මිං,

**පරිකථා:-** (62-63) "නිබ්බුතපදං සුත්වාන"

නිබ්බුත පදනම:-

"නිබ්බුතා නූන සා මාතා-නිබ්බුතො නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරී-යස්සායං ඊදිසො පති"

යනුයි. මේ තෙමේ හෝ මෙවැන්නෙක් යම් මවෙකුට පියෙකුට පුත්වේ ද, ඒ මවු නිවුනී මැයි, ඒ පියාත් නිවුනේ මැයි. යම් ස්ත්‍රියකගේ සැමි වේ නම් ඒ බිරින් ද නිවුනී මැයි. මේ එහි තේරුමයි. සිදුහත් කුමරු දහ මත නුවන් තමන් වෙත හයවමින් මහජනයාගේ නෙත් නමැති ඉඳුනිල් මිණි තොරණින් සරසන ලද වීථියෙන් සිය මාලිගය කරා පැමිණෙනු දුටු කෘශ ගෞතමිය උඩුමහල් තලයෙහි සිට පුණ්‍යොත්කත ප්‍රීති වාක්‍යය ප්‍රකාශ



කළාය. සංසාරික දුඃඛ ක්‍ෂයාගේ නිවීම පිළිබඳ ගැඹුරු කල්පනාව තව නැඹුරුවූ සිත් ඇත්තේ මා මැනි අත්බැවක් දක්නා මවුපිය ආදීන්ගේ සිත් නිවියේයයි කියයි. ඇතුළත කුමක් නිවී කල සඳවත නිවේදැයි සිතනුයේ රාග ද්වෙෂ මොහ ආදී ගිනි නිවීතලම නිවුනේ නම් වේයයි දිටීය. මෙසේ දැන කෘශාගෞතමිය මට මෙසින් මහත් උපදෙසක් දුන්නියයි සතුටුව කර පැලඳි මුත්හර ගලවා ඇය වෙත යැව්වේය. ඕ තොමෝ මෙය වරදවා සිතා ගත්තී තමන් කෙරෙහි පිළිබඳ සිත් ඇති කරන්නේ යයි සතුටු වූවාය.

**64 අථාගම්ම තදනෙකා-නාටිකා පරිවාරයුං**
**වජ්ජන්ති හෙරියො තාසු-පග්ගය්හ කාචි නාරියො.**

**අන්වය:-** අථ තදා අනෙකනාටිකා ආගම්ම පරිවාරයුං. තාසු කාචි නාරියො හෙරියො පග්ගය්හ වජ්ජන්ති.

**පදාර්ථ:-** අථ, ඉක්බිත්තෙන්; තදා, එකල්හි; අනෙකනාටිකා, නොයෙක් නළඟනෝ; ආගම්ම, එළඹ; පරිවාරයුං, පිරිවැරූහ. තාසු, ඔවුනතුරෙන්; කාචි නාරියො, ඇතැම් ස්ත්‍රීහු; හෙරියො, හෙරින්; පග්ගය්හ, ගෙණ; වජ්ජන්ති, වයත්.

**භාවාර්ථ:-** සිදුහත් කුමරු සිය භවනයෙහි උතුම් අස්නෙහි වැඩහුන් කල්හි නොයෙක් නළඟනෝ ඒ වට පිරිවරා ගෙණ නෘත්‍යයට පටන්ගත්තාහු ඇතැම් ස්ත්‍රීහු හෙරින් ගෙණ වාදනය කරන්ට පටන්ගත්හ.

**ක්‍රි: ස:** අනෙකනාටිකා ආගම්ම (තං) පරිවාරයුං: තාසු කාචි නාරියො හෙරියො වජ්ජන්ති.

**ළ: ක:** පරිවාරයුං (පරි පූර්ව වර-ආවරණෙ) යන අජ්ජතනී විභක්ති කර්තෘකාරක පරස්මෛපද බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදය විසින් කථිත හෙයින් අනෙකනාටිකා යනු උක්ත කර්තෘයි. තං යනු අධ්‍යාහෘත අනුක්ත කර්මයි. ආගම්ම (ආ පූර්ව-ගමු-ගතියං) යන පූර්වක්‍රියාවට ද අනෙකනාටිකා යනුම කර්තෘයි. තං යනු කර්මයි. වජ්ජන්ති යන (වද-වචනෙ) වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදය විසින් කථිත හෙයින් කාචි නාරියො යනු උක්ත කර්තෘයි. හෙරියො අනුක්ත කර්මයි. පග්ගය්හ (ප පූර්ව-ගහ-උපාදානෙ) යන පූර්ව ක්‍රියා පදයට ද කාචි නාරියො යනු කර්තෘයි. හෙරියො යනු කර්මයි.

65 නානාලයසමාකිණ්ණං-ගීතං ගායන්ති කාචි'පි
ධමන්ති සුසිරං කාචි-කාචි වාදෙන්ති තන්තියො.

**අන්වය:-** කාචි අපි නානාලයසමාකිණ්ණං ගීතං ගායන්ති, කාචි සුසිරං ධමන්ති, කාචි තන්තියො වාදෙන්ති.

**පදාර්ථ:-** කාචි, ඇතැම් තැනැත්තියෝ; නානාලය, අනෙක තාලයෙන්; සමාකිණ්ණං, ගැවසුනාවූ; ගීතං අපි, ගීතිකාද; ගායන්ති, ගායනය කෙරෙත්; කාචි, සමහරු; සුසිරං, කුලල්; ධමන්ති, පිඹිත්; කාචි, සමහරු; තන්තියො, තන්ත්‍රීන්; වාදෙන්ති, වාදනය කෙරෙත්;

**භාවය:-** ඔවුනතුරෙන් ඇතැම් තැනැත්තියෝ නොයෙක් තාලයෙන් යුක්තවූ ගී කියන්නවද සමහරු කුලල් පිඹින්නවද කිසිවෙක් වීණා වාදනය කරන්නව ද පටන් ගත්හ.

**ක්‍රි: ස:** කාචි ගීතං ගායන්ති, කාචි සුසිරං ධමන්ති, කාචි තන්තියො වාදෙන්ති.

**උ: කා:** වාදෙන්ති යන (වද-වචනෙ) වර්තමාන විභක්ති කර්තෘ කාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් කාචි යනු උක්ත කර්තෘයි. ගීතං යනු අනුක්ත කර්මයි. ධමන්ති (ධම-සද්දෙ) වාදෙන්ති, (වද-වචනෙ) යන ක්‍රියාවන්ටද කාචි යනු ම උක්ත කර්තෘයි. සුසිරං තන්තියො යනු පිළිවෙළින් අනුක්ත කර්මයෝ යි.

**වි: විශෙෂ්‍ය:** ගීතං විශෙෂ්‍යයි, නානාලය සමාකිණ්ණං, තුල්‍යාධිකරණ විශෙෂණයෝ යි.

**සමාස;-** නානාලය සමාකිණ්ණං.

**විග්‍රහ:** අනෙකා ලයා නානාලයා තෙහි සමාකිණ්ණං නානාලය සමාකිණ්ණං, තං.

**පරිකථා:-** "නානාලයසමාකිණ්ණං"

නෘත්‍යාදියෙහි පවත්නා සාම්‍යය ලය නම්. නෘත්‍යයන්හි දී පවත්නා ගී කීම වාදනය පද වින්‍යාසය යනාදී ක්‍රියාවන්ගේ සමභාවය-අන්‍යොන්‍ය අවිරුඬත්වයෙන් යුත් පැවැත්ම ලය නම්. සියලුම ක්‍රියාවන්ගේ සමභාවයට ද ඇතැමෙක් ලය යයි කියති.

(සත්තානං ජීවිතං ලූනතෙත්ථ ගච්ඡතීති ලයො ගීතවාදිත පදන්‍යාස ක්‍රියානං කාලසාමසමත්තං ලයො නාම සබ්බක්‍රියානම්පි සාම්‍යං ලයොති කෙචි.)



"තන්තියො"

තන්ත්‍රී නම් වීණායෙහි තත් ය. වීණාව සප්ත තන්ත්‍රියකින් යුක්තය. සංගීත විද්‍යාවෙහි වෙන් වශයෙන් දතයුතු ස්වරයෝ නම්:- ෂඩ්ජය-ධෛවත-ඍෂභය-ගාන්ධාරය-මධ්‍යමය-පඤ්චමය-නිෂාදය යන මොහු යි.

උසභො ධෙවතො චෙව-ඡජ්ජගන්ධාරමජ්ඣිමං
පඤ්චමො ච නිසාදො'ති-සත්තෙ'තෙ කථිතා සරා.

**වීණාශිල්පයෙහි ස-රි-ග-ම-ප-ද-නී වර්ණයෝ සත්දෙන සප්ත ස්වරයන්ට භාවිත ලද සංඥාවෝ යි.**

66 චාරුබිම්බාධරාරම්ම-පයොධරහරාසුභා
විසාලායතනීලක්ඛා-සොම්මසොම්මානනා තදා.

**අන්වය:-** තදා චාරු බිම්බාධරාරම්ම පයොධරහරා සුභා විසාලායත නීලක්ඛා සොම්මසොම්මානනා.

තදා, එකල්හි, චාරු, මනොඥවූ; බිම්බඅධරා, බිඹුඵල වැනි තොල් ඇති; රම්ම, සිත්කලු වූ; පයොධරහරා, පියයුරු බර ඇති; සුභා, යහපත්වූ; විසාල, මහත්වූ; ආයත, දික්වූ; නීලක්ඛා, නිල්වන් ඇස් ඇති; සොම, චන්ද්‍රයා වැනිවූ; සොම්මආනනා, සොම් මුහුණක් ඇති;

**වි: විශෙෂ්‍ය:** (67 හෙරිමණ්ඩලමජ්ඣගා යනු විශෙෂ්‍ය යි) චාරුබිම්බාධරා, රම්මපයොධරහරා, සුභා, විලාසයතනීලක්ඛා, සොම සොම්මානනා තත්තුල්‍යාධිකරණ විශෙෂණයෝ යි.

**සමාස:** චාරුබිම්බාධරා, රම්මපයොධරහරා, විසාලායත නීලක්ඛා, සොමසොම්මානනා.

**විග්‍රහ:** චාරූ ච තානි බිම්බානි චා'ති චාරුබිම්බානි චාරු බිම්බානි විය අධරා යාසං තා චාරුබිම්බාධරා, පයො ඛීරං ධාරෙන්තී'ති පයොධරා (ධර-ධාරණෙ) රම්මා ච තෙ පයොධරා චේ'ති රම්ම පයොධරා රම්මපයොධරා හරන්තීති (-හර ධාරණෙ,) රම්මපයොධරහරා, විසාලානි ච තානි ආයතානි චෙති විසාලායතානි නීලානි ච තානි අක්ඛීනිචේ'ති නීලක්ඛීනි, විසාලායතානි නීලක්ඛීනි යාසං තා විසාලායත නීලක්ඛා. සොම්මං ච තං ආනනං චේ'ති සොම්මානනං සොමොවිය සොම්මානනානි යාසං තා සොමසොම්මානනා.

67 නච්චගන්ධපූරණොකාසා-භෙරිමණ්ඩල මජ්ඣගා
දෙවකඤ්ඤා'ව රඞ්ගමහී-රසනාවනිරන්තරං.

**අන්වය:-** හෙරිමණ්ඩලමජ්ඣගා දෙවකඤ්ඤා විය රඞ්ගමහි තස්ස පුරතො රසභාවනිරන්තරං නච්චන්ති.

**පදාර්ථ:-** හෙරිමණ්ඩල මජ්ඣගා, බෙරමඬුලු මැදට පැමිණි කලඟනෝ; දෙවකඤ්ඤා විය, දිව්‍ය කන්‍යාවන් මෙන්; රඞ්ගමහි, රඟමඬුල්ලෙහි; තස්ස, ඒ මහ බෝසතුන්ගේ; පුරතො, ඉදිරියෙහි; රසභාව නිරන්තරං, රස-භාව දෙකින් නිරතුරු කොට; නච්චන්ති, නටත්;

**භාවය:-** (66-67) ඒ නෘත්‍ය මණ්ඩලයෙහි මනහර බිඹුපල වැනි තොල් ඇති සිත්කලු පියවුරු බර ඇති සොභමාන වූ දිගු පුළුල් ඇස් ඇති සඳ වැනි මුහුණු ඇති බෙරමඬුලු මැදට පැමිණි කලඟනෝ දෙවඟනන් මෙන් රඟමඬුල්ලෙහි බෝසතුන් ඉදිරියෙහි රස භාව දෙකින් විසිතුරු කොට නටත්.

**ක්‍රියා කාරක පද සම්බන්ධ:-**

හෙරිමණ්ඩලමජ්ඣගා, රඞ්ගමහි රසභාවනිරන්තරං නච්චන්ති.

**උ: ක:** නච්චන්ති (නට-නච්ච) යන වර්තමාන විභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියාපදයා විසින් කථිත හෙයින් හෙරිමණ්ඩලමජ්ඣගා යනු උක්ත කර්තෘයි. රඞ්ගමහි යනු අනුක්තාධාරයි. රසභාවනිරන්තරං යනු ක්‍රියා විශෙෂණ යි.

**විශෙෂණ විශෙෂ්‍ය:**

හෙරිමණ්ඩලමජ්ඣගා යනු විශෙෂ්‍යයි. දෙවකඤ්ඤා යනු විශෙෂණයි.

**සමාස:-** හෙරිමණ්ඩලමජ්ඣගා, දෙවකඤ්ඤා, රසභාව නිරන්තරං.

**විග්‍රහ:-** හෙරීනං මණ්ඩලං හෙරිමණ්ඩලං හෙරිමණ්ඩලස්ස මජ්ඣං හෙරිමණ්ඩලමජ්ඣං තං අගමංසූති හෙරිමණ්ඩමජ්ඣගා, දෙවානං කඤ්ඤා, දෙව කඤ්ඤා රසා ච භාවා ච රසභාවා තෙහි අන්තරං යස්ස තං නිරන්තරං රසභාවෙහි නිරන්තරං රසභාවනිරන්තරං.



**පරිකථා.**

**චාරුබිම්බාධරා.**

මේ නාටක ස්ත්‍රීන්ගේ දෙතොල් බිඹුපලවලට සමාන කළහ. බිඹු නම් කෙම් ගෙඩි නමින් ප්‍රසිද්ධ ඵල වර්ගය යි. ඒවා තද රතු පැහැයෙන් බබලන හෙයින් රූමත් කාන්තාවන්ගේ රත් දෙතොල් වලට අතිශයින් සමානය. එහෙයින් සියලු කවීහු මේ උපමාවෙන් දෙතොල් වර්ණනා කිරීමට කැමති වූහ.

**රම්මපයොධර භාරා.**

පයස් (කිරි) දරණ හෙයින් පයොධර නම්. මේ පයෝදර යෝ අතිශයින් මනහරයහ. පයොදරයන්ගේ මනොහරත්වය ඇතිවන්නේ ස්ථූලතාවත් ශ්ලිෂ්ටතාවත් ඇතිවූ විටය. මේ කාන්තාවන්ගේ පයොදරයෝ මෙකී ලක්ෂණයන්ගෙන් යුත් හෙයින් අතිශයින් රම්‍යවූවාහු වෙත්.

**විසාලායතනීලක්ඛා.**

විස්තර යට දැක්වීමු.

**සොම්මසොම්මානනා.**

මෙකී කාන්තාවන්ගේ මුහුණු චන්ද්‍රයා හා සමාන වෙත්. චන්ද්‍රයා වටකුරුය. සෞම්‍යය පූර්ණය. මේ කාන්තාවන්ගේ මුහුණු ද සෞම්‍යත්වය පූර්ණත්වය වටකුරු භාවය යන මෙකී ගුණයන්ගෙන් යුක්ත බැවින් සාකල්‍යයෙන් ම චන්ද්‍ර තුල්‍යයහ.

**රසභාව නිරන්තරං.**

රසයෙන් හා භාවයෙන් නිරන්තර වූයේ රසභාව නිරන්තර නම් වේ. රසභාවනිරන්තරත්වය කාව්‍ය ලක්ෂණයකි. කාව්‍යය දෘශ්‍ය කාව්‍ය-ශ්‍රව්‍ය කාව්‍යය යි ද්වි භෙදයකින් යුක්තය. ශ්‍රවණය කිරීමෙන් පමණක් රස විඳ ගන්නා කාව්‍යයෝ ශ්‍රව්‍ය කාව්‍යයෝ යි. දර්ශනයෙන් ම රස විඳ ගැනීම කළයුතු කාව්‍යයෝ දෘශ්‍ය කාව්‍යයෝ නම් වෙත්. ඔවුනතුරෙන් මෙහි අභිප්‍රෙත වූයේ ශ්‍රව්‍ය කාව්‍යය යි. දෘශ්‍ය කාව්‍ය-ශ්‍රව්‍ය කාව්‍ය දෙපක්ෂයට ම රස භාව දෙක සාධාරණ වේ. භාවයෝ නම් රසයන්ට හෙතුවූ කාරණයෝයි. රසයෝ නවදෙනෙක් වෙත්.

ශෘඞ්ගාර හාස්‍ය කරුණා-රෞද්‍රවීර භයානකාඃ
බීභත්සාද්භූත ශාන්තාඛ්‍යා-රසා නව සම්රිතාඃ.

(1) ශෘඞ්ගාරය, (2) හාස්‍යය, (3) කාරුණ්‍යය, (4) රෞද්‍රය, (5) වීරය, (6) භයානකය, (7) බීභත්සය, (8) අද්භූතය, (9) ශාන්තය යන නව දෙන රසයෝ නම් වෙත්.

මේ එක් එක් රසය එක් එක් ස්ථායි භාවයෙන් උපදී. එයට හෙතුවූ ස්ථායි භාවයෝ නව දෙන පිළිවෙළින් මෙසේ යි.

රතිර්හාසශ්ච ශෝකශ්ච - ක්‍රෝධෝත්සාහෞ භයං තථා
ජුගුප්සාවිස්මය ශමාඃ - ස්ථායී භාවාඃ ප්‍රකීර්තිතාඃ.

(1) රතිය (=ඇල්මය).(2) හාස්‍ය ය,(3) ශොක ය,(4) ක්‍රොධ ය, (5) උත්සාහ ය, (6) ජුගුප්සාය, (8) විස්මය, (9) සමය යන මොව්හු ස්ථායි භාවයෝයි කියන ලද්දුහ. මේ ස්ථායි භාවයන්ට සඟචාරි ව්‍යභිචාරි භාවයෝ තෙතිසක් වෙති.

නිර්වේද ග්ලානි ශඞ්කාඛ්‍යාස් - තථා'සූය මදශ්‍රමාඃ
ආලස්‍යඤ්ච දෛන්‍යඤ්ච - චින්තා මොහඃ ස්මෘතිර්ධෘතිඃ.

ව්‍රීඩා චපලතා හර්ෂ - ආවෙගො ජඩතා තථා
ගර්වෝ විෂාද ඖත්සුක්‍ය - නිද්‍රාපස්මාර එවච.

ස්වප්නො විබොධො'මර්ෂශ්චා - ප්‍යවහිත්ථමථොග්‍රතා
මතිර්ව්‍යාධිස්තථොන්මාදස් - තථා මරණ මෙවච.
ත්‍රාසශ්චෛව විතර්කශ්ච - විඥෙයා ව්‍යභිචාරිණඃ.

(1) නිර්වේද ය හෙවත් කළකිරීම, (2) ග්ලානිය හෙවත් ගිලන් බව, (3) ශඞ්කාව ය යන මේ නම් ඇත්තෝය. එසේම (4) අසූයා හෙවත් ඊර්ෂ්‍යාව ය, (5) මද ය හෙවත් උඩඟු බව ය, (6) ශ්‍රම ය හෙවත් වෙහෙසුණු බවය. යන මොව්හු ය. (7) අලස භාව ය, (8) දීන භාව ය (9) චින්තාව හෙවත් දුක්මුසු කල්පනාව ය, (10) සිත් මූළාභාව ය, (11) ස්මෘති'ය හෙවත් සිහිකිරීම (12) ධෘතිය හෙවත් තෘප්තියෙන් ජාත වූ සතුටු සිත් ඇති භාව ය, (13) ලජ්ජාය (14) චපල භාවය, (15) සොම්නස ය, (16) ආවේගය හෙවත් චඤ්චල භාව ය, එසේම (17) ජඩතාව ය හෙවත් බුද්ධියෙහි තීක්ෂණ භාව ය ක්ෂණයෙහි නැවතීම ය, (18) ගර්වය හෙවත් අහඞ්කාරකම ය, (19) විෂාදය හෙවත් දොම්නස ය, (20) උත්සුක භාව ය හෙවත් ආශාව ය, (21) නිද්‍රාව ය, (22) අපස්මාරය යන මොව්හු ද, (23 නිදීම ය, (24) පිබිද සිටීම ය, (25) අමර්ෂය හෙවත් අවමන් හේතුවෙන් ජාත වූ අසන්තුෂ්ටි ය, (26) අවහිත්ථ ය හෙවත් ඇතිවූ ආකාරයක් ලජ්ජාදියෙන් සැඟවීම ය. (27) උග්‍රතාය හෙවත් වැරැද්ද මැඩීමෙහි කදම සිටීමය. (28)මතිය හෙවත්



ස්ථිර බුද්ධියෙහි පිහිටි භාව ය (29) ව්‍යාධිය (=ශරීරාබාධයයි.) (30) උන්මාද ය, එසේම (31) මරණය (32) ත්‍රාසය හෙවත් ක්ෂණයෙන් උපන් භය ය (33) විතර්කය හෙවත් බුද්ධිය මෙහයා බැලීම ය, යන මොව්හු ව්‍යභිචාරි භාවයෝ යයි දත යුතුයි.

68 දිස්වා සො නාමවජ්ජියං-විරතෙනා විසයෙ තදා
උරතාලංච අද්දක්ඛි-සබ්බගතං හෙරිතාලකං.

**අන්වයඃ-** තදා සො තං අවජ්ජියං දිස්වා විසයෙ විරතෙනාතං සබ්බං හෙරිතාලානං උරතාලංච අද්දක්ඛි.

**පදාර්ථ:-** තදා, එකල්හි; සො, ඒ මහබෝසත් තෙමේ; තං අවජ්ජියං, ඒ ආශ්චර්යය; දිස්වා, දැක; විසයෙ, කාමයෙහි; විරතෙනා, නොඇලුනේ; තං සබ්බං හෙරිතාලකං, ඒ සියලු බෙර වැයීම; උතතරාලං'ච, ලෙහි ගැසීමක් මෙන්; අද්දක්ඛි, දිටිය.

**භාවයඃ-** ඒ වේලායෙහි බෝසත් තෙමේ ඒ ආශ්චර්යවූ නෘත්‍ය විලාසය දැක පස්කම් රසයෙහි නොඇලුනේ ඒ සියලු බෙර වැයීම තමන්ගේ ලෙහි ගැසීමක් මෙන් දුටුයේය.

**ක්‍රියා කාරක පද සම්බන්ධ.**

සොතං අවජ්ජියං දිසවා විසයෙ විරතෙනා තං සබ්බං හෙරි තාළතං උරතාලං'ච අද්දක්ඛි.

උ: නා: අද්දක්ඛි (දිස-පෙක්ඛණෙ) යන අජ්ජතනී විභක්ති කර්තෘ කාරක පරස්සෙම පද ප්‍රථම පුරුෂ එකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් සො යනු උක්ත ප්‍රකෘති කර්තෘයි. විරතෙනා යනු උක්ත විකෘති කර්තෘයි. අවජ්ජියං යනු ද හෙරි තාළතං යනු ද උතතරාලං යනුද කර්මයෝයි. විසයෙ යනු අනුක්ත කර්ම යි. දිස්වා යන (දිස-පෙක්ඛණෙ) යන පෙරකිරිය පදයට සො යනු උක්ත කර්තෘයි. අවජ්ජියං යනු අනුක්ත කර්මයි.
**වි: විශෙෂ්‍ය:**

සො යනු විශෙෂ්‍ය යි. විරතෙනා යනු තත්තුල්‍යාධිකරණ විශෙෂණ යි. අවජ්ජියං යනු විශෙෂ්‍ය යි. තං යනු විශෙෂණ යි. හෙරිතාළතං යනු විශෙෂ්‍ය යි. උරතාලං යනු විශෙෂණයි.

**සමාසඃ-** විරතෙනා, උතතාලරං හෙරිතාළතං.

**විග්‍රහඃ-** විරජ්ජිත්ථාති විරතෙනා (වි පූර්ව රඤ්ජ-රාගෙ) උරස්ස තාලතං උරතාළතං හෙරීනං තාළනං හෙරිතාළතං.

**පරිකථා:-** නෘත්‍ය ගීත වාද්‍යයන් බලමින්, සිරි පස්කම් රස යෙහි නොඇලුණු සසර කලකිරුණු බෝසත් තෙමේ වයන බෙරපදය සවකීය හෘදයෙහි ගැසීමක් මෙන් සැලකීය. තමහට අප්‍රිය ශබ්දයක් ඇසෙනවිට එය කණෙහි හුලක් මෙන් ද, හිසට යකුල් පහර දෙන කල මෙන් ද යි යනාදි වශයෙන් කීම සිරිතකි. එහෙයින් බෝසතුන්ට මෙහිදී භෙරිවාදනය ඉතා අප්‍රියව පැවති බැව් භෙරීතාලනං උත්තාලං'ව යනුවෙන් දක්වූහ.

විෂය නම් පස්කම් රසය යි. චක්ඛුරාදී ඉන්ද්‍රියන්ට විෂය වන බැවින්-ගොචරවන බැවින් රූප ශබ්දාදියට විෂය යි කියති. රූප බැලීම ඇසට විෂය වේ (=ගොචර වේ.) ශබ්දශ්‍රවණය ශ්‍රොත්‍රයට විෂය වේ. ගන්ධාඝ්‍රාණය ඝ්‍රාණයට විෂය වේ. රස විඳීනය ජිව්හාවට විෂය වේ. ස්පර්ශය කයට විෂය වේ. මහ බෝසත් තෙමේ මෙකී දින පස්කම් විෂයෙහි නො ඇලී සිටියේය.

69 **පරිදෙවං වුපට්ඨාසි - ගීතං සංසාර සාගරෙ**
**වායුවෙග විකාරංව - නච්චං චින්තෙසි නායකො.**

**අන්වය:-** ගීතං පරිදෙවං විය උපට්ඨාසි නායකො සංසාර සාගරෙ වායුවෙගෙ විකාරං ඉව නච්චං චින්තෙසි.

**පදාර්ථ:-** ගීතං, ගීතිකාව, පරිදෙවං විය, විලාපයක් මෙන්: උපට්ඨාසි, එළඹිය; නායකො, ලොකනායක තෙමේ; සංසාර සාගරෙ, සසර සයුරෙහි; වායුවෙගවිකාරං ඉව, වායු වෙගයෙන් හටගත් විකාරයක් මෙන්; නච්චං, නෘත්‍යය; චින්තෙසි, සිතීය,

**භාවය:-** ගී කීම විලාප කීමක් මෙන් සැලකූ බෝසත් තෙමේ නෘත්‍යය වාතවෙගයෙන් හටගත් විකාරයක් ලෙස කල්පනා කෙළේය.

**ක්‍රි: ස:** ගීතං පරිදෙවං විය උපට්ඨාසි. නායකො නිච්චං සංසාරසාගරෙ වායුවෙගවිකාරං ඉව චින්තෙසි.

**සමාස:** සංසාරසාගරෙ, වායුවෙගවිකාරං.

**විග්‍රහ:** සාගරොවිය සාගරො, සංසාරො එව සාගරො සංසාර සාගරො තස්මිං, වායුනොවෙගො වායුවෙගො විකාරො ඉව විකාරො වායුවෙගස්ස විකාරො වායුවෙගවිකාරො තං.



**පරිකථා:-** මහබෝසත් තෙමේ ගීතිකාව විලාපයක් මෙන් සැලකීය. දුඃඛසන්තාපාදියකින් පෙළුණු තැනැත්තහුගේ කෑගැසීම විලාපනම්. අන්‍යයන්ගේ කන් පිණවන රසයෙන් වශීකරවන ලියන්ගේ මිහිරි ගී ගායනය බෝසතුන් සැලකුවේ මේ ලෙසිනි. මහසත් තෙමේ ඒ නාටකාවන්ගේ නැටීම සසර නැමැති සයුරෙහි සුළඟින් හටගත් විකෘතියක් මෙන් සැලකීය. සාගරය විශාලය, සසරද සීමා රහිතය. එහෙයින් හෙද අතිවිශාලය. එහෙයින්ම සසර මුහුදට සමානය. හැම සත්වයෝම සසරෙහි වූවෝ වෙත්. වාතයෙන් කම්පිතවන හෙයින් නිරතුරු උස් පහත් වන තරඟයන් යුක්තය. සසර සයුරක් නම් එහි පවත්නා වායු වෙග විකාරය මේ ස්ත්‍රීන්ගේ නෘත්‍යය යි. ස්ත්‍රීන් නෘත්‍ය කරණවිට හස්ත පාදාදී අවයව සහිත ශරීරය නිරතුරු චලනය වේ. එහෙයින් එය සාගරයාගේ වායුවෙග විකාරයක් කොට සැලකූහ.

70 **කදා'හං ඝරමොස්සජ්ජ - පබ්බජ්ජාසිරි මුබ්බහෙ**
**ඉච්චෙවං චින්තයන්තො සො - සුපන්තො'ව සයී තහිං.**

**අන්වය:-** අහං කදා ඝරං ඔස්සජ්ජ පබ්බජ්ජාසිරිං උබ්බහෙ ඉති එවං චින්තයන්තො සො සුපන්තො ඉව සයී.

**පදාර්ථ:-** අහං, මම; කදා, කවරදිනයෙක්හි; ඝරං, ගිහි ගෙය; ඔස්සජ්ජ, හැර; පබ්බජ්ජාසිරිං, ප්‍රව්‍රජ්‍යාශ්‍රිය; උබ්බහෙ, උසුලන්නෙම් දෝහෝ යි; ඉති එවං, මෙපරිද්දෙන්; චින්තයන්තො, සිතන්නාවූ; සො, ඒ මහබෝසත් තෙමේ; සුපන්තොඉව, නිදන්නාක් මෙන්; සයී, හොත්තේය;

**භාවය:-** බෝසත්තෙමේ නාටිකාවන්ගේ ක්‍රීඩාවන් කෙරෙහි විරත වූ බැව් (නොඇලුනු බැව්) යට කියනලදී. එසේවූ උන් වහන්සේ කවර දිනයෙක්හි මම ප්‍රව්‍රජ්‍යාශ්‍රිය ලබන්නෙම් දැයි සිතසිතා හුන්නේම නිදන්නාක්මෙන් එහිම වැද හොත්තේය.

**ක්‍රි: ශ:** අහං කදා පබ්බජ්ජා සිරිං උබ්බහෙ ඉති චින්තයන්තො තහිං සයී.

උබ්බහෙ (උසුලම් වහ-ප්‍රාපුණනෙ) සත්තමී විභත්ති කර්තෘ කාරක උත්තම පුරුෂ ඒකවචනාන්තාඛ්‍යාත ක්‍රියාපදයා විසින් කථිත හෙයින් අහං යනු උක්ත කර්තෘයි. පබ්බජ්ජාසිරිං යනු අනුක්ත කර්මයි.

සයි (සී=සයෙ) අතීත ආඛ්‍යාත ක්‍රියාවෙන් උක්ත හෙයින් සො යනු උක්ත කර්තෘයි. තහිං යනු ආධාරයි.

සමාස: සුගමයි.

71 යං නිස්සාය මයං එත්ථ-නච්චගීතෙසු ව්‍යාවටා
සො'යං'දනි සුපි අමෙහ-කස්ස'දනි කරොම තං.

අන්වය:- මයං එත්ථ යං නිස්සාය නච්චගීතෙසු ව්‍යාවටා, සො අයං ඉදනි සුපී, අමෙහ කස්ස තං ඉදනි කරොම.

පදාර්ථ:- මයං, අපි; එත්ථ, මෙහි; යං නිස්සාය, යමෙකු නිසා; නච්චගීතෙසු, නැටීම් ගී කීම්හි; ව්‍යාවටා, යුක්ත වූවෝ වෙමුද; සො අයං, ඒ මේ මහබෝසත් තෙමේ; ඉදනි, දැන්; සුපි, සයනය කෙළේය; අමෙහ, අපි; කස්ස, කවරෙක්හට; තං, ඒ නෘත්‍ය ගීතකා; ඉදනි, දැන්; කරොම, කරමුද;

භාවය:- අපි මෙහි යමෙකු උදෙසා නැටුම් ගීකීම් ආදියෙහි ව්‍යාපෘත වූවෝ වෙමුද? ඒ බෝසත් තෙමේ දැන් සයනය කෙරෙයි. අපිදු දැන් කවරෙකුහට මේ නෘත්‍ය ගීතාදිය පවත්වමුද?

ක්‍රි: ස: මයං යං නිස්සාය නච්චගීතෙසු ව්‍යාවටා සො ඉදනි සුපි. අමෙහ කස්ස තං කරොම.

උ: කා: සුගමයි.

72 ඉති චින්තිය තෙ තත්ථ-තූරියෙසු සකෙ සකෙ
ආලම්බා සයිතා කඤ්ඤ-සුසඤ්ඤඤ්ඤමනිස්සිතා.

අන්වය:- ඉති චින්තිය තා සකෙ සකෙ තූරියෙ ආලම්බා සුසඤ්ඤ අඤ්ඤඤ්ඤං අනිස්සිතා (අථවා) සුසුකඤ්ඤ අඤ්ඤඤ්ඤඤ්ඤං අනිස්සිතො තත්ථ සයිතා.

පදාර්ථ:- ඉති මෙසේ; චින්තිය, සිතා; සකෙසකෙතූරියෙ, ඒ සවකීය සවකීය තූර්‍යයන්; ආලම්බා, එල්බුනාවූ; සුසඤ්ඤ, යහපත් සංඥද; අඤ්ඤං, (අරමුණු) දැන්මද; අනිස්සිතා, ඇසුරු නොකළාවූ; (නොහොත්) සුසු, තරුණවූ; කඤ්ඤ, කන්‍යාවෝ; අඤ්ඤඤ්ඤං, ඔවුනොවුන්; අනිස්සිතා, නිශ්‍රිත නොවූවාහු; තත්ථ, ඒ රඟමඬුල්ලෙහි; සයිතා, සයනය කළාහුය.

භාවය:- (අපි කුමට නෘත්‍ය කරමුදැයි) මෙසේ සිතා තම තමන් ගත් තූර්‍යයන් එල්බගෙණ සිහිනැත්තාහු තැන් තැන්වල වැටී ඒ රඟමඬලෙහි ම සයනය කළාහුය.



ක්‍රි: ස: කඤ්ඤ ඉති චින්තිය සකෙ සකෙ තූරියෙ ආලම්බා සුසඤ්ඤ අඤ්ඤං අනිස්සිතා තත්ථ සයිතා (ආසුං).

උ: කා: ආසුං (අස-භුවි) යන අධ්‍යාහෘත අජ්ජතනී විභක්ති කර්තෘ කාරක පරස්සෙමපද ප්‍රථම පුරුෂ බහුවචනාන්තාඛ්‍යාත පදයා විසින් කථිත හෙයින් කඤ්ඤ යනු උක්ත ප්‍රකෘති කර්තෘයි. සෙස්ස සුගමයි.

පරිකථා:- පූර්වෝක්ත ගාථාවෙන් කියූ පරිදි සිතා නාටිකාංගනාවෝ තම තමන්ගේ තූර්‍යභාණ්ඩයන්හි ම එල්බගෙණ නිදන්නට පටන් ගත්හ. ඔව්හු කෙතරම් තදින් නිදන්ට වන්නාහු ද යත් අංශුමාත්‍රවූ ද සිහියක් නැත්තවුන් මෙන් රඟමඬලෙහි ම තැන්තැන්වල වැටී සයනය කළාහු යයි කීමෙන් කැයේ.

73 ඛාදන්තා කාචි දන්තානි කාචි ලාලා වහන්තියො
කාචි රුදන්තියො තත්ථ-විලපන්ති අථා'පරා.

අන්වය: කාචි දන්තානි ඛාදන්තා, කාචි ලාලා වහන්තියො, කාචි රුදන්තියො අථ තත්ථ අපරා විලපන්ති.

පදාර්ථ.- කාචි, ඇතැම් තැනැත්තියෝ; දන්තානි, දත්; ඛාදන්තා, කන්නියෝ ය; කාචි, ඇතැම් තැනැත්තියෝ; ලාලා වහන්තියො, (කුණු) කෙල වගුරුවන්නියෝ ය; කාචි, සමහර ස්ත්‍රීහු; රුදන්තියො, හඬන්නියෝය; අථ, තවද; තත්ථ, එහි; අපරා, අන් තැනැත්තියෝ; විලපන්ති, වැලපෙත්;

භාවය:- ඒ රඟමඬලෙහි දත්කන්නාවූ ද කුණුකෙල වගුරුවන්නාවූ ද හඬන්නාවූ ද ස්ත්‍රීහු සිටියාහ.

ක්‍රි: ස: කාචි දන්තානි ඛාදන්තා හොන්ති (ඛාද-භක්ඛනෙ)
,, ලාලාවහන්තියො ,, (වහ-පාපුණනෙ)
,, රුදන්තියො ,, (රුද-රොදනෙ)
අපරා විලපන්ති (ලප-වාචායං)

උ: කා: සුගමයි.

74 කාසාචිජ්ජන්ති සෙම්හම්පි-ගිලන්ති ච වමන්ති ච
කරොන්ති නාදං නාසාය-සරූ'ති ච කිසන්ති ච.

අන්වය:- සුගමයි.

**පදාර්ථ:-** අපි, යලිත්; කාසවජ්ජන්ති, (සමහරු) කසිත්; සෙමහමපි, සෙමද; ගිලන්ති ච, (සමහරු) ගිලිත්; වමන්ති ච, (සමහරු) වමාරත්; නාසාය, නාසිකාවෙන්; සරුඥන්, සරු ශබ්ද; නාදං ච, ශබ්දය ද; කරොන්ති, කෙරෙත්; ඛිපන්ති ච, කිවිසිත්;

සෙස්ස සුගමයි.

කාසවජ්ජන්ති - කාස - සද්දකුච්ඡායං.
ගිලන්ති - ගිල - අදනෙ.
වමන්ති - වමු - උග්ගිරණෙ.
ඛිපන්ති - ඛිප - අබ්‍යත්ත සද්දෙ.

75 මුත්තයන්ති තදා කාචි - රහස්සං විවරන්ති ච
දුග්ගන්ධං වාති තං ඨානං - සුසානං ආමකං යථා.

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** තදා එකල්හි; කාචි, කිසියම් ස්ත්‍රීහු; මුත්තයන්ති, මුත්‍ර කෙරෙත්; රහස්සං, ගුහ්‍යස්ථානය; විවරන්ති ච, විවෘත ද කෙරෙත්; තං ඨානං, ඒ ස්ථානය; ආමකං සුසානං යථා, අමු සොහොනක් මෙන්; දුග්ගන්ධං වාති, දුගඳ හමයි.

**පරිකථා:-** මුත්තයන්ති (මුත්ත-පස්සාවෙ)
විවරන්ති (වි පුබ්බ වර-ආවරණෙ)
වාති (වා-ගති ගන්ධනෙසු)

**ආමකං සුසානං.**

පෙර බොහෝ රටවල මළමිනී මෙකල මෙන් වැළලීම හෝ දැවීම නො කළේය. මිනිස් පියසින් ඈත ඒ සඳහා වෙන්වූ පෙදෙසෙක මළකුණු දමාපියත්. එවිට කපුටු ගිජුලිහිණි ආදී පක්ෂීහු ද බලු සිවල් ආදීහු ද ඒවා කා දමත්. මෙපරිද්දෙන් මළමිනී දමන ස්ථානය ආමක සුසාන නම්.

76 පබුද්ධො අඩ්ඪරත්තම්හි - ගතෙ තත්‍ථ නිසීදිය
අද්දක්ඛි තාසං නෙකානි - විකාරානි තහිං තදා.

**අන්වය:-** තදා අඩ්ඪරත්තම්හි ගතෙ පබුද්ධො තත්‍ථ නිසීදිය තහිං තාසං නෙකානි විකාරානි අද්දක්ඛි.

**පදාර්ථ:-** තදා, එකල්හි; අඩ්ඪරත්තම්හි, මධ්‍යම රාත්‍රිය; ගතෙ, ඉක්ම ගිය කල්හි; පබුද්ධො, ප්‍රබුද්ධවූ මහා සත්වතෙමේ; තත්‍ථ, එහි, නිසීදිය, වැඩහිඳ; තහිං, ඒ රඟ මඬලෙහිවූ; තාසං, ඒ ස්ත්‍රීන්ගේ, නෙකානි විකාරානි, නොයෙක් විකාරයන්; අද්දක්ඛි, දිටී.



**භාවය:-** මහා සත්වතෙමේ මධ්‍යම යාමය ඉක්ම ගියකල්හි ප්‍රබුද්ධ වූයේ එහි වැඩහිඳ රඟමඬලෙහි වූ ඒ ස්ත්‍රීන්ගේ නොයෙක් විකාරයන් දුටුයේය.

පබුද්ධො (ප පුබ්බ බුධ-බොධනෙ)
නිසීදිය (නි පුබ්බ සද-විසරණගත්‍යවසාදනෙසු)
අද්දක්ඛි (දිස-පෙක්ඛණෙ)

77 තස්සෙ'වං පෙක්ඛමානස්ස - භවෙ සංවිග්ගචෙතසො
ආදිත්තං'ව උපට්ඨාසි - මනෙ බලු භවත්තයං.

**අන්වය:-** එවං පෙක්ඛමානස්ස භවෙ සංවිග්ගචෙතසො තස්ස මනෙ භවත්තයං බලු ආදිත්තං ඉව උපට්ඨාසි.

**පදාර්ථ:-** එවං, මෙසේ; පෙක්ඛමානස්ස, බලන්නාවූ; භවෙ, සංසාරයෙහි; සංවිග්ගචෙතසො, සංවෙගයට පැමිණියා වූ සිත් ඇති; තස්ස, ඒ බෝසතුන්ගේ; මනෙ, සිත්හි; භවත්තයං, තුන් ලොව; බලු, ඒකාන්තයෙන්; ආදිත්තං ඉව, ඇවිලගත්තාක් මෙන්; උපට්ඨාසි, වැටහුනේය.

**භාවය:-** පූර්වොක්ත පරිදිවූ රඟමඬල දෙස බලන්නා වූ සසර කලකිරුණු බෝසතුන්ට මුළු තුන්ලොවම ගින්නෙන් ඇවිල ගත්තාක් මෙන් වැටහුනේ ය.

**ක්‍රි: ස:** තස්ස භවත්තයං ආදිත්තං ඉව උපට්ඨාසි.

**සමාස:-** භවානං තයං භවත්තයං.

**පරිකථා:-** උපට්ඨාසි (උප පුබ්බ ඨා-ගතිනිවුත්තියං.)

අමු සොහොනක් වැනි නාටිකාවන්ගේ විප්‍රකාරයන්ගෙන් පිරුණු රඟමඬල දුටු බෝසතුන්ට ඒ නිමිති කොට ගෙණ තරුණු සලකත්ම මුළු තුන්ලොවම ගින්නෙන් ඇවිල ගත්තාක් මෙන් පෙණී ගියේය. ගින්නෙන් ඇවිල ගත් විට ඇතිවන දුඃඛය-විනාශය සියල්ලන්ටම ප්‍රත්‍යක්ෂය.

සත්වයන්ගේ සන්තාන ගත කෙලශ ද සියලු ගුණ ධර්මයන් හළු කර දමා විපතට හෙළන හෙයින් ගිනිවලට සමානය. කෙලශාග්නියෙන් දැවෙන සත්වයන්ට ඇතිවෙන පීඩාව අතිශය භයඞ්කරය. කාම-රූප-අරූප සඞ්ඛ්‍යාත භවත්‍රය මේ කෙලශයන්ගෙන් ඇවිලගෙණ තිබේ. මේ භවත්‍රයෙහිම සත්වයන් කෙලෙසුන් මුලුසුන් නො කළවුන් හෙයිනි. රාග-ද්වේෂ-මොහ-

මද-මාන-ඊර්ෂ්‍යාදී කෙලෙසුන් ගිනිමෙන්ද, එයින් ලොකය ඇවිල ගෙණ පවත්නා පරිද්ද පෙනී ගියේ ප්‍රව්‍රජ්‍යාවට සිත ,නැඹුරුව ගිහි ගෙයින් නික්මෙන්නට චිත්තාභිලාෂය බලවත්වූ අවස්ථා වෙති ය.

78 දවානලසමාදිත්තා - මහාරඤ්ඤා යථා ගජො
නික්ඛමාසි තථෙවස්ස - ගෙහතො ගමනෙ මති.

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** දවානල, ලැව්ගින්නෙන්; සමදිත්තා, අතිශයින් ඇවිලගෙණ දිලියෙන්නාවූ; මහා අරඤ්ඤා, මහා වනයෙකින්; (නික්මෙන්නාවූ) ගජො යථා, හස්තියෙක් යම්සේ ද; තථා එව, එපරිද්දෙන්ම, තස්ස, නිර්දෙශවූ බෝධිසත්වයන්ට; ගෙහතො ගිහිගෙයින්; ගමනෙ, නික්මීමෙහි; මති, අදහසක්; ආසි වී.

**භාවය:-** ලැව් ගින්නෙන් ඇවිලගෙණ දිලියෙන මහවන යෙකින් නික්මෙන ඇතෙකුට මෙන් මහබෝසතුන්ට ගිහිගෙයින් නික්ම යාමේ අදහසක් විය.

**පරිකථා.**

**දවානල.**

දවානල (දව + අනල) නම් ලැව් ගින්නයි. (දව වනය-අනල-ගින්න) නියං සමයෙහිදී මහවනයන්හි ලැව්ගිනි ඇති වේ. වනයේ ගස් එකට ඝර්ෂණය වීමෙන් ඇතිවන ගිනි කාරණකොට ගෙණ ගස් වැල් ඇදිග විනාශ වීමෙන් එහි වැසි සිවුපා ආදී සතුන්ට ද භයඞ්කර විපත්වලට පැමිණෙන්ට සිදු වේ.

79 තතො වුට්ඨාය සයනා - කරොන්තො අභිනික්ඛමං
විතක්කෙසි මහාරාජා - පස්සිතුං සකමත්‍රජං.

**අන්වය:-** තතො සයනා වුට්ඨාය අභිනික්ඛමං කරොන්තො මහාරාජා සකං අත්‍රජං පස්සිතුං විතක්කෙසි.

**පදාර්ථ:-** තතො, ඉක්බිති; සයනා උට්ඨාය, යහනින් නැගිට; අභිනික්ඛමං කරොන්තො, මහබිනික්මන් කරන්නාවූ; මහා රාජා, මහාරාජ වූ මහාබෝධිසත්වතෙමේ, සකං අත්‍රජං, ස්වකීය පුත්‍රයා; පස්සිතුං, දක්නට; විතක්කෙසි, විතර්කණය කෙළේය. (සිතුයේය.)

**භාවය:-** ඉක්බිති යහනින් නැගිට මහබිනික්මන් කරන්නා වූ බෝධිසත්වයන් වහන්සේ සියපුතු දැකීමට කල්පනා කළහ.



**පරිකථා:-** මහාරාජා

සිදුහත් කුමරුට යශෝධරා දේවිය සරණ පාවා දී අභිෂෙක කොට එදින සකල රාජ්‍යයම භාරදුන්හේය. එහෙයින් මහාරාජ යනු සිදුහත් කුමරු සඳහා යොදන ලදී.

**සකමත්‍රජං.**

මෙහි සිය පුත්‍රයා නම් රහල් කුමරුය. අභිනිෂ්ක්‍රමණය කරන්නට සැරසෙද්දී රහල් කුමරු උපන් අස්න අසා ඔහු දක්නට යමහයි සිතීය.

80 පවිසිත්වා තතො ගබ්භං - සනිකං සන්තමානසො
පස්සිත්වා සහ පුත්තෙන - නිද්දායන්තිං යසොධරං.

**අන්වය:-** තතො සන්තමානසො සනිකං ගබ්භං පවිසිත්වා පුත්තෙන සහ නිද්දායන්තිං යසොධරං පස්සිත්වා.

**පදාර්ථ:-** තතො, ඉක්බිත්තෙන්; සන්තමානසො, සන්හුන් සිත්ඇති; මහාසත්තො, මහා සත්වතෙමේ; සනිකං, සෙමින්; ගබ්භං සැතපෙන ගෙට; පවිසිත්වා, පිවිස; පුත්තෙන සහ, පුත්‍රයා සමග; නිද්දායන්තිං, නිදන්නාවූ; යසොධරං, බිම්බා දේවින්; පස්සිත්වා, බලා;

81 චිරාගතං මහාපෙමං - ධාරයං සක මානසෙ
බුද්ධො හුත්වා'පිමං සක්කා - පස්සිතුං ඉති විතක්කිය.

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** චිරාගතං, දිඝීකාලයක පටන් පැවත ආවාවූ; මහා පෙමං, මහත්වූ ප්‍රේමය; සකමානසෙ, සිය සිත්හි; ධාරයං, ධරන්නේ; බුද්ධො හුත්වා අපි, බුදුව ද; ඉමං, මේ පුත්‍රයා; පස්සිතුං, දක්නට; සක්කා ඉති, හැකි යයි; විතක්කිය, සිතා;

82 ගන්තා නාථො තතො ධාතා - බොධියා බද්ධමානසො
තදහෙ'වා'සි බුද්ධො'ති - කාමුකො යො න චින්තයෙ.

**අන්වය:-** බොධියා බද්ධමානසො නාථො තතො ධාතා ගන්තා තදහෙව බුද්ධො ආසි ඉති යො කාමුකො න චින්තයෙ.

**පදාර්ථ:-** බොධියාබද්ධමානසො, සම්‍යක් සම්බෝධිය කෙරෙහි බැඳුන සිත් ඇති; නාථො, නාථ වූ බෝසත්තෙමේ; තතො

ඨානා, එතැනින්; ගතො, නික්ම වැඩිසේක; තදහෙව, එදවස්හිම; බුද්ධො ආසි ඉති, බුදුවූසේකැයි; කො කාමුකො, කවර නම් කාමී පුද්ගලයෙක්; න චින්තයෙ, නො සිතාද; (සිතාමය).

**භාවය:-** (80=82)

සියපුතු දක්නට යමි යි සිතූ මහබෝසත් තෙමේ සෙමින් සැතපෙන ගෙට පිවිස පුතු සමග නිදන බිම්බාදේවිය දෙස බලා දිගු කලක පටන් පැවත එන මහත් වූ ප්‍රේමය ඇත්තේ ද බුදු වීමෙන් පසුව පුතු දක්නට හැක්කේමැයි සිතා බොධිය කෙරෙහි ඇලුන සිත් ඇත්තේ එතැනින් නික්ම වැඩිසේක. අන් කවරකු විසින් නමුත් නොකට හැකි මේ ක්‍රියාව දක්නා කවරනම් කාමුක පුරුෂයෙක් එදිනම උන් වහන්සේ බුදු වූහ යි නො සිතන්නේ ද? (සිතාමැයි.)

**පරිකථා—විරාගතං මහාපෙමං**

යශොධරාව හා බෝසතුන් අතර පැවති ප්‍රේමය ඉතා පැරණි ය. එය කල්ප ගණනක දූරාතීතයට සම්බන්ධ ඇති බැව් ජාතක කථාවලින් පැහැදිලිව පෙණේ. කෙතරම් බද්ධ ප්‍රේමයක් බෝස තුන් කෙරෙහි යශොධරාවගේ පැවත්තේ ද යනු ඇතැම් ජාති වලදී සිය සැමියා වෙනුවෙන් දිවි පිදීමට පවා ඉදිරිපත් වීමෙන් පැහැදිලිය. එහෙයින් මෙසේ කියන ලදී.

**කාමුකො.**

පස්කම් රසෙහි ලොල්වූ සිතැති පුරුෂ තෙමේ කාමුක නම්. කාමී පුද්ගලයාහට පසිඳුරන්ට විෂය වූ රූප-ශබ්ද ආදිය අතිශය චිත්තාභිරමණීය වේ. සකල නාරීලාලිත්‍යයෙන් හා අතිමානුෂ වූ රූපශ්‍රියකින් විරාජමාන උත්තම ස්ත්‍රී රත්නයක් වූ යශොධරා නම් තරුණ රජ දූ සඳහටම අතහැර දමා ගිහි ගෙයින් නික්ම යන බෝසතුන්ගේ වීර ක්‍රියාව සැබවින් ම ආශ්චර්යාවහය. කාමුක පුරුෂයකුහට මෙබඳු ක්‍රියාවක් කරණු තබා සිතීම පවා අතිශය දුෂ්කරය. එහෙයින්,

බෝසතුන් යශොධරා බිසව හැර ආයේ රජමාළිගයේදීම බුදුබවට පැමිණි නිසාම යන කල්පනාව කාමී පුරුෂයකුහට ඇති වනු පුදුමයෙක් නො වේ.

83 සිනෙරු මුද්ධරන්තො'ව - පාදුද්ධරිය නික්ඛමං
ඡන්නමාහුය ආනීතං - කණ්ඩකං තුරගාධිපං.



84 අස්සරාජං සමාරුය්හ - සහ ඡන්නෙන රත්තියං
දෙවෙහි විවටද්වාරා - පටිපජ්ජි මහාපථං.

**අන්වය:-** සිනෙරුං උද්ධරන්තො ඉව පාදං උද්ධරිය නික්ඛමං ඡන්නං ආහුය ආනීතං තුරගාධිපං කණ්ඩකං තං අස්සරාජං ආරුය්හ ඡන්නෙන සහ රත්තියං දෙවෙහි විවටද්වාරා මහාපථං පටිපජ්ජි.

**පදාර්ථ:-** සිනෙරුං, මහමෙර; උද්ධරන්තො ඉව, උදුරන්නාක් මෙන්; පාදං, පාදය; උද්ධරිය, උදුරා; නික්ඛමං, මහබිනික් මන් නික්මෙන්නේ; ඡන්නං, ඡන්න නම් අමාත්‍යයා; ආහුය, කැඳවා; ආනීතං, කැඳවන ලද; තුරගාධිපං තුරගශ්‍රෙෂ්ඨ වූ; කණ්ඩකං, කණ්ඩක නම් වූ; තං අස්සරාජං, ඒ අස්රජුපිට; ආරුය්හ, නැගී; ඡන්නෙන සහ, ඡන්න නම් අමාත්‍යයා සමග; රත්තියං, මධ්‍යම රාත්‍රියෙහි, දෙවෙහි, දෙවියන් විසින්; විවටද්වාරා, හළදො රින් (නික්ම): මහා පථං, මහා වීථි මාර්ගයට; පටිපජ්ජි, පිළි පැද් දේය.

**භාවය:-** මහමෙර උඩට ඔසවන්නාක්මෙන් පය නගා මහ බිනික්මන් කරණුයේ ඡන්න නම් ඇමතිහු විසින් ගෙණෙන ලද කණ්ඩක අසුපිට නැගී මැදියම් රැයෙහි දෙවියන් හළ දොරින් නික්ම මහවෙයට පැමිණියේය.

**පරිකථා:-සිනෙරු.**
යනු මහමෙරට නමකි. විස්තර යට දක්වන ලදී.

**ඡන්න.**

බෝසතුන් බිහිවන දිනයෙහි ම උපන් මේ තෙමේ බුදු කෙනෙකුන් කාමබන්ධනයෙන් ගැලවීමෙහි අනුබල වෙමි යි කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි කරණලද පින්ඇති උතුමෙකි.

**කණ්ඩක.**

මේ තෙමේ ද බෝසතුන් උපන් දවසෙහිම ඉපදී අභිනිෂ්ක්‍රමණයේදී උපකාරීවූ ශ්‍රෙෂ්ඨ අශ්වයෙකි.

**දෙවෙහි විවටද්වාරා.**

සිදුහත් කුමරුන් ගිහි ගෙයිම රඳවා ගණු කැමති සුදොවුන් රජතෙමේ නොයෙක් ප්‍රකාරයෙන් හා දොරටුලු ආදියෙන් සුරක්ෂිතවූ රැකවල් යොදා තිබුනේය. මිනිසුන් දහසකට දු නො සෙල්වියහැකි ලෙස අගුලු ලා තිබුනු මහාවාරය දෙවියන් විසින් හැර දෙනලදින් නිරායාසයෙන්ම නුවරින් පිටවී ගියේ ය.

85 චක්කවාළෙසු නෙකෙසු-දෙවතා සුසමාගතා
දීපධූපධජෙහෙව-ගන්ධමාලෙහි පූජයුං.

**අන්වය:-** අනෙකෙසු චක්කවාළෙසු දෙවතා සුසමාගතා දීපධූපධජෙහි එව ගන්ධමාලෙහි පූජයුං.

**පදාර්ථ:-** අනෙකෙසු චක්කවාළෙසු, නොයෙක් සක්වළ; **දෙවතා**, දෙවියෝ; සුසමාගතා, රැස්වූවාහු; දීපධූපධජෙහි **එව**, පහන් දුම් කොඩියෙන් ද; ගන්ධමාලෙහි, සුවඳ මලින්; පූජයුං, පිදූහ;

**භාවාර්ථ:-** නොයෙක් සක්වළින් රැස්වූ දෙවියෝ පහන් දුම් කොඩියෙන් හා සුවඳ මලින්ද බෝසතුන් පිදූහ.

**ක්‍රි: ස:** දෙවතා තං දීපධූපධජෙහි ගන්ධ මාලෙහි පූජයුං.

**ද: නා:** පූජයුං (පූජ=පූජනෙ) අජ්ජතනී වි: කර්තෘ කාරක ප: ප: ප්‍ර: පු: බහුවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයා විසින් කථිත හෙයින් දෙවතා යනු උක්ත කර්තෘයි. තං යනු අනුක්ත කර්මයි. දීපධූපධජෙහි ගන්ධමාලෙහි යනු අනුක්ත කරණයි.

86 පුරතො සට්ඨි සහස්සානි-දණ්ඩදීපානි ධාරයුං
තථා දක්ඛිණපස්සම්හි-වාමපස්සෙ ච පච්ඡතො.

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** පුරතො, ඉදිරියෙහි; සට්ඨි සහස්සානි, සැටදහසක්, දණ්ඩදීපානි, දඬුවැට පහන්; ධාරයුං, දැරූහ.; තථා, **එසේම**; **දක්ඛිණ** පස්සම්හි, දකුණුපස්හි ද, වාමපස්සෙ ච, **වම්පස්හි ද** පච්ඡතො, පිටිපස්හි ද; (දණ්ඩදීපානි දඬුවැට පහන් ධාරයුං දැරූහ.)

සෙස්ස සුගමයි.

87 ගගනා පුප්ඵවස්සානි-වස්සාපෙසුං සදෙවකා
මන්දාරවං කොකනදං-සුගන්ධං විත්තපාටලිං.

**අන්වය:-** සදෙවකා ගගනා සුගන්ධං මන්දාරවං කොකනදං විත්තපාටලිං පුප්ඵ වස්සානි වස්සාපෙසුං.

**පදාර්ථ:-** සදෙවකා, දෙවියන් සහිත ජනයෝ; **ගගනා**, අහසින්; සුගන්ධං, සුවඳ ඇත්තාවූ; මන්දාරවං, මදාරය; කොකනදං, රත්පියුම්ය; විත්තපාටලිං, චිත්‍රපාටලිය යන; පුප්ඵවස්සානි, **මල් වැසි**; වස්සාපෙසුං, වැස්වූහ.



**සටහන:-** වස්සාපෙසුං (වස්ස-සෙචනෙ) ප්‍රයෝජ්‍ය අතීත කාලික ආඛ්‍යාත බහුවචනයි.

88 චම්පකාසොකපුන්නාග-නාගපූගාගසම්භවං
මාලතිවස්සිකීයාදි-නානාවල්ලීහි සම්භවං

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** චම්පක, සපුය; අසොක, හෝපලුය; පුන්නාග, දොඹය; නාග, නා ය; පූග, පුවක්ය යන; අගසම්භවං, **වෘක්ෂයන්ගෙන්** හටගත්තාවූ (මල්වැසිද); මාලතී, සිනිද්දය නොහොත් සමන්ය; වස්සිකීයාදී, දෑසමන්ය යන මේ ආදීවූ; නානාවල්ලීහි සම්භවං, නන්ලියෙන් හටගත්තාවූ (මල්වැසිද);

89 පදුමුප්පලකල්හාර-කුමුදාදම්බු සම්භවං
සුගන්ධමධුමත්තාහි-ඡප්පදාලීහි කූජිතං

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** සුගන්ධමධු, සුවඳ මී බීමෙන්; මත්තාහි, මත්වූ; ඡප්පදාලීහි, භෘංග පඞ්ක්තීන් විසින්; කූජිතං, නාද පවත්වන ලද; පදුම, පියුම්ය; උප්පල, උපුල්ය; කල්හාර, හෙල්මැලිය; කුමුදාදි, හෙලුපුල්ය යන මේ ආදි වූ; අම්බුසම්භවං, ජලජ (මල්වැසිද);

90 පුප්ඵවස්සං පවස්සිත්ථ-තිංසයොජනමත්තකෙ
පසෙනතො තත්ථ තුරගො-දුක්ඛෙනො අගමි තදා

**අන්වය:-** පුප්ඵවස්සං තිංසයොජන මත්තකෙ පවස්සිත්ථ තදා තුරගො තත්ථ පසෙනතො දුක්ඛෙනො අගමි.

**පදාර්ථ:-** පුප්ඵවස්සං, (යන මේ) මල්වැසි; තිංසයොජන මත්තකෙ, තිස්යොදුන් මාත්‍රයෙහි; පවස්සිත්ථ, වැස්සේය; තදා, **එකල්හි**; තුරගො, අශ්වතෙමේ; තත්ථ, ඒ මල්හි; පසෙනතො, **එරුණේ**; දුක්ඛෙනො, දුකින්; අගමි, ගියේය.

**විග්‍රහ:-** චම්පකා ච අසොකා ච පුන්නාගා ච නාගා ච පූගා ච චම්පකාසොකපුන්නාගනාගපූගා, තෙ ච තෙ අගා චෙති චම්පකාසොකපුන්නාගනාගපූගාගා තෙහි සම්භවා චම්පකාසොකපුන්නාගනාගපූගාගසම්භවා, තං, මාලතියො ච වස්සිකියො ච මාලතිවස්සිකියො තා ආදි යාසං තා මාලතිවස්සිකියාදයො නානප්පකාරා වල්ලියො නානාවල්ලියො, මාලතිවස්සිකියාදයො ච තා නානාවල්ලියො චෙති මාලතිවස්සිකියාදිනානාවල්ලියො තාහි, පදුමානි ච උප්පලානි ච කල්හාරානි ච කුමුදානි ච පදුමුප්පලකල්හාරකුමුදානි තානි ආදි යෙසං තානි පදුමුප්පලකල්හාර

කුමුදාදීනි අම්බුසම්ං; සමහවානීති අම්බුසම්භවානි, චම්පකාසොක-පෙ-පුගාදීනි ච තානි අම්බුසම්භවානි චාති පදුමුප්පලකල්හාරකුමුදාද්‍යම්බුසම්භවානි තං, සුගන්ධානි ච තානි මධූනි චාති, සුගන්ධමධූනි, තෙහි, මත්තා සුගන්ධමධුමත්තා, තාහි.

පසඤ්චයිත්වාති පසන්නො, (ප පුබ්බ සඤ්ජ=සඞ්ග) තුරං සීඝං ගච්ඡතීති තුරඞ්ගො (තුරං සඳුපපද ගමු-ගතියං)

91 එවං පූජා විධානෙහි-ගන්ත්වා'නොමං මහානදිං
සිතසෙතසඞ්කිණ්ණං-බහුමිතකුලාකුලං.

අන්වය: එවං පූජාවිධානෙහි සිතසෙතසඞ්කිණ්ණං බහුමිත කුලාකුලං අනොමං මහානදිං ගන්ත්වා.

පදාර්ථ:- එවං, මෙසේ; පූජාවිධානෙහි, පූජාවිධියෙන් යුක්තව; සිතසෙතසඞ්කිණ්ණං, සුදුවැල්ලෙන් ගැවසුනාවූ; බහු, බොහෝවූ; මිතකුලාකුලං, මනුෂ්‍යසමූහයාගෙන් ගැවසිගත්තාවූ; අනොමං මහානදිං, අනොමා නම් මහ ගංතෙරට; ගන්ත්වාන, වැඩ;

භාවය:- මෙසේ පූජාවිධියෙන් යුක්තව සුදුවැල්ලෙන් ගැවසුනා වූ බොහෝ මනුෂ්‍ය සමූහයාගෙන් යුක්තවූ අනෝමා නම් මහ ගංතෙරට ගොස්,

වි: විශෙෂ්‍ය: මහානදිං විශෙෂ්‍යයි. සිතසෙතන සංකිණ්ණං බහුමිතකුලාකුලං අනොමං යනු තද්විශෙෂණයෝයි.

92 තීරට්ඨොපසසී සො ධීරො-ගඞ්ගානාරිං රසාවහං
කරොනතිං වීචිබාහාහි-ඵෙණපුප්ඵොපහාරකං.

අන්වය:= ධීරො සො තීරට්ඨො රසාවහං වීචිබාහාහි ඵෙණ පුප්ඵොපහාරකං කාරොන්තිං ගඞ්ගානාරිං අපස්සි.

පදාර්ථ:= ධීරො, ධෘතිමත්,වූ; සො, ඒ මහාසත්වතෙම; තීරට්ඨො, ඉවුරෙහි සිටියේ; රසාවහං, සත්‍රීරස (හෙවත්) ජල වහනය කරන්නාවූ; වීචිබාහාහි, තරඞ්ග නමැති බාහුවෙන්; ඵෙණපුප්ඵොපහාරකං, පෙණනැමති මලින් අසනිය මල්පූජා; කරොන්තිං, කරන්නීවූ; ගඞ්ගානාරිං, ගඞ්ගා නමැති කාන්තාව; අපස්සි, දිටී;

භාවය:- ධෘතිමත්වූ ඒ මහාබෝධිසත්වයන් වහන්සේ ගං ඉවුරෙහි සිටියේ ජලවහනය කරණ තරඞ්ග නමැති අතින් පෙණ නමැති මල් කරණකොටගෙණ අසනියමල් පූජාකරන්නීවූ ගඞ්ගා කාන්තාව දිටී.



පරිකථා:- "පුප්ඵොපහාරකං" (පෙණ නමැති අසෙනිය මල්පූජාව) අසෙනිමල් (අර්චනීය පුෂ්ප) යනු විලඳවලට නමෙකි. මෙය මඞ්ගලාවසථාවන්හි හා ආගමික උත්සවයන්හිදී ද පූජා පැවැත්වීම සඳහා ගණු ලැබේ.

අනෝමා නදී නමැති කාන්තාව බෝධිසත්වයන්ට තරඞ්ග නමැති අත්වලින් පෙණ නමැති මල් කරණකොටගෙණ අසනිය මල් පූජාව කලාය. නදී ශබ්දය ස්ත්‍රීලිඞ්ගික ශබ්දයක් හෙයින් කාන්තාවකට සමාන කරණ ලදි. ඒ කාන්තාවගේ අත් ගංගෙහි තරඟයෝ ය. පෙණ පිඩු පුෂ්පයෝ ය. පෙණ අසනිය මල්වලට සමානකොලේ පුෂ්ඨෝක්ත පරිදි අර්චනීය පුෂ්පයන් උත්තමයන් කෙරෙහි පූජාව පැවැත්වීම් සඳහා ගණුලබන මල් වර්ගයක් හෙයිනි. මෙහිදී මේ පූජාව ලැබූ උතුමා වනාහි සිද්ධාර්ථ යොගින් වහන්සේ ය.

"රසාවහං" ජලාර්ථයෙහි වැටෙන රස ශබ්දය සිංහලව ද තත්සමව ව්‍යවහාර වන හෙයින් සිරි රහල් හිමියෝ කාව්‍යශෙඛර යෙහි "පිරි සරසවිය රස - සුබ තරග නතමින් රස" යනාදී වශයෙන් ජලාර්ථයෙහි රසශබ්දය යෙදූහ. මෙහි රසශබ්දය ජලාර්ථය හා ස්ත්‍රීරසය යන අර්ථවයෙහි වැටේ. ස්ත්‍රී රසය නම් ඔවුන් පිළිබඳ ව පවත්නා ශෘඞ්ගාරාදි රසයෝ යි.

93 අසොසන තං මහා'නොමං-ලඞ්ඝාපෙත්වා මහාමතී
පරතීරෙ පතිට්ඨාසි-විමලෙ වාලුකාතලෙ

අන්වය:= මහාමතී අසෙසන තං මහා'නොමං ලඞ්ඝාපෙත්වා පරතීරෙ විමලෙ වාලුකාතලෙ පතිට්ඨාසි.

පදාර්ථ:= මහාමතී, මහාප්‍රාඥවූ ඒ බෝසත්තෙම; අසෙසන අස්රජුලවා; තං මහා'නොමං, ඒ අනෝමා නම් මහ ගඟ; ලඞ්ඝාපෙත්වා, පන්වා; පරතීරෙ, පරතෙරවූ; විමලෙ, නිර්මලවූ; වාලුකාතලෙ, වැලිතලාවෙහි; පතිට්ඨාසි, පිහිටියේ ය;

94 පබ්බජිතුං මයෙ'ත්ථෙ'ව-යුත්තං නො මෙ පපඤ්චිතුං
ඉති චින්තිය භාය-ධාරිතාභරණානි සො

අන්වය:- මයා එත්ථෙ'ව පබ්බජිතුං යුත්තං පපඤ්චිතුං නො (යුත්තං) ඉති සො චින්තිය ධාරිතාභරණානි භාය.

**පදාර්ථ:=** මයා, මාවිසින්; එත්ථෙව, මෙහි ම; පබ්බජිතුං, පැවිදි වන්නට; යුත්තං, සුදුසු; මෙ, මට; පපඤ්චිතුං, පමාවන්නට; නො (යුත්තං) සුදුසු නො වේ; ඉති, මෙසේ; සො, ඒ මහසත්තෙමේ; චින්තිය, සිතා; ධාරිතාභරණානි, පැළඳි ආභරණයන්; ඔහාය, මූද;

95 **ඡන්නස්ස පටියාදෙත්වා-කන්ථකඤ්ච හයාධිපං**
**නිසිතං ඛග්ගමුග්ගය්හ-සමොළිං ඡින්දි කුන්තලං.**

**අන්වය:-** හයාධිපං කන්ථකඤ්ච ඡන්නස්ස පටියාදෙත්වා නිසිතං ඛග්ගමුග්ගය්හ සමොළිං කුන්තලං ඡින්දි.

**පදාර්ථ:-** හයාධිපං, තුරඟ ශ්‍රේෂ්ඨවූ; කන්ථකං ච, කන්ථකයා ද; ඡන්නස්ස, ඇමතියාන්ට; පටියාදෙත්වා, භාරකොට; නිසිතං, තියුණු කරණලද; ඛග්ගං, කඩුව, උග්ගය්හ, ඔසවාගෙණ; සමොළිං, මෞළිසහිත වූ; කුන්තලං, කෙශකලාපය; ඡින්දි සිඳී;

96 **එවමාවජ්ජයං නාථො-සචෙ'හං සුගතො භවෙ**
**තිට්ඨතු ගගනෙ ගන්ත්වා-ඉති උක්ඛිපි ච'ම්බරං**

**අන්වය:-** නාථො සචෙහං සුගතො භවෙ ගගනෙ ගන්ත්වා තිට්ඨතු ඉති එවං ආවජ්ජයං අම්බරං උක්ඛිපි.

**පදාර්ථ:-** නාථො, ලොකස්වාමී වූ බොධිසත්වතෙමේ; සචෙ, ඉදින්; අහං, මම; සුගතො භවෙ, බුදුවන්නෙම් නම්; ගගනෙ, අහස්කුස; ගන්ත්වා, ගොස්; තිට්ඨතු ඉති, සිටීවා යි; එවං, මෙසේ; ආවජ්ජයං, ආවර්ජනය කෙරෙමින්; අම්බරං, අහසට; උක්ඛිපි දැමීය.

97 **තතො සක්කො මහෙසක්ඛො-මණිචඞ්ගොටකෙන තං**
**පටිග්ගහෙත්වා සිරසා-නෙත්වා දෙවපුරං වරං**

**අන්වය:-** තතො සක්කො මහෙසක්ඛො මණිචඞ්ගොටකෙන වරං තං සිරසා පටිග්ගහෙත්වා දෙවපුරං නෙත්වා.

**පදාර්ථ:-** තතො, ඉක්බිති; සක්කො, සක් දෙව්රජතෙම; මහෙසක්ඛො, මාහැගි වූ; මණිචඞ්ගොටකෙන, මිණිමුවා සුමුගකින්; වරං, උතුම් වූ; තං, ඒ කෙශකලාපය; සිරසා, මස්තකයෙන්; පටිග්ගහෙත්වා, පිළිගෙණ; දෙවපුරං, දෙවපුරයට, නෙත්වා, ගෙණ ගොස්;



98 **කාරෙත්වා මණිථූපං සො-නිධෙත්වා තං සිරොරුහං**
**අනග්ඝං පතිමානෙති-සහ දෙවෙහි නෙකධා**

**අන්වය;-** සො මණිථූපං කාරෙත්වා තං සිරොරුහං නිධෙත්වා සහ දෙවෙහි අනෙකධා අනග්ඝං පතිමානෙති.

**පදාර්ථ:-** සො, ඒ සක්දෙව්රජතෙම; මණිථූපං, මිණිසෑයක්, කාරෙත්වා, කරවා; තං සිරොරුහං, ඒ කෙශධාතුව; නිධෙත්වා, පිහිටුවා (නිධානකොට); සහ දෙවෙහි, දෙවියන් සමග; අනෙකධා, නොයෙක් ආකාරයෙන්; අනග්ඝං, දිනපතා; පතිමානෙති, පුදයි;

99 **මහාබ්‍රහ්මොපනීතට්ඨ-පරික්ඛාරං මහාමති**
**පටිග්ගහෙත්වා කාසාවං-නිවසෙත්වා පාරුතො තදා**

**අන්වය:-** තදා මහාමතිමහාබ්‍රහ්මොපනීතට්ඨපරික්ඛාරං පටිග්ගහෙත්වා කාසාවං නිවසෙත්වා පාරුතො.(ආසි.)

**පදාර්ථ:-** තදා, එකල්හි, මහාමතී, මහාප්‍රාඥ වූ බොධිසත්ව තෙමේ; මහාබ්‍රහ්ම, මහබඹු විසින්; උපනීත, එලවනලද; අට්ඨ පරික්ඛාරං, අටපිරිකර; පටිග්ගහෙත්වා, පිළිගෙණ; කාසාවං, කාෂාය වස්ත්‍ර; නිවසෙත්වා, හැන්දේ; පාරුතො, (ආසි) පෙරවූයේ ද වී.

100 **පුබ්බෙ වියම්බරං ගය්හ-අම්බරෙ ඛිපි නායකො**
**පටිග්ගහෙත්වා තං බ්‍රහ්මා-නෙත්වා බ්‍රහ්මපුරං වරං**

**අන්වය:-** නායකො පුබ්බෙ විය වරං අම්බරං ගය්හ අම්බරෙ ඛිපි බ්‍රහ්මා පටිග්ගහෙත්වා බ්‍රහ්මපුරං නෙත්වා.

**පදාර්ථ:-** නායකො, ලොකනායකවූ බොධිසත්වතෙමේ; පුබ්බෙවිය, පෙරමෙන්; අම්බරං, හන්සළුසගළ; ගය්හ, ගෙණ; අම්බරෙ, අහසෙහි; ඛිපි, දැමීය; වරං, උතුම් වූ; (ඒසළුසගළ) බ්‍රහ්මා, මහාබ්‍රහ්මතෙමේ; පටිග්ගහෙත්වා, පිළිගෙණ; බ්‍රහ්මපුරං නෙත්වා, බඹලොවට ගෙණගොස්;

101 **ද්වාදසයොජනුබ්බෙධං-කත්වා ථූපවරං සුභං**
**තත්ථ තං නිදහිත්වාන-පණිපාතෙති සබ්බදා**

**අන්වය:-** ද්වාදසයොජනුබ්බෙධං සුභං ථූපවරං කත්වා තත්ථ තං නිදහිත්වාන සබ්බදා පණිපාතෙති.

**පදාර්ථ:-** ද්වාදසයොජනුබ්බෙධං, දොළොස්යොදුන් උසඇති; සුභං, යහපත් වූ; ථූපවරං, උතුම් සෑයක්; කත්වා, කොට; තත්ථ, එහි; තං, එය; නිදහිත්වාන, නිධානකොට; සබ්බදා, හැමකල්හි; පණිපාතෙති, ප්‍රණිපාතකරයි.

**පරිකථා:-** (ගාථාව 98) "මණිථූපං"

සිළුමිණිසෑය නමින් ප්‍රසිද්ධ මෙය දෙවියන් විසින් දිනපතා වැඳුම් පිදුම් ලබමින් පවතී.

(ගාථාව 99) "මහාබ්‍රහ්මොපනීතවර පරික්ඛාරං"

**අටපිරිකර—** (1) දෙපට සිවුර, (2) තනිපට සිවුර, (3) අඳනය, (4) පටිය, (5) පාත්‍රය, (6) ඉදිකටුව, (7) පෙරහන්කඩය, (8) දැලි පිහිය යන මොහුයි.

මේ මහාභද්‍රකල්පයේ බුදුවන පසිඳෙයන් වහන්සේලා පස් නම සඳහා පහළවූ අෂ්ට පරිෂ්කාරයෝ පස්දෙනෙක් වූහ. ඔවුනතුරෙන් සතරවැනි අෂ්ටපරිෂ්කාරය අප ගෞතම මුනීඳුයන් වහන්සේට මහාබ්‍රහ්මරාජයා විසින් මඟුණ වත ද ගෙණවුත් පිළිගන්වන ලදී.

"ථූපවරං" සිළුමිණි සෑය නමින් ප්‍රසිද්ධවූ දෙලොස් යොදුනක් උස්වූ මේ ථූපය බඹලෙව් වැසියන් විසින් පුද පූජා පවත්වනු ලබමින්ද අද දක්වාත් පවතී.

102 **සම්පුණ්ණමන සඞ්කප්පො-පබ්බජ්ජාසිරිමුබ්බහං**
**ඡාදෙන්තො කමලෙනෙ'ව-මරුං වඞ්කමි නායකො**

**අන්වය:-** නායකො සම්පුණ්ණමනසඞ්කප්පො පබ්බජ්ජාසිරිං උබ්බහං කමලෙන මරුං ඡාදෙන්තො විය වඞ්කමි.

**පදාර්ථ:-** නායකො, ලොකනායකවූ මහාසත්වතෙමේ; සම්පුණ්ණමනසඞ්කප්පො, සම්පූර්ණවූ චිත්තසඞ්කල්පනා ඇත්තේ; පබ්බජ්ජාසිරිං, ප්‍රව්‍රජ්‍යාශොභාව; උබ්බහං, උසුලන්නේ; කමලෙන, පද්මයකින්; මරුං, වැලිතලාව; ඡාදෙන්තො ඉව, වසන්නාක් මෙන්; වඞ්කමි, සක්මන් කළසේක;

**භාවය:-** ලොකනායකවූ මහාසත්වතෙමේ සපිරුණු අදහස් ඇතිව පැවිදි සිරිය උසුලන්නේ පියුමකින් වැලිතලාව වසන්නාක්මෙන් (වැලිතලාවෙහි) සක්මන් කෙළේය.

**විග්‍රහ:-** මනසස සඞ්කප්පො මනොසඞ්කප්පො සම්පුණ්ණො මනොසඞ්කප්පො යස්ස සො සම්පුණ්ණමනසඞ්කප්පො, පබ්බජ්ජාය සිරි, පබ්බජ්ජාසිරි, තං.

**පරිකථා:-** බෝසතුන්ගේ ශ්‍රී පාදය පියුමක් වැනිය. පියුම මොලොක්ය. රන්පැහැ ඇත්තේය. පාදයද මොලොක්ය. රන්පැහැය. එහෙයින් පාදයට පියුම සමාන කළහ. සක්මන් කරණ විට පොළොව පාදයෙන් වැසේ. එහෙයින් වැලිතලාවෙහි සක්මන් කිරීම පියුමකින් වැලිතලාව වසන්නාක්මෙනැයි කීහ.



"සම්පුණ්ණමනසඞ්කප්ප" නම් සිතේ අදහස් සම්පූර්ණ වීමයි. හෙතුව නම් කලක සිට බලාපොරොත්තුවූ මහණ කම ලැබීමයි. එහෙයින් "සම්පුණ්ණමනසඞ්කප්ප" නමි.

103 **තතො අම්බවනං ගන්ත්වා-විඳෙන්තො පීතිජං සුඛං,**
**විතිනාමෙසි සත්තාහං-රම්මෙ පාදපමණ්ඩපෙ.**

**අන්වය:-** තතො අම්බවනං ගන්ත්වා පීතිජං සුඛං විඳෙන්තො රම්මෙ පාදපමණ්ඩපෙ සත්තාහං විතිනාමයි.

**පදාර්ථ:-** තතො, ඉක්බිති; අම්බවනං, (අනුපිය) නම් අඹ වනයට; ගන්ත්වා, ගොස්; ප්‍රීතිජං, ප්‍රීතියෙන් නිපන්; සුඛං, සැපය; විඳෙන්තො, විඳිමින්; රම්මෙ, සිත්කළුවූ; පාදපමණ්ඩපෙ, වෘක්ෂච්ඡායා මණ්ඩපයෙහි; සත්තාහං, සත්දිනක්; විතිනාමෙසි, ඉක්මවී.

**භාවය:-** (සක්මන් කිරීමෙන් පසුව) අනුපිය නම් අඹවනයට ගොස් මහණවීමේ ප්‍රීතියෙන් උපන් සන්තොෂය විඳිමින් සිත්කළුවූ, වෘක්ෂච්ඡායාමණ්ඩපයෙහි සත්දිනක් විසී ය.

**පරිකථා:-** "පාදපමණ්ඩපෙ"

ලොකු කුඩා ගස් ආදියෙන් හෙවීගොස් මඩුවක් මෙන් තවාකාරව පිහිටි වන ලැහැබ පාදපමණ්ඩප නමි. එහි නිතර ඡායාව (සෙවන) පවතී. බෝසතාණන් වහන්සේ මේ රුක්වලින් ගැවසුන වනයෙහි සතියක් වාසය කෙළේය.

104 **තතො රාජගහං ගන්ත්වා-පාරුපිත්වාන චීවරං,**
**ගහෙත්වා මණිවණ්ණං සො-පත්තං කරතලම්බුජෙ**

**අන්වය:-** තතො සො රාජගහං ගන්ත්වා චීවරං පාරුපිත්වාන මණිවණ්ණං පත්තං කරතලම්බුජෙ ගහෙත්වා රාජගහං ගන්ත්වා.

**පදාර්ථ:-** තතො, ඉක්බිති; සො, ඒ මහාසත්වතෙමේ; චීවරං, සිවුරු; පාරුපිත්වාන, පොරවා; මණිවණ්ණං, (ඉඳුනිල්)මිණිපැහැති; පත්තං, (ඝනශෛලමය) පාත්‍රය; කරතලම්බුජෙ, හස්තතල නමැති පද්මයෙහි; ගහෙත්වා, ගෙණ; රාජගහං, රාජගෘහනගරයට; ගන්ත්වා, වැඩ.

105 **බත්තිංසලක්ඛණුපෙතො-අනුබ්‍යඤ්ජනමණ්ඩිතො**
**බ්‍රහ්මුජ්ජුගත්තො භගවා-පුරසෙට්ඨමුපාගමි.**

**අන්වය:-** සුගමයි.

**පදාර්ථ:-** බත්තිංසලක්ඛණුපෙතො, දෙතිස්මහා පුරිස් ලකුණින් යුක්තවූ; අනුබ්‍යඤ්ජනමණ්ඩිතො, අසූ අනුබ්‍යඤ්ජනයෙන් සැරසියාවූ; බ්‍රහ්මුජ්ජුගත්තො, බඹහුගේ කායමෙන් සෘජු කායක් ඇත්තාවූ; භගවා, භාග්‍යවත්වූ; (බොධිසත්වතෙම) පුරසෙට්ඨං, ශ්‍රෙෂ්ඨවූ රාජගෘහනගරයට; උපාගමි, එළඹියේ ය.

**භාවය:-** (අනුපිය අඹවනයෙහි විසීමෙන් පසුව) මහසත් තෙමේ සුපිළිසන් කොට (උභයාංශකොට) සිවුරු පෙරවා ඉඳුනිල් මිණි පැහැ ඇති ශෛලමය පාත්‍රය අතින් ගෙණ වැඩ දෙතිස් මහාපුරිස් ලකුණෙන් හා අසූ අනුව්‍යඤ්ජනයෙන් හෙබි බඹහුගේ කය මෙන් සෘජු වූ ගාත්‍ර ඇත්තේ රජගහ නගරයට එළඹියේ ය.

**පරිකථා:-** “රාජගහ”

මගධරට අගනුවර රජගහ නම්. මිට මාගධ පුර-ගිරිව්‍රජ යි නම් දෙකක් ද විය. බුදුරදුන්ගේ කාලයේදී රාජගෘහ-ගිරිව්‍රජ-යන නම් දෙක ව්‍යවහාර විය. මේ නගරය වෙභාර-වෙපුල්ල ගිජ්ඣකූට ඉසිගිලි-පාණ්ඩව යන පර්වත පසකින් වටවී ගාලක් මෙන් පිහිටියේය. කපිලවාස්තු පුරයට මෙහි සිට යොදුන් 60 ක් දුරය. බත්තිංස ලක්ඛණ-අනුබ්‍යඤ්ජන යන මොහු යට විස්තර කරණ ලදහ.

“බ්‍රහ්මුජ්ජුගත්තා” යන තන්හි බ්‍රහ්මයා සෙයින් ඔවුන් සෘජු ගාත්‍රා ඇති පරිදි කියේ ය? යත්; බොහෝසේ සත්වයෝ ස්කන්ධයෙන් හෝ නැමෙත්. කටිප්‍රදෙශයෙන් හෝ නැමෙති. ජානුමණ්ඩලයෙන් හෝ නැමෙති. කටිප්‍රදෙශයෙන් නැමෙත්තාහු පිටට නැමෙති. තුඹු දෙතැනින් නැමෙන්නාහු පෙරටවැ නැමෙති. දීර්ඝ ශරීර ඇති ඇතැම් කෙනෙක් පාර්ශ්වයෙන් වක්වෙති. ඇතැම් කෙනෙක් උඩබලා තකස් තරු ගණනුවන් සෙයින් ඇවිදිති. ඇතැම් කෙනෙක් අල්පමාංස රුධිර වන බැවින් ශූල සදෘශවැ වෙවුලමින් ඇවිද්දති. බුදුනට වූ කල ඍජුව උද්ගත වූ ශරීරය දෙව්නුවර නැගූ රන්තොරණක් සෙයින් ශොභිත ය. මෙසේ මහාබ්‍රහ්මයාගේ ගාත්‍ර සෙයින් ඍජුවූ දීර්ඝ ප්‍රමාණවූ ගාත්‍ර ඇතිවන බැවින් “බ්‍රහ්මුජ්ජුගත්ත”නම් වේ.

සද්ධර්මබෝධිනී නම් වූ

සමන්තකූටවණ්ණනාව්‍යාඛ්‍යාවෙහි ප්‍රථමභාගය

මෙතෙකින් නිමියේ යි.